
# ජීවිතය මරණය සහ පුනරුත්පත්තිය




නිලන්ත හෙට්ටිගේ

Scanned with CamScann

ජීවිතය, මරණය, අන්තරාභවය, පුනරුත්පත්තිය,
අනාවැකි, අධිමානසික හැකියා, හාස්කම්
යනාදී දේ ගැන දුර්ලභ ඉගැන්වීම් රැසක් ඇතුළත් ග්‍රන්ථය

# ජීවිතය මරණය සහ පුනරුත්පත්තිය



ස ම් පා ද න ය

නිලන්ත හෙට්ටිගේ

Scanned with CamScanner

# පටුන

හැඳින්වීම
1. ජීවිතය සහ ජීවලෝකය
2. මරණයේ දොරටුව
3. මරණය කෙබඳු අත්දැකීමක්ද?
4. මරණය අබියස ඔබ කුමක් කළ යුතුද?
5. මරණයට බිය වන දෙවිවරු
6. භවය සහ අන්තරාභවය
7. අන්තරාභවය තුළ අත්දැකීම්
8. පුනරුත්පත්තිය සහ පුනර්භවය
9. පුනර්භව දාමය සැකසෙන අයුරු
10. පුනර්භවය වෙත කර්මය බලපාන අයුරු
11. පුනරුත්පත්තිය ඔප්පු කළ හැකිද?
12. පුනරුත්පත්ති ගවේෂකයා - එඩ්ගා කේසි
13. එඩ්ගා කේසි හෙළි කළ අපූරු සබඳතා
14. එඩ්ගා කේසිගේ ජීවන දර්ශනය
15. මනෝකාය සහ මනෝමයකාය
16. මරණයේදී සිරුර හැර යන මනෝකාය
17. මනෝකාය දැකගත හැකිද?
18. සිරුර හැරගොස් නැවත පැමිණෙන ස්වප්නකාය
19. ජීව ලෝකයේ නොපෙනෙන රහස්
20. දිවැසින් දුටු අපායේ තතු
21. යක්ෂයෝ සහ අසුරයෝ
22. ප්‍රේත ලොව සැබෑ තතු
23. සදෙව් ලොව අසිරිසිරි
24. බ්‍රහ්මයන්ගේ ජීවන තතු
25. අපව දකින්නට එන පිටසක්වළ අමුත්තෝ
26. අබිරහස් මෘත ශරීරාගාරය



Scanned with CamScanner

27. අබිරහස් සවැනි ඉන්ද්‍රිය
28. මිනිසාගේ අබිරහස් හැකියා
29. අතීන්ද්‍රිය ඥාන
30. අසාමාන්‍ය හැකියා ඇති මිනිස්සු
31. මිනිසුන්ට අහසින් යා හැකිද?
32. අසහාය අනාවැකිකරු - නොස්ත්‍රදාමුස්
33. නොස්ත්‍රදාමුස්ගේ විස්මිත අනාවැකි
34. සිහිනෙන් දකින අනාගතය
35. පෙරනිමිති හෙවත් අනාගතයේ සෙවණැලි
36. විශ්වය පිළිබඳ විස්මිත රහස්
37. විශ්වය බිහිවූයේ කෙසේද?
38. අබිරහස් කළුකුහර
39. කල්ප විනාශය එළඹෙන අයුරු
40. ළඟ ළඟ එන ලෝක විනාශය
41. පෘථිවිවාසීන්ගේ අනාගතය

# හැඳින්වීම

ඔබ ලද මිනිස් දිවියේ අරුත කුමක්ද? මෙම පැනයට ඔබ විසින් දෙනු ලබන පිළිතුර කුමක් වුවද ඒ පිළිතුර වෙත ළඟා වීම සඳහා සෑහෙන වෙහෙසක් දැරීමට ඔබට සිදුවනු ඇත. මෙම කෘතිය ලිවීමේ මූලික පරමාර්ථය වනුයේ එකී ප්‍රශ්නයට දිය යුතු නිවැරදි පිළිතුර වෙත ළඟා වීම සඳහා ඔබට සහය වීම ය.

ළදරුවන් විලස මෙලොව උපදින අපි සැවොම ඉනික්බිති වයසින් මුහුකුරා ගොස් අවසානයේ වියපත්ව අසරණව මරුට පරදිමු. මෙලොවෙහි මරණය ජයගත් කෙනෙක් වෙත් නම් ඒ කිසිදින නූපන් අයෙක් විය යුතුය. උපදින සියලු දෙනාම තමන්ට අයත් භූමිකා රඟපා ජීවිතය නම් රඟමඩල හැර යති. මරණය නම් වූ ඒ බියකරු දොරටුවෙන් එපිට ඇත්තේ කුමක්ද? මරණයෙන් සියල්ල අවසාන වේද? නැතහොත් මරණය යනු තවත් ආරම්භයක්ද? ජීවිතය යනු හුදු මායාවක් පමණක්ද? කෙනෙකුට එසේ සිතෙන්නට බැරි කමක් නැත. එහෙත්, මරණය නම් දොරටුවෙන් එපිට ඇත්තේ කුමක්දැයි දැන ගැනීම සැම අතින්ම නුවණට හුරුය. කල්තබා සූදානම් වීම මරණයට මුහුණදීමට ඇති බිය පලවා හරින දිව ඔසුවක් ළඟ තබා ගැනීම වැනිය. ඔබ ජීවත් වීමට උගත යුත්තේ යම් සේ ද එසේම මරණින් මතු ජීවිතයට මුහුණ දීමට උගත යුතුය.

ජීවිතය හා මරණය දම්වැලක පුරුක් දෙකක් නම් එහි ඊළඟ පුරුක පුනරුත්පත්තියයි. පුනරුත්පත්තිය මිථ්‍යාවක් බව බටහිර පන්නයට හැඩ ගැසුණු බොහෝ දෙනෙක් මෑතක් වනතුරු කල්පනා කළහ. මන්දයත් ඔවුනට දිව්‍යඥාන හෝ ජාතිස්මරණ ඥාන නොතිබුණු බැවිනි. එහෙත්, කාලය සියල්ල උඩුයටිකුරු කළේය. මෑත කාලයේ ප්‍රසිද්ධ වූ පුනරුත්පත්ති ගවේෂණ පිළිබඳ තොරතුරු නිසා අද බහුතර ජනතාව මතු උපතක් ඇත යන්න අවිවාදයෙන් පිළිගනිති. ඇමෙරිකා එක්සත් ජනපදවාසීන්ගෙන් සියයට පනහකට වඩා පුනරුත්පත්තිය පිළිගන්නා බව මෑත කාලීන සමීක්ෂණවලින් හෙළිවී ඇත. පුනරුත්පත්ති පර්යේෂකයන්ගේ නව සොයාගැනීම් නිසා මනෝවිද්‍යාව සහ වෛද්‍ය විද්‍යාව අද



Scanned with CamScanner

සම්පූර්ණයෙන්ම වෙනස් මගකට පිවිස ඇත. පෙර භවයන්හි ලද අත්දැකීම් සහ පුරුදු කළ දේ නිසා මනුෂ්‍ය චර්යාව හැඩගැන්වෙන ආකාරය ද පෙර කළ කර්මයන්හි විපාක හේතුවෙන් විවිධාකාර රෝගාබාධ ඇතිවන ආකාරය ද පර්යේෂකයන් විසින් අපූරු නිදසුන් ඇසුරෙන් පෙන්වා දී ඇත.

පෙර කල විසූ දිව්‍යසිවරුන් පළ කළ අනාවැකි දැන් සත්‍ය වෙමින් පවතී. ඔවුන් කී සේම අද ආගම හා විද්‍යාව එක්වෙමින්, බද්ධ වෙමින් හා මිශ්‍ර වෙමින් පවතී. ආගම හා විද්‍යාවේ සුසංයෝගයක් වන ඒ නව විෂය ආධ්‍යාත්මික විද්‍යාව (Spiritual Science) යන නමින් බටහිර රටවල ජනප්‍රියය. අද ලියවෙන පොත්පත්වලින් වැඩිම ඉල්ලුමක් ඇත්තේ මෙකී ආධ්‍යාත්මික විද්‍යාව වෙනුවෙනි. ආධ්‍යාත්මික විද්‍යාව 21 වන සියවසේ ප්‍රබලතම බලවේගය බවට පත්වෙමින් පවතී. ආගම් අතර ඇති පරතරය බිඳ හෙළී යමින් නව ලෝක ආගමක් බිහිවීමේ ප්‍රවණතාවක් ද දැන් හටගෙන ඇත. පුනරුත්පත්තිය, කර්ම බලය හා විශ්වයේ නොපෙනෙන බලවේග දැනට බිහිවෙමින් පවතින ඒ විශ්ව ආගමෙහි හරය තුළ පවතින අනිවාර්යය මාතෘකා බවට පත්ව ඇත.

ආධ්‍යාත්මික වටිනාකමකින් යුතු මාතෘකා කිහිපයක් යටතේ දිගහැරෙන මෙම කෘතිය ජීවිතය, මරණය හා පුනරුත්පත්තිය පිළිබඳ අපූරු තොරතුරු රැසක් හෙළි කරයි. මෙය පරිශීලනය තුළින් ඔබේ ජීවන දර්ශනය ප්‍රබල පරිවර්තනයකට ලක් වනු නිසැකය.



Scanned with CamScanner

# 1. ජීවිතය සහ ජීවලෝකය

පෘථිවිය මත ජීවය ඇරඹුණේ කෙසේද? ඒ කොපමණ කලකට පෙරද? මේ ප්‍රශ්න දෙකට පිළිතුරු සැපයීමට එදා මෙදා තුර විද්‍යාඥයෝ අධිකතර වෙහෙසක් ගත්හ. ජීවයෙහි ආරම්භය පිළිබඳව විද්‍යාඥයන් විසින් කර ඇති පැහැදිලි කරදීම් ආකාර කිහිපයකට වර්ග කර දැක්විය හැකිය.

☆ පෘථිවිය මතට ජීවය පැමිණියේ බාහිර ග්‍රහ වස්තුවක සිටය යන්න ජනප්‍රිය මතවාදයකි. බාහිර ග්‍රහ වස්තුවක් දැනට වසර බිලියන ගණනකට පෙර පෘථිවිය සමග ඝට්ටනය වී ඇත. එහි තිබී වායුගෝලයට මුසු වූ ජීවාංශු හෙවත් ජීවයේ තැනුම් ඒකක මගින් පෘථිවිය මත ප්‍රථම ජීවීන් බිහිවිය.

පෘථිවිය මතට ජීවාංශු විසුරුවා හළ ඒ ග්‍රහ වස්තුව වල්ගා තරුවක් හෝ ග්‍රහකයක් විය හැකිය. එකී වල්ගා තරුව හෝ ග්‍රහකයෙන් කැඩී ආ කුඩා කොටසක් මුළු පෘථිවිය මත ජීවය විසුරුවා හැරීමට වග කිවයුතු වේ!

මුල් බැල්මට මේ මතවාදය එතරම් ප්‍රායෝගික එකක් නොවූ බැවින් බොහෝ තාරකා විද්‍යාඥයෝ පෘථිවිය මත ජීවය හටගැනීම වෙනත් ආකාරයකට සිදුවූ බව තර්ක කළහ. එනමුත්, 20 වන සියවසේ අවසාන භාගයේ දී හමු වූ අපූරු උල්කාෂ්මයක් (ග්‍රහවස්තු කොටසක්) නිසා විද්‍යාඥයෝ මවිතයෙන් මවිතයට පත්වූහ. පෘථිවිය මත තිබී හමු වූ ඒ ආගන්තුක පාෂාණ කැබැල්ල මත අප නොදන්නා ආකාරයක ජීවීන්ගේ මළ සිරුරු කොටස් තැන්පත්ව තිබුණි. එබැවින් පිටසක්වළින් පෘථිවියට ජීවය පැමිණි බවට වන මතවාදය නැවත කරළියට පැමිණ ඇත.

☆ මේ අතර තවත් විද්‍යාඥ පිරිසක් ඊට හාත්පසින්ම වෙනස් ආකාරයට ජීවයේ ආරම්භය පිළිබඳව තතු දක්වයි. ඔවුන් පවසනුයේ පෘථිවිය මත ම ජීවය ඇරඹි බවයි. මේ මතය සනාථ කරන්නට ඔවුහු අපූරු පරීක්ෂණයක් සැලසුම් කළහ. විද්‍යාඥයෝ වීදුරු ගෝලයක් තුළට මුහුදු ජලය, නයිට්‍රජන් වායුව සහ කාබන් ඩයොක්සයිඩ් වායුව පුරවා ඒ මතට කෘත්‍රිමව ඇති කළ අකුණු



Scanned with CamScanner

සැර වැදෙන්නට සැලැස් වූහ. පුදුමයකි! වීදුරු ගෝලය තුළ තිබූ ජලය රත් පැහැයට හැරවුණි. ජලය මත උපන් රත් පැහැ රසායනික ද්‍රව්‍යය පරීක්ෂා කර බැලූ විද්‍යාඥයෝ උද්දාමයට පත්වූහ. ජලය මත ජීවයේ මුල් ඒකක තැනී තිබුණි. සියලුම ජීවී ආකාරවල තැනුම් ඒකක වන ඩී. එන්. ඒ. අණු තැනීමට සමත් ඇමයිනෝ අම්ල ඒ වීදුරු ගෝලය තුළ නිපදවී තිබුණි.

ජීවයේ ආරම්භය පිළිබඳව පවතින මේ තරගකාරී මත දෙකටම හොඳ තල්ලුවක් ජීවය පිළිබඳ බෞද්ධ ඉගැන්වීමෙන් ලැබේ. දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍රයේ ද බ්‍රහ්මජාල සූත්‍රයේ ද ජීවයේ ආරම්භය පිළිබඳ ප්‍රමාණවත් විස්තර ඇත. ඒ අනුව,

1. පෘථිවිය මතට ජීවය පැමිණියේ වෙනත් ලෝකයක සිටය. එම ස්ථානය "ආභස්සර බඹලොව" නම් වෙයි.

2. පෘථිවිය බිහිවී දීර්ඝ කාලයක් ගත වූ පසුව පෘථිවියේ ජලතලය මත ගිතෙල් වැනි දෙයක් හට ගත්තේය. මේ ගිතෙල් වැනි "ආදි සූපය" මිහිරි රසකින් යුතුය. පෘථිවි වායුගෝලය තුළ සැරිසරමින් සිටි සත්ත්වයෝ ක්‍රමක්‍රමයෙන් ආදි සූපය තම ආහාරය ලෙස එක් කර ගැනීම ඇරඹූහ. පෘථිවි තලය මත ජීවය ආරම්භ වූයේ එලෙසය.

ජීවය හා ජීවලෝකය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් ඒ පිළිබඳ නූතන විද්‍යාවේ සොයා ගැනීම්වලටත් වඩා කුතුහලය දනවන සුලුය. බුදුන්වහන්සේ විසින් දේශනා කර ඇති පරිදි විශ්වය තුළ අප තනිවී නැත. ගණනින් කියා නිම කළ නොහැකි තරම් ජීවලෝක ප්‍රමාණයක් විශ්වයෙහි ඇත. විශ්වයෙහි ජීවය පිළිබඳ විස්තරය මෙලෙස සවිස්තරව දැක්විය හැකිය.

☆ අප වෙසෙන ක්ෂීරපථ මන්දාකිනියෙහි පෘථිවියට එපිටින් ජීවය පවත්නා තිස් එක් ආකාරයක වාස භූමි ඇත. ඒවා "තිස් එක් තල" නම් වේ.

☆ මෙවැනි චක්‍රාවාට දහසකින් සැදුණු ඒකකයක් සහස්සී ලෝක ධාතුවක් නම් වේ. ඒ අනුව එක ළඟ පිහිටි මන්දාකිනි දහසකම දිව්‍ය ලෝක, මනුෂ්‍ය ලෝක, අපාය සහ බ්‍රහ්ම ලෝක ඇත.



Scanned with CamScanner

☆ විශ්වයෙහි ජීවලෝක ප්‍රමාණය මෙතෙකින් නිම නොවේ. සහස්සී ලෝක ධාතුවලින් එපිට තවත් එවැනිම ලෝක ධාතු අනන්ත සංඛ්‍යාවක් ඇත.

විද්‍යාඥයන් මෑතක් වනතුරු සිතා සිටියේ විශ්වයට අවසාන ඉමක් ඇති බවයි. මෑතකදී අභ්‍යවකාශයේ ස්ථානගත කළ හබ්ල් දුරේක්ෂයෙන් ගත් ඡායාරූප නිසා එම මතය පුස්සක් බවට පත්ව ඇත. හබ්ල් දුරේක්ෂය පෘථිවි වායුගෝලයෙන් එපිට රඳවා ඇති නිසා එහි ඇති කැමරාවලට දුර ඇති ග්‍රහ වස්තුන්ගේ ඉතා පැහැදිලි ඡායාරූප ගත හැකිය. ඒ අනුව,

☆ අප දන්නා විශ්වයේ ඈතම ඉමටත් එහා ඇති චක්‍රාවාට (මන්දාකිනි) දහස් ගණනක් ඒ ඡායාරූපවලට හසුව ඇත.

☆ ජීවය පවතී යැයි සැක කළ හැකි ග්‍රහ වස්තුන් කිහිපයක්ම මේ වන විට හඳුනාගෙන ඇත.

කෙසේ නමුත්, විද්‍යාඥයන්ට මේ වන තුරු පෘථිවියෙන් එපිට ජීවය ඇත් ද යන්න පිළිබඳව ස්ථිර නිගමනයකට පැමිණීමට නොහැකිව ඇත. පෘථිවියෙන් එපිට ජීවය පිළිබඳව සුප්‍රකට මතවාද දෙකක් වෙයි. ඉන් එක මතවාදයකින් කියවෙනුයේ,

☆ සූර්යයාගේ ප්‍රමාණයේ තාරකාවක් වටා,

☆ පෘථිවියේ ප්‍රමාණයේ ග්‍රහ වස්තුවක්,

☆ එවැනි දුර පරතරයක් සහිතව,

පරිභ්‍රමණය වේ නම් නිසැක වශයෙන්ම එහි ජීවය හටගන්නා බවයි. එහෙත් තවත් විද්‍යාඥ පිරිසක් කියා සිටිනුයේ පෘථිවි අක්ෂය ඇලව පැවතීමත්, පෘථිවිය හා චන්ද්‍රයා අතර අන්‍යෝන්‍ය ගුරුත්ව බලපෑමත් නිසා ඍතු වෙනස්වීම් ද සයුර මත උදම් රළද ඇති වී පෘථිවිය මත ජීවය හටගත් බවයි. ඒ මතවාදය අනුව කියවෙනුයේ පෘථිවිය වැනිම වූ ජීව ලෝකයක් තවත් තිබීමට ඉඩකඩ (සම්භාවිතාව) ඉතා අල්ප බවයි.

පෘථිවියෙන් පිට අන් තැනක ජීවය පවතී නම් ඒ ජීවීන් කවරාකාර හැඩරුවක් ගනු ඇතිද? සුප්‍රකට විද්‍යා ප්‍රබන්ධ



Scanned with CamScann

රචකයෙකු වන ආචාර්ය ආතර් සී. ක්ලාක් මහතාගේ මතය වනුයේ මනුෂ්‍ය රූපාකාරය ගන්නා ජීවීන් පෘථිවියෙන් පිට නොසිටින බවයි. පිටසක්වළ ජීවීන් වෙත් නම් ඔවුන් අද්භූත පෙනුමක් ඇති සත්ත්වයන් විය යුතුය. ක්ලාක් මහතා ඒ නිගමනය වෙත පැමිණ ඇත්තේ හේතු සාධක ඇතිවය. මෙලොව ජීවීන් ක්‍රමක්‍රමයෙන් පරිණාමය වී මිනිසා බිහිවූයේ "පරිණාමයේ දාදු කැටය" අහඹු ලෙස විශාල වාර ගණනක් පෙරළීමෙනි. වෙනත් අයුරකින් කියතොත් මිනිසාගේ උපත දක්වා පරිණාමය සිදුවූයේ අහඹු සිද්ධීන් රාශියකගේ ප්‍රතිඵලයක් වශයෙනි. එබැවින් වෙනත් ග්‍රහ ලොවක මේ හා සමාන අහඹු සිදුවීම් රැසක් ඇතිවී "මිනිසෙකු" බිහිවීම ඉතා දුර්ලභ සිද්ධියකි.

කෙසේ වෙතත්, පිටසක්වළ ජීවය ඇත්දැයි සෙවීම ගැන අධික උනන්දුවක් දැක්වූ ආතර් සී. ක්ලාක් මහතා ඒ සම්බන්ධ වැදගත් හෝඩුවාවක් ලබා ගැනීමට සමත් වූයේය. ඇමෙරිකාවේ නාසා ආයතනය විසින් පවත්වාගෙන යන වාර්තා අතර පිටසක්වළ ජීවය හා සම්බන්ධ වැදගත් ඡායාරූප කිහිපයක් ඇති බව ආතර් සී. ක්ලාක් මහතා පවසයි. ඉන් එක් ඡායාරූප කට්ටලයක ඇත්තේ අඟහරු ග්‍රහයා මත ඇති මිනිස් මුහුණක හැඩයක් ගත් දැවැන්ත ගල් කැටයමකි. කිලෝමීටර් කාලක් පමණ විශාල වැලි ගලක් මත නෙළා ඇති ඒ කැටයම තුළින් අහස දෙස නෙත් යොමු කර ගෙන සිටින මිනිස් මුහුණක් පැහැදිලිව දිස්වේ.

දෙවැනි ඡායාරූප කට්ටලයේ අඩංගු තොරතුරු මීටත් වඩා සිත් ගන්නා සුලුය. අඟහරු ග්‍රහයා මත ඇති කුඩා පඳුරු විශේෂයක රූ සටහන් එම ඡායාරූපවල පැහැදිලිව සටහන්ව තිබේ. නාසා ආයතනයේ විද්‍යාඥයන් අඟහරු ග්‍රහයා ගැන මෙතරම් උනන්දුවක් දක්වනුයේ පෙර කී කුතුහලය දනවන ඡායාරූප නිසාමය. මෑතක දී අඟහරු ග්‍රහයා වෙත යවන ලද ස්වයංක්‍රීය කැමරා සහිත යානාවලට අඟහරු මත ජලය පවතින බව සනාථ කරගත හැකිව ඇත. එහෙත් අඟහරු මත ජීවය පවතින බව තවමත් කිසිවෙකුට සනාථ කළ නොහැකි වී ඇත.



Scanned with CamScanner

# 2. මරණයේ දොරටුව

මරණින් මතු සියල්ල අවසන් වේ යැයි සමහරු සිතති. පහනක් නිවී යාමෙන් එහි ආලෝකය නැතිව යන්නේ යම් සේද මරණින් මතු සත්ත්වයාගේ පැවැත්ම ද අහෝසි වේ යන්න ඔවුන්ගේ මතයයි. මරණින් මතු සියල්ල අවසන් වන බව සිතන අය ඉදිරිපත් කරන ප්‍රබල තර්කයක් වෙයි. ඔවුන් කියන පරිදි සිත යනු මොළය නම් වූ භෞතික ඉන්ද්‍රියේ ක්‍රියාකාරිත්වය නිසා හටගත් ප්‍රතිඵලයක් වේ. මනුෂ්‍යයෙක් මිය යත්ම මොළයට ලැබෙන රුධිර සැපයුම නැවතී එහි ක්‍රියාකාරිත්වය අඩාල වේ. එහෙයින් මරණින් මතු සත්ත්වයාගේ විඤ්ඤාණය (සිහිය) කයින් ඉවතට නොගොස්ම අභාවයට යයි. මේ මතවාදය කෙතරම් ප්‍රබල එකක් වුවද ප්‍රායෝගිකව සලකන කල ඊට විපක්ෂ මතවාද ශක්තිමත් වන ආකාරයේ තොරතුරු රැසක්ම ඇත. හෘදයාබාධයක දී හෝ හදිසි ශල්‍යකර්මයක දී සායනිකව "මිය යන" මිනිසුන් නැවත "මළවුන්ගෙන් නැගිටින" අවස්ථා ඇත. මෙවැනි අවස්ථාවලට මුහුණ පෑ සියලු දෙනාම පිළිගන්නා එක දෙයක් ඇත. සායනිකව මරණයට පත්වූ පසුවද සිත ක්‍රියාකාරීව පැවති බව එවැනි තත්ත්වයන්ට පත්වූ සියලු දෙනාම එකහෙළා පවසති. එබැවින් මරණය දෙස භෞතිකවාදී දෘෂ්ටිකෝණයෙන් බැලීම තවදුරටත් සිදුනොකළ යුතු බව පැහැදිලිය.

පුද්ගලයෙකු මරණයට පත්වන අවස්ථාව පිළිබඳව බුද්ධ ධර්මයෙහි එන ඉගැන්වීම් ඉතා වැදගත් කොට සැලකිය හැකිය. සත්ත්වයාගේ මරණයට හේතුව මෙහි පහත සඳහන් කවර හෝ වර්ගයට අයත් විය හැකිය.

1. *ආයුක්ෂය මරණය :-*

සත්ත්වයාගේ ආයුෂය ගෙවී ගොස් මහලු වී කය දුර්වල වීමෙන් පසු එම කය අත්හැර දමා යාමට සිදුවෙයි. මෙය ආයුක්ෂය මරණයයි. මනුෂ්‍යයන්ගේ හෝ තිරිසන් සතුන්ගේ කය දිරායාමෙන් ආයුෂ කෙළවර වෙයි. දෙවියන්, යක්ෂයන් හා සමහර සත්ත්වයන්ගේ සූක්ෂම ශරීර කාලයත් සමග නොදිරයි. එහෙත් තම උපන් භවයේ පරමායුෂය ගෙවීයත්ම ඔවුන්ගේ මරණය අනිවාර්යයෙන්ම සිදුවේ.



Scanned with CamScanner

**2. කර්මක්ෂය මරණය :-**

සත්ත්වයාගේ උපතට මුල් වනුයේ කිසියම් කර්මයක බලපෑමයි. ඒ කර්මයේ ශක්තිය සිඳී ගිය දින සත්ත්වයා මරණයට පත්වන්නේය. සත්ත්වයාගේ ආයුෂය ඉතිරිව පැවතිය ද උපතට බලපෑ (ජනක) කර්මය අවසන් වීමෙන් පසු ඔහුට තව කල් ජීවත්විය නොහැකිය. බුදුන් කල තරුණ වියේ සිටි රාජ කුමාරයෙකුගේ ආයුෂය ඉතිරිව තිබුණේ තවත් මාස 5ක් පමණකි. බුදුහු මේ කුමරා හමු වී ඒ බව පහදා දී මතු සුගතිගාමී වන ප්‍රතිපදාව හෙළි කළහ. බුදුන් විසින් අනාවැකි පළ කළ ලෙසම ඒ රජ කුමරා ඉන් මාස 5කට පසු මියගොස් දෙව්ලොව උපත ලද්දේය. දෙව්ලොවට අධිපති ශක්‍ර දේවේන්ද්‍රයාගේ ජනක කර්මය ගෙවී ගියේ ඔහු කෙළි දෙළෙන් ගත කරන අතර ඔහුටත් නොදැනීමය. මරණාසන්න වූ ශක්‍රයා බියෙන් ඇළලී ගොස් බුදුන් හමුවට පැමිණියේය. බුදුහු ශක්‍රයා අස්වසා ධර්මානුශාසනයක් කළහ. අනුශාසනාව අසා පෙර පිනක් මතක් වීම හේතු කොට ගෙන තවත් කල් ජීවත් වීමේ වරම ඔහුට ලැබිණි. මරණාසන්න පුද්ගලයෙකුට පිංකම් කර ආයුෂ දිගුකර ගත හැකිය යන්න මේ කතා ප්‍රවෘත්තියෙන් අපට උගත හැකි පාඩමකි.

**3. උභයක්ෂය මරණය :-**

යමෙකුගේ ජනක කර්මයත්, ආයුෂත් යන දෙකම ගෙවී යාමෙන් මරණය සිදුවේ නම් එය උභයක්ෂය මරණය නම් වේ.

**4. අකාල මරණය :-**

ආයුෂයත්, ජනක කර්මයත් තව ඉතිරිව තිබියදී යමෙකු මරණයට පත් වුවහොත් එය අකාල මරණයක් ලෙස හැඳින්විය හැකිය. සමහරු තව ආයුෂ ඉතිරිව තිබිය දීම සියදිවි නසාගනිති. නැතහොත් අනුන්ගේ උපක්‍රමයකින් හෝ රාජ දඬුවමකින් මරණයට පත්වෙති. උපතක් ලබාදීමට හේතු වූ ජනක කර්මය බල පවත්තද්දීම යමෙකු මරණයට පත්වීමට ඇති ඉඩකඩ බෞද්ධ කර්ම වාදය තුළින් තවදුරටත් පහදා දිය හැකිය. සත්ත්වයාගේ උපතට හේතුවන කර්මය "ජනක" කර්මය නම් වේ. "උපස්ථම්භක" කර්මවල බලපෑමෙන්, උපත් සත්ත්වයාට වාසි අත්වේ. "උපපීඩක" කර්මවල බලපෑමෙන් රෝග පීඩා, සතුරු උවදුරු ආදී බාධා හිරිහැර ඇති වේ.



Scanned with CamScanner

"උපඝාතක" කර්මයක් ක්‍රියාත්මක වීමෙන් සත්ත්වයා හදිසි මරණයකට ලක්වේ. මුගලන් මහරහතන් වහන්සේ පෙර ආත්මභාවයක ගිහිව වෙසෙන කල තම බිරිඳගේ කීම් අසා තම අසරණ දෙමාපියන් කැලයට ගෙන ගොස් පල්හොරුන් විසින් මරා දමන බව අඟවා, ඔවුන් දෙදෙනාව තළා, පෙළා, මරා දැමුවේය. මේ පාප ක්‍රියාවේ බලපෑම ඉන්පසු උපන් හැම ආත්ම භවයකදීම උන්වහන්සේ ලුහුබැඳ ආවේය. දිනක් රාත්‍රී කාලයේ කුටියට ඇතුළු වූ පල්හොරු මුගලන් මහ රහතන් වහන්සේගේ මුළු ශරීරයම පිදුරු බිස්සක් මෙන් තළා පොඩි කර දැමූහ. උන්වහන්සේ ඍද්ධි බලයෙන් තම කය නැවත සකස් කර ගෙන අහසින් පැමිණ බුදුන් හමු වී වැඳ අවසර ගෙන පිරිනිවනට පත්වූහ. මුගලන් මහ රහතන් වහන්සේ මෙවන් හදිසි වියෝවකට පත්වූයේ "උපඝාතක" කර්මයක බලපෑමට හසු වීමෙනි. මිනිසුන් හිටි අඩියේ අවාසනාවන්ත ලෙස මරණයට පත් වනුයේ "උපඝාතක" කර්මයන්හි බලපෑමෙන්ය, යන්න මෙහිදී අවබෝධ කර ගැනීම වටී.

සමහරු කිසියම් හදිසි ආපදාවකට ලක්වී ක්ෂණිකව මරණයට පත්වෙති. තවත් අය කිසියම් හේතුවක් නිසා මරණාසන්නව තමා මිය යන බව දනිමින්ම මිය යති. මරණය වේදනාකාරී දෙයක් ද යන්න බොහෝ දෙනෙක් විමසති. අවියකින් හෝ උලකින් සිරුර සිදුරුවීම නිසා හෝ වේදනාකාරී රෝගාබාධයක් නිසා මරණයට පත්වීම අතිශයින්ම පීඩාකාරී දෙයක් බව අමුතුවෙන් කිවයුතු නැත. යමෙකු ස්වාභාවික මරණයකට පත්වන විට ඔහුට යම් වේදනාවක් දැනේද? ස්වාභාවිකව මරණයට පත්වන පුද්ගලයකු වුවද ඉවසිය නොහැකි වේදනාවකට පත්වන බවට සාධක ඇත. මෙම කරුණු සූත්‍ර පිටකයේ විස්තරාත්මකව දැක්වෙනුයේ අනේපිඬු සිටුතුමාගේ මරණය සම්බන්ධ විස්තරයන්හිය. ප්‍රකට දානපතියෙකු වූ අනේපිඬු සිටුතුමා මරණාසන්න වූයේය. ඔහුට ඉවසිය නොහැකි තදබල වේදනාවක් දැනුණි. එමෙන්ම තදබල මරණ බියක්ද දැනුණි. මරණ මංචකයේදී බණ ඇසීම නිසා මරණ බියෙන් අත්මිදීමට ඔහුට හැකිවිය.

යමෙකු සිහි මුළාවී මරණයට පත්වීම ඔහුට අහිතකර ලෙස බලපාන බව බුද්ධ ධර්මයෙහි තදින්ම ඉගැන්වෙන කරුණකි.



Scanned with CamScanner

එබැවින් සිහි නුමුළාව මිය යාම සඳහා නිතර භාවනා වඩන ලෙස බෞද්ධයන්ට උපදෙස් දෙනු ලැබේ. යමෙකු සිහි මුළා වී මරණයට පත්වීම යනු,

1. නින්දේදී මරණයට පත්වීම,
2. සිහි විසඥව සිටියදී මරණයට පත්වීම,
3. සිහි නැතිව ගොස් ඉන් අනතුරුව මරණයට පත්වීම,
4. අඩු සිහියකින් (අවසිහියෙන්) මරණයට පත්වීම,

යන අවස්ථාවන්ය. යමෙකු සිහි මුළාවට පත්ව මිය ගියහොත් එම පුද්ගලයා අපායෙහි උපදින ස්වභාවයක් ඇති බව බුද්ධ දේශනයෙහි දක්වා ඇත. (ඊට හේතු දක්වා නැත.) නිතර භාවනා කරන අය සිහි මුළාවට පත් නොවී හොඳ සිහියෙන් මිය යති.

එසේම බලගතු පින්කම්වල යෙදෙන අය වුව සිහි මුළා වී මරණයට පත්විය හැකිය. මෙවැනි අවස්ථාවලදී ඒ පුද්ගලයා මරණින් මතු දෙව්ලොව උපදියි. ඔහු දෙව්ලොව උපදිනුයේද සිහි මුළාවූ දෙවියෙකු ලෙසය. මෙම රෝගී දෙවියා ක්‍රමක්‍රමයෙන් සිහි නුවණ එළැඹ ප්‍රකෘති තත්ත්වයට පත්වේ. (සූත්‍ර පිටකයේ සඳහන් ධර්ම කරුණකි.)

දියෙහි ගිලී මරණයට පත් වූ අයට යළි මිනිසත් බව ලැබීමට නොහැකි වේය යන මතය මෑත කාලයේදී මෙරට බෞද්ධයන් අතර පැතිර ගියේය. සුනාමි ව්‍යසනය නිසා තම නෑසියන් වියෝවූ බොහෝ දෙනෙක් මේ කරුණ අසා මහත් සේ දුකට පත්වූහ. මෙම මතවාදයට යම් පදනමක් ද වෙයි. යම් අයෙක් දියේ ගිලී මිය යන්නට පෙර ඔහුගේ පෙණහලු දියෙන් පිරී යයි. (එසේ සිදු වන්නේ ඔහු දියේ ගිලී ස්වසනය කිරීමට උත්සාහ කරන බැවිනි.) මෙලෙස පෙණහලු දියෙන් පිරුණු වහාම ශ්වසනය අක්‍රිය වේ. ශ්වසනය අක්‍රියවීමත් සමග සිහිසුන් වීම අනිවාර්යයෙන්ම සිදුවේ. දියෙහි ගිලී මිය යන පුද්ගලයා සිහි විසඥව මෙලොව හැර යයි. එබැවින් පෙර කී ඉගැන්වීම අනුව එවැන්නෙක් අපාගත වීමට වැඩි ඉඩක් ඇති බව පැහැදිලිය. එනමුත්, හොඳින් සිත හික්මවා ගත් කෙනෙක් දියේ ගිලී මරණයට පත්වුවද ඔහු සුගතිගාමී වන

බව සූත්‍ර පිටකයේ එන කරුණු අනුව පෙනෙයි.

පෙර කල එක් පිරිසක් නැවක නැගී මුහුද තරණය කිරීම ඇරඹූහ. මුහුද මැද දී සිදු වූ ආපදාවක් හේතු කොට ගෙන ඔවුන් ගමන්ගත් නැව ගිලෙන්නට පටන් ගත්තේය. මේ පිරිස අතර බෞද්ධයෙක් විය. ඔහු නැවේ සිටි අන් අය තිසරණ සහිත පංච ශීලයේ පිහිටුවා තෙරුවන් ගුණ හා පන්සිල් නැවත නැවතත් සිහි කරන්නට සැලැස් වූයේය. මේ පිරිස මරණින් මතු සුගතිගාමී වූහ.

බිළිඳෙකු මෙලොව උපත ලබා ස්වල්ප දිනක් ගතවන තුරුම ඒ බිළිඳාට ස්වකීය පෙර උපත් දැකීම, දෙවියන් වැනි සූක්ෂම ජීවීන් දැකීම වැනි සුවිශේෂ හැකියා පවතින බවත් ඔහුගේ ඉන්ද්‍රියයන් වැඩීමත් සමගම ඒ දිව්‍යමය හැකියාවන් යටපත් වන බවත් බෞද්ධ ආචාර්යවරු කියති. මෙලෙසම යමෙකු මරණාසන්න වන විට ඔහුගේ ඇස්, කන්, නාසාදී ඉන්ද්‍රියයන් දුබල වී යයි. ඒ සමගම යටපත්ව තිබූ දිව්‍යමය හැකියා යළි අවධි වෙයි. මිය යමින් සිටි මිනිසුන්ට පහත සඳහන් අත්දැකීම් ලද හැකි බව බෞද්ධ ආචාර්යවරු කියති.

☆ අවකාශයේ සිටින යක්ෂයන්, ප්‍රේතයන් සහ දෙවියන් පෙනෙයි.

☆ තම ජීවිත කාලය තුළ කරන ලද සුවිශේෂ ක්‍රියාවන් (චිත්‍රපටයක් මෙන්) තමා අබියස දිග හැරෙයි.

☆ තමා ඊළඟ ආත්මයෙහි උපත ලබන ස්ථානය හෝ එහි ගති ස්වභාවය දකින නුවණක් පහළ වේ. මේ සම්බන්ධ කතා පුවත් කිහිපයක් බෞද්ධ සාහිත්‍යයෙහි අඩංගු වේ. වයස් ගතවී මරණාසන්න තත්ත්වයට පත් වූ දුටුගැමුණු රජතුමාට පිරිත් ඇසීමට සිත් විය. ඒ අනුව ස්වාමීන් වහන්සේලා පැමිණ පිරිත් කීම ඇරඹූහ. ස්වල්ප මොහොතකට පසු රජතුමා යමක් නැවැත්වීමට මෙන් අතින් සන් කළේය. එවිට ස්වාමීන් වහන්සේලා පිරිත් දේශනය අතරමග නැවැත් වූහ.

"මා අතින් සන් කළේ පිරිත් දේශනය නැවැත්වීමට නොවේ. සදෙව් ලොව දෙවිවරු දිව්‍ය රථවලින් පැමිණ දෙව් ලොව යන්නට මට ආරාධනා කරති. ඔවුන්ට මොහොතක් නැවතී හිඳින ලෙස



Scanned with CamScanner

දන්වා මම අතින් සන් කළෙමි." යනුවෙන් රජතුමා රැස්ව සිටි පිරිසට කීය. ඒ අනුව පිරිත් දේශනාව නැවත අරඹන ලදී.

මෙලෙසම මරණාසන්න පුද්ගලයෙක් දෙවියන් දුටු අවස්ථාවක් සද්ධර්මරත්නාවලියෙහි ධම්මික උපාසක කතා ප්‍රවෘත්තියෙහි දැක්වේ.

දෙව් ලොව යාමට තරම් පින් කළ අය මරණාසන්න වන විට ඔහුව පිළිගැනීමට දෙවියන් පැමිණෙන්නා සේම මතු අපාගත වන පුද්ගලයෙකු මරණාසන්න වන විට යමපල්ලන්ද, යමබල්ලන්ද ඔහුට අපායට මග පෙන්වීමට පැමිණෙන බව පැවසේ. මේ සම්බන්ධ කදිම කතා පුවතක් අසල්වාසී ඉන්දියාවෙන් වාර්තාවේ. පාප ක්‍රියාවල නියුතු වූ එක් දුෂ්ට පුද්ගලයෙක් ඉන්දියාවේ ප්‍රසිද්ධ රෝහලක මරණාසන්නව සිටියේය. තමා රැගෙන යාමට යමපල්ලන් හා යමබල්ලන් පැමිණ සිටින වග හේ රෝහල් බලධාරීන්ට දැනුම් දුන්නේය. යමපල්ලන් සිටිතැයි ඔහු පෙන්වූ සෑම තැනකම කපුටෝ රැස්ව සිටියහ. ඔහු අත දිගු කරන හැම වතාවකම කපුටෝ මහ හඬ නංවමින් අහසට නැගුණහ. මේ පුද්ගලයා මරණයට පත්වීමත් සමගම කපුටෝ ඈතට පියඹා ගියහ. "කපුටා" අපායෙහි සංකේතය බවත්, යමපල්ලන් කපුටන්ට ආවේශ වන බවටත් පොදු විශ්වාසයක් ඇත.

යමෙකු මරණයට පත්වී සුගතියට හෝ දුගතියට යාම සංකේතවත් කරන සිද්ධීන් ඇති බව ගුප්ත විද්‍යාවෙහි කියවේ. මේ එවැනි සිද්ධීන් කිහිපයකි.

1. යම් පුද්ගලයෙකුගේ මෘත දේහය නිවසෙන් එළියට ගන්නා විට හොඳ වැසි වැටේ නම් ඒ පුද්ගලයා සුගතිගාමී වූ බවට එය සලකුණකි.

2. අවමංගල උත්සවයක් ඇති තැනක අහස කළු වී අකුණු ශබ්ද ඇසේ නම් එම පුද්ගලයා දෙවියන් හා වාසයට එක් වූ බව ඉන් කියවේ.

3. යම් සොහොනක් මත හෝ එය වටා වන මල් පිපේ නම් අදාළ පුද්ගලයා සුගතිගාමී වූ බවට එය සලකුණකි.



Scanned with CamScanner

කෙසේ වෙතත් මරණය පිළිබඳ පර්යේෂණ පැවැත්වූ බංගලාදේශයෙහි බෞද්ධ භික්ෂුවක් විසින් අපූරු කරුණු රැසක් හෙළිදරව් කර ඇත. යමෙකු මරණ මංචකය මත මිය යමින් හිඳින කල අපායෙන් ද දෙව් ලොවෙන් ද ඔහු කරා නියෝජිතයෝ පැමිණෙති. මිය යමින් සිටින පුද්ගලයා වරෙක තමා කළ අකුශල කර්මවල විපාක ලෙස අපාය දකිමින් බිය වෙයි. එම චිත්ත රූප දාමය අවසන් වත්ම ඔහු කළ කුශල කර්මවල බලයෙන් දෙව් ලොවට ආදාළ චිත්ත රූප ඔහුට දිස්වේ. අපායට අදාළ චිත්ත රූප පෙනෙද්දී මරණයට පත්වූ අය අපායෙහි උපදිති. දෙව් ලොව විසිතුරු පෙනෙද්දී මිය ගිය අය මරණින් මතු දෙව් ලොව උපදිති. යමෙකු මරණාසන්න වූ කල ඔහුගේ සිත වෙනත් අරමුණක යෙදවූවහොත් මේ චිත්ත රූප දාමයට හසුවීම වළකාලිය හැකිය. ඊට හොඳම විසඳුම මරණාසන්න පුද්ගලයාට පිරිත් දේශනයක් හෝ ධර්ම දේශනයක් ඇසෙන්නට සැලැස්වීමයි. එවිට ඔහු කර්මානුරූප චිත්ත රූප දාමයෙන් වෙන්වී ගොස් සුගතියෙහි ඉපදීමට අවශ්‍ය “ආසන්න” කර්මය රැස් කරගනී.

“ආසන්න” කර්මය පිළිබඳව තවදුරටත් පැහැදිලි කරදීම සුදුසුය. යම් පුද්ගලයකු මරණයට පත්වීමෙන් අනතුරුව මතු උපතක් ලැබීම සඳහා කර්මය බලපානුයේ පහත පරිදිය.

1. යම්කිසි කර්මයක් නිසා අනිවාර්යයෙන්ම කිසියම් ස්ථානයක උපත ලැබීමට සිදුවේ නම් ඒ කර්මයට අනුකූලව උපත සිදුවේ. මෙවැනි කර්ම “ගරුක කර්ම” නම් වේ. මව හෝ පියා මැරීම, රහතන් වහන්සේ මැරීම, බුදුන්ගේ ලේ සෙලවීම, සංඝ භේදය යන පාප කර්ම කළ අය අනිවාර්යයෙන්ම මතු අපායෙහි උපදිති. මෙම අවස්ථාව ගරුක කර්මයක බලපෑමට සත්ත්වයා හසුවීම පිළිබඳ හොඳ නිදසුනකි.

2. ගරුක කර්මයක් නොමැති විට මතු උපත සඳහා බලපානුයේ මරණාසන්නව සිදුකළ යම් කර්මයකි. යමෙකු සිහි නුවණින් යුතුව මිය යාම භාග්‍ය සම්පන්න සිදුවීමක් බව කියනුයේ මේ හේතුව නිසාය. මරණාසන්නයේදී තමා කළ යම් කුශල කර්මයක් සිහිපත් කිරීම වුවද සෑහෙන බව කියනු ලැබේ.



Scanned with CamScanner

3. ගරුක කර්මයක් හෝ ආසන්න කර්මයක් නොමැති විට තමා පුරුදු පුහුණු කළ, බහුලව වැඩූ යම්කිසි කර්මයක් වේ නම් ඒ අනුව මතු උපත සිදුවේ. මෙම කරුණු සූත්‍ර පිටකයේ මහාකම්ම විභංග සූත්‍රයේ ගැඹුරින් විස්තර කර දී ඇත. බහුලව පින්කම් කිරීමෙන් මතු සුගතියෙහි උපදින බව හෝ බහුලව පව් කිරීමෙන් මතු දුගතියෙහි උපදින බවද දුර්මත දෙකක් බව එහි දැක්වේ. සමහරු බහුලව පින් කර දුගතියෙහි උපදිති. සමහරු බහුලව පින් කර සුගතියෙහි උපදිති. සමහරු බහුලව පව් කර දුගතියෙහි උපදිති. සමහරු පව් කර සුගතියේ උපදිති. එබැවින් පින්කම් බහුලව කළේය යන්න සුගතියේ ඉපදීමට බලගතු හේතුවක් නොවේ. මේ කරුණු ඉතා තදින් සිතෙහි ධාරණය කරගැනීම සුදුසුය. බහුලව සිදු කරන කර්මයන්ට වඩා මරණාසන්න කර්මය මතු උපතක් ගෙන දීමේ දී ප්‍රබලව නැගී සිටින බව සැලකිල්ලට ගත යුතුය.

4. පෙර කී තුන් ආකාරයේම කර්මයක් ප්‍රකටව නොමැති විට කවරාකාරයෙන් හෝ කර්මයක් ඉදිරිපත් වී මතු උපත සලසා දෙයි. මෙහි දී තමා එක වරක් සිදුකළ දෙයක් වුවද උපත ලබාදීම සඳහා නැගී සිටියි.

කෙසේ නමුත් අසම්පූර්ණ කර්මවලට මතු උපතක් ලබාදීමේ හැකියාව නැති බව කියනු ලැබේ. යමෙක් සතෙකු මැරීමට උපාය යොදයි. උපාය වැරදී ගොස් සත්ත්වයා ජීවිතය ගලවා ගනියි. මෙම කර්මය සම්පූර්ණ නොවූ බව පැහැදිලිය. නමුත් එකී උපාය සම්පූර්ණ වී සත්ත්වයා මිය ගියේ නම් කර්මය ද පරිපූර්ණ වී "කර්ම පථයක්" බවට පත්වේ. සත්ත්වයා මතු උපතක් සඳහා ඇද ඇමීම සිදු කරනුයේ මෙවැනි කර්ම පථයක් මගිනි.

සමහරු ඉතා පහසුවෙන් මෙලොව හැරදමා යති. සමහරුන්ගේ මරණය සිදු වන්නේ සෙමින්ය. ඔවුහු දින ගණන්, සති ගණන් මරණය සමග පොර බදති. මෙසේ වීමට හේතුව කුමක්ද? මීට හේතු කිහිපයක් මුල් විය හැකිය.

1. සත්ත්වයා මරණයට ඇදගෙන යාමට බලපාන රෝගී තත්ත්වයන් නිසා සමහර විට ක්‍රමක්‍රමයෙන් මරණයට පත්වීම සිදුවේ.



Scanned with CamScanner

2. පව්කම් කළ අය මරණයට ළං වෙත්ම ඔවුන්ට මතු උපත ලබන අපාය භූමි හෝ අපායේ ගිනිදැල් හෝ යමපල්ලන් පෙනෙන්නට පටන් ගනී. මෙවිට ඔවුහු මරණයට බිය වෙති. තව තවත් කල් ජීවත් වීමට ඔවුන් දරන උත්සාහය නිසා මරණය තවදුරටත් පමාවේ.

3. සමහරු ජීවිතයට ඇඩිසේ ඇලුම් කරති. තදබල ජීවිතාශාවක් ඇති අය මරණයට පත්වීමට දිගු වේලාවක් ගත වන බව පර්යේෂකයෝ කියති.

4. මරණින් මතු සියල්ල අවසන් වේය, යනුවෙන් සිතන අය මරණ මංචකයේ දී වෙසෙසින්ම බිය වෙති. මන්දයත් මෙලොව ජීවත්වීම ඔවුන්ගේ එකම බලාපොරොත්තුව වන බැවිනි.

5. ඉටු නොවූ අපේක්ෂා ඇති අයගේ මරණය ද වෙසෙසින්ම පමාවේ. තම ආදරණීය ඥාති මිත්‍රයන් දැක අවසන් හුස්ම හෙළීමට බලාපොරොත්තු වන මාරාන්තික රෝගීන් එකී ඥාති මිත්‍රාදීන් දැක ස්වල්ප මොහොතකින්ම මරණයට පත් වන බව අවස්ථා ගණනාවකදී නිරීක්ෂණය කරනු ලැබ ඇත.

යමෙකු මරණාසන්නව සිටින විට ඔහු සුදුසු උත්පත්ති ස්ථානයක් කරා යොමු කරවීමේ ක්‍රමවේදයක් බුදුන්වහන්සේ විසින් හෙළිදරව් කර ඇත. මරණාසන්නව සිටින තම ඥාති මිත්‍රයෙකු වේ නම් ඔහු වෙත එළඹ මෙහි පහත දැක්වෙන ආකාරයට ඔහුගේ සිත සකස් කළ යුතුය. ඔහුට මෙසේ උපදෙස් දිය යුතුය.

☆ ඔබගේ ජීවිතය ගැන ආශාවක් ඇත්නම් එය අත්හරින්න. (මන්දයත් ඔබ තව ස්වල්ප මොහොතකින් මරණයට පත්වන බැවිනි.)

☆ ඔබගේ වස්තුව ගැන ඇල්මක් ඇත්නම් එය ද අත්හරින්න. (ඔබ තව ස්වල්ප මොහොතකින් එය හැර යන බැවිනි.)

☆ ඔබගේ ප්‍රිය බිරිඳ, ස්වාමියා හෝ දරුවන් හෝ වෙන යම් කෙනෙකු ගැන ඇල්මක් ඇත්නම් එය ද අත්හරින්න. (ඔබ තව ස්වල්ප මොහොතකින් ඔවුන් අත්හැර යන බැවිනි.)



Scanned with CamScanner

☆ මෙලොව ඇති යම් කිසි දෙයක් ගැන ඇල්මක් වේ නම් එය ද අත්හරින්න.

☆ මිනිස් ලොවට වඩා චාතුර්මහාරාජික දෙව්ලොව සැප බහුලය. එහි වැස්සෝ දීර්ඝායුෂ විඳිති. එහි ඉපදීමට කැමැත්ත ඇති කරගන්න.

මේ ආකාරයට අනුපිළිවෙළින් ඉහළට ඇති දිව්‍ය ලෝකවලට ද බ්‍රහ්ම ලෝකවලට ද මිය යමින් සිටින පුද්ගලයාගේ හිත යොමු කළ හැකිය. මෙලෙස මෙලොවට ඇති ආශාව අත්හැර දමා කිසියම් වෙනත් ලොවක් කරා සිත යොමු කිරීමෙන් මරණින් මතු ඒ ලොවෙහි උපත ලබන බව බුදුන්වහන්සේ පෙන්වා දෙති. කැමති නම් මේ අවස්ථාවේ දී සත්ත්වයා නිවනට වුවද යොමු කළ හැකිය. පෙර කී උපක්‍රමය භාවිත කර කිසිදු පිංකමක් නොකළ අයෙක් සුගතියේ උපතක් කරා යොමු කරවීමට ශාරිපුත්‍ර හිමියෝ සමත් වූහ.

බෞද්ධයන්ගේ මරණය පිළිබඳ විද්‍යාවෙහි මීටත් වඩා පුදුම දේ ඇත. කෙනෙකුට අවශ්‍ය නම් මරණින් මතු තමා උපදින ලෝකය කල්තබා තීරණය කළ හැකිය. ඒ සඳහා ක්‍රියා මාර්ගය මෙසේය. මරණින් මතු තමා කැමති දෙව්ලොවක උත්පත්තිය ලැබීමට කැමති පුද්ගලයා පළමුව මාර්ග ඵලයක් ලබාගත යුතුය. මාර්ග ඵලයක් ලබා ගැනීම අපහසු දෙයක් නොවේ. සෝවාන් ඵලයෙහි අංග වන ත්‍රිවිධරත්නය කෙරෙහි අචල ශ්‍රද්ධාව සහ පංචශීලය රැකීම යන කරුණු තමා තුළ ඇති කර ගැනීම ඊට ප්‍රමාණවත්ය. අනතුරුව තමා මතු ඉපදීමට කැමති දෙව්ලොව කුමක්දැයි සිතාගත යුතුය.

☆ ස්වාභාවික පරිසරයට ඇලුම් කරන අය තව්තිසා දෙව්ලොවත්

☆ ධාර්මික පරිසරයට කැමති අය තුසිත දෙව්ලොවත්

☆ අසීමිත සැප ප්‍රිය කරන අය නිර්මාණරති දෙව්ලොවත්

☆ වැඩිම කලක් දිව්‍ය සැප විඳීමට කැමති අය පරනිර්මිත වසවර්ති දෙව්ලොවත් තෝරා ගැනීම සුදුසුය.

දැන් ඉන් අනතුරුව දිනපතාම මෙලෙස සිතිය යුතුය.



Scanned with CamScanner

"අසවල් දිව්‍ය ලෝකයේ උපන් අය එහි උපත ලබා ඇත්තේ ධාර්මිකව ජීවත් වී පින්කම් කිරීම නිසාය. එම දෙවියන් තුළ පවතින ගුණාංග මවෙත ඇත. එබැවින් මම ද ඔවුන් අතර ඉපදීමට සුදුස්සෙකු වෙමි. මම මරණින් මතු එහි ඉපදීමට කැමැත්තෙමි."

මේ ආකාරයට නිතර සිහිපත් කරන අය මරණින් මතු තමා කැමති දිව්‍ය ලෝකවල උත්පත්තිය ලබන බව ධර්මයෙහි සඳහන්ය. මෙම අභ්‍යාස විධිය දේවතානුස්සති භාවනාව නම් වේ.



Scanned with CamScanner

# 3. මරණය කෙබඳු අත්දැකීමක්ද?

තිබ්බත බුදු දහමෙහි තරම් මරණය පිළිබඳ විස්තරාත්මක සටහන් තබා ඇති තැනක් තව ඇත්ද යන්න සැක සහිතය. තිබ්බත බුදු දහම තුළ ඉගැන්වෙන කරුණුවලින් අති විශාල ප්‍රමාණයක් මරණය සම්බන්ධව විස්තර කිරීමට වෙන් කර ඇත.

තිබ්බතයේ පිළිගත් ආගමික මතය අනුව පුද්ගලයා මරණයට පත්වීමේ දී අවස්ථා 4ක් පසු කරමින් මළවුන් වෙත එක්වෙයි. එම අවස්ථා 4 මෙලෙස විස්තර කළ හැකිය.

1. මරණයට ළං වූ තැනැත්තාගේ ශරීරය පළමුව ඉහිල් වෙයි. එහි ශක්තිමත් ස්වභාවය නැති වෙයි. ශරීරයට ස්පර්ශය දැනීම අඩු වෙයි.

2. ඉන් අනතුරුව තෙත් ගතියක් ද සිහිල් ගතියක් ද ශරීරයට දැනෙයි.

3. ඉන් අනතුරුව උණ ගැනුණාක් මෙන් තද උෂ්ණයක් තමාට දැනෙයි.

4. අවසානයේ තමාගේ මුළු ශරීරයම විසිරී යන්නාක් මෙන් දැනේ.

තවද, පහත සඳහන් රෝග ලක්ෂණවලින් පෙන්නුම් කරනුයේ තමා මරණයට පත්වන බවයි.

✧ මුහුණේ මාංස පේශීන් පාලනය කරගත නොහැකි වීම.

✧ කියාගන්නට උත්සාහ කරන දේ කියාගන්නට නොහැකි වීම.

✧ කන් ඇසීම නැතිව යාම

✧ ඇස් නොපෙනී යාම

✧ ඉතා බරට අමාරුවෙන් හුස්ම වැටීම

මෙකී ලක්ෂණ 5 ඇති වූ සැණින් තමා නොබෝ වේලාවකින් මරණයට පත්වන බව අවබෝධ කර ගත යුතුය.



Scanned with CamScanner

පුද්ගලයෙකු මරණයට පත් වීමට ආසන්න වෙත්ම ඔහුගේ අතපය අවලංගු වීම, සංවේදන ඉන්ද්‍රියයන් මොට වී යාම සිදුවෙයි. මේ අවස්ථාවේ දී ක්‍රමක්‍රමයෙන් තීව්‍ර වන වේදනාවක් ඇතේ. එනමුත් පුදුමයකට මෙන් වේදනාව ශීඝ්‍රයෙන් අඩු වී යයි. එවිටම පුද්ගලයා කය හැර දමා යන මොහොත එළඹෙයි. මේ අවස්ථාවේ දී සමහරු සිහි විසඥ වෙති. සමහරුන්ට තද ආලෝකයක් පෙනී ඒ දෙසට ඇදී යනු පෙනේ. යෝග භාවනා ප්‍රගුණ කළ අය මේ අවස්ථාවේ දී හොඳ සිහියෙන් යුතුව කය හැර දමා පිටතට පැමිණෙති. මරණය නම් වූ සිද්ධිය මෙම ක්‍රියාවත් සමග සම්පූර්ණ වේ.



Scanned with CamScanner

# 4. මරණය අබියස ඔබ කුමක් කළ යුතුද?

තමා තව නොබෝ වේලාවකින් මරණයට පත්වන බව දැනගත් තැනැත්තෙකු විසින් කුමක් කළ යුතුද? තමා මරණයට පත් වෙමින් සිටින බව දැනගත් පුද්ගලයා විසින් කළ යුත්තේ තමාගේ ඊළඟ ආත්මය වෙත තමාව මෙහෙය වීමයි. මෙම කාර්යය සිදු කරන ආකාරය දැනට වසර 1000 කට පමණ පෙර ඉන්දියාවේ විසූ මහා යෝගී නාරොපා විසින් සවිස්තරව දක්වා ඇත.

ඔබ මරණයට කල් තබාම සූදානම්ව සිටිය යුතුය. නොඑසේ නම් සිදු වන්නේ මරණයට පත්වන විට ඇති වන අධික වේදනාව සහ භය නිසා සිහි මුළා වී ගොස් කර්මානුරූපව වෙනත් උපතක් ලැබීමයි. කර්මානුරූපව උපතක් ලැබීමට සිදුවීම බලගතු අන්තරායකි. මන්දයත් කර්මානුරූපව උපතක් කරා යොමු වන සත්ත්වයන් බොහෝ විට තමාට නොරිසි තැන්වල උපදින බැවිනි. එබැවින් ඔබ මරණයට කල් තබා සූදානම් විය යුතුය. සිහි නුමුළාව මිය යාමට කල් තබා සූදානම් වීමක් අවශ්‍යමය. ඒ නිසා ඔබ විසින් කළ යුත්තේ සිත එක්තැන් කිරීමට හෙවත් භාවනා කිරීමට හුරුවීමයි. එය මරණයට පත්වීමේ අවස්ථාවට සැහෙන කලක් පෙර සිට හුරු කළ යුතු දෙයකි.

තමා මරණයට පත්වීමේ සලකුණු එක දෙක පහළ වන විට පහත සඳහන් පරිදි කටයුතු කිරීම මැනවි.

✧ තමා හුරු කරගත් භාවනා ක්‍රමයට සිත යොදවන්න.

✧ හැකිතාක් තදින් සිත සමාධි ගත කළ යුතුය. හැකිතාක් ගැඹුරට චිත්ත සමාධිය උපයා ගත යුතුය.

✧ මෙලොව සියලු දේට ඇති ආශාව අත්හළ යුතුය.

✧ මෙලොව ඇති සියලු දෙය ද ණයකාරයන් ද සතුරන් ද මිතුරන් ද අමතක කළ යුතුය.

✧ දැන් ඔබ කළ යුත්තේ හැකිතාක් උත්සාහ දරා හිස් මුදුනින් පිටව යාමට උත්සාහ කිරීමයි. හොඳින් භාවනා කරන කෙනෙකුට තමා මිය යන මොහොතේ සුළු උත්සාහයකින් පසු කය හැර දමා



Scanned with CamScanner

යා හැකිය. හැම විටකම හිස් මුදුනින් පිටවීමට උත්සාහ කළ යුත්තේ දෙකන්වලින් හෝ නාසයෙන් ප්‍රාණ වායුව පිටවුවහොත් මනුෂ්‍ය උපතක් ලැබිය හැකි නිසාත් ඊට පහළින් ප්‍රාණ වායුව පිටවුවහොත් සතර අපායෙහි උත්පත්තිය ලැබීමට ඉඩ ඇති නිසාත්ය.

✧ මෙම මොහොතේ ඔබේ සිතට අවස්ථා දෙකකදී ආලෝකයන් දර්ශනය විය හැකිය. සිරුරෙන් පිටවීමට ආසන්න අවස්ථාව සහ සිරුරෙන් පිටවූ අවස්ථාව එම අවස්ථා දෙකයි. මේ කිසිදු ආලෝකයක් කෙරේ සිත නොඇලවිය යුතුය. ඔබ විසින් කළ යුත්තේ මේ ආලෝකය ධර්මාවබෝධයට සම කර දැකීමයි. එසේ නැතහොත් සියලු බුදුවරුන්ගේ ඥානාලෝකයට එය සම කිරීමයි. එම කාර්යය සඵල වුවහොත් ඔබ තවත් උපතකට යායුතු නොවේ. එයින්ම ඔබ ධර්මාවබෝධයේ පිහිටනු ඇත.

✧ ඔබ කයින් පිටතට ඒමට උත්සාහ කරන විට ද කයෙන් පිටතට පැමිණි විට ද දෙවතාවක දී ආලෝකය දැකගත හැකි වූයේ නම් ඒ ආලෝක ප්‍රභව දෙකම මිශ්‍ර වන බව සිතා ඒ සියලු දෙය ශූන්‍යයට සම වන බව සිතිය යුතුය. එම ප්‍රයත්නය සාර්ථක වුවහොත් එයින්ම සත්‍යාවබෝධය සම්පූර්ණ වේ.

✧ ඔබ සිහි නුමුළාව කයින් පිටතට පැමිණියේ නම් හා පෙරකී සත්‍යාවබෝධයට ද පත් නොවූයේ නම් ලොව කලාතුරකින් කෙනෙකුට ලැබෙන වරමක් ඔබට ලැබෙනු ඇත. ඒ ඔබට කැමති ලෙස සිත මෙහෙයවා කැමති තැනකට ගොස් මතු ඉපදීමේ දුර්ලභ වරමයි.

*සටහන -*

නාරොපා යනු දැනට අවුරුදු දහසකට පමණ පෙර ඉන්දියාවේ නාලන්දා විශ්වවිද්‍යාලයේ සිටි පීඨාධිපතිවරයෙකි. හේ පීඨාධිපති පදවිය හැර දමා තිලොපා නම් බෞද්ධ යෝගියා හමුවී ඔහුගෙන් ගුරු උපදෙස් ලැබ සත්‍යාවබෝධයට පැමිණියේය.



Scanned with CamScanner

# 5. මරණයට බිය වන දෙවිවරු

මරණය සෑම සත්ත්වයෙකුටම පොදු ධර්මතාවකි. මනුෂ්‍යයෝ මෙන්ම දෙවියෝ ද යක්ෂයෝ ද බ්‍රහ්මයෝ ද මරණයට පත්වෙති. එනමුත්, මේ එක් එක් සත්ත්ව කොට්ඨාස මරණයට මුහුණ පාන ආකාරවල සියුම් වෙනස්කම් ඇත.

දෙවියන් මරණයට පත්වීමට ආසන්න වන විට දී "පූර්ව නිමිත්ත" හෙවත් පෙර නිමිති පහළ වේ. ඔවුන්ගේ ශරීරවලින් නික්මෙන දිව්‍යමය ආලෝකය අතුරුදන් වේ. ශරීර වර්ණය අවපැහැගැන් වේ. දිව්‍යමය මල් මාලා මැලවී යයි. ශරීරයෙන් දහදිය දමයි, දිව්‍යමය ආසනය මත හිඳීමේ අපහසුතාවක් ඇති වේ. මෙවැනි පෙර නිමිති දුටු කල දෙවියෝ මහත් සේ කලබල වෙති. එවිට කරුණු දත් අනෙක් දෙවියෝ එතැනට පැමිණ මරණාසන්න දෙවියා අස්වැසීමට උත්සාහ ගනිති.

"සබඳ ඔබ මරණයේ දොරටුව අබියසට පැමිණ සිටියි. තව නොබෝ වේලාවකින් ඔබ මෙලොව අතහැර යනු ඇත. ඔබට නැවත අප වෙත පැමිණීමට ක්‍රමයක් ඇත. පුණ්‍ය ක්ෂේත්‍රයක් බඳු වූ මිනිස් ලොව ඉපිද බුදු බණ අසා දන් පින්හි යෙදෙන්න. එය අප වෙත නැවත පැමිණීමට ඒකායන මාර්ගයයි"

මෙලෙස උපදෙස් ලද දෙවියා නොබෝ වේලාවකින් දෙව් ලොවෙන් චුත වෙයි.

මියගිය දෙවියාගේ සූක්ෂම කය එසැණින්ම අතුරුදන් වේ. එනමුත් සමහර දෙවියන් සහ යක්ෂයන් මියගොස් සෑහෙන වේලාවක් යන තුරු ඔවුන්ගේ මෘත දේහය ඉතිරි වී පවතින බව මිලින්ද ප්‍රශ්නය නම් ඉපැරණි ග්‍රන්ථයේ සඳහන්ය. මිලින්ද ප්‍රශ්නයේ කියන පරිදි යක්ෂයන්ගේ මෘත දේහ විවිධ වර්ණ ගනියි. සමහර විට ඒවායේ වර්ණය කටුස්සන්ගේ පැහැයට සමානයි.

දෙවියන්ගේ මරණය පිළිබඳ අපූරු කතා ප්‍රවෘත්තියක් ඉපැරණි බෞද්ධ සාහිත්‍යයේ අපට හමුවේ. එක්තරා දිව්‍ය විමානයක සිටින දෙවියෝ ක්‍රීඩාවක යෙදෙමින් සිටියහ. ඔවුන් අතරින් එක් අයෙක් ආගිය අතක් සොයාගත නොහැකි විය. බොහෝ වේලාවක්



Scanned with CamScanner

මහන්සි වී සොයා බැලූ කල නැති වූ දෙවඟන ඔවුන්ට මුණගැසුණි.

"මාගේ ආයුෂය නිමවී මම හදිසියේම මරණයට පත්වීමි. අනතුරුව මිනිස් ලොව ඉපිද බුදු දහම වැලඳගෙන දන් පින් කර මහලුව මිය ගොස් (පෙර පුරුද්දට මෙන්) නැවත ඔබ අතර ඉපදුණෙමි"

මෙතෙක් අතුරුදන්ව සිටි දෙවඟන කී කතාව ඇසූ බොහෝ දෙවියෝ පුදුමයට පත්වූහ. මිනිස් ලොව පරමායුෂ ගෙවී යනතුරුම දෙවියන් ක්‍රීඩා කරමින් සිටියේ ඔවුන්ගේ කාලය අපේ කාලයට වඩා වෙනස් බැවිනි. දිව්‍ය ලෝක පිළිබඳව අති විශාල දැනුම් සම්භාරයක් මහායෝගී මිලාරෙපා සතුව තිබුණි. මිලාරෙපා පුදුමාකාර හාස්කම් කළ යෝගියෙකි. දැනට වසර 900කට පමණ පෙර තිබ්බතයේ විසූ මේ යෝගියාට තමා කැමති ඕනෑම තැනකට අහසින් යාමේ හැකියාවක් තිබිණි. ඔහුගේ ශිෂ්‍යයන් විස්තර කර ඇති පරිදි මිලාරෙපා නිතරම වැටුණේ අහසෙහි පා වෙමිනි. යෝග භාවනා ක්‍රමවලින් සිරුර සැහැල්ලු කරගත් මිලාරෙපා දිව්‍ය ලෝක රාශියකට ගොස් ඒවායේ තොරතුරු එක්රැස් කළේය. දෙවියන් යනු කාලය කා දමන පිරිසකි. ඔවුහු විවිධාකාර ක්‍රීඩාවන්හි යෙදී නිසරු ලෙස ජීවිතය ගත කරති. දිව්‍ය ලෝකයේ කාලය ගලා යනුයේ අධික වේගයකිනි. දෙව් ලොව අසුරු සැණක් ගසන මොහොතක දී මිහිපිට පැය ගණනක් කාලය ගෙවී යයි. දෙවියන් වැඩි කලක් ජීවත් වේ යැයි අපට දැනුණ ද දෙවියන්ට දැනෙන්නේ එය කෙටි කාලයක් ලෙසය. එබැවින් දෙවියෝ තමන්ට නොදැනීම මරණයට ළං වෙති. මරණය ළං වූ කල දෙවියෝ බියෙන් ඇළලී යති. මරණයට ළං වූ දෙවියන්ගේ සංතාපය මිනිසුන් එවැනි අවස්ථාවක විඳින දුක හා සංතාපයට වඩා කිහිප ගුණයකින් වැඩිය.

දෙවියන්ගේ මරණයට විවිධාකාර හේතු මුල්වේ.

- ආයුෂය ගෙවීයාම
- කර්මය ගෙවීයාම
- ආහාර වේලක් මගහැරීම
- කල්ප විනාශය
- ක්ෂණික කෝපය



Scanned with CamScanner

යන කරුණු නිසා දෙවියෝ මරණයට පත්වෙති. මිනිසුන් අතර මෙන්ම දෙවියන් අතර ද යුද්ධ සහ කලකෝලාහල නිතර ඇතිවේ. එකල්හි දෙවියෝ දේව ආයුධවලින් එකිනෙකාට දමා ගසති. සටනේ දී පැරදුණු සතුරු පාක්ෂික දෙවියන් ජීවග්‍රහයෙන් අල්ලා ප්‍රාණ ඇපකරුවන් ලෙස රඳවා තබා ගැනීම ද දෙවියන්ගේ සිරිතකි.

තව්තිසා දෙව් ලොව දෙවියන් අතර නිතර වර්ගවාදී කෝලාහල ඇති වේ. දේව නිකායේ අධිපති ශක්‍රයා ද අසුර නිකායේ අධිපති වේපචිත්ති නම් අසුරයා ද තම බළ සේනා කැටුව යුද බිමට පැමිණ මුහුණට මුහුණලා සටන් කරති.

දෙවියන් අතර සටන්වල දී ඔවුන්ගේ අත්පා කැපී වෙන් වුවද මඳ කලකින් දෙවියන්ගේ අත්පා ලියලා වැඩේ. එහෙත් හිස කැපී වෙන් වුවහොත් දෙවියන්ගේ මරණය සිදුවන බව අටුවාචාර්යවරු කියති. පෙර කල ලංකාවේ ජීවත් වූ මිනිසෙක් ගසක් කපා බිම හෙළීය. ගස කැපීමට ගසන ලද පොරෝ පහරකින් දේව දරුවෙකුගේ අත කැපී වෙන් විය.

දෙව්වරුන්ට ද යක්ෂයන්ට ද ප්‍රේතයන්ට ද මරණයට ළං වූ විට මතු උපදින තැන දකින නුවණක් පහළ වේ. එක්තරා කාන්තාවක් මරණින් මතු ප්‍රේතියකව ඉපිද අනුන් දුන් පින් අනුමෝදන්ව දෙවියන් හා සමාන සැප ලැබුවාය. එහෙත් ඇයගේ මරණය ළංවත්ම අපායේ ගිනිදලු පෙනෙන්නට විය. ඊට හේතුව ඇය පෙර මිනිසත් බව ලැබී තිබිය දී පින් නොකළ නිසා ඇය අපායට නියම වූ බැවිනි. (ප්‍රේත වස්තු පාලියේ එන කතා පුවතකි.)



Scanned with CamScanner

# 6. භවය සහ අන්තරාභවය

මෙලොවින් චුත වී කය හැරදා යන සත්ත්වයා වහාම වෙනත් උපතකට යයිද? නැති නම් ඒ සඳහා තව කල් බලා හිඳීමට ඔහුට සිදුවේද? මේ සම්බන්ධව උණුසුම් විවාදයක් මෙකල හටගෙන ඇත.

යමෙකු මියගිය වහාම ඊළඟ උපත ලබන බව ථෙරවාදී ගුරුකුලයට අයත් බහුතර පිරිස සිතති. මරණයත්, මතු උපතත් අතර තාවකාලික පැවැත්මක් ගැන මූලික ථෙරවාදී ගුරුකුලයෙන් බැහැර බෞද්ධ ආචාර්යවරු විශ්වාස තබති.

අන්තරාභවය යන්නෙහි තේරුම කුමක්ද? එය මරණයත් මතු උපතත් අතර පවතින සංක්‍රමණික අවස්ථාවක් ලෙස විස්තර කර දිය හැකිය. එකී අන්තරාභවයේ ලක්ෂණ මෙබඳු වේයැයි බෞද්ධ ආචාර්යවරු කියති.

1. අන්තරාභවය තුළ හිරු හෝ සඳු නොමැත.

2. අන්තරාභවිකයාගේ ලෝකය තුළ අඳුර පැතිර ඇත. එනමුත් අරුණාලෝකය වැනි මන්දාලෝකයකින් අන්තරාභවිකයාට අහස පෙනෙයි.

3. මරණාසන්න අවස්ථාවේ දී දැනුණු දරුණු සියලු කායික පීඩාවලින් අන්තරාභවිකයා නිදහස් වෙයි.

4. අන්තරාභවිකයාගේ ශරීරය සැහැල්ලුය. ඔහුට දෙවියන්ට මෙන් ඍද්ධි බලය නැතත් ශරීරය අතිශයින් සැහැල්ලු බැවින් අන්තරාභවිකයාට තමා සිතන තැනට පාවී යා හැකිය.

5. අන්තරාභවිකයා අන්තරාභවය තුළ තනි නොවේ. තමා වැනි වූ අන්තරාභවිකයන් ද දෙවියන් ද යක්ෂයන් ද ප්‍රේතයන් ද ඔහුට දැකගත හැකිය.

6. අන්තරාභවිකයා ගන්ධය හෙවත් ගඳ හෝ සුවඳ ආහාර කොට ජීවත් වෙයි. එබැවින් "ගන්ධබ්බ" නම් වෙයි.

7. අන්තරාභවිකයාට අනුන් දෙන පින් අනුමෝදන් විය



Scanned with CamScanner

හැකිය. එනමුත් අන්තරාභවිකයා ප්‍රේත අපායෙහි උපන් සත්ත්වයෙකු නොවේ. මක්නිසාද යත් ඔහු ප්‍රේතයන් මෙන් පව් පලදී එහි නූපන් බැවිනි. එමෙන්ම අන්තරාභවිකයා ප්‍රේත අපායෙහි උපන් සත්ත්වයන් මෙන් දුකට පාත්‍ර නොවේ.

8. අන්තරාභවය තුළ සිටින අවසාන කාලයේ දී අන්තරාභවිකයාට දෙයාකාරයක හැකියා පහළ වෙයි. තමා මතු උපදින තැන දකින දිවැසකුත් එතැනට යන ඍද්ධි බලයකුත් පහළ වේ.

මෙහි ඉහත දක්වන ලද්දේ දැනට දෙදහස් වසරකට පමණ පෙර ඉන්දියාවෙහි විසූ බෞද්ධ භික්ෂූන් පිළිගත් අන්තරාභව විස්තරයයි.

මිය යන හැම කෙනෙක්ම අන්තරාභවයට යයිද? නැතහොත් මිය යන සත්ත්වයන්ගෙන් කොටසකට පමණක් අන්තරාභවයට යාමට සිදුවේද? තිබ්බතයේ කග්යු (Kagyu) සාම්ප්‍රදායට අයත් යෝගීන් විශ්වාස කරනුයේ මිය යන පෘථග්ජන පුද්ගලයන් සියලු දෙනාම අන්තරාභවයට යන බවයි. සත්‍යාවබෝධය ලද අය මිය ගොස් අන්තරාභවයට එක් නොවී පරම සැපත වූ නිවන් සුවය ලබති. කෙසේ නමුත් සමහර ඉන්දියානු බෞද්ධ උගතුන් කියා ඇත්තේ මරණින් මතු සීමිත පිරිසක් පමණක් අන්තරාභවයට එක් වන බවයි.

1. සිහිසුන්ව මිය ගිය අය,
2. හදිසි අනතුරුවලින් මිය ගිය අය,
3. බලගතු පිනක් හෝ පවක් නොකළ අය,
4. ජනක කර්මය ගෙවී යාමට පෙර මිය ගිය අය,

මිය ගොස් අන්තරාභවිකයන් බවට පත්වෙති.

ලක්දිව මහාවිහාරය ආශ්‍රිතව ගොඩනැගුණු ථෙරවාදී ගුරුකුලය තුළ අන්තරාභව සංකල්පයට කිසිදු ඉඩක් නොලැබුණි. ඊට මූලික හේතුව වූයේ මහාවිහාරිකයන් සමග තරගකාරීව නැගී සිටි අභයගිරිවාසී භික්ෂූන් අන්තරාභවය පිළිගැනීමයි. ථෙරවාදීහු



Scanned with CamScanner

චිත්තක්ෂණවාදය ගරු කරති. ඒ අනුව සත්ත්වයාගේ චුති චිත්තයට අනතුරුව ප්‍රතිසන්ධි චිත්තය හටගනියි. වෙනත් අයුරකින් දක්වතොත්, සත්ත්වයා මිය ගිය වහාම නැවත උපදියි.

මිය යන සත්ත්වයා අතරක් නොමැතිව උපතක් ලබන බවට සූත්‍ර පිටකයෙන් යම් ඉඟියක් ලබාගත හැකිය. චුතූපපාත ඥානය හෙවත් "මතු උපත් දැන ගැනීම" යන හැකියාව ලබන යෝගීන් මෙලොවින් චුත වන සත්ත්වයන් වහාම මතු උපතක් ලබන ආකාරය මැනවින් නිරීක්ෂණය කරන බව දීඝ නිකායෙහි දැක්වේ. එනමුත් සමහර අවස්ථාවල දී මතු උපතක් ලැබීම ප්‍රමාද වීම සිදුවන බව සංයුක්ත නිකායේ වච්ඡගොත්ත සංයුක්තයට අයත් කුතුහලසාලා සූත්‍රය අනුව පැහැදිලිය.

"යම් කලෙක සත්ත්වයා මේ කය අතහැර යයි. ඔහුට වෙනත් කයකට යාමට ද අවස්ථාවක් නොලැබේ. එවිට කුමක් ආධාර කරගෙන සත්ත්වයා ජීවිතය පවත්වා ගන්නේද?" යන්න වච්ඡගොත්ත බුදුන්ගෙන් විමසීය.

"වච්ඡය, යම් කලෙක සත්ත්වයා මේ කය අත්හරීද, ඔහුට සුදුසු වෙනත් කයක් නොලැබුණද, එකල්හි ඔහු තෘෂ්ණාව ආධාර කරගෙන වාසය කරයි." යන පිළිතුර බුදුහු මෙම අවස්ථාවේ ලබාදුන්හ. සත්ත්වයා කය අත්හැර වෙනත් කයක් නොලබන අවස්ථා නොතිබුණි නම් බුදුන් වහන්සේ විසින් ඒ බව නොවළහා ප්‍රකාශ කරනු ඇත. එබැවින්,

✧ සමහර සත්ත්වයෝ මිය ගිය සැණින් මතු උපතක් ලබති.

✧ අනෙක් සත්ත්වයෝ මරණින් මතු අන්තරාභවයට එක්වී සුදුසු කලෙක මතු උපතට යොමු වෙති.

යන නිගමනය වෙත එළඹීමට අපට සිදුවේ. එම නිගමනය සනාථ කරන තැනක් මහා නිදාන සූත්‍රයෙහි ඇත. යමෙකු මව් කුසක පිළිසිඳ ගැනීම සඳහා කරුණු 3ක් සම්පූර්ණ විය යුතුය.

✧ මව ඍතුවත් වීම.

✧ මව හා පියා කායිකව එක්වීම.



Scanned with CamScanner

✧ ගන්ධබ්බයා එළඹ සිටීම.

ඒ අවස්ථා තුනයි. මෙහි ගන්ධබ්බයා යනු පිළිසිඳ ගැනීමක් බලාපොරොත්තුවෙන් සිටින අන්තරාභවිකයෙක්ය යන්න ඉතාම පැහැදිලිය. මව්කුසට පැමිණි ගන්ධබ්බයා යම්කිසි හේතුවක් නිසා මව්කුස හැර ගියහොත් කළලය නොමෝරයි.

මේ අවස්ථාව සම්බන්ධ වැදගත් කරුණක් මහායානිකයන්ගේ ඉගැන්වීම් අතර හමුවේ. ගන්ධබ්බයෙක් මව්කුසට එළඹි පසුව ද ඔහු විටින් විට මව්කුසින් එළියට ගොස් නැවත එය තුළට ඇතුළු වේ. මව්කුස තුළ සිටීම කරදරකාරී බව පෙනෙන විට සත්ත්වයා මව්කුසින් තරමක් ඈත්ව මව අසල නොපෙනෙන සේ රැඳී සිටියි. අනතුරුව ඔහු නැවතත් මව්කුස තුළට ඇතුළු වෙයි. විටින් විට තම කළල රූපයෙන් ඉවත්වීමේ හැකියාව දරුවා වැඩී බිහි වූ පසුවද එක්වරම අහෝසි නොවේ. මව්කුසින් උපන් ළදරුවෙකුට දින දෙකක් ගතවන තුරු තම කය හැරදා ගොස් නැවත පැමිණීමේ හැකියාව පවතී. මෙහි දී වඩාත් විස්මයජනක සිද්ධිය වන්නේ එලෙස අත්හරින ලද ළදරුවෙකුට හෝ කළලයකට වෙනත් අන්තරාභවිකයෙකු ඇතුළු වීමයි. සමහර අන්තරාභවිකයෝ සුදුසු මව්කුසක් සොයා ගනු නොහැකි විට වෙන අයෙක් අත්හැර දැමූ කළලයක් වෙතට ඇතුළු වෙති. මෙලෙස ඇතුළු විය හැකි කාලය කලින් සිටි ජීවියා මව්කුස හැරදමා දින 2ක් ගත වන තුරු පමණක් වේ. ගන්ධබ්බයා මව්කුස හැරදමා දින 2ක් ගත වන තුරු කළලය කුණු නොවී පවතී.

මහායානිකයන් විසින් ඉදිරිපත් කරන ලද මේ තොරතුරු පුනරුත්පත්ති පර්යේෂකයන්ගේ වාර්තා සමග හරියටම ගැළපේ. තම පියා මවට පහරදුන් අවස්ථාවල දී මව්කුසෙන් ඉවත්ව සිටි බව එක් පුද්ගලයෙකු මෝහන නිද්‍රාව තුළින් “අතීතයට ගමන් කර” පවසා ඇත.

දීඝ නිකායට අයත් මහාපදාන සූත්‍රය ත්‍රිපිටක සාහිත්‍යයේ එන දීර්ඝතම සූත්‍රයයි. බෝසතාණන් වහන්සේ තුසිත දෙව්ලොව සිට සිහි නුවණින් චුතව ගොස් සිහි නුවණින් යුතුව මහාමායා දේවියගේ කුසට ඇතුළු වූ බව මහාපදාන සූත්‍රයේ දැක්වේ. මෙම සිද්ධිය “චිත්තක්ෂණයක් තුළ” සිදුවුණා නම් සිහි නුවණින් යුතුව

පැමිණීමක් ගැන සඳහන් නොකළ යුතුව තිබුණි. එබැවින් බෝසතුන් තුසිත දෙව්ලොවින් චුතවීමත් මව්කුස පිළිසිඳ ගැනීමත් යන සිද්ධි දෙක අතර සාධාරණ කාල පරතරයක් තිබූ බව පැහැදිලිය.

තවද මව්කුස අතහැර ඇමීමත්, නැවත මව්කුසට පිවිසීමත් සිහි නුවණින් කරන අයද සිහි නුවණ නොමැතිව කරන අයද සිටින බව සූත්‍ර පිටකයේ තවත් තැනක දැක්වේ. එම ඉගැන්වීම නාරොපා මුනිවරයා විසින් තවදුරටත් විස්තරාත්මකව දක්වනුයේ මෙසේය.

✧ සිත දියුණු නොකළ සාමාන්‍ය පුද්ගලයෝ මරණාසන්න මොහොතේ සිහි විසඥ වෙති. ඔවුහු අවසිහියෙන් යුතුව සිරුර හැර යති.

✧ මනාව සිත වැඩූ පුද්ගලයා (භාවනා කළ පුද්ගලයා) මිය යන අවස්ථාව දක්වාම සිහි නුවණ පවත්වා ගැනීමට සමත් වෙයි. ඔහු මරණයට පත්වූ පසුව ද ඔහුගේ සිහි නුවණ අඛණ්ඩව පවතී.

✧ ඔබ මෙලොව උගත් දේ ද ඔබේ මතකය ද ඔබ සිහි නුවණින් යුතුව මරණයට පත් වී නම් ඔබත් සමගම ඉතිරි වේ. සිහි විසඥව මිය යන පුද්ගලයාට තම මතකය අහිමි වේ. තමා උගත් දේ ද ඔහුට අමතක වේ.

✧ එබැවින් සිහි නුවණින් යුතුව මිය යාමට ඉටා ගත යුතුය. ඊට ඇති එකම ප්‍රතිපදාව නිරතුරුව භාවනා ප්‍රගුණ කිරීමයි.

20 වන සියවස මැදභාගය වන තෙක්ම යුරෝපා රටවල වැසියන් අතර අන්තරාභවය පිළිබඳ කිසිදු උනන්දුවක් නොතිබුණි. 20 වන සියවසේ ප්‍රසිද්ධියට පත්වූ බ්‍රයිඩේ මර්ෆි නම් කාන්තාවගේ පුනරුත්පත්ති කතාවත් සමග බොහෝ දෙනෙක් "අන්තරාභවයක් ඇත" යන්න ගැන තම සිත මෙහෙයවන්නට පටන් ගත්හ.

බෙන්ස්ටයින් යනු වෘත්තියෙන් මෝහන චිකිත්සකයෙකි. හේ එක්තරා කාන්තාවක් මෝහන නිද්‍රාවට පත්කර ඇගෙන් අතීතය විමසුවේය. තමා බ්‍රයිඩේ මර්ෆි නමින් 19 වන සියවසේ අයර්ලන්තයේ ජීවත් වූ බවත්, තමා මියගොස් පරිවර්තනීය යුගයක් පසුකර මේ උපත ලද බවත් ඇය පැවසුවාය. ඒ පරිවර්තන යුගය තුළ,

1. ඇය නිදා නොගත් බවත්,

2. ආහාර නොගත් බවත්,

3. දුක් පීඩා නොදැනුණු බවත්,

හෙළි කර ඇත. පුදුමයකට මෙන් සත්‍ය බ්‍රයිඩේ මර්පිගේ සොහොනද, ඇයගේ නිවසද, යකඩ ඇඳද සොයා ගැනීමට බෙන්ස්ටයින් සමත් වූයේය. ඒ අනුව බ්‍රයිඩේ මර්පි පිළිබඳ සිද්ධිය අන්තරාභවයේ පැවැත්මට ප්‍රබල සාක්ෂියක් ලෙස පිළිගැනුණි.

පුනරුත්පත්තිය පිළිබඳව පර්යේෂණ පවත්වා විශ්ව කීර්තියට පත්වූ ආචාර්ය ඉයන් ස්ටීවන්සන් පවසන්නේ මරණයත්, මතු උපතත් අතර සංක්‍රාන්ති කාලයක් පවතින බවයි. මෙම කාල සීමාව සාමාන්‍යයෙන් වසර එකහමාරක් පමණ වේ.

අන්තරාභවය බුදු දහමට එකඟ නොවන බව කියමින් කෙස් පැළෙන තර්ක ගෙන එන අය ද අප අතර වෙති. සූත්‍ර පිටකය ප්‍රවේසමෙන් කියවා බලන ඕනෑම කෙනෙකුට බුදුන් අන්තරාභවය පිළිගත් බව සැක හැර දැනගත හැකිය. ඛුද්දක නිකායේ උදාන පාළියට අයත් චතුර්ථ නිබ්බාන සූත්‍රයෙහි මරණය, මතු උපතත් අතර සිටින සත්ත්වයන් ගැන කියවේ. නිසැකයෙන්ම ඒ අන්තරාභවිකයන්මය. මජ්ඣිම නිකායේ මහා සකුළුදායි සූත්‍රයේ මතු උපත ගැන දැක්වෙනුයේ ගෙයකින් පිටත්ව තවත් ගෙයකට ඇතුළුවීමට හා සමාන දෙයක් කොටය. එබැවින් මරණයත් මතු උපතත් අතර කාල පරතරයක් තිබීමට ඉඩ ඇති බව පැහැදිලිය. මජ්ඣිම නිකායෙහිම මහා අස්සපුර සූත්‍රයේ මේ උපමාව තවදුරටත් විස්තර කර දී ඇත. එහි එන ගෙයින් පිටවීම, ගෙයින් පිටව සැරිසැරීම, නව ගෙයකට පැමිණීම යන අවස්ථාවන්ට මරණය, අන්තරාභවය හා පුනරුත්පත්තිය සම කළ යුතුය.

අන්තරාභවය ප්‍රතික්ෂේප කිරීම ලක්දිව මහාවිහාරිකයන් හා අභයගිරිවාසීන් අතර වූ බල අරගලයක ප්‍රතිඵලයක් බව අමතක නොකළ යුතුය.



Scanned with CamScanner

# 7. අන්තරාභවය තුළ අත්දැකීම්

තිබ්බතය හෙවත් ටිබෙට් රට ලොව අන් කිසිදු රටක නැති සුවිශේෂී භූවිෂමතා ලක්ෂණවලින් යුක්තය. තිබ්බතය සිව්දිගින්ම වටවී ඇත්තේ ලෝකයේ උසම කඳු වැටි ලෙස සැලකෙන හිමාල කඳු සහ ඒ ආශ්‍රිත කඳු පන්තීන්ගෙනි. අවශේෂ ලෝකයෙන් වෙන්ව තනි වූ තිබ්බතය තුළ වසර 2000ක් පමණ පැරණි ආධ්‍යාත්මික රහස් අද දක්වාම ආරක්ෂා වෙමින් පවතී.

බෞද්ධ රටක් වන තිබ්බතයේ ථේරවාදය, මහායානය සහ වජ්‍රයානය යන ප්‍රධාන බෞද්ධ සාම්ප්‍රදායන් තුනටම අයත් විහාරස්ථාන ඇත. තිබ්බතයේ වඩාත්ම ජනප්‍රිය වජ්‍රයාන සාම්ප්‍රදාය තුළ අමුතු ඇදහිලි හා විශ්වාස රාශියක්ම දක්නට හැකිය. එබැවින් තිබ්බත වජ්‍රයාන බුදුදහම "ගුප්ත බුදුදහම" යන නම ලබා ඇත. මරණය හා මරණින් මතු ජීවිතය ගැන අන් කවර හෝ ආගමක නොදකින තරම් විශාල ඉගැන්වීම් ප්‍රමාණයක් තිබ්බත වජ්‍රයාන ධර්ම සාහිත්‍යය තුළ හමුවේ.

"ඔබ මරණය ගැන හදාළ යුත්තේ යහතින් ජීවත්ව සිටින කාලය තුළදීය. මරණය ගැන හැදෑරීමට මිය යන මොහොත තෙක් බලා සිටිය යුතු නැත." යනුවෙන් මරණය හා සම්බන්ධ එක් ටිබෙට් ග්‍රන්ථයක සඳහන් වේ.

තිබ්බතයේ ප්‍රචලිත මරණය පිළිබඳ විද්‍යාව ශාඛා හා අනුශාඛා කිහිපයකටම බෙදා දැක්විය හැකිය.

1. මරණය ළං වූවකු වෙනුවෙන් කළ යුතු වතාවත්
2. මළගිය ඇත්තන් වෙනුවෙන් කළ යුතු වතාවත්
3. අන්තරාභවය පිළිබඳ ඉගැන්වීම්
4. මළවුන් නැගිටුවීමේ කලාව
5. කැමති විට මියගොස් කැමති තැනක ඉපදීමේ විද්‍යාව
6. ප්‍රාණය හුවමාරු කිරීමේ ශිල්ප ක්‍රම

යනාදිය මරණය පිළිබඳ තිබ්බතීය විද්‍යාවේ ප්‍රධාන ශාඛාවන්



Scanned with CamScanner

ලෙස හැඳින්විය හැකිය. මෙම ශිල්ප ක්‍රම ඩෝන් ජුග්, ට්‍රොන් ජුග්, පෝ - ආ, තුල්කු ආදී විවිධ නම්වලින් හැඳින්වේ.

මරණය හා අන්තරාභවය පිළිබඳ ඉපැරණි තිබ්බතීය ග්‍රන්ථයන්ගෙන් වඩාත්ම කතාබහට ලක්ව ඇත්තේ බාර්ඩෝ තොදොල් නම් කෘතියයි. මෙය අනාදිමත් කාලයක සිට තිබ්බතීය ආධ්‍යාත්මික ගුරුවරුන් අත රැඳී පවතී. එනමුත් මෙහි කර්තෘ හෝ ලියැවුණු කාලය පිළිබඳ කිසිදු තොරතුරක් සොයා ගැනීමට නොමැත. 20 වන සියවස මුල දී තිබ්බතීය ආධ්‍යාත්මික රහස් සොයා ගිය ඊවන්ස් වෙන්ට්ස් නම් බටහිර ගවේෂකයා විසින් මෙම ග්‍රන්ථය "ද ටිබෙටන් බුක් ඔෆ් ද ඩෙඩ්" යන නමින් ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කර ඇත. ස්වාභාවික මරණයකට ලක්වන පුද්ගලයකු ඉන් අනතුරුව මුහුණ පාන ත්‍රාසජනක අත්දැකීම් මෙහි පියවරෙන් පියවර විස්තර කර ඇත. "ටිබෙටන් බුක් ඔෆ් ද ඩෙඩ්" හෙවත් "තිබ්බතීය මළ පොතෙහි" මරණය හා අන්තරාභවය සම්බන්ධව දැක්වෙන වැදගත් ඉගැන්වීම් කිහිපයක් මතු දැක්වේ.

✧ සත්‍යාවබෝධය නොලද සෑම අයෙක්ම මරණින් මතු අන්තරාභවයට එක්වෙයි.

(තිබ්බතීය මළ පොතෙහි වන මෙම ඉගැන්වීම මූලික බුදු සමයෙහි එන ඉගැන්වීම් හා නොගැළපේ.)

✧ අන්තරාභවයට එක්වන සත්ත්වයා තම කර්ම බලයට අනුරූපව ඊළඟ උපත ලබන තුරු අන්තරාභවයෙහි ගත කරයි.

✧ අන්තරාභවයෙහි සිටින සත්ත්වයාට විවිධාකාර දර්ශන පෙනෙයි. දෙවිවරු, බුදුවරු, බෝසත්වරු, යක්ෂයෝ සහ යක්ෂණියෝ විටින් විට ඔහු ඉදිරිපිට පෙනී සිටිති.

✧ මේ කියූ දර්ශනවල දී සත්‍ය දෙවිවරු හෝ බුදුවරු අන්තරාභවිකයා ඉදිරිපිට පෙනී නොසිටිති. ඒ සියල්ල අන්තරාභවිකයාගේ සිතෙහි හටගන්නා මායා දර්ශනයන්ය.

(සටහන - මෙය ඉතා වැදගත් ඉගැන්වීමකි. මරණින් මතු අන්තරාභවයේ දී අත්විඳින විවිධාකාර අත්දැකීම් සියල්ල මියගිය සත්ත්වයන්ගේ සිතෙහි හටගත් මායාකාරී දර්ශන වීමට හොඳටම



Scanned with CamScanner

ඉඩ තිබේ. බෞද්ධයන් අන්තරාභවයේ දී බෝසත්වරු, බුදුවරුන් හා ආරක්ෂක දේවතාවෝ දකිනුයේ එම සංකල්ප ඔවුන්ගේ සිත තුළ තැන්පත්ව ඇති බැවිනි. අන්තරාභවය සම්බන්ධ අත්දැකීම් ලැබූ කිතුනු බැතිමතුන්ට පෙනී ඇත්තේ ජේසුතුමා, මරිය මාතා, සාතන් වැනි ඔවුන්ට අදාළ වන ඔවුන්ගේ සිතෙහි නිතර රැව් දෙන චරිතයන්ය.)

✧ අන්තරාභවය තුළ දී යමෙකුට පහසුවෙන්ම සත්‍යාව-බෝධය ලද හැකිය.

(අන්තරාභවය තුළ දී සත්‍යාවබෝධය ලද හැකිය යන මතය මුල්වරට ඉදිරිපත් වනුයේ තිබ්බතයේ රචිත බාර්ඩෝ තොදොල් හෙවත් තිබ්බත මළ පොතෙනි.)

✧ 'අන්තරාභවය තුළ අත්දකින සියලු දේ මායාවකි' යන්න තමාට අවබෝධ කළ හැකි නම් අන්තරාභවිකයා එසැණින්ම සත්‍යාවබෝධයට පත්වේ.

(වජ්‍රයාන බෞද්ධ සාම්ප්‍රදාය තුළ වසර 2000ක් පමණ පැරණි බෞද්ධ (ශූන්‍යතාවාදී) සංකල්ප ඇතුළත්ය. ශූන්‍යතාවාදය යන බෞද්ධ සංකල්පය අනුව ලොව සියලු දෙය දෘෂ්ටි මායාවන්ය. එම තත්ත්වය අවබෝධ කරන පුද්ගලයා සසර ගැන ඇති ඇලීම අත්හැර දමා නිවන් පුරට පිවිසෙයි.)

✧ මෙලොව ජීවත්ව සිටින අයට මළගිය ප්‍රාණකාරයන් නොපෙනෙතත් මළගිය ප්‍රාණකාරයන්ට මෙලොව ජීවත් වන අය හොඳින් පෙනේ. එමෙන්ම අප කියන දේ ඔවුන්ට ඇසේ. උපතින් අඳ, ගොළු, බිහිරි අය පවා අන්තරාභවය තුළ දී ඇසීමේ හා දැකීමේ හැකියාවන් ලබති.

✧ අන්තරාභවිකයා ඊළඟ උත්පත්ති ස්ථානය තෝරා ගන්නා තෙක් තම මෘත දේහය අසල හෝ තම නිවස අසල සැරිසරයි. එබැවින් මළගිය තැනැත්තා වෙනුවෙන් සිදු කරන චාරිත්‍ර වාරිත්‍රවලට සුදුසුම තැන වනුයේ ඔහු ජීවත්ව සිටි නිවසයි.

(මෙම කරුණ මුල් බුදු සමයට අයත් තිරෝකුඩ්ඩ සූත්‍රයේ එන ඉගැන්වීම් හා සැසඳේ.)



Scanned with CamScanner

✧ යමෙකු මළ අවස්ථාවේ දී හැඬීම හෝ වැලපීම නොකළ යුතුය. එලෙස හැඬීමෙන් හෝ වැලපීමෙන් මළගිය ප්‍රාණකාරයාට අයහපතක් සිදුවේ.

(යමෙකු මියගිය කල හැඬීමෙන් හෝ වැලපීමෙන් කිසිදු ප්‍රයෝජනයක් අත් නොවන බවත්, හඬන්නාට වෙහෙස පමණක් අත්වන බවත් බුදුන්වහන්සේ විසින් විස්තර කර වදාරා ඇත. යමෙකු තම මළගිය ඥාතීන් වෙනුවෙන් හැඬීම හෝ වැලපීම මියගිය තැනැත්තාට අහිත පිණිස පවත්නා බව ද බුද්ධ දේශනයේ සඳහන්ය. මෙම කරුණ පිළිබඳ විස්තර දක්වන බෞද්ධ ආචාර්යවරුන්ගේ මතය වී ඇත්තේ මළගිය තැනැත්තා වෙනුවෙන් හැඬීම් වැලපීම් කරන කල ඔහු නමින් මෙලොව ජීවත් වන්නන් ගැන ඇති ආශාව බලවත් වන බවයි. එලෙස මෙලොව සිටින අය කෙරෙහි ආශාව බලවත් වූ කල ප්‍රේත ලෝකයේ ඉපදීමට ඇති ඉඩකඩ වැඩිය.)

✧ යමෙකු මියගිය වහාම ඔහුගේ දෙකන අසලට වී යමක් කියතොත් එය මළගිය තැනැත්තාට පැහැදිලිව ඇසෙයි.

✧ යමෙකු මරණාසන්නව සිටින විට ඔහු කළ කී හොඳ දේ ද බුදුගුණ ද ඔහුට සිහිගැන්විය යුතුය.

(මෙම ඉගැන්වීම මුල් බුදුසමයේ එන කරුණු හා හොඳින් ගැළපේ. මරණාසන්න පුද්ගලයෙකුට තමා කළ කී හොඳ දේ මතක් කළ විට හොඳ උපතක් කරා යාමට එය ආධාරක වන බව ථෙරවාද සාම්ප්‍රදාය තුළ ද පිළිගැනෙයි. මරණාසන්න වූවන් අසල සිට පිං පොත් කියවීමේ සිරිතක් අතීතයේ ශ්‍රී ලංකාව තුළ පැවතුණි. මෙහි පිං පොත යනු තමා දිනපතා කළ පිංකම් ලියා තැබීමට පැරැණ්නන් විසින් භාවිත කළ පොතකි.)

✧ අන්තරාභවිකයා එම තත්ත්වය තුළ අවස්ථා කිහිපයක් පසු කරයි. මුලින්ම ඔහු රෝගී, සිහිමුළා වූ සත්ත්වයෙකි. එම රෝගී, සිහිමුළා වූ තත්ත්වය දින තුනහමාරක් පමණ ගත වූ කල පහව යයි. එතැන් සිට ඔහු දිව්‍යමය හැකියා සහිත අන්තරාභවිකයෙකි.

✧ අන්තරාභවය තුළ සත්‍යාවබෝධය ලැබීමට හැකිය යන

සංකල්පය තිබ්බත මළ පොතෙහි හරයයි. මෙය ඉතා දුර්ලභ ඉගැන්වීමක් බවත් පෙර පින් ඇති වාසනාවන්තයන්ට පමණක් මේ ඉගැන්වීම් මුණගැසෙන බවත් එහිම දැක්වේ. "යමෙකු මේ ඉගැන්වීම් ගැන ඇති සැක දුරු කරයි ද හේ එයින්ම සත්‍යාවබෝධය සඳහා සුදුසුකම් ලබයි." යනුවෙන් තිබ්බත මළ පොතෙහි තවදුරටත් සඳහන් වේ.

මළගිය තැනැත්තෙක් මුහුණ දෙන විවිධාකාර ජවනිකාවන් පෙර කී බාර්ඩෝ තොදොල් ග්‍රන්ථයේ විස්තර වනුයේ පහත දැක්වෙන පරිද්දෙනි.

1. යමෙකුගේ ප්‍රශ්වාසය නැවතීමත් සමග ඔහු මරණය කරා යාම ඇරඹේ.

2. යමෙකු මිය යාමට ආසන්න වන විට ඔහු දකුණු ඇලයෙන් සතපවා ඔහුගේ උගුර දෙපස ඇති ධමනි යුගලය ඇඟිලිවලින් මෘදුව තද කරගෙන සිටිය යුතුය. එවිට ප්‍රාණවායුව ශරීරයේ පහත් තැනකින් පිටවීම වැළැක්විය හැකිය. පහත් තැනකින් ප්‍රාණවායුව පිටවුවහොත් පහත් ආත්මයකට යාමට ඔහුට සිදුවනු ඇත.

3. ප්‍රාණය ගිලිහී යන අවස්ථාවේ දී එම පුද්ගලයා මොහොතකට සිහිසුන් වේ. සමහරු වැඩි කාලයක් අන්තරාභවයෙහි සිහිසුන්ව සිටිති. සමහරු කෑම වේලක් කන වේලාව පමණ එලෙස සිහිසුන්ව සිටිති. තවත් අය අසුරු සැණින් සිහිඑළවා ගනිති. මේ අතර දින 3ක් පමණ සිහිසුන්ව අන්තරාභවයේ සිටින අය ද වෙති.

4. මියගිය පුද්ගලයාගේ ප්‍රාණවායුව ගිලිහී ගිය පසු ඔහු අන්තරාභවයට එක්වෙයි.

5. ඔහුට අන්තරාභවය තුළ දී පළමුව පිරිසිදු ආලෝකයක් (clear light) දර්ශනය වෙයි. මෙය එක් එක් පුද්ගලයාගේ චිත්ත ස්වභාවය අනුව අඩු වැඩි වශයෙන් දර්ශනය වන්නකි.

(යමෙකු මේ ආලෝකය සත්‍යාවබෝධයට හෝ බුද්ධත්වයට සමාන කළහොත් එයින්ම ඔහු සසරෙන් මිදෙන බව මහා යෝගී නාරොපා විසින් දක්වා ඇත.)

6. මියගිය තැනැත්තා දැන් අන්තරාභවය තුළ සිහි



Scanned with CamScanner

එළවාගෙන සිටියි. ඔහුට දැන් තමාගේ මෘත දේහය ද ඒ අසල සිට හඬා වැලපෙන නෑදෑ හිතවතුන් ද හොඳින් පෙනෙයි. මියගිය තැනැත්තා දැන් ගැටලුවකට මුහුණ දෙයි. 'මට අන් සියලු දෙනාද පෙනෙයි. එහෙත් මා කියන දේ ඔවුන්ට නොඇසේ. මට ඔවුන් පෙනුණත් ඔවුන්ට මා නොපෙනේ. මට වූයේ කුමක්ද' යනුවෙන් සිතමින් අන්තරාභවිකයා මහත් සේ දුකට පත්වේ.

7. දැන් නැවතත් මියගිය තැනැත්තා විවිධාකාර ආලෝක ධාරාවන් දකියි. ඒ අතරින් ඔහු තමා අදහන දෙවිදේවතාවුන්ද බුදුවරුන් ද බෝසත්වරුන් ද දකියි. ඒ සියල්ල මියගිය සත්ත්වයාගේ කර්ම ශක්තිය විසින් මෙහෙයවනු ලබන මායාකාරී දර්ශනයන් මිස සැබෑවටම ඇති දේ නොවේ. ඒ සියල්ල මායාවන් බව අවබෝධ කර ගැනීමට යමෙකුට හැකි නම් එයම සත්‍යාවබෝධය සඳහා ප්‍රමාණවත්ය.

මේ අවස්ථාව තුළ දී දකින ආලෝක ධාරාවන්ට වසඟ වීම හෝ ඉන් පැනයාමට උත්සාහ කිරීම නොකළ යුතුය.

8. එලෙස පැන යාම හෝ වසඟ වීම තුළින් සිදුවන්නේ කර්මානුරූප උත්පත්තියක් වෙත යොමු වීමයි. අන්තරාභවය තුළ දී දකින කවර හෝ ආලෝකයක් බුද්ධත්වයට හෝ සත්‍යාවබෝධයට සම කළ හොත්, එසේ සිතතොත් එයින්ම සත්‍යාවබෝධය සිදුවේ.

(අන්තරාභවය තුළ දී සත්ත්වයන්ගේ සිත නව ගුණයක් පිරිසිදු වන බව බාර්ඩෝ තොදොල් ග්‍රන්ථයේ දැක්වේ. එබැවින් බලගතු පාපකර්මවල නියැළුණු අයට ද අන්තරාභවය තුළ දී සත්‍යාවබෝධය ලැබීමේ හැකියාවක් ඇත්තේය.)

9. අන්තරාභවය වෙත පැමිණ දින තුනහමාරක් පමණ ගත වූවාට පසු අන්තරාභවිකයා තමා මෙතෙක් පෙළුණු ක්ලාන්ත වූ ගතියෙන් අත්මිදෙයි. දැන් ඔහුට පෙර ආත්මභවයේ කයට සමාන වූ තමාගේ සූක්ෂම වූ ශරීරය දැකිය හැකිය. දෙවියන් සතු සමහර දිව්‍යමය හැකියාවන් අන්තරාභවිකයාට ඇත. එමෙන්ම ඔහුට දැන් අවශ්‍ය නම් පර්වත, බිත්ති ආදිය විනිවිද යා හැකිය. අන්තරාභවිකයාගේ සිරුර තුළට ආයුධයක් ඇතුළු කළත් ඔහුගේ සූක්ෂම ශරීරයට ඉන් හානියක් සිදු නොවේ. මෙම සූක්ෂම රූපකායද



Scanned with CamScanner

අන්තරාභවිකයාම දකින මායාවක් බඳු ශරීරයකි. මිනිස් ලොව අන්ධව, බිහිරිව සිටි අයට ද මේ අවස්ථාවේ දී දැකීමට ඇසීමට හැකිය. තමා අංග සම්පූර්ණ ඉන්ද්‍රියයන් සහිත බව අන්තරාභවිකයාට දැකගත හැකිය.

10. මේ අවස්ථාවේ දී අන්තරාභවිකයාට ඇති ශරීරය තෘෂ්ණාව උපාදාන කොට ගත් එකකි. එබැවින් ඒ ශරීරය ඔහුටම පෙනෙන මායාවකි.

(මෙම ඉගැන්වීම සූත්‍ර පිටකයේ කුතුහලසාලා සූත්‍රයේ එන අන්තරාභව විස්තරය හා හරියටම සැසඳේ. එහි විස්තර කරන අන්තරාභවිකයා ද තෘෂ්ණාව උපාදාන කරගෙන සිටින්නෙකි.)

11. මේ අවස්ථාවේ සිටින (සුවපත් වූ) අන්තරාභවිකයා ඔහු දකින ස්වරූපයෙන්ම දිවැස් ඇති අයට දැකගත හැකිය.

12. අන්තරාභවිකයාට තමන්ට අවශ්‍ය තැනකට ඉතා සුළු මොහොතකින් යා හැකිය. තමා කැමති තැනකට යාමට ඔහුට ගත වන්නේ දික් කළ අතක් වක් කිරීමට යන කාලය වැනි සුළු මොහොතකි. අන්තරාභවය තුළ දී ලැබෙන මෙවැනි දිව්‍යමය හැකියාවන් කිසියම් කුශල කර්මයක විපාක නිසා ලැබෙන දේ නොවේ. තෘෂ්ණාවෙන් හටගත් සූක්ෂම ශරීරයේ සුවිශේෂී ස්වභාවය නිසාම එවැනි හැකියාවන් ලැබේ.

13. අන්තරාභවිකයන්ට ඔවුනොවුන් පෙනෙනුයේ මෙසේය. දෙවියන් බවට පත්වීමට නියමිතව සිටින අයට තවත් එවැනි අය පෙනේ. යක්ෂයන් බවට පත්වීමට සිටින අයට එවැනිම අය පෙනේ.

14. අන්තරාභවිකයෙකුට හොඳින් සිත එකඟ කර ගත්තොත් ධ්‍යානගත විය හැකිය. මහා කාරුණිකයන් වහන්සේගේ නව ගුණ සිහිකර පෙර තමා හුරු කළ භාවනා අරමුණකට සිත යොමු කළ කල්හි හොඳින් සිත එකඟ වේ. එලෙස හොඳින් සිත එකඟ කළ කල්හි අන්තරාභවිකයන්ට අහසේ සැරිසරන සැබෑ දිව්‍යාත්මයන් දැකගත හැකිය.

15. මෙම අවස්ථාවේ දී අන්තරාභවිකයාට ජීවත්ව සිටින තම නෑදෑ මිතුරන් පෙනෙනුයේ සිහිනෙන් දකින්නාක් මෙනි.



Scanned with CamScanner

නැඳෑ හිතමිතුරන් අතරට ගොස් කතා කළ ද ඔවුන්ට එය නොඇසේ. මළගිය තැනැත්තා වෙනුවෙන් හඬන වැලපෙන අය ඔහුට දැන් පෙනේ. ඔහුගේ හිතෙහි ද ඒ ගැන කම්පාවක් ඇති වේ.

16. මෙම (දෙවැනි) අන්තරාභව අවස්ථාව තුළ දිවි ගෙවිය යුතු කාලය පිළිබඳ නියමයක් නැත. එහෙත් ඒ කාල සීමාව සති හතක් පමණ වුව ද දිගුවිය හැකිය.

17. පෙර විස්තර දක්වා ඇති පරිදි අන්තරාභවිකයා කර්මයේ බලපෑමට සෘජුවම හසුවෙයි. ඔහුගේ බුද්ධිය දැන් ශරීරයෙන් වෙන්ව ඇත. (අන්තරාභවිකයා බුද්ධියේ කේන්ද්‍රස්ථානය වූ මොළය හැරදමා පැමිණ ඇත. ඔහුට බුද්ධිය මෙහෙයවා තීරණ ගත නොහැකිය.)

18. අන්තරාභවිකයාට සිතූ තැනට සිතූ විගස යා හැකි වුවත් ඔහුට කැමති පරිදි එකතැන රැඳී සිටිය නොහැකිය. කර්ම බලවේගය විසින් ඔහු ඇදගෙන වෙනත් තැන් කරා යනු ලැබේ.

19. අන්තරාභවයෙහි සිටින අවසාන අදියර වන විට සත්ත්වයාට තමාගේ කර්මානුරූපව ඉපදීමට සිදුවන ලෝකයක් පිළිබඳ පෙරනිමිති පහළ වීමට පටන් ගනී. නරක උත්පත්තියක් ලැබීමට සිදුවන සත්ත්වයා විවිධාකාර බියකරු දර්ශන දකී. සුගතියේ ඉපදීමට නියමිත සත්ත්වයා සුබ අරමුණු දකී. බොහෝ දෙනෙක් මේ දෙයාකාරයේම දර්ශන එම කාලය තුළ දකිති.

20. දැන් සත්ත්වයා අන්තරාභවයෙන් මිදී උපතක් කරා යාමට ආසන්න අවස්ථාවයි. මේ අවස්ථාවේ කර්මානුරූපව තමාට ඉපදීමට සිදුවන ස්ථානයට අදාළ ආලෝක සංඥා පහළ වේ.

✧ දෙව් ලොව ඉපදීමට නියමිත සත්ත්වයෝ සුදු පැහැ ආලෝකයක් දකිති.

✧ අසුර ලොව ඉපදීමට නියමිත සත්ත්වයෝ අප්‍රසන්න අඳුරු කොළ පැහැ ආලෝකයක් දකිති.

✧ මිනිස් ලොව ඉපදීමට නියමිත සත්ත්වයෝ කහ පැහැ ආලෝකයක් දකිති.

✧ තිරිසන් ලොව ඉපදීමට නියමිත සත්ත්වයෝ නිල් පැහැ



Scanned with CamScanner

ආලෝකයක් දකිති.

- ✧ ප්‍රේත ලොව ඉපදීමට නියමිත සත්ත්වයෝ රතු පැහැ ආලෝකයක් දකිති.
- ✧ නිරයෙහි ඉපදීමට නියමිත සත්ත්වයෝ දම් පැහැ ආලෝකයක් දකිති.

මේ ආලෝකය පැමිණීමත් සමගම අන්තරාභවිකයාගේ ශරීරය තමා උපදින්නට නියමිත ලෝකයට අදාළ ආලෝක ධාරාවේ වර්ණයට හැරෙයි. මේ කවර හෝ ආලෝකයක් බුද්ධත්වයට සම කර සිතීමට හැකි නම් ඒ ලෝකයේ ඉපදීමේ අනතුරෙන් මිදී අන්තරාභවිකයා නිවනට පැමිණෙයි.

21. අන්තරාභවයෙන් මිදී උපතක් කරා යොමු වන සත්ත්වයා කුණාටුවකට අසු වූ ආකාරයෙන් එක දිශාවකට ඇදී යන්නේය.

මෙය අන්තරාභවය තුළ සත්ත්වයා සැරිසරන ආකාරයයි.



Scanned with CamScanner

# 8. පුනරුත්පත්තිය සහ පුනර්භවය

මෙකල මුද්‍රිත මාධ්‍යවල දිගහැරෙන කතා ප්‍රවෘත්ති අතර වැඩිම ජනප්‍රියතාවයක් උසුලන්නේ පුනරුත්පත්තිය හා සම්බන්ධ සිද්ධීන්ය. ඒ අතර සමහරු "පුනරුත්පත්තිය" සහ "පුනර්භවය" යන යෙදුම් දෙකින් කුමක් නිවැරදි ද යන්න පිළිබඳව කෙස් පැළෙන තර්ක ඉදිරිපත් කරති. සමහරුන් අදහස් කරන පරිදි බුදු දහම තුළ පුනර්භවයක් කියා දෙයක් නැත. ඇත්තේ පුනරුත්පත්තිය පමණි. තවත් අය මීට හාත්පසින්ම වෙනස් මතයක් ඉදිරිපත් කරමින් පුනරුත්පත්තිය ආත්මවාදය හා බැඳුණු යෙදුමක් බවත් එය හින්දූන්ට අයත් යෙදුමක් බවත් ප්‍රකාශ කරති.

මේ සම්බන්ධ සූත්‍ර පිටක ඉගැන්වීම් ඇසුරෙන් පුනරුත්-පත්තිය හා පුනර්භවය අතර ඇති ප්‍රශ්නය පහසුවෙන් නිරාකරණය කළ හැකිය. නැවත ඉපදීම සම්බන්ධ බෞද්ධ න්‍යාය ඉදිරිපත් වනුයේ පටිච්චසමුප්පාද දේශනාව තුළය. පටිච්ච-සමුප්පාදයට අදාළ සෑම සූත්‍රයකම මතු උපත ගැන කියවෙන තැන් දෙකක් හමු වේ.

1. මතු භවය ලැබීම (භව)

2. මතු භවයෙහි උපත ලැබීම (ජාති)

එම අවස්ථා දෙකය. ඒ අනුව පුනරුත්පත්තිය හා පුනර්භවය යනු සංසිද්ධීන් දෙකකි. මෙය තවදුරටත් පැහැදිලි කර දිය හැකිය.

✧ සත්ත්වයා නැවත ඉපදීම ලබන භවය සැකසෙනුයේ උපාදාන හෙවත් ඇලීම් නිසාය. කාම, රූප හා අරූප වශයෙන් භව 3 කි. මෙකී භව තුන මගින් අනුපිළිවෙළින් කාම ලෝක, රූප හා අරූප ලෝක නියෝජනය වේ. පුනර්භවය යනු සත්ත්වයාගේ මතු උපත සඳහා මෙවැනි ස්ථානයක් සකස් වීමයි. එය සමහර විට ජීවිත කාලය අවසන් වීමට පළමු සිදුවිය හැකිය. යම් යම් පුද්ගලයෝ මෙලොව දී සිදු කරන විශාල පුණ්‍ය කර්මයන්ගේ බලය හේතුවෙන් ඔවුන් මෙලොව ජීවත්ව සිටියදීම දෙව් ලොව ඔවුන් වෙනුවෙන් විමාන පහළ වේ. මෙය පුනර්භවයයි.



Scanned with CamScanner

✧ සත්ත්වයා මරණින් මතු එකී භවයෙහි උත්පත්තිය ලබයි. එය පුනර්ජන්මය හෙවත් පුනරුත්පත්තියයි.

පුනර්භවය හා පුනරුත්පත්තිය මෙලෙස වෙන් කර පෙන්වීමට තවත් හේතුවක් ඇත. සමහර සත්ත්වයන්ගේ උපත එක්වරම සිදුවේ. ඔවුන් ඒක බීජක සත්ත්වයන් නම් වේ. ඕපපාතිකව උපදින දෙවියන්, බ්‍රහ්මයන් හා සමහර අපාගත සත්ත්වයන් මීට උදාහරණ වේ. සමහර සත්ත්වයන් උපදින්නේ දෙවතාවකටය. බිජු මගින් උපදින සත්තු බිජු මෝරා පිපිරී ගිය කල්හි මෙලොව එළිය දකිති. මව්කුස පිළිසිඳින සත්තු ගැබ් කාලය අවසානයේ මෙලොව එළිය දකිති. මෙවන් සතුන් ද්වි බීජක වර්ගයට අයත් වේ. ද්වි බීජක සතුන් පුනරුත්පත්තිය ලබන්නේ ඔවුන් "පුනර්භවය" තුළ පිළිසිඳ ගෙන ගැබ (හෝ බිජු) මෝරායාමෙන් අනතුරුවය.



Scanned with CamScanner

# 9. පුනර්භව දාමය සැකසෙන අයුරු

පුනරුත්පත්තිය පිළිබඳව විස්තරාත්මක සටහන් මුල්වරට හමුවන්නේ ඉන්දියානු උපනිෂද් මුනිවරුන්ගේ කෘතීන් තුළය. සත්ත්වයාගේ කය තුළ පිහිටි ආත්මය මරණයේ දී කය හැර ගොස් වෙනත් කයකට ඇතුළු වන බව උපනිෂද් මුනිවරුන්ගේ පොදු මතය විය. සත්ත්වයා මරණින් මතු නැවත නැවතත් උපදින බවට ඉන්දීය බමුණු කුලය තුළ ද පිළිගැනීමක් විය.

පුනරුත්පත්තිය ගැන විප්ලවීය අදහසක් ඉදිරිපත් කරන ලද්දේ බුදුන්වහන්සේ විසිනි. බුදුන්වහන්සේ විසින් ඉදිරිපත් කළ පුනරුත්පත්ති යාන්ත්‍රණය පටිච්චසමුප්පාදය නම් විය. පටිච්ච-සමුප්පාදය ගොඩනැගෙනුයේ මෙහි පහත සඳහන් පදනම මතය.

✧ සත්ත්වයාගේ ඉපදීම් මියයාම් ක්‍රියාවලියේ අගක් හෝ මුලක් නොපෙනෙයි.

✧ සත්ත්වයාගේ මතු උපතට කර්ම බලය, තෘෂ්ණාව, අවිද්‍යාව (වැරදි වැටහීම්) යන දේ බලපායි.

✧ එකිනෙක බැඳී ඇති හේතුඵල දාමයක් අනුව මතු උපතක් ඇති වනු විනා ඒ කෙරෙහි අන්‍ය (දිව්‍යමය) බලවේගයක සහය නොලැබේ.

✧ හේතුඵල දාමයක ක්‍රියාකාරිත්වය නිසා මතු උපත ඇති වන අතර, මෙම ක්‍රියාවලිය වරදවා වටහා ගන්නා චින්තකයෝ ආත්මයක් ඇත, එම ආත්මය කයෙන් කයට මාරුවී යයි යන වැරදි චින්තනය ගරු කරති.

මෙවැනි සංකල්පනාත්මක පදනමක් මත ගොඩනැගෙන පටිච්චසමුප්පාදයෙහි මතු උපත ලැබෙන ක්‍රියාවලිය විස්තර කර ඇත්තේ මෙලෙසය.

✧ සත්ත්වයාගේ ඉන්ද්‍රියයන් වෙත ලැබෙන අරමුණු නිසා කිසියම් වින්දනයක් ලැබෙයි. වින්දනය පිළිබඳ ඇලීමක් (තෘෂ්ණාව) ඇති වේ.

✧ තෘෂ්ණාව නිසා බැඳීමක් (උපාදාන) හටගනී.



Scanned with CamScanner

✧ මෙකී බැඳීම නිසා සත්ත්වයාගේ පුනර්භවය (භව) ඇති වේ.

✧ සත්ත්වයාගේ මරණින් මතු පුනර්භවය තුළ ඉපදීම සිදු වේ.

මෙලෙස පුනරුත්පත්තිය ලද සත්ත්වයා නැවත නැවතත් සංවේදන ලබයි. එවිට නැවත නැවතත් තෘෂ්ණාව හටගනී. මේ ලෙස පුනර්භව දාමය නොකැඩී ඉදිරියට ගමන් කරයි. යමෙකුට මේ පුනර්භව දාමය බිඳීමට අවශ්‍ය නම්, ඔහුට තෘෂ්ණාව අත්හැරීමෙන් හෝ වැරදි අදහස් (අවිද්‍යාව) අතහැරීමෙන් හෝ එය සිදු කළ හැකිය. නිර්වාණය සාක්ෂාත් කිරීම යනුවෙන් විස්තර කරනුයේ එම තත්ත්වයයි. නිර්වාණය සාක්ෂාත් කළ පුද්ගලයා කෙරෙහි තෘෂ්ණාව නැත. ඔහු කර්ම රැස් නොකරයි. එබැවින් ඔහුට උපාදානද නැත. පුනර්භවයක් හෝ පුනරුත්පත්තියක් ද ඔහුට නැත.



Scanned with CamScanner

# 10. පුනර්භවය වෙත කර්මය බලපාන අයුරු

පුනරුත්පත්ති ක්‍රියාදාමයට කර්මය බලපානුයේ කෙසේද? මේ ප්‍රශ්නයට පටිච්චසමුප්පාදය තුළින් පිළිතුරු සොයන සමහරු බරපතළ ගැටලුවකට මුහුණ දෙති. පටිච්චසමුප්පාද විස්තරයන්හි "කර්මය" මතු උපතට බලපාන බලවේගයක් ලෙස හුවා දක්වා නොතිබීමයි. සැබැවින්ම කර්මයේ කාර්යභාරය මතු උපතක් ලබාදීම නොවේ. මතු උපතෙහි ස්වභාවය හා උත්පත්ති ස්ථානයේ ස්වභාවය තීරණය කිරීම මෙහි දී කර්මයට අයත් කාර්යභාරයයි.

කෙසේ නමුත්, පටිච්චසමුප්පාද ධර්මය ගැඹුරින් විස්තර කර දෙන තැන්වලදී මතු උපතට කර්මය සම්බන්ධ වන ආකාරය වටහා දෙනු ලැබේ.

ඒ අනුව,

✧ කර්ම රැස් කිරීම මගින් කාම ලෝක, රූප ලෝක හෝ අරූප ලෝකවල ඉපදීමට සත්ත්වයාට වාසනා ගුණය ලැබේ. (මෙය භව වාසනාව ලෙස පසුකාලීනව ශූන්‍යතාවාදීන් විසින් නම් කර ඇත.)

✧ කර්මය නිසා උත්පත්ති ස්ථානය සත්ත්වයාට යෝග්‍ය පරිදි සකස් වේ. (මෙය කර්ම භව නමින් අභිධර්මය තුළ හැඳින්වේ.)

ඒ අනුව භව වාසනාව ලෙසත්, කර්ම භවය ලෙසත් මතු උපත සඳහා කර්මය ආධාරක වන බව තේරුම් ගත යුතුය.

සත්ත්වයාගේ උත්පත්ති ස්ථානවල ස්වභාවය තීරණය කිරීමේ හැකියාව ඇත්තේ කර්මයටය. කර්මය විසින් උත්පත්ති ස්ථානය තෝරනුයේ මෙලෙසය.

✧ පින්කම්වලින් සුගතියේද පව්කම්වලින් දුගතියේද උපත ලබා දෙයි.

✧ සුළු හෝ පවකට මරණින් මතු අපායෙහි උපත ලබාදීමේ බලය ඇත.

✧ කර්මය විපාක දීම හෝ මෝරා වැඩීමක් සිදුවේ. එබැවින්



Scanned with CamScanner

මේ ආත්මය තුළ කළ කර්මයකින් තවත් ආත්ම කිහිපයකට පසු ලැබෙන උපත තීරණය විය හැකිය. (පෙර මිනිස් ආත්ම භවයක දී කළ පව් නිසා නිරයට නියම වී සිටි ප්‍රේතයන් ගැන ප්‍රේතවස්තුවෙහි විස්තර දැක්වේ.)

✧ එකම කර්මයකට වාර ගණනාවක් වුවද එකම ආකාරයේ උත්පත්තියක් ලබාදීමේ හැකියාව ඇත. (එකම පිංකමක් නිසා කිහිපවරක් සක්දෙව් ලෙස උපන් අයෙකු ගැන සූත්‍ර පිටකයේ කරුණු දැක්වේ.)

✧ සත්ත්වයෝ මියගිය වහාම කර්මානුරූපව නැවත උත්පත්තියක් සඳහා යොමු වෙති. (වහාම නැවත උපත ලබන බවක් මෙයින් අදහස් නොවේ.)

✧ බහුලව පිංකම් කර තිබූ පමණින් සුගතියෙහි උපදින්නේ නැත.

✧ උපන් සත්ත්වයන් අතර උස්මිටිකම්, කුලභේද ආදිය තීරණය වනුයේ කර්ම ශක්තිය අනුවය. ඒ සත්ත්වයා කර්මය දායාද කොට සිටිතැයි කියනුයේ එබැවිනි.

✧ සුළු හෝ පාප කර්මයකට සත්ත්වයාගේ උපතෙහි තත්ත්වය පහත හෙළිය හැකිය.

✧ මිනිසත් බව ලැබෙනුයේ කිසියම් කුශල කර්මයක ඵල විපාක නිසාය. එහෙත් පව්කම්වල බලපෑම නිසා එම උපතේ තත්ත්වය බාලවී දුප්පත්ව ඉපදීම, විරූපීව ඉපදීම, අඩු ආයුෂ ලැබ ඉපදීම වැනි අයහපත් ප්‍රතිවිපාක අත්විය හැකිය.

✧ මිනිසත් බවට කුශල කර්මයක බලපෑම හේතුවන නමුත් ඒ කුශල කර්මය කළ ආකාරයේ දුර්වලකම් ද සිත පහදා ගැනීමේ දුර්වලකම් ද නිසා අඩුපාඩු සහිත මිනිසුන්ව ඉපදිය හැකිය.

✧ යක්ෂයන්ව ඉපදෙනුයේ අඩුපාඩු සහිත කුශල කර්මවල බලපෑමෙනි.

✧ තිරිසන්ව උපදිනුයේ කිසියම් පාප කර්මයක බලපෑම නිසාය.



Scanned with CamScanner

✧ සතර අපායෙහි උත්පත්තිය ලැබීමට හේතු වනුයේ පාප කර්මයන්ය.

✧ දෙවියන් හෝ දිව්‍ය නාගයන්ව ඉපදෙනුයේ පින්කම්වල විපාක වශයෙනි.

✧ ධ්‍යාන වැඩූ අය බඹලොව උපදිති. එහෙත් බලගතු පුණ්‍ය කර්ම ද ඊට ප්‍රමාණවත් වේ. දෙකඩ වූ බුද්ධ ශාසනය යළි එක් කිරීම මෙවැනි "බ්‍රහ්ම" පුණ්‍ය කර්මයකි.

මෙහි ඉහත දක්වා ඇත්තේ පුනරුත්පත්තිය කෙරෙහි කර්මය බලපාන ආකාරය සූත්‍ර දේශනාවන්හි පැහැදිලි කර දී ඇති ආකාරයයි. කෙසේ නමුත්, කර්මානුරූපව සත්ත්වයා මතු උපතක් වෙත යොමු වීම අභිධර්මයට අනුකූලව ඉතා පහසුවෙන් පහදා දිය හැකිය.

✧ සත්ත්වයා මිය යන මොහොත ආසන්න වෙද්දී මතු උපතට බලපාන කිසියම් කර්මයක් ඉස්මතු වේ.

✧ මිය යමින් සිටින සත්ත්වයා කර්මය, කර්ම නිමිත්ත හෝ ගති නිමිත්ත සිතේ අල්වා ගනියි.

1. මෙහි කර්මය යනු තමා කළ ක්‍රියාවය. සතෙක් මැරූ පුද්ගලයාට සතා මැරූ ආකාරය සිහිපත් විය හැකිය.

2. කර්ම නිමිත්ත යනු කර්මයට නිමිති වූ දෙයයි. සතෙක් මැරූ පුද්ගලයාට සමහර විට මියගිය සතා සිහිපත් විය හැකිය.

3. ගති නිමිත්ත යනු තමා කර්මානුරූපව උපදින ස්ථානයේ ගති ස්වභාවයයි. අපායෙහි උපදින සත්ත්වයා ගිනිදැල්, යමපල්ලන් ආදී දේ ද දෙව් ලොව උපදින සත්ත්වයා දිව්‍ය විමාන, දිව්‍ය රථ ආදී දේ ද දකියි.

මෙලෙස නිමිත්ත අරමුණු කරගත් සත්ත්වයාගේ ප්‍රාණය නිරුද්ධ වූ වහාම මතු භවයේ විපාක චිත්තය හටගනියි. එබැවින් අතරක් නැතිවම සත්ත්වයා මතු භවයට යයි. (මෙය අභිධර්මවාදීන්ගේ ඉගැන්වීමකි. අන්තරාභවය ද භවයක් ලෙස සලකතොත් අන්තරාභවය සම්බන්ධ මතවාදයන් ථෙරවාදී ඉගැන්වීම් සමග ද පෑහෙන බව පෙනෙයි.)




Scanned with CamScanner

# 11. පුනරුත්පත්තිය ඔප්පු කළ හැකිද?

පුනරුත්පත්තිවාදයට ප්‍රතිපක්ෂව තර්ක විතර්ක ගෙන එන බොහෝ දෙනෙක් කියා සිටියේ පුනරුත්පත්තිය පර්යේෂණ මගින් තහවුරු කළ නොහැකි බවයි. ඒ කියමනෙහි ද අර්ථයක් ඇත. යමක් විද්‍යාත්මකව තහවුරු කිරීමට නම් ඒ හා සම්බන්ධව සුදුසු පර්යේෂණයක් ඇටවිය යුතුය. පුනරුත්පත්තිය ඔප්පු කිරීමට සුදුසු පර්යේෂණ ක්‍රමවේදයක් සොයාගැනීම තරමක අභියෝගයක් විය.

ඇමරිකාවේ වර්ජිනියා විශ්වවිද්‍යාලයේ ආචාර්ය ඉයන් ස්ටීවන්සන් (Ian Stevenson) මේ කාර්යයට අත ගැසුවේය. පෙර ආත්මය කියන දරුවන් සොයා ගොස් ඔවුන්ගෙන් ලැබෙන හෝඩුවාවන් මත ඔවුන් කී පෙර ආත්මයේ වාසස්ථාන සොයා යෑම ආචාර්ය ස්ටීවන්සන්ගේ පර්යේෂණ විධියයි. ආචාර්ය ස්ටීවන්සන් මේ කාර්යයට අත ගැසුවේ ශ්‍රී ලංකාවෙනි. පුනරුත්පත්තිය ගැන කියන කුඩා දරුවෙකු සම්බන්ධව පර්යේෂණ මෙහෙය වූ ආචාර්ය ස්ටීවන්සන් පුනරුත්පත්තිය යනු සිදුවිය හැකි දෙයක් බව වෛද්‍ය සඟරාවකින් මුල්වරට ප්‍රසිද්ධියට පත් කළේය. ඉන් නොනැවතුණු හෙතෙම ශ්‍රී ලංකාව, ඉන්දියාව, ටිබෙටය ආදී රටවල් ගණනාවක පුනරුත්පත්ති පර්යේෂණ තුන්දහසකට (3000) අධික සංඛ්‍යාවක් සාර්ථක ලෙස මෙහෙය වූයේය.



සුප්‍රසිද්ධ පුනරුත්පත්ති ගවේෂකයකු වන ආචාර්ය ඉයන් ස්ටීවන්සන්



Scanned with CamScanner

ආචාර්ය ස්ටීවන්සන් විසින් 1974 දී ලියා පළ කළ Twenty Cases Suggestive of Reincarnation නම් ග්‍රන්ථය බොහෝ දෙනෙකුගේ ඇස් ඇරවීමට සමත් විය. පුනරුත්පත්තිය යනු මිථ්‍යාවක් නොව විද්‍යාත්මකව ඔප්පු කළ හැකි සංසිද්ධියකි යන්න එම කෘතියෙන් ඔහු ගෙන ආ පණිවිඩයයි.

ආචාර්ය ස්ටීවන්සන් නිරීක්ෂණය කළ පරිදි පුනරුත්පත්තිය කියන දරුවන්ට එම හැකියාව ලැබෙනුයේ වයස අවුරුදු 2 ත් 4 ත් අතර අවධියේදීය. වයස අවුරුදු 4 ත් 7 ත් අතර කාලය වන විට මේ හැකියාව ක්‍රමයෙන් වියැකී යයි. පුනරුත්පත්තිය කියන දරුවෝ ද්විත්ව චරිත ඇති අය වෙති. ඔවුහු තමා පෙර ආත්මභාවයෙහි සිටි පුද්ගලයාම බව විශ්වාස කරති. ආචාර්ය ස්ටීවන්සන් විසින් පර්යේෂණයට ලක් කළ එක් දරුවෙකු කියා සිටියේ තමාගේ ස්වාමිපුරුෂයා සහ දරුවන් ජායිපූර් (Jaipur) නුවර වාසය කරන බවයි. මේ දරුවා ඊට පෙර ආත්මයෙහි ජායිපූර් නුවර කාන්තාවක්ව සිටීම ඊට හේතුවයි. පෙර ආත්මවල උසස් කුල ගෝත්‍රවල ඉපිද සිටි අය මේ ආත්මයේ දී අනවශ්‍ය ලෙස ගරුසැලකිලි බලාපොරොත්තු වන බව ආචාර්ය ස්ටීවන්සන් පෙන්වා දෙයි.

මේ සෑම අවස්ථාවකටම වඩා පුදුම සහගත ප්‍රතිඵල ඇති කරන්නේ ප්‍රතිවිරුද්ධ ලිංගිකයන් ලෙස නැවත උපදින අවස්ථාවන්හිදීය. පෙර ආත්මභාවයන්හි පිරිමින්ව සිට මේ ආත්මයෙහි ගැහැනුන්ව උපදින අයත් ගැහැනුන්ව සිට පිරිමින්ව උපදින අයත් බොහෝ අසීරුතාවන්ට මුහුණ දෙති. ඔවුන්ට නව තත්ත්වයට ගැළපෙන ලෙස සීරුමාරු වීමට අධික වෙහෙසක් ගැනීමට සිදුවේ.

පෙර ආත්මභවයන්හි ගැහැනුන්ව හිඳ මේ ආත්මභවයෙහි පිරිමින්ව උපදින අය පහත දැක්වෙන ව්‍යාකුල තත්ත්වයන්ට මුහුණ දෙති.

- ✧ ඔවුන්ගේ පෙනුම ගැහැනුන්ගේ මෙනි.
- ✧ ඔවුහු බොහෝ විට ගැහැනු කටහඬින් කතා කරති.
- ✧ ඔවුන් වැඩිපුරම ආශ්‍රය කරන්නේ ගැහැනුන්ය.



Scanned with CamScanner

✧ ඔවුහු පිරිමින් හා කායිකව එක්වීමට ප්‍රිය කරති.

✧ ඔවුහු තවදුරටත් කාන්තා ඇඳුම් ඇඳීමට ප්‍රිය කරති.

මිනිසුන් විසින් දක්වන මෙවැනි චර්යාත්මක වෙනස්කම් පැහැදිලි කර දිය හැකි එකම ක්‍රමය වනුයේ ද පෙරකී පුනරුත්පත්ති සාධකවල බලපෑම පමණකි.

පුනරුත්පත්තිය විද්‍යාත්මකව ඔප්පු කිරීමෙන් අනතුරුව පුනරුත්පත්තිවාදය හා වෛද්‍ය විද්‍යාව බද්ධ කිරීමේ කාර්යයට ආචාර්ය ස්ටීවන්සන් අත ගැසුවේය. ඔහු විසින් 1997 වර්ෂයේ දී ලියා පළ කළ Reincarnation and Biology යන ග්‍රන්ථය තුළින් වෛද්‍ය විද්‍යාවේ නොවිසඳුණු ප්‍රශ්න රැසකට සාර්ථක පිළිතුරු ලැබුණි. එම කෘතියෙන් හෙළිදරව් කෙරුණු වැදගත් කරුණු මෙසේය.

✧ හදිසි අනතුරුවලට හෝ අවි ආයුධවලින් කරන පහරදීම්වලට ලක්ව මියගිය අයගේ පසු ආත්මයන්හි සිරුර මත උපන් ලප දැකිය හැකිය. මේ උපන් ලප පෙර ආත්මයෙහි සිදු වූ මාරක තුවාලයේ හැඩය ගනී. උපන් ලපය පිහිටනුයේ ද මාරක තුවාලය තිබූ තැනෙහිමය. වෙඩි වැදීමකට ලක්ව මියගිය පුද්ගලයෙකු නැවත උපත ලබනුයේ වෘත්තාකාර ලප කැළැල් සහිතවය. ගිනිගත් තෙල් මත වැටී මියගිය අයෙකුගේ පිටෙහි එවැනි උපන් ලප ඇති වේ.

✧ දරුවන්ගේ, උපතින්ම පිහිටන ඌනතාවලින් 30% ත් 60% ත් අතර ප්‍රමාණයක් වෛද්‍ය විද්‍යාත්මකව පැහැදිලි කරදිය හැකිය.

1. උපතේ දී සිදුවන බාධාකාරී තත්ත්වයන් (birth defects)

2. ජානමය දුර්වලකම් (genetic factors)

3. ගර්භාෂයේ දී සිදුවන වෛරස් ආසාදන

4. ගර්භාෂයේ දී සිදුවන රසායනික බලපෑම් (උදා- මව දුම්පානයට ඇබ්බැහිවීමෙන් දරුවාට නිකොටින් විෂ වේ.)

5. පෝෂණ ඌනතා යනාදිය නිසා උපතින් ඇති වන ඌනතාවන්ගෙන් 30% ත් 60% ත් අතර ප්‍රමාණය හටගනියි.



Scanned with CamScanner

ඉතිරි ප්‍රමාණය සාම්ප්‍රදායික වෛද්‍ය විද්‍යාවෙන් පැහැදිලි කළ නොහැකිය. ආචාර්ය ස්ටීවන්සන් පවසනුයේ මෙවැනි උපතින් ඇති වන ආබාධ හා පුනරුත්පත්ති සාධක අතර සෘජු බලපෑමක් ඇති බවයි. ඔහුගේ පර්යේෂණවලට බඳුන් වූ එක් දරුවෙකුට නිසි පරිදි වචන උච්චාරණය කළ නොහැකි විය. මෙම තත්ත්වයට හේතු වී තිබුණේ පෙර ආත්මභවයෙහි ගෙල වැලලා ගැනීමෙන් මරණයට පත්වීමයි. ගෙල වැලලා ගෙන මරණයට පත්වීමේ දී උගුරේ ඇති වූ හිරවීම පසු ආත්මය දක්වාම ගමන් කළේය.

✧ මිනිසුන් අහේතුක ලෙස බියපත් වීම ෆෝබියා (Phobia) ගණයට අයත් මානසික රෝග ලෙස වර්ගීකරණයට ලක්වේ. සමහර විට මෙවැනි ෆෝබියාවකට මූල හේතුව වනුයේ ළදරු වියේ දී ඇති වූ කම්පනයකි. ළදරු වියේ දී පිලිස්සීමකට ලක් වූ දරුවෙක් මුළු ජීවිත කාලය තුළදීම ගින්දරට අධික ලෙස බියවීම ස්වාභාවිකය. කෙසේ නමුත් සමහර ෆෝබියාවන්ට (පැහැදිලි කර දිය නොහැකි අහේතුක බිය පත්වීම්වලට) හේතුව පූර්ව ජන්මයක සිදු වූ යම් ආපදාවක් බවයි. මෙහි පහත දැක්වෙනුයේ ආචාර්ය ස්ටීවන්සන් විසින් දක්වන ලද එවන් අවස්ථා කිහිපයකි.

1. එක්තරා දරුවෙක් ජලයට අධික බියක් දැක්වූයේය. මීට හේතුව පූර්ව ජන්මයෙහි ඔහු දියෙහි ගිලී මිය යාමයි.

2. පූර්ව ජන්මයෙහි වෙඩි වැදී මියගිය අයෙක් ගිනි අවිවලට හා වෙඩි ශබ්දවලට අධිකතර බියක් දැක්වූයේය.

3. එක්තරා පුද්ගලයෙක් වාහන දකින විට අධිකතර ලෙස බියවූයේ පූර්ව ජන්මයෙහි රිය අනතුරකින් මියගිය නිසාය.

4. මිනිසුන්ගේ අසාමාන්‍ය දක්ෂතාවලට හේතුව ජාන විද්‍යාත්මකව පැහැදිලි කළ නොහැකිය. බොහෝ විට ඊට හේතුව ඇත්තේ පූර්ව ජන්මයකය. පූර්ව ජන්මයන්හි පුහුණු කළ ඇකියාවන්ට බොහෝ දෙනෙක් වැඩි සමත්කමක් දක්වති.

5. සමහරු අසාමාන්‍ය ලෙස විවිධාකාර ආහාරපාන වර්ගවලට ඇලුම් කරති. මීට හේතුව ද ඇත්තේ ද පූර්ව ජන්මයන්හිය. මිනිස්සු පෙර ජන්මයන්හි පැවති ආහාර පුරුදු

දිගටම ගෙන යාමට උත්සාහ කරති.

මෙවැනි හෙළිදරව් කිරීම් රාශියක් කරන ආචාර්ය ස්ටීවන්සන් සෑම මවක හා පියෙකු වෙතම වැදගත් පණිවිඩයක් ද ලබාදෙයි.

දරුවන්ගේ අසාමාන්‍ය චර්යාවන්ට ඔවුන්ට බැණ වැදීම නොකළ යුතුය. මන්දයත් බොහෝ අසාමාන්‍ය චර්යාවන් පුනරුත්පත්ති සාධකවල බලපෑමෙන් සිදුවන බැවිනි.



Scanned with CamScanner

# 12. පුනරුත්පත්ති ගවේෂකයා - එඩ්ගා කේසි

නූතනයේ බටහිර රටවල වැසියනට පුනරුත්පත්තිය එතරම් නුහුරු වදනක් නොවේ. ඉංග්‍රීසි භාෂාවෙහි දැනට පුනරුත්පත්තිය හැඟවීමට වචන කිහිපයක්ම භාවිත වේ. දැනට සියවසකට පෙර පැවති තත්ත්වය මීට වඩා සහමුලින්ම වෙනස් විය. ක්‍රිස්තියානි පල්ලිය පුනරුත්පත්තිවාදය මිථ්‍යා ලබ්ධිකයන්ගේ ඉගැන්වීමක් බව කීවේය. බටහිර ජාතිකයන් සුළුතරයක් හැරුණු කොට කිසිවෙක් පුනරුත්පත්තිය ගැන විශ්වාස කළේ ම නැත. මේ තත්ත්වය උඩු යටිකුරු කරන ලද්දේ තනි මිනිසෙකු විසිනි. හේ එඩ්ගා කේසි නම් විය. ඇමරිකාවේ වර්ජිනියා බීච් හි විසූ මේ උදාරතර මිනිසා පුනරුත්පත්තිය ආශ්‍රිත පර්යේෂණ සඳහා තම ජීවිත කාලයම කැප කළේය. 1877ත් 1945ත් අතර තම කෙටි ජීවිත කාලය තුළ සාර්ථක පුනරුත්පත්ති පරීක්ෂණ 11,000 කට වඩා සිදුකර වාර්තා සුරක්ෂිතව තැබීමට තරම් මේ මිනිසා මානව හිතවාදියෙක් විය.

එඩ්ගා කේසි පුනරුත්පත්ති ගවේෂණවල යෙදුණේ ඔහුටම අනන්‍ය වූ පුදුමාකාර ක්‍රමයකටය. වයස අවුරුදු 22 වන තෙක් කේසි සාමාන්‍ය පුද්ගලයෙකු විය. මෝහන විද්‍යාඥයෙකු විසින් ඔහුව මෝහනයට ලක් කිරීමේ දී ඇති වූ කම්පනයක් නිසා ඔහුට පෙර ජාතිස්මරණ ඥානය පහළ විය. තමාගේ ද තමා ළඟ සිටින අයගේ ද පමණක් නොව දුර සිටින ඕනෑම කෙනෙකුගේ ද පූර්ව ජන්මයන් පරීක්ෂා කර බැලීමට තරම් කේසිගේ දිව්‍යමය හැකියාව ප්‍රබල විය.

කේසි තම පුනරුත්පත්ති පර්යේෂණ කළේ අමුතුම ක්‍රමයකටය. කේසි පළමුව තමා අසල යතුරු ලියන්නෙකු තබා ගනියි. පුනරුත්පත්ති පර්යේෂණයට සහභාගි කරවා ගන්නා පුද්ගලයා තමා අසලට කැඳවා හෙතෙම දිගු කවිච්චියක උඩුබැලි අතට දිගා වෙයි. අනතුරුව ක්‍රමක්‍රමයෙන් ධ්‍යානමය සමාධියකට පිවිසෙයි. එතැන් සිට අදාළ පුද්ගලයාගේ අතීත ආත්මභාවයන් ඔහු ඉදිරියේ දිග හැරෙයි. මේ ආකාරයට කේසි විසින් හෙළිදරව් කරන තොරතුරු ඔහුගේ යතුරු ලේඛකයා යතුරුලියනය කරයි.



Scanned with CamScanner

කේසි පුනරුත්පත්ති ගවේෂණ කිරීමට අමතරව කර්මජ රෝගවලට ප්‍රතිකාර කළේය. පූර්ව කෘත අකුශල කර්ම නිසා හෝ පෙර ආත්මභාවයන්හි පැවැත්මෙහි වූ දෝෂයන් නිසා මේ ආත්මභාවයේ සුව කිරීමට අපහසු රෝග සෑදෙන බව කේසි සොයා ගත්තේය. මේ ආබාධවලට ප්‍රතිකාර කර සුව කිරීමට ද ඔහුට තිබුණේ පුදුමාකාර හැකියාවකි.

කෙසේ නමුත් කේසි සතු දිව්‍යමය විඥානයේ සීමාවක් තිබූ බව ඔහුගේ වාර්තා අධ්‍යයනය කරන්නන්ට පැහැදිලි වෙයි. ඔහු කිසිදින ප්‍රේතාත්ම හෝ දිව්‍යමය ආත්ම දැක නැත. එමෙන්ම පෙර ආත්මභාවයන්හි මිනිසුන් හැර වෙනත් ආත්මභාවයන් ලැබ සිටි අවස්ථා ඔහුගේ දිවැසට විෂය වී නැත.



Scanned with CamScanner

# 13. එඩ්ගා කේසි හෙළි කළ අපූරු සබඳතා

පෙර ආත්මභවයන්හි කළ කී දෑ මේ ආත්මභාවයට බලපාන ආකාරය අපූරු නිදසුන් මගින් පෙන්වා දීමට කේසි සමත් විය. මෙහි පහත දැක්වෙනුයේ කර්මය හා පුනරුත්පත්තිය අතර සම්බන්ධය හෙළි කරන එවැනි අවස්ථා කිහිපයකි.

1. ආහාර අරුචිය ඇති එක් පුද්ගලයෙකුට එම රෝගය ඇති වී තිබුණේ පෙර ආත්මභාවයක කළ කෑදරකම් නිසාවෙනි.

2. එක් දරුවෙකු රක්තහීනතාවයෙන් පෙළුණේ පෙර ආත්මභාවයක මිනීමරු රජ කෙනෙකුව සිටි බැවිනි.

3. නව හැවිරිදි දරුවෙක් රාත්‍රියේ නින්දෙන් ඇඳ තෙමීම සිදු කළේය. මෙම රෝගයට හේතු වූයේ පෙර ආත්මයක වධකයෙකු ලෙස පත්වීම් ලැබ ගෝත්‍රික ආගම් අදහන්නවුන් දියේ ගිල්වා මැරීමෙන් කරන ලද පාපයයි.

4. පෝලියෝ රෝගය සෑදී කොර බවට පත් වූ කාන්තාවකට එම ඇබැද්දිය සිදු වූයේ පෙර ආත්මභාවයක ඇය රෝම රජ මැඳුරේ ජීවත්ව සිටිය දී මිනිසුන්ට සතුන් ලවා වධහිංසා කරවනු දැක සතුටු වූ නිසාය.

5. එක්තරා තරබාරු ගැහැනියකට එම ඇබැද්දිය සිදු වී තිබුණේ ඇය පෙර ආත්මයක රූමතියක්ව සිටිය දී තරබාරු අයට සමච්චල් කළ බැවිනි.

6. විකෘති කාමාශාවලින් පෙළෙන අයෙකු එම තත්ත්වයට පත් වූයේ පෙර ආත්මයක එවැන්නන්ගේ අඩුපාඩු ප්‍රසිද්ධියේ විවේචනය කළ බැවිනි.

7. එක් රූමතියක් මේ භවයේ දී අතිශයින් රූමත් වූයේ පෙර භවයක දී ගිලනුන්ට උපස්ථාන කළ බැවිනි.

8. මේ ආත්මයේ කාමාතුර ලෙස ජීවත් වන අයට ඊළඟ ආත්මයේ ඊට දඬුවම් ලැබේ. ඔවුනට අපස්මාරය වැනි රෝග වැලඳේ.



Scanned with CamScanner

9. ඔබ මේ ආත්මයේ අනුන්ගේ දුකට කන් නොදුන්නහොත් ඊළඟ ආත්මයේ බිහිරෙකුව ඉපදීමට ඉඩ ඇත.

10. ගිය ආත්ම භාවයේ පිරිමින් පිළිකුල් කළ ගැහැනියකට මේ ආත්ම භාවයේ විවාහ වීමට නොහැකි වූයේ එම කර්මයේ විපාක වශයෙනි.



Scanned with CamScanner

# 14. එඩ්ගා කේසිගේ ජීවන දර්ශනය

එඩ්ගා කේසිගේ ඉගැන්වීම් විග්‍රහ කරන අය ඔහු ආත්මවා-දියෙකු කොට සලකති. එම කියමනෙහි සත්‍යතාවයක් ද ඇත්තේය. කෙසේ නමුත් කර්මය හා පුනර්භවය පිළිබඳව ඔහු කළ නව සොයාගැනීම් සියලු ලෝකවාසීන්ටම වැදගත් වනු ඇත. මෙහි පහත දැක්වෙනුයේ කේසිගේ එවැනි සොයාගැනීම් කිහිපයකි.

1. සත්ත්වයෝ ක්ෂුද්‍ර ජීවීන් ලෙස උපත ලබා ක්‍රමක්‍රමයෙන් ඉදිරියට පරිණාමය වෙති. ඔවුහු ක්‍රමයෙන් විශාල සතුන් බවට පත්වී අවසානයේ මිනිසුන් බවට පත් වෙති.

2. මිනිස්සු නැවත නැවතත් ඉපදෙමින් ආත්මීය පරිණාමයකට ලක්වී ක්‍රමක්‍රමයෙන් තම වැරදි නිවැරදි කර ගනිති.

3. අප විසින් කරන ලද කිසියම් කර්මයකට විපාක ලැබෙනුයේ අප නිවැරදි මාර්ගයකට ගැනීම සඳහාය. අපගේ චිත්ත සන්තානය තුළ ඇති වැරදි අදහස් නිවැරදි කරගන්නා තුරු කර්මය අපට එළව එළවා පහර දෙයි.

4. පෙර ආත්මවල නෑදෑ හිතවතුන්ව සිටි අය නැවත නැවතත් නෑදෑ හිතමිතුරන්ව උපදිති. ඔවුන් අතර පවතින කර්ම බැඳීම් හා කර්ම ණය එවැනි එක්වීම්වලට හේතුවේ.

5. යමෙකු යම් විවාහයක් කරගනුයේ කර්ම බැඳීමක් නිසා හෝ කර්ම ණයක් නිසාය. මේ ආකාරයට එක් පුද්ගලයෙකු හා විවාහයට ගැළපෙන තවත් 25 දෙනෙක් පමණ ලෝකයේ විවිධ තැන්වල වෙසෙති.

6. පූර්ව ජන්මයන්හි අප ලද අත්දැකීම් අපගේ යටි සිතෙහි තැන්පත්ව පවතී. ඒවා ආශාවන් ලෙස, අප්‍රිය කරන දේ ලෙස, රෝගාබාධ ලෙස, හැකියාවන් ලෙස හෝ දුබලතා ලෙස වරින් වර ඉස්මතු වේ.

7. මෙලොව සිදුවෙන සියලු සිදුවීම් ආකාශය තුළ වාර්තාගතව පවතී. ආකාශය තුළට සිත සුසර (Tune) කරන කෙනෙකුට අනාගතය දැනගත හැක්කේ මේ හේතුව නිසාය.



Scanned with CamScanner

8. පෙර ආත්මභාවයන්හි අසීමිත ලෙස ආශාවන් පසුපස ලුහුබැඳ ගිය අය එක්කෝ ඉන්ද්‍රිය දුර්වලතාවයෙන් යුතුව උපදිති. නැතහොත් ඔවුහු ඊට හාත්පසින්ම වෙනස් චරිතයක් බවට පත්ව උපදිති.

9. කර්මය බූමරංගයක් මෙන් ආපසු කැරකී එයි.

10. කර්මය විපාක දෙන තෙක් ඕනෑම කාලයක් බලා සිටියි. එය විපාක දෙනුයේ විපාක දීමට සුදුසු අවස්ථාවක් පැමිණි විටයි. එතෙක් එය සැඟව පවතියි.

11. කර්ම විපාකවලට තුඩු දුන් තම චර්යාමය හෝ චින්තන දුබලතා හඳුනාගෙන එම වැරදි නිවැරදි කළහොත් ඒ කර්ම අප පසුපස එළවා ඒම නවතී.

12. යමෙකුට නපුරක් කිරීම මෙන්ම උදව් අවැසි අයට උදව්, නොකර සිටීම ද බලගතු පාප කර්මයකි. ඊට 'අකරණීය කර්ම' යන නම යෙදිය හැකිය.

13. සිරුරට අධික දුක්දීම හෝ අධික සැපදීම කළහොත් ඊළඟ ආත්මභාවවල එහි විපාක විඳින්නට සිදුවනුයේ අනික් අන්තයට යාමෙනි.

(උදා: අධික ලෙස සිරුරට සැප දුන් අය කෘශව ඉපදීමට හැකිය.)

14. මිනිස්සු පෙර ආත්මභාවවල ඉපිද සිටි පෙදෙස්වලට යාමට ප්‍රිය කරති.

15. ඔබට දැනෙන අස්ථාන බියට හේතු වනුයේ පූර්ව ජන්මයක ලද අමිහිරි අත්දැකීමකි.

(උදා: සමහරු වැසූ කාමරවල තනිව සිටීමට බියවෙති. පූර්ව ජන්මයක සිරගතව සිටීම ඊට හේතුව විය හැකිය.)

16. සියදිවි නසාගැනීම පාප කර්මයකි. එය නපුරු විපාක ගෙනදේ. සමහරවිට මෙය ආත්ම ගණනක් පුරුද්දට යා හැකිය.

17. උපදින සත්ත්වයාට තම අනාගත මව්පියන් තෝරා



Scanned with CamScanner

ගැනීමට තරමක නිදහසක් ඇත. එනමුත් ඔවුහු තම කර්ම ණය ගෙවී යන ආකාරයේ මව්පියන් වෙත යති.

18. ඔබ මේ ආත්මභාවයේ එක්රැස් කරන දක්ෂතා පසු ආත්මයක ඔබේ සහයට සිටියි. පෙර ආත්මයක පුහුණු කළ විෂයක් හැදෑරීමෙන් මේ ආත්මයේ එහි නිපුණත්වය කෙටි කලකින්ම ලද හැකිය.

19. ඔබේ උත්සාහය කිසිදින අපතේ නොයයි. මේ ආත්මභවයේ යමක් සඳහා උත්සාහ කර අසාර්ථක වුවද ඊළඟ ආත්මයේ ඒ උත්සාහය මල්ඵල ඇරීමට හැකිය.

(උදා: වෛද්‍යවරයෙකු වීමට ගන්නා උත්සාහය)

20. කර්මය ඔබ පසුපස එළව එළවා විපාක දෙනුයේ හේතු දෙකක් මතය.

i. ඔබ කළ වැරදිවලට ඔබ විසින් වන්දි ගෙවිය යුතුය.

ii. ඔබව ක්‍රමක්‍රමයෙන් ඉහළ මානසික තලයකට ගෙන ඒමට "විශ්වීය නිර්මාපක බලවේගය" බලාපොරොත්තු වෙයි. ඔබ කර්ම විපාකවලට මුහුණ දෙනුයේ "පාඩම්" ඉගෙන ගැනීමටය. ඒ පාඩම් තුළින් ඔබේ ආත්මය තුළ ඇති වැරදි එකිනෙක නිවැරදි කරගැනීම අපේක්ෂා කරනු ලැබේ.



Scanned with CamScanner

# 15. මනෝකාය සහ මනෝමයකාය

"මනෝකාය" හෙවත් ශක්ති ශරීරය (Astral body) මෑතක සිට බහුලව සාකච්ඡාවට භාජනය වන මාතෘකාවකි. සමහරු බුදු දහම තුළ මනෝකාය පිළිගන්නා බව කියති. අනෙක් අය කියනුයේ මනෝකාය පිළිබඳ සංකල්පය බුදු දහමට කිසිසේත් එකඟ නොවන බවයි. මනෝකාය යන්නෙන් අදහස් වන්නේ කුමක්ද? සැබැවින්ම එවැන්නක් පවතීද?

මනෝකාය යනු හින්දු අධිමානසික විද්‍යාවේ අනාදිමත් කාලයක සිට විස්තර වන සංකල්පයකි. අපගේ ශරීරයට වඩා සූක්ෂම වූ ශක්ති ශරීරයක් ගැන ඉපැරණි උපනිෂද් ග්‍රන්ථවල කියවේ. උපනිෂද් මුනිවරු ඊට 'ආත්මන්' යන නම තැබූහ. දැනට වසර 2500 කටත් වඩා එපිට ජීවත් වූයේ යැයි සැලකෙන උපනිෂද් මුනිවරුන්ගේ විස්තර අනුව ආත්මන් හෙවත් ආත්මය පහත සඳහන් ලක්ෂණවලින් යුක්තය.

✧ ආත්මය විනාශ කළ හැකි දෙයක් නොවේ.

✧ මිනිසාගේ ශරීරය ගින්නෙන් දැවුණ ද ආත්මය දැවී නොයයි.

✧ මිනිසා සිරුර හැර යන්නේ ආත්මය ද සමගය.

✧ සිරුර හැරදා යන ආත්මය නව ශරීරයට ඇතුළු වෙයි.

✧ ආත්මය විසින් සිරුර හැර දැමීමත්, නව සිරුරක් වෙත ගෙවැදීමත් දිගින් දිගටම සිදුවේ. ඊට සංසාරය හෙවත් පුනරුත්පත්ති ක්‍රියාවලිය යයි කියනු ලැබේ.

✧ ආත්මය සිරුරෙන් වෙන්වී නැවත සිරුරකට බද්ධ නොවන තැනට පත්වීම මෝක්ෂයයි.

✧ ව්‍රත සමාදානයෙන් ද තපසින් ද භාවනාවෙන් ද බලාපොරොත්තු වන්නේ ආත්මය සිරුරෙන් වෙන් කිරීමයි.

✧ ආත්මය මෙලෙස සිරුරෙන් වෙන් වී ගිය කල එය පරමාත්මය සමග එක්වෙයි. පරමාත්මය යනු විශ්ව නිර්මාපක



Scanned with CamScanner

බලවේගයයි. ඊට බ්‍රහ්මන් යයිද කියති.

පෙර කී ආත්මය හා පරමාත්මය යන කරුණු දෙකම තරමක් වියවුල් සහගත ස්වභාවයක් ගත්තේය. ආත්මය යනු කෙබඳු දෙයක් ද යනුවෙන් විස්තර කරදීම අපහසු බව උපනිෂද් මුනිවරුන් පවා පිළිගත් දෙයකි. එමෙන්ම පරමාත්මය කවරාකාර වේද යන්න පිළිබඳ එකඟතාවයකට පැමිණිය නොහැකි විය.

✧ විශ්ව නිර්මාපක බ්‍රහ්මන් පුරුෂ රූපාකාරයක් ගන්නා බවත් ඔහුට බිරිඳක් ද සිටින බවත් සමහරු සිතූහ.

✧ බ්‍රහ්මන් යනු බඹසර රකින අයෙකු බවට ද මතයක් විය.

✧ විෂ්ණු ලොව නිමවන අතර ශිව ලොව නසන බවට ද විශ්වාසයක් විය.

✧ බ්‍රහ්ම, විෂ්ණු හා ශිව යන තිදෙනාම එක් අයෙක් බවට ද මතවාද පළ විය.

ක්‍රිස්තු වර්ෂ පළමු සියවස පමණ වන විට මේ මතවාද උණුසුම් ස්වරූපයකට හැරුණි. හින්දු ඇදහිලි ක්‍රම දෙදරා යන තත්ත්වයක් උද්ගත විය. අතිශය බුද්ධිමත් හින්දු යෝගියෙකු වූ ශංකර් මේ පැනයට පිළිතුරක් සොයමින් සිටියේය. හේ බෞද්ධ භික්ෂුවක් ලෙස මහණ වී බුදු දහම ඉගෙන ගත්තේය. බුදු දහම ගැන ඔහු කළ අධ්‍යයනයන්ගෙන් පසු කදිම අදහසක් ඔහුට පහළ විය.

"ආත්මය හා පරමාත්මය යනු දෙකක් නොව එකකි."

හින්දු ඇදහිල්ල පිළිබඳව තිබූ බොහෝ ප්‍රශ්නවලට පිළිතුර මේ ප්‍රකාශය තුළ විය. ශංකර් හෙවත් ශංකරාචාර්යගේ ඉගැන්වීම් කෙටි කලක් තුළ හින්දූන්ගේ පිළිගැනීමට ලක්විය. අද්වෛතවාදය හෙවත් ආත්මය හා පරමාත්මය යනු එකකි යන ඉගැන්වීම තුළින් හින්දු ආගම ඇඩි හා ස්ථිර පදනමක් මත සවි විය.

හින්දු ආගම සමග සමගාමීව වර්ධනය වූ ජෛනාගම තුළ ද ආත්මයක් ඇතැයි පිළිගැනෙයි. ආත්මය ශරීරය තුළින් ඉවත් වී නැවත ශරීරයක් වෙත පැමිණීම පුනරුත්පත්තියයි. භාවනා කර



Scanned with CamScanner

සිත දියුණු කර සියලු ආශාවන් අත් හැරීමෙන් ආත්මය හා කය අතර ඇති බන්ධනය ලිහී යයි. එයින් සැහැල්ලු බවට පත්වන ආත්මය විශ්වයේ ඈතට ගොස් සදාකාලික සැප ඇති භූමියට සැපත් වෙයි. මේ ආත්මය සහ මෝක්ෂය පිළිබඳ ජෛන ඉගැන්වීමයි.

ආත්මය පිළිබඳ ඉගැන්වීම් මේ ලෙස මුහුකුරා යද්දී තව පිරිසක් ආත්මය පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණ පවත්වන්නට පටන් ගත්හ. ඒ හින්දු යෝගී පිරිසකි. ඔවුහු විවිධාකාර උපක්‍රම ඇසුරෙන් ආත්මය මෙල්ල කරන්නටත් එය ශරීරයෙන් එළියට ඇදගන්නටත් උත්සාහ කළහ. විවිධාකාර යෝගාභ්‍යාස ඇසුරෙන් සිත හා කය පුහුණු කර "ආත්මය" එළියට ඇදගැනීමට හින්දු යෝගීහු සමත් වූහ. එළියට ඇදගත් ආත්මයේ ස්වරූපය ඔවුහු පැහැදිලිව දුටුවහ. මිනිස් සිරුරට සමාන හැඩරුව ඇති ඒ ශක්ති ශරීරය විවිධ නම්වලින් හඳුන්වනු ලැබීය. තම කයින් එළියට ඇදගත් ආත්මය සමග විවිධ තැන්වල සැරිසරා නැවත ඒමට තරම් හින්දු යෝගීහු දියුණු තත්ත්වයකට පැමිණියහ. සමහරු තම ආත්මය මළ සිරුරු තුළට ඇතුළු කර ඊට පණ දුන්හ. තවත් අය විනෝදයට "ආත්ම" හුවමාරු කරගත්හ. ඒ අනුව පරකාය ප්‍රවේශය පිළිබඳ හින්දු යෝග විද්‍යාව දියුණු විය.

පරකාය ප්‍රවේශය පිළිබඳ හින්දු යෝග විද්‍යාවට වසර 2000 කටත් වඩා දිග ඉතිහාසයක් ඇත. දැනට වසර 2000 කට පමණ පෙර විසූ ශංකරාචාර්ය පරකාය ප්‍රවේශය පිළිබඳ ශාස්ත්‍රයේ කෙළ පැමිණියෙකි. හේ තම රටෙහි රජු මියගිය පසු මෘත ශරීරයට ඇතුළු වී රජබිසව සමග දින තුනක් රජ සැප වින්දේය. බිසව කල්පනා කළේ රජු නින්දෙන් නැගිටි බවයි. කෙසේ වෙතත් ශංකරාචාර්යගේ ශිෂ්‍යයෝ මේ රහස් දැන සිටියහ. ඔවුහු ශංකරාචාර්යගේ මනෝකාය (ආත්මය) නැවත පැමිණෙන තුරු දින තුනක් ඔහුගේ අප්‍රාණික ශරීරය අසල රැකවල් ලා සිටියහ.

ශංකරාචාර්ය මේ ශාස්ත්‍රයේ කෙතරම් කෙළ පැමිණි අයෙක් ද යත් ඔහු මියගොස් නැවත නැවතත් ශංකරාචාර්ය ලෙස උපදියි. ශංකරාචාර්ය මියගොස් නැවත නැවතත් ශංකරාචාර්ය ලෙස ඉපදීමේ ප්‍රතිපත්තිය 20 වන සියවස දක්වාම නොනැවතී ගලා ආවේය.



Scanned with CamScanner

හින්දූන්ගේ ආත්ම හුවමාරු කිරීමේ ක්‍රීඩාව දෙස බලා සිටි බෞද්ධ යෝගීන්ට මේ අපූරු සෙල්ලමට සහභාගිවීමේ ආශාව නිතැතින්ම ඇති විය. එනමුත් බෞද්ධයන් යනු ආත්මවාදය තදින්ම ප්‍රතික්ෂේප කළ අයයි. බෞද්ධ යෝගීහු ආත්මයක් නොව "මනෝකායක්" ගැන විශ්වාසය තබමින් ආත්ම හුවමාරු කිරීමේ සහ පරකාය ප්‍රවේශය යන ක්‍රීඩාවන්ට අත ගැසූහ. නාලන්දා විශ්වවිද්‍යාලය බෞද්ධ හා හින්දු මතවාද මිශ්‍රවීම හොඳින්ම සිදු වූ තැනකි. නාලන්දාවේ සිටි බෞද්ධ යෝගීහු පරකාය ප්‍රවේශය පිළිබඳ උපක්‍රම ඉතා උසස් අයුරින් දියුණු කළහ. නාලන්දා ගුරු පරපුරේ විශිෂ්ටතමයෙකු වූ මහාචාර්ය නාරොපා නාලන්දාවෙහි පීඨාධිපති පදවිය ද හැරදමා අධිමානසික අභ්‍යාස ප්‍රගුණ කරන්නට වන වැදුණේය. තිලෝපා ගුරුතුමා හමුවීම නාරොපාගේ දිවියෙහි වැදගත්ම සන්ධිස්ථානයයි. නාරොපා, තිලෝපා ඇසුරේ සිට පරකාය ප්‍රවේශය ඇතුළු මනෝකාය සම්බන්ධ අභ්‍යාස රාශියක් ප්‍රගුණ කළේය. මේ අභ්‍යාස කෙතෙක් ප්‍රබල වීද යත් නාරොපාගේ ජීවිතයේ අවසාන කාලය තුළ ඔහුගේ ශරීරය දැකගත හැකිවූයේ ධ්‍යාන වඩන ලද අයට පමණි. ඒ තරමටම ඔහුගේ ශරීරය සූක්ෂම බවට පත්වී තිබුණි.

නාරොපාගේ සිසුන් වන තිබ්බත ජාතික මිලාරෙපා සහ මාර්පා තිබ්බතයේ සිට මේ අබිරහස් යෝග විද්‍යාව උගන්වන්නට පටන් ගත්හ. මිලාරෙපාගේ සිසු පරපුර අද දක්වාම තිබ්බතයේ සිට මේ අබිරහස් යෝග ක්‍රම රහසේ හුරු කරති. ඔවුහු මනෝකාය සහ ආත්මවාදය පටලවා ගැනීමක් නොමැතිව ශරීරය තුළ ඇති සූක්ෂම ශක්ති කලාප පාලනය කර විවිධ දස්කම් පෑමට හැකියාව ලබා ගනිති.

"මනෝමය කාය" නිර්මාණය පිළිබඳ බෞද්ධ ක්‍රමවේදය මුල් බුදුසමය තෙක් ඈතට දිවයයි. තමාගේ ශරීරය වැනිම වූ මනෝමය කයක් මැවීමේ ක්‍රමයක් ගැන දීඝ නිකායේ සූත්‍ර කිහිපයකම කරුණු දැක්වේ. චතුර්ථ ධ්‍යානයට පැමිණ එම ධ්‍යානය තුළ නිසල වූ යෝගියාට ධ්‍යාන සිත ශක්තිමත් කිරීමෙන් පසු අංග සම්පූර්ණ කයක් මැවීමට හැකි බව සාමඤ්ඤඵල සූත්‍රයේ කියවේ. මෙහි දී මනෝමය කය මවනුයේ කොපුව තුළින් කඩුව ඇදගන්නාක් මෙනි. නැතහොත් සර්පයෙකු හැව අරින්නාක් මෙනි.



Scanned with CamScanner

එසේත් නැතහොත් මෘදු තල්ගොබයක් එළියට ඇදගන්නාක් මෙනි. කෙසේ නමුත් "මනෝකාය" සහ "මනෝමයකාය" අතර පැහැදිලි වෙනසක් දැකිය හැකිය. මනෝකාය යනු හින්දු යෝගීන් හා සමහර බෞද්ධ යෝගීන් පිළිගනු ලබන සංකල්පයකි. මනෝකාය ශරීරය තුළ රැඳී පවතින ඉන් එළියට ඇදගත හැකි එකකි. දෙවනුව කී "මනෝමයකාය" සෘද්ධි බලය අනුව මවන එකකි. සෘද්ධි ප්‍රාතිහාර්යය නිම කළ විගස මනෝමයකාය අතුරුදහන් වේ.

මේ පිළිබඳ කදිම කතා පුවත් කිහිපයක්ම ඇත. චුල්ලපන්ථක හිමි මනෝමයකාය මැවීමේ විශේෂඥයෙකි. උන්වහන්සේ තමා වැනිම වූ භික්ෂූන් වහන්සේලා රාශියක් මවා පෙන්වූහ. එදින චුල්ලපන්ථක හිමියන්ට දනට ආරාධනා කරන්නට පැමිණි පුද්ගලයාට මේ ප්‍රහේලිකාව විසඳාගත නොහැකි විය. බුදුහු ඊට කදිම පිළිතුරක් සැපයූහ. පළමුව තමා චුල්ලපන්ථක යැයි කියන භික්ෂුව අතින් අල්ලාගත යුතු බව එම උපදේශයයි. බුදුන්ගේ උපදේශය අනුව ක්‍රියා කළ උපාසකයා නියම චුල්ලපන්ථක හිමියන්ගේ අතින් අල්ලා ගත්තේය. ඒ සමග මනෝමය රූප පෙළ අතුරුදහන් විය. මනෝමය රූප මැවීම පිළිබඳ මෙවැනිම කතා කිහිපයක් අටුවා ග්‍රන්ථවල දැක්වේ.

හින්දු යෝගීන් සිය "මනෝකාය" එළියට ඇදගනුයේ මීට වෙනස් ක්‍රමයකටය. ඔවුහු ඒ සඳහා සිය සිරුරේ ඇති ශක්ති මධ්‍යස්ථාන සූසර කරති. ඉන්පසු මනෝකාය හිස් මුදුනින් එළියට ඇදගනු ලැබේ. තිබ්බත යෝග විද්‍යාව ප්‍රගුණ කරන අයට මීට වඩා පහසුවෙන් "මනෝකාය" එළියට ඇදගත හැකිය. තිබ්බත යෝගීන් එය වඩා ලෙහෙසියෙන් කරනුයේ චිත්ත රූප ආධාරයෙනි. චිත්ත රූප ඇසුරෙන් මනෝකාය එළියට ඇදගත හැකි බව බටහිර පර්යේෂකයෝ පවසති. මෙහි දී පළමුව තම කයෙහි ප්‍රමාණයට තවත් කයක් තම කය තුළම ඇතැයි සිතෙන් දැකිය යුතුය. අනතුරුව ඒ කය ක්‍රමක්‍රමයෙන් කුඩා වෙමින් සිරුර තුළ ඉහළ නගින බව දැකිය යුතුය. අවසානයේ එය අබ ඇටයක් තරම් කුඩා වෙමින් හිස මුදුනින් පිටවී යන බව දැකිය යුතුය. මෙම මානසික අභ්‍යාසය කිහිප දිනක් කරන විට සාර්ථක ප්‍රතිඵල ලැබෙයි.

මෙලෙස මනෝකාය එළියට ඇදගත් පසු එය සිහින් හුයකින්



Scanned with CamScanner

සිරුරට සම්බන්ධව පවතින බව හින්දු යෝගීහු කියති. යම්කිසි හේතුවකින් මේ අදෘශ්‍යමාන නූල බිඳී ගියහොත් යෝගියාට තම කය වෙත ආපසු ඒමට නොහැකි වේ. එවැනි අවස්ථා විරල වන නමුත් එලෙස තම කයට නැවත පැමිණීමට නොහැකි වූ යෝගීන් ගැන තොරතුරු වාර්තා වී ඇත.

හින්දූන් මනෝකාය හා ආත්මය එකක් කොට සැලකූ බව මුල් විස්තරයේ දී අපි දුටුවෙමු. තවද, මනෝකාය යනුවෙන් යමක් පැවතීමට ඇති ඉඩකඩ ද බැහැර කළ නොහැකිය. කෙසේ වෙතත් එය "ආත්මය" නම් නොවේ. මන්දයත් ආත්ම වශයෙන් ගැනෙනුයේ සදාකාලික වූ අවිනාශී බලවේගයක් වන බැවිනි. සදාකාලිකව පවතින කිසිවක් නොමැති බව ප්‍රත්‍යක්ෂව වැටහෙන හෙයින් ආත්මයක් තිබිය නොහැකි බව පැහැදිලිය. එනමුත් පෙර කී අද්භූත සිද්ධි අනුව මනෝමයකයක පැවැත්ම ස්ථිර කළ හැකිය. ඊට සූක්ෂම ශරීරය (Astral body) යනුවෙන් ව්‍යවහාර කිරීමේ වරදක් ද නැත.



Scanned with CamScanner

# 16. මරණයේ දී සිරුර හැර යන මනෝකාය

මිනිසාගේ මරණය සනිටුහන් කරන කරුණු 4ක් ඇති බව වෛද්‍යවරු පෙන්වා දෙති.

- ✧ සිහිය නැතිවීම.
- ✧ ශ්වසනය නැතිවීම.
- ✧ හෘදස්පන්දනය නැවතීම.
- ✧ මොළයේ විද්‍යුත් කම්පනයන් නැවතීම.

යමෙක් මරණයට පත්වී යයි කියනු ලබන්නේ මේ කරුණු සතරම එක් වූ විටය. පුද්ගලයෙකු මරණයට පත්වීමේ දී ඔහුගේ සිහිනුවණ ක්‍රියාකරන ආකාරය පිළිබඳව මෑත කාලීනව පර්යේෂණ රාශියක් සිදුකර ඇත. ඒ අනුව, පුද්ගලයකු සායනික ලෙස (වෛද්‍යවරුන් පිළිගන්නා පරිදි) මරණයට පත්වීමට පෙරාතුව ඔහුගේ සිහිනුවණ ඔහු හැරදමා යන බව පැහැදිලි වී ඇත. එලෙස කය අත්හැර යන පුද්ගලයා සූක්ෂම ශරීරයක් දරමින් තමා අත්හැර දමා ගිය ශරීරය අසලම සැරිසරන බවත් පර්යේෂකයෝ කියති. මේ අවස්ථාවට පුද්ගලයෙකු පත්වීම ගැන සුලබ උදාහරණ මතු දැක්වේ.

1. පුද්ගලයෙකු තදබල රිය අනතුරකට මුහුණපාන සමහර විටක එම පුද්ගලයාට තමා කයෙන් ඉවතට ඇදී යනු දැනෙයි. මෙහි දී තමාගේ කයට මඳක් ඉහළින් සිට අනතුරට පත් වූ ශරීරය දෙස බලා සිටි බව ඒ සිද්ධීන්ට මුහුණ පෑ අය විස්තර කර ඇත.

2. හෘදයාබාධවලට ලක් වූ සමහර පුද්ගලයන්ට තමා භෞතික කය අත්හැර දමා එළියට පැමිණ සිටින බව දැනී ඇත.

3. ඇමරිකානු ගගන විද්‍යා ආයතනය මගින් අභ්‍යවකාශගාමීන් පුහුණු කිරීමේ දී ඔවුන්ට හදිසි කම්පන හා පීඩන දරා සිටීමට පුහුණු කරවනු ලැබේ. එහි දී සීසෝවක් වැනි උපකරණයක අභ්‍යවකාශගාමියා හිඳුවා එම උපකරණය වේගයෙන් භ්‍රමණය කරවයි. මේ උපකරණයේ වේගය තව තවත් වැඩි කරද්දී තමා කය අතහැර එළියට විසිවෙන වග අභ්‍යවකාශගාමීන්ට දැනී ඇත.



Scanned with CamScanner

හරියටම එම අවස්ථාවේ දී අභ්‍යවකාශගාමියාගේ සිරුර අප්‍රාණික වේ.

4. සමහර පුද්ගලයෝ නින්දේ දී තමාගේ සිත විසින් කය හැරදමා ගිය බවට වෛද්‍යවරුන්ට පැමිණිලි කරති. සමාජයේ සිටින බහුතරයක් මෙම අත්දැකීමට එක වරක් හෝ පත්ව ඇති බව කියනු ලැබේ. නින්දෙන් තම ශරීරය අතහැර බැහැරට පැමිණි පුද්ගලයන් විසින් තම සිරුර නිදි යහන මත ඇති ආකාරය නිරීක්ෂණය කරනු ලැබ ඇත.

5. භාවනා අභ්‍යාස ප්‍රගුණ කරන අයට තම සිත කය හැරදමා ඉහළ යන අවස්ථාවන් නිරීක්ෂණය කළ හැකිය.

මෙකී සෑම අවස්ථාවකම පොදුවේ නිරීක්ෂණය කළ හැකි අත්දැකීම් මෙසේය.

✧ තම සිරුර අතහැර ගිය සෑම දෙනාටම පාහේ මහත් සැහැල්ලුවක් දැනී ඇත.

✧ කය අතහැර යාමත් සමගම කායික වේදනා සියල්ල පහ වෙයි.

✧ තමාට රිසි පරිදි ගුවනේ පාවී යාමේ හැකියාව ලැබෙයි.

✧ මේ අවස්ථාව වන විට තමාගේ සූක්ෂම ශරීරය කෙතරම් සැහැල්ලුද යත් තමාට සිතෙන සිතෙන දිශාවට සිරුර පාවී යයි.

✧ මෙකී සූක්ෂම ශරීරය සහිත සත්ත්වයා තමා අසල වන දේ හොඳින් දකියි.

✧ මොහුගේ සූක්ෂම ශරීරය පෙර භවයේ හැඩ රුවට සමාන වේ. සිරුරෙන් වෙන්ව ගිය සත්ත්වයා (සූක්ෂම කය) අත්දකින මෙවැනි දේට සිරුරෙන් බැහැර අත්දැකීම් (Out of body experience) යන නම ව්‍යවහාර වේ.

සත්ත්වයාගේ මරණයත් සමග ඔහුගේ මනෝකාය (Astral body) සිරුර හැර යන්නේය යන මතය බුදු දහමට කෙතෙක් දුරට එකඟද? සත්ත්වයා සිරුර හැර යන අවස්ථාව පිළිබඳව කදිම විස්තරයක් සූත්‍ර පිටකයේ මහා තණ්හා සංඛ්‍යය සූත්‍රයෙහි දැක්වේ.



Scanned with CamScanner

එම විස්තරය මෙසේය.

බුදුන් කල විසූ සාති නම් භික්ෂුවක් ධර්ම කථිකයෙකු ලෙස ප්‍රසිද්ධව සිටියේය. සත්ත්වයාගේ විඤ්ඤාණය (හෙවත් සිහිය/ Consciousess) මරණින් මතු සිරුර හැර යන්නේය යන මතය මෙම භික්ෂුවගේ දේශනා තුළ අන්තර්ගත විය. බුදුහු ඒ මතය තරයේ ප්‍රතික්ෂේප කළහ. සත්ත්වයාගේ මරණයත් සමග විඤ්ඤාණය බැහැර වී යාමක් සිදුනොවෙයි. ඒ වෙනුවට සිදුවන්නේ පටිච්චසමුප්පාදයට අනුකූලව තවත් උපතක් ලැබීමයි. (මහා තණ්හා සංඛෙය්‍යය සූත්‍රය)

කෙසේ නමුත් සත්ත්වයකුගේ මරණින් මතු සූක්ෂම සිරුරක් දරමින් සත්ත්වයා සිය කයෙන් ඉවත් වන්නේය යන පොදු මතය බුදුදහමට පටහැනි නොවේ. ඒ බව පහත දැක්වෙන උදාහරණවලින් පැහැදිලිවේ.

1. ගෝධික නම් භික්ෂුව සියදිවි හානි කරගත්තේය. භික්ෂුවගේ මළ කඳ අබියස අඳුරු පැහැ දුමාරයක් ඒ මේ අත යනු බොහෝ දෙනෙක් දුටුවහ. එලෙස දුමාරයක් ලෙස පෙනුණේ මාර දිව්‍ය පුත්‍රයා බව බුදුහු භික්ෂූන් වහන්සේලාට පැවසූහ. පාපී මාරයා ගෝධික භික්ෂුවගේ විඤ්ඤාණය කොහි ගියේ දැයි සොයයි. ගෝධික භික්ෂුව ගෙල සිඳගෙන මරණයට පත්වෙද්දීම පිරිනිවන් පෑ බැවින් උන්වහන්සේගේ විඤ්ඤාණය අභාවයට ගොස් තිබුණි.

2. සෝවාන් වූ පුද්ගලයා මිය ගිය පසු ඔහු තම සිරුරෙන් ඉවත් වේ. සැහැල්ලු වූ ඔහුගේ සිරුර ඉහළට ගොස් දිව්‍ය ලෝකයක් කරා සැපත් වේ, යන කරුණ සංයුක්ත නිකායේ ඇත. මෙම ඉගැන්වීම මනෝකාය පිළිබඳ නූතන මතවාද සමග හොඳින් පෑහෙයි.



Scanned with CamScanner

# 17. මනෝකාය දැකගත හැකිද?

මිනිස් ශරීරය තුළ පවතින තවත් සූක්ෂම කයක් ලෙස මනෝකාය හැඳින්විය හැකිය. මනෝකාය පිළිබඳව කුතුහලයකින් යුතුව ප්‍රශ්න කරන බොහෝ දෙනෙකු අසන කරුණ වනුයේ මනෝකාය දැකිය හැකි විද්‍යාත්මක ක්‍රමයක් ඇත්ද යන්නයි.

රුසියානු විද්‍යාඥයෙකු වූ සිමියොන් කිර්ලියන් වසර ගණනාවක පර්යේෂණවලින් පසුව මිනිස් සිරුරේ ශක්ති කලාපවල පිහිටීම දක්වන ඡායාරූප යන්ත්‍රයක් නිපදවීමට සමත් විය. මේ යන්ත්‍රයෙන් ගන්නා ඡායාරූප කිර්ලියන් ඡායාරූප නම් වේ. කිර්ලියන් ඡයාරූප යන්ත්‍රයෙන් ගත් ඡායාරූපවල මිනිස් ශරීරය තුළ ඇති ශක්ති කදම්බයන් පැහැදිලිව නිරූපණය වේ. මෙම ශක්ති කදම්බයන් මිනිසාගේ හැඩහුරුකමට බොහෝ දුරට සමාන වේ. තවද මිනිසෙකු මියගොස් ස්වල්ප වේලාවකදී ඔහුගේ ශරීරයේ ඇති මෙවැනි ශක්ති කලාප අතුරුදත් වන බව ද පර්යේෂණවල දී තහවුරු වී ඇත. මෙම කිර්ලියන් ඡායාරූපවලින් මනෝකාය (Astral body) නිරූපණය වන බව සමහරු අදහස් කරති. එහෙත් සජීවී ශාකවලද මෙවැනිම ශක්ති කලාප දක්නට හැකි නිසා සමහරු එම නිගමනය ගැන සැක උපදවති.




කිර්ලියන් ඡායාරූප ක්‍රමය අනුව ගන්නා ලද අත්ලක සේයාරුවක්, අත්ලෙන් විහිදෙන ශක්ති ධාරාවක් පැහැදිලිව පෙනෙයි.



Scanned with CamScann

කෙසේ නමුත් භාවනා ක්‍රම ප්‍රගුණ කර සිත අපූරු තත්ත්වයට පත් කර ගැනීමෙන් ඉතා පහසුවෙන් මනෝකාය දැකගත හැකි බව ජපානයේ යෝගීහු කියති. ජපානයේ රේකී සුවකිරීමේ ක්‍රමවල පදනම වනුයේ ද දුර්වල වූ මනෝකාය සුවපත් කර ඒ තුළින් භෞතික කය සුවපත් කිරීමයි.

පුනරුත්පත්තිය පිළිබඳ පර්යේෂණවලින් ද මනෝකාය පිළිබඳ විශ්වාසයන්ට සහයක් ලැබේ. විවිධාකාර තුවාලවලින් මිය යන පුද්ගලයන් පසු ආත්මවල දී තුවාලවලට සමාන උපන් ලප සහිතව උපදින ආකාරය පුනරුත්පත්ති පර්යේෂකයන් විසින් නිරීක්ෂණය කර ඇත. භෞතික කය තුවාල ලබන විට මනෝකාය පළුදු වන බවත්, එම පළුද්ද උපන් ලප ලෙස මතු ආත්මභාවවල සිරුරේ පිළිබිඹු වන බවත් පර්යේෂකයෝ කියති.



සිමියොන් කිර්ලියන් මනෝකාය ඡායාරූපයට හසු කරගැනීමට සමත් වූයේ මොහුය



Scanned with CamScanner

# 18. සිරුර හැරගොස් නැවත පැමිණෙන ස්වප්නකාය

මිනිසාගේ මනෝකායට නින්දේ දී ඔහුගේ ශරීරයෙන් ඉවත්ව යාමේ හැකියාවක් ඇති බව අධිමානසික විද්‍යාඥයෝ කියති. ප්‍රකට මනෝවිද්‍යාඥ කාල් යුං පවා මේ මතවාදයට පක්ෂව කරුණු දැක්වූ අයෙකි.

නින්දේදී සිරුර හැර යන මනෝකායට "ස්වප්නකාය" යන වදන යෙදේ. ස්වප්නකාය තමාට රිසි තැනට පාවී ගොස් එම තැන්වල හැසිරී නැවත අවදි වීමට පෙර භෞතික කය තුළට රිංගයි. ස්වප්නකාය සහ භෞතික ශරීරය ඇසට නොපෙනෙන ශක්ති තන්තුවකින් බැඳී ඇති බව විශ්වාස කරනු ලැබේ. ස්වප්නකාය අවකාශයේ සැරිසරද්දී දකින දේ ද අපට සිහින ලෙස පෙනෙන බව මේ මතයට පක්ෂ අය විශ්වාස කරති.

ස්වප්නකායට සිරුර හැරගොස් විවිධ තැන්වල සැරිසැරීමට අමතරව ප්‍රකෘති මිනිසෙකු ලෙස ද පෙනී සිටීමේ හැකියාව ඇති බව සමහර පර්යේෂකයෝ කියති. සමහර මිනිසුන් ජීවත්ව සිටියදීම ඔවුන්ගේ "අවතාර" දැක ඇති අය ඕනෑ තරම් සිටිති. මෙවැනි අවතාර පෙනීම්වලට එක් හේතුවක් වනුයේ ස්වප්නකාය නින්දේදී සිරුර හැර ගොස් විවිධ තැන්වල සැරිසැරීමයි.

කෙසේ නමුත් "ස්වප්නකාය" පිළිබඳව පර්යේෂකයන් අතර පැහැදිලි එකඟතාවයක් නොමැත.



Scanned with CamScanner

# 19. ජීව ලෝකයේ නොපෙනෙන රහස්

සත්ත්ව ලෝකය අතිශයින් විසිතුරු තැනකි. මෙලොව වෙසෙන විවිධාකාර සත්ත්ව විශේෂ ගණන මෙතෙක් ගණනය කර නැත. සංඛ්‍යාව අතින් බලන කල ද සත්ත්ව ලෝකයේ ස්වභාවය පුදුමාකාරය. පොළොව මත එක් වර්ග සැතපුමක් තුළ සිටින කෘමි සතුන් සංඛ්‍යාව මුළු පෘථිවිතලය මත සිටින මිනිසුන් සංඛ්‍යාවද ඉක්මවයි. ක්ෂුද්‍ර ජීවීන්ගේ ලෝකය ඊටත් වඩා පුදුම සහගතය. වැඩුණු මිනිසෙකුගේ සිරුර මත හා සිරුර තුළ කිලෝ ග්‍රෑම් 2ක් පමණ බර ක්ෂුද්‍ර ජීවී ගහනයක් සිටින බව ගණනය කර ඇත. පියවි ඇසට හෝ නවීන විද්‍යාවට නොපෙනෙන ලෝකයේ විසිතුරු මීටත් වඩා පුදුම සහගත විය යුතුය.

බුදුන්වහන්සේ සහ බුද්ධ ශ්‍රාවකයන් විසින් දිවැසින් දුටු නොපෙනෙන ලෝකය පිළිබඳ විස්තර සූත්‍ර පිටකය ප්‍රමුඛ ධර්ම ග්‍රන්ථවල ඇතුළත් කර ඇත.

සත්ත්වයන් දුක් විඳින ලෝක අපාය භූමි නම් වේ. නරකය හෙවත් නිරය ගණයට වැටෙන අපායවල උපදින සත්ත්වයෝ දුකම අනුභව කරති. ඔවුන්ට සැපක් නම් නැත. නරකයේ උපන් සත්ත්වයන්ගේ ආයුෂ ගණන් කළ යුත්තේ අවුරුදු දහස් ගණනිනි. සමහර නිරයන්හි උපන් සත්ත්වයෝ කල්ප ගණන් එහි දුක් විඳිති. අපායෙහි උපන් සත්ත්වයන් දුක් විඳින ආකාරය සූත්‍ර පිටකයෙහි ද අටුවා ග්‍රන්ථයන්හි ද ඉතා විචිත්‍රව දක්වා ඇත.



Scanned with CamScanner

# 20. දිවැසින් දුටු අපායේ තතු

අපාගත සත්ත්වයන් විඳින අනේක විධ දුක් වේදනා ගැන විස්තරාත්මක සටහන් ජාතක පාලියට අයත් නිමි ජාතකයෙහි දැක්වේ. කෙසේ නමුත් එකී විස්තරය ජාතක අටුවාව ලියවෙන අවධිය වන විට තරමක් වෙනස් වී ඇති අයුරු පෙනෙයි. සූත්‍ර පිටකයේ නිමි ජාතකයේ එන අපාය විස්තරය සැකෙවින් දැක්වීම සුදුසුය.

✧ දුබලයන්ට හිංසා පීඩා කරන අය මරණින් මතු වේ තරණී නිරයේ වැටී දුක් විඳිති. ලෝදියෙහි කැකෑරෙමින් සිටින සත්ත්වයන් මෙහි දැකිය හැකිය.

✧ තද මසුරෝ, මහණ බමුණන්ට නින්දා, පරිභව, හිංසාපීඩා කරන අය ද ඒ පව්කමින් අපාය භූමියක උපදිති. එහි වෙසෙන බල්ලෝ ද කපුටෝ ද ගිජුලිහිණියෝ ද නිරි සතුන් හඬව හඬවා මස් උදුරාගෙන කති.

✧ නිවැරදි පුද්ගලයන්ට හිංසාපීඩා කරන අය මරණින් මතු නිරයෙහි ඉපිද මුගුරු පහරවලින් තැළෙමින් පීඩාවට පත්වෙති.

✧ බොරු සාක්ෂි කියන්නෝ ද පොදු දේපළ වංචා කරන්නෝ ද මරණින් මතු ගිනි අඟුරු වළවල් සහිත නිරය භූමියක ·වැටී විලාප දෙමින් පිලිස්සෙති.

✧ සිල්වත් මහණ බමුණන්ට හිංසා පීඩා කරන අය මරණින් මතු නිරයේ ඉපිද ලෝහ හැළිවල වැටී ගින්නෙන් තැවෙති.

✧ එක් නිරයක සිටින වධකයෝ නිරි සතුන්ගේ ගෙල වැලලා උණු ලෝදියෙහි ඔබා ගෙල සිඳිමින් වධ දෙති. ගෙල සිඳ සතුන් මරණ අය එම දුකට පත්වෙති.

✧ තවත් එක් නිරයක නොගැඹුරු පුළුල් ගංගාවක් ඇත. ඒ අසබඩ වෙසෙන නිරිසත්තු පිපාසාවෙන් පීඩිතව වෙසෙති. ගඟට බැස දිය බොන්නට උත්සාහ කළත් දිය බීමට නොහැකි වේ. ආහාර ද්‍රව්‍ය බාල කරන කූට ව්‍යාපාරිකයන් මරණින් මතු නිරයේ ඉපිද එලෙස දුක් විඳිති.



Scanned with CamScanner

✧ තවද, අන්සතු ධනය හොරකම් කර දිවිගෙවන අය මරණින් මතු නිරයේ ඉපිද අනේකවිධ දුක් විඳිති. ඔවුන්ගේ ශරීරවලට උල්වලින් අනිමින් විවිධාකාර දුක්වේදනා දීම එහි දී සිදුවේ.

✧ සතුන් මරා මස් කර විකුණන අය මරණින් මතු නිරයෙහි උපදිති. නිරය පාලකයෝ ඔවුන් අල්ලා සතුන් මරා මස් කරන්නාක් මෙන්ම වධහිංසාවන්ට භාජනය කරති.

✧ අනුන්ට හිංසා කරන අය ද අනුන්ගේ අත්පා කපා වධ හිංසා කරන අය ද මිත්‍රද්‍රෝහී වූවෝ ද මරණින් මතු නිරයෙහි උපදිති. ඔවුහු අශුචි, ලේ සහ සැරව මිශ්‍ර වූ දුර්ගන්ධය හමන විල්වල ඉපිද අශුචි කමින් ජීවත් වෙති.

✧ තවත් අපායක සිටින සත්ත්වයෝ දුක් විඳිමින් තමාගේම ලේ හා සැරව පානය කරති. දෙමාපියන් හෝ රහතුන් මරන අය අපායෙහි වැටී එලෙස දුක් විඳිති.

✧ වංචනික ලෙස වෙළඳාම් කර අයුතු ලාභ උපයන වෙළෙන්දෝ මරණින් මතු අපායෙහි ඉපදෙති. ඔවුහු බිලී කොකුවලින් එල්ලෙමින් අනේක විධ දුක් විඳිති.

✧ ස්වකීය සැමියා හැර සොර සැමියන් සමග සතුටු වූ ගැහැනු මරණින් මතු අපායෙහි උපදිති. ඔවුහු කැපුම් තුවාල සහිතව අනේක විධ දුක් වේදනා විඳිති.

✧ පර ස්ත්‍රීන් සමග සතුටු වන පුරුෂයෝ මරණින් මතු අපායෙහි ඉපදෙති. ඔවුහු හිස පහතට සිටින සේ හිඳ අනේක විධ වධ වේදනාවන්ට ලක්වෙති.

✧ තමනුත් මිථ්‍යාදෘෂ්ටි ලැබ අනුන්ද එහි සමාදන් කරවා ජීවත් වන අය මරණින් මතු අපායෙහි උපදිති. ඉපිද අනේක විධ වධ බන්ධනයන්ට භාජනය වෙති.

මෙහි ඉහත දක්වා ඇත්තේ සූත්‍ර පිටකයට අයත් නිමි ජාතකයෙහි එන අපාය විස්තරයයි. සමහර අපායවල උපදින සත්ත්වයන් අපාය පාලකයන් විසින් දුකට හෙළන සැටිත් අනෙක් අය තමාම දුක් විඳිමින් සිටින අයුරුත් මෙහි පැහැදිලිව දැක්වේ.



Scanned with CamScanner

සම්බුද්ධ පරිනිර්වාණයෙන් පසුව මතුවී ආ ආචාර්ය මතවාදයක කියවෙන පරිදි අපායෙහි පාලකයන් නොමැත. අපාගත සත්ත්වයෝ තම අකුශල කර්මයන්හි බලය නිසාම අපාය පාලකයන් තමාට වධ හිංසා කරන බව දකිති. සැකෙවින් දක්වතොත් අපාගත සත්ත්වයෝ තමන්ට පෙනෙන චිත්ත රූපවල ග්‍රහණයට ලක්ව "මනසින්" ඒ දුක් විඳිති. තවත් එක් ඉගැන්වීමකින් කියවෙනුයේ අපාගත සත්ත්වයා කෙතෙක් වධ හිංසා ලැබුවත්, අත් පා කැපුම් හෝ හිස් කැපුම් ලැබුවත් කර්ම ශක්තිය ගෙවී යනතෙක් මිය නොයන බවයි. මේ මතයට ප්‍රතිපක්ෂ වන ඇතැමෙක් පවසනුයේ අපායෙහි වධ වේදනා විඳ හිස් කැපුම් ලබන සත්ත්වයා මියගොස් කර්ම ශක්තිය නිසා වහාම නැවත එහිම උපදින බවයි.

සමහර නිරය භූමිවල යමපල්ලන් සිටින්නාක් මෙන්ම නිරය පාලකයෙකු ද සිටියි. සූත්‍ර පිටකයට අයත් දේවදූත සූත්‍රයෙහි නිරය පාලකයා ගැන කදිම විස්තරයක් සඳහන් වේ. අපායට අලුතින් නිරිසතෙක් පැමිණි කල අපායවාසී නිරිසත්ත්වයෝම ඒ සත්ත්වයා හිරිහැරයට වධබන්ධනවලට ලක් කරති. ඒ දකින නිරය පාලනය කරන සේවක පිරිස් නවක නිරිසත්ත්වයා ලබන වධබන්ධනවලින් මොහොතකට මුදවා අපාය පාලකයා වෙත යොමු කරති. අපාය පාලකයා වෙත පැවරී ඇත්තේ භාරදූර කාර්යයකි. නිරිසතා දුකට හා වධයට පමුණුවන්නේ ද යන්න ඔහු විසින් තීරණය කළ යුතුය. නිරය පාලකයා නවක නිරිසත්ත්වයාගෙන් ප්‍රශ්න කිහිපයක් අසයි. ඒ ප්‍රශ්නවලට දුන් පිළිතුරු අනුව ඔහු යහපත් කල් ක්‍රියාවෙන් විසූ අයෙකු බව පෙනෙයි නම් ඔහු වධබන්ධනවලින් නිදහස් කර හරිනු ලැබේ. ප්‍රමාණවත් පිළිතුරු නොසපයන නිරිසත්ත්වයන් වධබන්ධනවලට ලක් කරනු පිණිස අපාය කාර්ය මණ්ඩලය වෙත නැවත භාර කරනු ලැබේ.

අපායෙහි පාලකයා ගැන ද රසවත් විස්තර බෞද්ධ සාහිත්‍යයෙහි හමුවේ. හේ නමින් යම රජු වෙයි. යම රජු ධර්මිෂ්ඨ පාලකයෙකි. වරද කළවුන් තෝරා බේරා ඔවුන්ට සුදුසු දඬුවම් නියම කිරීම ඔහුගේ කාර්යභාරයයි. ඔහු එය නොපිරිහෙළා ඉටු කරයි. එබැවින් ඔහු "ධර්මරාජ" නම් වේ. ධර්මරාජ නම් ලද යම රජු කාරුණික පුද්ගලයෙකි. හේ හැකි සෑම විටම නවක



Scanned with CamScanner

තිරිසත්ත්වයන් වධබන්ධනවලින් බේරා නැවත ආපසු හරවා යැවීමට උත්සාහ කරයි. ඔහු තිරිසතුන්ගෙන් ප්‍රශ්න අසනුයේ ඔවුන් මුදවා හැරීමට සුළු හෝ ඉඩකඩක් ඇත්දැයි පිරික්සීමටය. එහෙත්, අභාග්‍යයකට මෙන් බොහෝ තිරිසතුන්ගේ "පාප බලය" නිසාම ඔවුන්ට ඒ ප්‍රශ්නවලට පිළිතුරු මතක් නොවේ. තවත් විස්තරයක දැක්වෙන පරිදි යම රජු තිරිසතුන් කැඳවා තමා කළ පිංකම් ඇතොත් මතක් කරන ලෙස කියයි. අපායෙන් මිදීමට තරම් ප්‍රමාණවත් පිංකමක් මතක් වුවහොත් තිරිසත්ත්වයා එකෙණෙහිම නිදහස් වේ. ඒ අවස්ථාවේ තෙරුවන් ගුණ සිහි කළහොත් අපායෙන් නිදහස් වේය යන්න තවත් මෙවැනි ආචාර්ය මතවාදයකි.

යම රජු ගැන පසුකාලීනව එකතු වූ තොරතුරු රාශියක් ඇත. යම රජු, සතරවරම් දෙවිවරුන්ගෙන් කෙනෙකු බව සිංහල බෞද්ධයෝ අදහති. ධෘතරාෂ්ට, විරූඪ, විරූපාක්ෂ සහ වෛශ්‍රවණ යන අය සතරවරම් දෙවියෝ වෙති. මින් වෛශ්‍රවණ හෙවත් වෙසමුණි රජු අපාය පාලකයාය. සතරවරම් දෙවියෝ අපාය පාලනයට හවුල් වීමට අමතරව මිනිස් ලොව මිනිසුන්ගේ ආරක්ෂාවට කටයුතු කරති. සිංහල බෞද්ධයන් සතරවරම් දෙවි පිහිට යදින්නේ එබැවිනි. අපායෙහි රජු වන වෛශ්‍රවණයන්ට දූවරු සතර දෙනෙක් වෙති. ඔවුහු තකරී, මකරී, යමී සහ යමදූතී නම් වෙති. යම රජුගේ සුරතලා කුකුළෙකි. යම රජුගේ එක් පාදයක සුව නොවන තුවාලයකි. තුවාලයෙහි වෙසෙන පණුවන් කාදැමීම යම රජුගේ කුකුළු සුරතලාට අයත් කාර්යයයි. මේ සියල්ලම යම රජු පිළිබඳව පසුකාලීනව එක් වූ විස්තරයන් ය.

අපායෙහි සිටින යමපල්ලන් ගැන ද මෙවැනි පසුකාලීන මතවාද එක්වී ඇත. අපායෙහි වෙසෙන තිරිසත්තු කලෙක නිර පාලකයන් බවට පත්වෙති. ඔවුන්ගේ "වැඩමුරය" නිම වෙත්ම නැවත දුක් විඳීමට යොමු කරනු ලැබෙති.

අපාගත සත්ත්වයන් විඳින ආයුෂය ගණනය කළ යුත්තේ වසර සියගණන්වලින් නොව දහස් ගණනකිනි. සමහර අපාය භූමිවල ආයුෂ ගණනය කරනුයේ කල්ප ගණන්වලිනි. කල්පයක් යනු පෘථිවියේ පරමායුෂයයි. අපායෙහි ආයුෂ ප්‍රමාණය පිළිබඳ



Scanned with CamScanner

විස්තර සූත්‍ර පිටකයට අයත් කෝකාලික සූත්‍රයේ දක්වා ඇත.

බුදුන් සමීපයෙහි නිතර විසූ කෝකාලික භික්ෂුව තදබල ඊර්ෂ්‍යාකාරයෙක් විය. හේ සැරියුත් මුගලන් මහතෙරුන් දෙනම ලබන කීර්ති ප්‍රශංසා නොඉවසුවේය. සැරියුත් මුගලන් දෙනමට නින්දා අපහාස කරමින් කල් ගෙවූ කෝකාලික සමේ රෝගයක් උත්සන්න වී ලේ විෂ වීමෙන් මිය ගියේය. කෝකාලික මරණයට පත්වීමෙන් අනතුරුව "පදුම" නම් නිරයෙහි උපන් බව බුදුන් විසින් භික්ෂූන් වහන්සේලා වෙත හෙළි කළහ. නිරයෙහි ආයුෂ වර්ෂවලින් ගණනය කිරීමට අපහසු බව එහි දී බුදුහු දේශනා කළහ. පෙර කී පදුම නිරයේ උපන් සත්ත්වයෙකු එහි දුක් විඳිනා කාලය මෙසේ ගණනය කළ යුතුය.

1. තල කුරුණි 20 ක් ගෙන වසර 100 කට ඉන් තල ඇටය බැගින් ඉවත් කළහොත් ඒ තල ඇට සියල්ල ගණන් කිරීමට යන කාලයට වැඩි ආයුෂක් අබ්බුද (අර්බුද) නිරයක ඇත.
2. අබ්බුද නිරයක පරමායුෂය මෙන් 20 ගුණයක් "නිරබ්බුද" නිරයක ඇත.
3. නිරබ්බුද නිරයක් මෙන් 20 ගුණයක් ආයුෂ "අටට" නිරයක ඇත.
4. "අහන" නිරයක එමෙන් 20 ගුණයක් ආයුෂ ඇත.
5. "කුමුද" නිරයක ආයුෂ එමෙන් 20 ගුණයකි.
6. කුමුද නිරයක ආයුෂ මෙන් 20 ගුණයක් "සොගන්ධික" නිරයේ ඇත.
7. සොගන්ධික නිරයක ආයුෂ මෙන් 20 ගුණයක් "උප්පල" නිරයක ඇත.
8. උප්පල නිරයක ආයුෂ මෙන් 20 ගුණයක් "පුණ්ඩරික" නිරයක ඇත.
9. "පදුම" නිරයේ ආයුෂය එමෙන් 20 ගුණයකි.

කෝකාලික භික්ෂුව නිරයේ පැසෙන කාලය මැනිය යුත්තේ



Scanned with CamScanner

අවුරුදුවලින් නොව අබ්බුද සහ නිරබ්බුදවලින්ය. හරියටම කිවහොත් එම කාලය නිරබ්බුද 100,037 කුත් අබ්බුද 5 කි. ගුණවතුන්ට නින්දා අපහාස කරන අය එතරම් කල් නිරයේ පැසෙති.

ඉහත විස්තර දැක්වුණේ නිරයෙහි උපන් සත්ත්වයන්ගේ ආයුෂය ගැනයි. සාමාන්‍යයෙන් සිදුවනුයේ සත්ත්වයා මියගොස් නිරයෙහි නැවත ඉපදීමයි. එනමුත් "පණපිටින්" නිරයට ඇදගෙන ගිය තිදෙනෙක් ගැන බෞද්ධ සාහිත්‍යයෙහි දැක්වේ.

1. යශෝදරාවගේ පියා වන සුප්‍රබුද්ධ රජු බුදුන්ට අපහාස කර ඒ පව නිසා පණපිටින්ම නිරයට ගියේය.

2. බුදුන්ට අපහාස වන පරිදි ක්‍රියා කළ චිංචිමානවිකාව ද ඒ ඉරණමටම ලක්වූවාය.

3. යශෝදරාවගේ සහෝදරයා වන දේවදත්ත භික්ෂුව බුදුන් මරා දැමීමට තැත් කර ඒ තැත වැරදී ගොස් රෝගාතුරව කලක් සිට අනතුරුව පණපිටින්ම නිරයට ගියේය.

දෙව්දත් තෙර නිරයට ඇදගෙන යාම පිළිබඳ සිද්ධිය සැකෙවින් මෙසේය.

බුදුන් කෙරෙහි තදබල ලෙස ඊර්ෂ්‍යා කළ දේවදත්ත කිහිපවරක්ම බුදුන් මරා දැමීමට කුමන්ත්‍රණ කිහිපයක්ම කළේය. ඒ කුමන්ත්‍රණ අසාර්ථක වූ තැන නවක භික්ෂූන් වහන්සේලා 500 නමක් සමග වෙන්ව ගොස් වෙනම වාසය කළේය. දෙව්දත් ක්‍රමක්‍රමයෙන් කාය බලයෙන් පිරිහී ගොස් රෝගාතුර වූයේය. තමා කළ වැරදි ගැන පසුතැවෙමින් සිටි ඔහුට කෝකාලික භික්ෂුව වැළමිටෙන් පහර දුන්නේය.

බුදුන්ගෙන් සමාව ගතයුතු බව ඉටා ගත් හෙතෙම තම අනුගාමිකයන් සමග බුදුන් දකින්නට පැමිණියේ ඇඳ පිටිනි. දෙව්රම් වෙහෙර ආසන්නයේ පිරිස් නැවතී සිටිය දී මුහුණ කට සෝදා පිරිසිදු වී බුදුන් හමුවිය යුතු බව දේවදත්ත සිතීය. හේ ඇඳෙන් නැගිට ඉදිරියට පියවර තබත්ම ක්‍රමක්‍රමයෙන් පොළවෙහි ගිලී ගියේය. අවසානයේ දෙව්දත් පොළවේ ගිලී අතුරුදහන් වූ



Scanned with CamScanner

අතර ඔහුගේ සිවුර පමණක් එතැන ඉතිරි විය. දෙව්දත් නිරයට ඇදගෙන ගිය බව බුදුහු මෙහි දී හෙළි කළහ. මෙම සිද්ධිය පිළිබඳ පසුකාලීන විස්තරවල දැක්වෙනුයේ පොළව විවර වී මතුවූ ගිනිජාලා මැදින් දෙව්දත් නිරයට ගිය බවයි. එම විස්තරය මූලික දේශනා තුළ හමු නොවේ. කෙසේ නමුත් දෙව්දත් නිරයට ඇදගෙන ගිය තැන අදට ද ඇත්තේ පතුල නොපෙනෙන ආගාධයකි. අවම වශයෙන් සතෙකු හෝ එතැනට ළං නොවන බව කියනු ලැබේ.

වඩා විශාල අපායවලට යාබදව ඇති කුඩා අපාය භූමි "ඔසුපත් නිරය" නම් වේ. විශාල අපායෙන් නිදහස් කෙරෙන සත්ත්වයා ඊළඟට ඇද වැටෙනුයේ ඔසුපත් නිරයටයි. නිරයේ උපන් නිරිසතුන්ට සම්පූර්ණ නිදහස ලැබෙනුයේ ඔසුපත් නිරයෙහි ද කාලයක් දුක් විඳීමෙන් අනතුරුවය.

අපාය භූමි අතරෙන් භයානකම තැන අවීචි මහා නිරයයි. මව මැරීම, පියා මැරීම, රහතන් වහන්සේ මැරීම, බුදුන්ගේ ඇඟෙහි ලෙය සෙලවීම හෝ සංඝ භේදය කරන අය මතු අවීචි මහා නිරයට ඇද වැටෙති. අවීචි මහා නිරය අති විශාල ලෝහ පෙට්ටියක් වැනි දෙයකි. එහි සතර දිශාවෙන් දොරටු 4ක් ඇත. අපාය පතුලේ සිට ඉහළටම ගිනිදලු ඇවිළෙයි. අපායෙහි එක් දිශාවකින් පිට වන ගිනි කුණාටුවලට මැදිවන සත්ත්වයෝ ඉන් ගැලවෙනු රිසිව එහෙ මෙහෙ දුවති. එහෙත් ඔවුනට ඉන් ගැලවීමක් නැත. අපායෙහි සතර පැත්තෙන්ම ඇති ලෝහමය දොරටු තදින් වැසී ඇත. අපාය සතර වටේ ඇති ලෝහමය දොරටු ඉඳහිට විවර වෙයි. අපායෙහි ඇති ගිනි කුණාටුවෙන් බේරෙනු රිසිව ඉන් ඉවතට දිවයන නිරිසත්තු මහා අපායෙන් පිටත ඇති ඔසුපත් නිරයක් වෙත ඇද වැටෙති.

සත්ත්වයාට දුකම ගෙන දෙන ප්‍රධාන නිරය භූමි අටක් ඇති බව බෞද්ධ ඉගැන්වීම්වල දැක්වේ.

1. සංජීව
2. කාලසූත්‍ර
3. සංඝාත
4. රෞරව
5. මහා රෞරව
6. තාපන



Scanned with CamScanner

7. මහාතාපන 8. අවීචිය

යනු ඒ නිරය භූමි අටයි. මේ නිරය භූමි අට වට කොට තවත් ඔසුපත් නිර 16 බැගින් ඇත. ඒ අනුව ඔසුපත් නිර 128 ක්ම පිහිටා ඇත. ඒ අනුව සම්පූර්ණ නිරය භූමි සංඛ්‍යාව 136 කි.

අපාය භූමි ඇත්තේ කොහිද? පොළව යට අපාය භූමි පිහිටා ඇති බව අටුවාචාර්යවරු කල්පනා කරති. මෙකී අපාය භූමිවල පැවැත්ම පිළිබඳව නූතන පර්යේෂකයන්ට හමුවී ඇත්තේ හෝඩුවාවල් කිහිපයක් පමණි.

යුරෝපයෙහි එක් පර්යේෂක කණ්ඩායමක් පෘථිවි ගර්භය තුළ උෂ්ණත්වය වෙනස් වීම අධ්‍යයනය කිරීමට සැතපුම් 5ක් පමණ ගැඹුරැති සිදුරක් සෑරූහ. ඒ සඳහා ඔවුන්ට නවීන පන්නයේ කැණීම් යන්ත්‍රවල සහය ලබාගත හැකිවිය. මෙලෙස කැණීම් කරගෙන යන විට කැණීම් යන්ත්‍රයේ තුඩ එක්වරම හිස් ඉඩකට ඇතුළු විය. පර්යේෂකයෝ වහාම කැණීම් නවතා ඒ සිදුර තුළට මයික්‍රොෆෝනයක් ඇතුළු කළහ. එකී හිස් ඉඩ තුළින් නැගුණු පැහැදිලි ශබ්ද පර්යේෂකයන්ට ඇසීමට හැකි විය. දුක් වේදනාවන් ඉවසාගත නොහැකිව විලාප නගන හඬට ඒ ශබ්ද බොහෝ දුරට සමාන විය.

එංගලන්තයේ සහ වෙනත් යුරෝපා රටවල හුදෙකලා ප්‍රදේශයන්හි පොළව යටින් රාත්‍රී කාලයට අමුතු ශබ්ද ඇසේ. මේ ශබ්ද කිසියම් පිරිසකගේ විලාප හඬකට සමාන බව කියනු ලැබේ.

අපායෝත්පත්තිය පිළිබඳ කදිම පුවතක් පුනරුත්පත්ති පර්යේෂකයන් පිරිසකට හමු වී ඇත. එක්තරා අධර්මිෂ්ඨ පුද්ගලයෙක් හදිසි හෘදයාබාධයකින් මිය ගියේය. පරලොවක් නැති බවට තර්ක විතර්ක කරමින් ජීවත් වූ මේ පුද්ගලයා කිසිදු ආගමක් පිළිනොගත් අයෙකි. මොහු හෘදයාබාධයක් සෑදී මිය ගිය වහාම රෝහලකට ඇතුළු කර ලබාදුන් ප්‍රතිකාර ක්‍රම හේතුකොට ගෙන ඔහුගේ නැවතුණු හෘදය නැවත ක්‍රියා කරන්නට පටන් ගත්තේය. හේ ඇස් හැර මහත් බියකින් වටපිට බැලුවේය. ස්වල්ප මොහොතකින් පියවි සිහිය ලද ඔහු තමා මුහුණ පෑ බිහිසුණු අත්දැකීම විස්තර කරන්නට පටන් ගත්තේය.



Scanned with CamScanner

ඔහු ඇත්තටම මිය ගියේය. මියගොස් වෙනත් ස්ථානයක අමුතු වේශයකින් උත්පත්තිය ලැබ සිටියේය. ඔහු වටා සිටි ඔහු වැනිම සත්ත්වයෝ ඔහු වටකර ගෙන දරුණු වධහිංසා කිරීම ඇරඹූහ. මෙලෙස ස්වල්ප වේලාවක් වධහිංසාවලට ලක්වෙමින් සිටි ඔහුට හදිසියේම ආලෝක ධාරාවක් පෙනුණි. ක්‍රමක්‍රමයෙන් තීව්‍ර වූ ඒ ආලෝකය තුළින් කරුණාවන්ත පෙනුමැති පුද්ගලයෙකු දිස්විය. කරුණාවන්ත පෙනුමක් ඇති පුද්ගලයා ඔහුගෙන් ප්‍රශ්න කිහිපයක් විමසුවේය. ඒ ප්‍රශ්නවලට ඔහු ලබාදුන් පිළිතුරුවලින් කරුණාවන්ත පුද්ගලයා සෑහීමට පත් වූ බව පෙනෙන්ට තිබුණි. එකෙණෙහිම ඔහුට තමා නැවත, ආපසු ගමන් අරඹන ආකාරයක් දැනුණි. ඉන් මොහොතකට පසු ගිලන් ඇඳ මත දී ඔහුට නැවත සිහිය ලැබුණි. අපායට ගොස් නැවත බේරී පැමිණි මේ පුද්ගලයා තමා අත්දුටු දෙයින් අතිශය කම්පනයට පත්ව සිටියේය. ඔහු තම ජීවන දර්ශනය සහමුලින්ම වෙනස් කරගත්තේය.

අපාය සහ දිව්‍ය ලෝක කියා දෙයක් නැත. ඒවා ඇත්තේ මිහිපිටමය යනුවෙන් කියන පිරිසක් ද අප අතර සිටී. බුදුන් කලද මෙවැනි මතවාදවලට තැනක් තිබුණි. අපාය හා දිව්‍ය ලෝක නැති බව යමෙක් ප්‍රකාශ කරයි නම් ඒ පුද්ගලයා තමා ගත් මිථ්‍යා දෘෂ්ටිය හේතු කොට ගෙන අපායටම යොමු වන බව බුද්ධ දේශනාවෙහි සඳහන්ය.

අපායෙන් මිදීම සඳහා ක්‍රම කිහිපයක් ඇති බව බෞද්ධ සූත්‍ර දේශනා අනුව පෙනෙයි.

1. සෝවාන් මාර්ගඵලයට පත් පුද්ගලයා සදහටම අපායෙන් ගැලවේ.

2. දිගු කලක් බුදුන් කෙරෙහි සිත පහදවා ගෙන සිටි පුද්ගලයා අපායෙහි නොවැටේ.

3. තෙරුවන් කෙරෙහි අචල ශ්‍රද්ධාව ඇති පුද්ගලයා ආනන්තරීය පාප කර්ම කිරීමට නුසුදුස්සෙකි. ඔහුද අපායට නොවැටේ.

4. ධ්‍යානලාභීහු ධ්‍යාන නොපිරිහී මිය ගියහොත් බඹලොව උපදිති.



Scanned with CamScanner

5. රහත් වී පිරිනිවන් පාන පුද්ගලයා කිසිම තැනක නූපදියි.

මේ අපාය දුකින් මිදීමේ ක්‍රමෝපාය කිහිපයයි.

*අපායෙහි සිදුකෙරෙන අවසන් විනිශ්චය*

කර්ම විපාක හේතු කොට ගෙන නිරයෙහි උපදින සත්ත්වයා නිරයෙහි දී වධබන්ධනවලට ලක් කිරීමට පෙර ඔහු පිළිබඳ අවසාන විනිශ්චයක් සිදු කෙරෙන බව සූත්‍ර පිටකයේ දේවදූත සූත්‍රය ඇතුළු කිහිපතැනකම දැක්වේ. අපායෙහි දී සිදුවන්නේ යයි කියන මෙකී නඩු විභාගය සැබවින්ම සිදුවන්නේද? නොඑසේ නම් කර්ම විපාකවලට අනුරූපව සත්ත්වයා මුහුණ දෙනු ලබන මායාකාරී අත්දැකීමක්ද?

තිබ්බත මළපොත නම් ඉපැරණි ග්‍රන්ථයෙහි අපාය භූමි පිළිබඳ දීර්ඝ විස්තර අඩංගු වේ. නිරයෙහි දී සිදු කෙරෙතැයි කියන අවසාන විනිශ්චය පිළිබඳව එහි දී තර්කානුකූල නිගමනයක් දී ඇත.

✧ සත්ත්වයාට අපායෙහි දුක් විඳීමට හේතු වනුයේ ඔහුගේ පාප කර්ම නිසාමය. නොඑසේව අන්කිසිවෙකුගේ වරදකින් නොවේ.

✧ නිරයට ඇද දමනු ලබන සත්ත්වයා ඉන් අනතුරුව අපායෙහි විනිශ්චය සභාව ඉදිරියට පමුණුවනු ලබන්නේය.

✧ මෙහි දී ඔබගේ කර්ම විනිශ්චය කරන විනිශ්චයකරු ඔබත් සමග එකවිටම අපායෙහි උපදියි. හේ “සාධු ප්‍රාඥ” නම් වේ.

✧ සාධු ප්‍රාඥ විසින් ඔබ කළ අකුශල කර්ම ගණන් කරයි. ඔහු ඒවා ගණන් කරනුයේ සුදු පැහැති ගල් කැට වෙන් කරමිනි.

(එක පාප කර්මයකට එක ගල් කැටයක් බැගින් ගණන් ගනු ලැබේ.)

✧ මෙලෙස අකුශල කර්ම ගණන් කරන විට අපාගත සත්ත්වයා බියෙන් කිලිපොළා වෙවුලන්නට පටන් ගනියි.

✧ තමා පව්කම් නොකළ බව කියමින් අපාගත සත්ත්වයා පිංසෙණ්ඩු වෙයි.



Scanned with CamScanner

✧ මෙවිට යම රජු ඉදිරිපත් වී කර්මයේ කැඩපත ගෙන අපාගත සත්ත්වයාගේ කර්ම බලය පිරික්සයි.

✧ කර්මයේ කැඩපත තුළින් සත්ත්වයාගේ කුශලාකුශල කර්ම පිළිබඳ නිවැරදි විස්තරය දැකගත හැකිය.

✧ ප්‍රධාන යමපල්ලෙක් (යම ලොව ජේලර්වරයෙක්) පැමිණ නිරි සත්ත්වයාගේ බෙල්ලට තොණ්ඩුවක් දමා වධයට පමුණුවනු පිණිස ඇදගෙන යයි.

✧ වධයට නියම කරනු ලබන සත්ත්වයාගේ හිසගසා දමනු ලැබේ. පපුව පළා හදවත ඉරා දමනු ලැබේ. අතුනුබහන් එළියට ඇද දමනු ලැබේ. යමපල්ලන් විසින් ලේ උරාබීම ද සිදුවනු ඇත. වධයට ලක්ව ඇටකටු පෑදුණු කල්හි ඒවා ද සපාකනු ඇත.

✧ මේ කිසිදු වධයකින් අපායෙහි උපන් සත්ත්වයා මිය නොයයි. වධයට ලක්ව කැබලි වන ශරීර නැවත නැවතත් සකස් වෙයි. නැවත නැවත වධබන්ධයන්ට ලක්වේ.

✧ නැවත නැවතත් වධයට ලක්වෙද්දීත් ශරීරය නැවත සැකසීමට හේතු කිහිපයකි.

1. නිරි සත්ත්වයාගේ ශරීරය ද්‍රව්‍යයන්ගෙන් සෑදුණු එකක් නොවේ.
2. එය කර්මය විසින් නිර්මිත මායා ශරීරයකි.
3. ජීවන තෘෂ්ණාව විසින් නිරි සත්ත්වයා නැවත නැවතත් මරණින් නැගිටුවා ඔහුගේ ශරීරය ප්‍රකෘතිමත් කරයි.
4. යම රජු ද යමපල්ලන් ද ඇත්තටම සිටින අය නොවේ. ඒවා තමාගේ කර්ම ශක්තියෙන්ම නැගුණු මායාකාරී දර්ශනයන්ය.
5. අපායට පමුණුවනු ලැබූවෙකුට වුවද මේ සියල්ල මායාවක්ය යන්න දැන අවබෝධ කරගත හැකි නම් අපාය භූමියෙන් ගැලවී ඉවතට පැනගැනීමට එයම ප්‍රමාණවත්ය.

කිසියම් දිවැසිවරයෙකු විසින් දැනට වසර 1000 කට පමණ

පෙර කරන ලදැයි සැලකෙන මේ අපාය විස්තරය අපාය, යමපල්ලන් සහ යම රජු පිළිබඳ යථාර්ථවාදී විවරණයක් සපයයි. කෙසේ වෙතත්, යම රජු අපායෙහි පරිපාලන කටයුතු කරනුයේ තද බල නොකැමැත්තකින්ය යන බුද්ධ වචනය සමග මෙම ඉගැන්වීම සසඳා බැලීම වටී. යම රජුට ද අපායෙහි දුකෙන් ගැලවීමේ අවශ්‍යතාවක් ඇති බව සූත්‍ර පිටකයේ දැක්වේ. අටුවාචාර්යවරුන් විසින් විස්තර කර ඇති පරිදි, යමෙකු යම රජුව උපත ලබන්නේ ද පාප කර්මයක විපාක නිසාය. එවැනි පාප කර්මයක් "අධිපති බව ලැබීමේ ගුණ සහිත" පාපයක් ලෙස විස්තර කරනු ලැබේ.



Scanned with CamScanner

# 21. යක්ෂයෝ සහ අසුරයෝ

අපාය හෙවත් දුක් විඳින සත්ත්වයන් සිටින ලෝක හතර වර්ගයක් ගැන බෞද්ධ ඉගැන්වීම්වල දැක්වේ.

1. නිරය,

2. අසුර ලෝක,

3. ප්‍රේත ලෝක,

4. තිරිසන් අපාය, එම "සතර අපායයි."

නිරයෙහි දුකම මිස සැපක් නැති නිසා ඊට ඒ නම ලැබී ඇත. අසුර අපාය නිරයට වඩා තරමක් වෙනස්ය. වර්ග ගණනාවකටම අයත් සත්ත්වයෝ අසුර යන නාමයෙන් හඳුන්වනු ලැබෙති. කුඩා මුඛයක් ද විශාල දුර්වල ශරීර ද සහිත අසුර නම් ජීවී විශේෂයක් ගැන අටුවා ග්‍රන්ථවල කියවේ. මෙකී අසුරයන්ට ආහාර ගැනීමේ දී අධික වෙහෙසක් දැරීමට සිදුවනුයේ උන්ගේ මුඛය ශරීරයේ තරමට සරිලන තරම් විශාල නොවන බැවිනි. අනෙකුත් අසුර විශේෂය "යක්ෂ" නම් වේ. යක්ෂයන් යනු දෙවියන්ට



ලතින් ඇමරිකානු රටවල රාත්‍රියේ සැරිසරන චුපකබ්රා නම් අද්භූත සත්ත්වයා සැණින් අතුරුදහන් වීමේ හැකියාවක් ඇති යක්ෂයෙකුට සමාන හැකියා ඇති බව කියවේ.



Scanned with CamScanner

මෙන් ඍද්ධි බල ඇති අමනුෂ්‍ය කොට්ඨාසයකි. අප්‍රසන්න හැඩරුව නිසා ද අන් සත්ත්වයන් මරා ආහාරයට ගැනීම නිසා ද යක්ෂයෝ දෙවියන්ගෙන් වෙනස් වෙති.

යක්ෂයන් ගැන පුරාවෘත්ත රාශියක් ත්‍රිපිටක ග්‍රන්ථ තුළ අඩංගු වේ. අලව් නුවර වනගතව සිටි අලව් යකු (ආලවක යක්ෂයා) මේ අතරින් වඩාත් ප්‍රකටය. ආලවක යක්ෂයාගේ ප්‍රධානතම ආහාරය වූයේ මනුෂ්‍ය මාංසයි. බුදුන්වහන්සේගේ බලවත් උත්සාහය නිසා අලව් යකු ඒ නරක පුරුද්දෙන් මිදී බැතිමත් බෞද්ධයෙකු බවට පත් වූයේය.

බුදුන් කල විසූ යක්ෂයන් සිය වාසස්ථාන ලෙස තෝරා ගෙන සිටියේ මනුෂ්‍ය වාසයෙන් එපිට ඇති වනාන්තර සහ හුදෙකලා ස්ථානයන්ය. වන මැද ජීවත් වූ සූචිරෝම සහ ඛරරෝම නම් යක්ෂයන් දෙදෙනෙකුගේ ශරීර සනකම් ලෝමවලින් වැසී පැවතුණි. නොදැනුවත්ව හෝ වනයට ඇතුළු වන අය බියපත් කර රෝගාතුර කිරීම හෝ මරණයට පත්කර ගොදුරු කරගැනීම ඔවුන්ගේ දිනචර්යාවෙහි අංගයක් විය. එක් දිනක් බුදුන්ට වන මැද දී සූචිරෝම යක්ෂයා හමුවිය. බුදුන් දුටු සූචිරෝම එක්වරම ඉදිරියට පැන බුද්ධ ශරීරය බදා ගත්තේය. එසේ කළේ බුදුන්වහන්සේ බිය ගැන්වීමටය.

තම ග්‍රහණය අත්හළ සූචිරෝම "මොකද? බය වුණාද?" යනුවෙන් බුදුන්ගෙන් විමසුවේය. "මම බය වුණේ නෑ. ඒත් ජීවිතේටම නොදැනුණු තරම් පිළිකුලක් මට ඇති වුණා." යනුවෙන් බුදුහු ප්‍රතිඋත්තර දුන්හ. බුදුන්ගේ මේ අවස්ථානුකූල ප්‍රකාශයෙන් යක්ෂයා මහත් ලැජ්ජාවට පත් වූයේය. යක්ෂයන් හිරිහැර කළේ බුදුන්ට පමණක් නොවේ. බුද්ධ ශ්‍රාවකයන් පවා යකුන්ගේ හිරිහැරවලට ලක් වූ බව සූත්‍ර පිටකයේ එන කරුණු අනුව පෙනේ. එක් දිනක් සැරියුත් තෙරුන් වහන්සේ සමාධි සුවයෙන් වැඩ හිඳිද්දී අහසින් යමින් සිටි යක්ෂයන් දෙදෙනෙකුගෙන් එකෙක් අත් මිට මොළවා සැරියුත් හිමියන්ගේ හිසට දැඩි පහරක් එල්ල කළේය. උන්වහන්සේ සමාධි සුවයෙන් සිටි නිසා ඒ පහර තදින් නොදැනුණත් අවශේෂ පුද්ගලයෙකු ඒ පහරට ලක්වී නම් එකෙණෙහිම හිස පැළී මිය යාමට ඉඩකඩ තිබුණි. සැරියුත් හිමියන්



Scanned with CamScanner

ඒ යක්ෂයා දුටුයේ නැත. යක්ෂයා පහර දුන් විගසම ඒ පාපය නිසාම පොළව පැළී නිරයට ඇද වැටුණේය. කෙසේ නමුත් ඈත ඉසව්වක ධ්‍යානගතව සිටි මුගලන් තෙරුන් වහන්සේ දිවැස් බලයෙන් සම්පූර්ණ සිද්ධියම දුටුවහ. උන්වහන්සේ වහා එතැනට වැඩම කළහ. මෙහි වැදගත්ම සිද්ධිය වන්නේ එකී යක්ෂයා සැරියුත් හිමියන්ගේ දිවැසට විෂය නොවී මුගලන් හිමියන්ට පමණක් දර්ශනය වීමයි. බුදුන්ට පවා නොපෙනී සිටීමට සමත් වූ යක්ෂයෙකු ගැන සූත්‍ර පිටකයේ ජනවසභ සූත්‍රයෙහි දැක්වේ. ඒ කතා ප්‍රවෘත්තිය මෙසේය.

රජගහ නුවර විසූ අජාසත්ත කුමරු සිය පියා සිරගත කර රජකම ලබා ගත්තේය. අජාසත්තගේ පියා වන බිම්බිසාර රජු බුදු බණ අසා සෝවාන්ව සිටි අයෙකි. එහෙත් ඔහු සිරගෙය තුළ ලද වධ වේදනා නිසා සිත කිලිටිව මිය ගොස් යක්ෂයෙකුව උපත ලද්දේය. ජනවසභ නම් වූ මේ යක්ෂ දේවතාවා දෙව් ලොව පණිවිඩකරුවෙකු ලෙස සේවය ඇරඹීය. හේ පණිවිඩයක් රැගෙන යන අතරමග බුදුන් බැහැ දැකීමට පැමිණියේය. බුදුන් අබියසට පැමිණ නොපෙනී සිටිමින් බුදුන් ඇමතීය.

"මට නොපෙනී සිට මා අමතන ඔබ කවුද?" බුදුහු විමසූහ.

"ස්වාමීනි! මම ජනවසභ නම් වෙමි!"

"ඔබගේ ශ්‍රාවකයෙකු වූ මම බිම්බිසාර රජව සිට මියගොස් ජනවසභ නමින් උපත ලදිමි."

"මම දැනට දෙව් ලොව අතවැසි යක්ෂයෙකු ලෙස සේවය කරමි."

"පණිවිඩයක් රැගෙන යන අතර ඔබ වහන්සේ හමුවීමට පැමිණියෙමි."

"මා සෝතාපන්නයෙකු වන බැවින් අවැසි නම් මට මේ යක්ෂ ආත්මභාවයෙන් මිදී වෙනත් ඉහළ උපතක් කරා යාමට හැකිය. එහෙත් මට දැනට මේ උපත ප්‍රමාණවත්ය."

යනුවෙන් ජනවසභ යක්ෂයා බුදුන්ට තමා සිටින තත්ත්වය හෙළි කළේය. කෙසේ නමුත් බුදුන්වහන්සේ ජනවසභ යක්ෂයා



Scanned with CamScanner

සිටින තත්ත්වය කෙරෙහි අනුකම්පා කළහ. මිය ගිය තම පියා වෙත පිං පමුණුවා යක්ෂ ආත්මයෙන් නිදහස් වීමට ඔහුට සහය වන ලෙස බුදුහු අජාසත්ත රජුට උපදෙස් දුන්හ. මෙම අවස්ථාව මළගිය ඇත්තන්ට පිං පැමිණවීමේ චාරිත්‍රයෙහි ආරම්භය බව සමහර විචාරකයෝ කියති.

ඉහත දැක්වූයේ සෝවාන් වූ අයෙක් මරණින් මතු යක්ෂයෙකු ලෙස උපත ලද අවස්ථාවක් සඳහා විරල ගණයේ උදාහරණයකි. මාර්ගඵල නොලද අයගෙන් සුළු පිරිසක් හැර ඉතිරි සියලු දෙනාම මරණින් මතු සතර අපායෙන් එක් අපායක උත්පත්තිය ලබති. (ඛුද්දක නිකායේ මේ බව දැක්වේ.)

බුදුන් කල නන්ද මාතා නම් සැදැහැවත් උපාසිකාවක් සිටියාය. ඇය ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙහි යෙදී අනාගාමී ඵලයට පැමිණි කාන්තාවකි. ඇයගේ ස්වාමිපුරුෂයා ඉතා සිල්වත් අයෙකි. හේ සතර පෝයටම සිල්ගනියි. කෙසේ නමුත් මේ සත්පුරුෂයා ද මරණින් මතු යක්ෂයෙකුව ඉපදීමට තරම් අවාසනාවන්තයෙක් විය. හේ යක්ෂයෙකුව උපත ලද පසුත් තම බිරිඳ කෙරෙහි ඇති ඇල්ම අත් නොහළේය. හේ දිනපතාම රාත්‍රියෙහි තම නිවසට පැමිණ බිරිඳ සමග සයනය කිරීමට හුරු වූයේය. ඒ අප්‍රසන්න යක්ෂයාගේ පහස ඉවසීමට තරම් නන්ද මාතාව ඉවසීමේ ගුණය ප්‍රගුණ කර තිබුණි.

සූත්‍ර ධර්මයන්හි දැක්වෙන පරිදි, යක්ෂයන් යනු බුද්ධිමත් පිරිසකි. බුදු බණ අසා මාර්ගඵලවලට පැමිණීමේ හැකියාව යක්ෂයන්ට ඇත. අලව් යකු බුදුන් පැරදවීමට උත්සාහ දරා එය නොහැකිව බණ අසා සෝවාන් වූයේය. ප්‍රියංකර මාතා නම් යක්ෂණිය ද බුදු බණ ඇසීමට ප්‍රිය කළ තැනැත්තියකි. ඇය ඇතින් සිට බුදු බණ අසමින්ම තම දරුවන් නැළවූ බව කියනු ලැබේ.

යක්ෂයන් ගැන වඩා විසිතුරු කතා ප්‍රවෘත්ති දැක්වෙනුයේ ජාතක පොතෙහිය. විලකට අරක් ගෙන සිටි යක්ෂයෙකු ගැන නළපාන ජාතකයෙහි විස්තර දැක්වේ. නළපාන විලට ඇතුළු වන ඕනෑම සත්ත්වයෙකු මරා කෑමට මෙම යක්ෂයා වරම් ලබා තිබුණි. යක්ෂයන් අතර තම තමන්ගේ බල ප්‍රදේශ වෙන් කර ගැනීමක්



Scanned with CamScanner

තිබූ බවට පැහැදිලි සාධක ඇත. යක්ෂයන් සඳහා බල ප්‍රදේශ වෙන් කර දීම භාරව සිටිනුයේ වෙසමුණි රජු බවට පිළිගැනීමක් ඇත. විලකට අරක් ගෙන සිටි යක්ෂයෙකු පිළිබඳ මෙවැනිම පුවතක් දේවධර්ම ජාතකයෙහි දැක්වේ. වනාන්තර, විල් හා පොකුණු හැරුණු විට කාන්තාර භූමි ද යක්ෂයන්ගේ වාසස්ථාන වෙයි. කාන්තාර මැද සිටින යක්ෂයෝ ඉඳහිට ඒ හරහා වෙළඳාමේ යන පිරිස් මංමුළා කර රාත්‍රියේ නින්දට වැටුණු පසු මරාගෙන කති. කාන්තාරය මැද ඇති විලක් පසුකර එන වෙළඳ පිරිසකගේ වෙස්ගත් යකුන් හා යක්ෂණියන් පිරිසක් බෝධිසත්ත්වයන් ප්‍රමුඛ වෙළඳ පිරිසක් රැවටීමට ගත් අසාර්ථක උත්සාහයක් පිළිබඳ තතු ජාතක පොතෙන් හමුවේ. බෝධිසත්ත්ව තෙමේ ඔවුන් යක්ෂයන් බව හඳුනාගත්තේ ඔවුන්ගේ පෙනුමෙහි සහ ක්‍රියා කලාපයේ ඇති යම් යම් වෙනස්කම් නිසාය.

යක්ෂයන්ගේ ඇස් රත් පැහැති බවත්, හොඳින් වැඩුණු සවිමත් හනු හා නල දත් ඇති බවත්, සිරුරේ ඝනකම් රෝම ඇති බවත් කියනු ලැබේ. තවත් අය විශ්වාස කරන පරිදි යක්ෂයන්ට සෙවණැලි නැත. ඊට හේතුව ඔවුන් මවාගත් වේශයන්ගෙන් පෙනී සිටීමයි. කැමති විටෙක ස්ත්‍රියකගේ, පුරුෂයෙකුගේ හෝ සත්ත්වයෙකුගේ වේශයෙන් පෙනී සිටීමට යක්ෂයන්ට හැකියාව ඇති බව කියනු ලැබේ.

ශ්‍රීමත් ආතර් වේල් විසින් රචනා කරන ලද The Real Tripitaka නම් ඓතිහාසික කතා පුවතක් රැගත් ග්‍රන්ථයෙහි යක්ෂයන් ගැන කදිම විස්තරයක් ඇත. මෙම සිද්ධි දාමයෙහි කතා නායකයා වනුයේ දැනට වසර දහසකට වඩා එපිට ජීවත් වූ චීන ජාතික භික්ෂුවකි. එම චීන භික්ෂුවගේ අරමුණ වූයේ ඉන්දියාවට පැමිණ සැබෑ ත්‍රිපිටක ධර්මය චීනය වෙත ගෙන ගොස් චීන බසට පරිවර්තනය කිරීමයි. ඉන්දියාවත් චීනයත් අතර වූ එම ගමන් මගෙහි දී අපගේ කතානායක භික්ෂුව මුහුණපෑ අද්භූත සිද්ධීන් වෙත මෙම කෘතියෙහි දී නොමඳ අවධානය යොමු කෙරේ. ඒ කෘතියෙහි එන එක් කතා පුවතක් මෙසේය.

ඉන්දියාවෙහි එක් කුඩා නගරයක කඩපිල් රැසක් සහිත භූමියක් වෙයි. මේ භූමිය අසල රථ නවත්වන ලැගුම් හලක් ඇත.



Scanned with CamScanner

ඒ ලැගුම් හල අසල මහ ගසක් ඇත. එනමුත් කිසිවෙක් ඒ ගස වෙත ළංවීමට හෝ උත්සාහ නොකරති. ඒ ගස ගැන පැතිරී ඇති ජනප්‍රවාද ඒ තරමට බිහිසුණුය. ගස මුල තැන තැන වැටී ඇත්තේ මිනිසුන්ගේ ඇට කටු සහ ඇටසැකිලිය. විඩාව සංසිඳුවා ගැනීම සඳහා මෙම මහ ගසට නගින මිනිසුන් යකුන් විසින් මරා කා ඇටසැකිලි පමණක් බිම හෙළනු ලැබේ. කුතුහලයෙන් මැඩුණු එක් මිනිසෙකුට මෙම කතන්දරයෙහි ඇත්ත නැත්ත බැලීමට සිත්විය. හේ නොබියව ගසට නැග්ගේය. ගස මුදුනින් ඇසුණේ කන්කලු සංගීත නාදයකි. ඒ නාදය සිත් මෝහනය කරන සුලුය. නාදය ඇසෙන දිශාවට යාමට පොලඹවන සුලුය. මේ නුවණැති මිනිසා තමන්ට තව මොහොතකින් අත්වන ඉරණම වහා වටහා ගත්තේය. හේ වහ වහා ගසින් බැස තම ප්‍රාණය බේරා ගත්තේය.

දුරාතීතයේ දී ශ්‍රී ලංකාව යකුන් අරක්ගත් දිවයිනක් බව කියනු ලැබේ. යකුන්ගේ රාජධානිය පිහිටියේ මහියංගනයෙහිය. බුදුවී මඳ කලකින් කරුණා නෙතින් ලොව බලා වදාළ බුදුහු ලක්දිවෙහි බුදු සසුන දිගුකලක් පවතින බව අවබෝධ කරගත්හ. ඊට හරහට සිටියේ මහියංගනය රාජධානිය කරගත් අණක් ගුණක් නොදත් යක්ෂ පිරිසයි. ඒ අනුව යක්ෂ පිරිස පලවා හැරිය යුතුය යන තීරණයට නොකැමැත්තෙන් වුවත් එළඹීමට බුදුන්ට සිදුවිය. බුදුහු ලක්දිවෙන් යකුන් පලවා හැරීමට ඉටා ගත්හ. යක්ෂ වාසභූමිය වන මහියංගනයට සෘද්ධි බලයෙන් වැඩම කළ බුදුහු ගිනිජාලා මවා පෙන්වා, යකුන් බියවැද්දූහ. තම සෘද්ධි බලයෙන් ගිරිදිවයින මෑත් කර යකුන් ඒ වෙත එළවා ඇමූහ. මේ කතා ප්‍රවෘත්තිය එතැනින් නිමවෙයි.

ලක්දිවට බුදුන් වැඩි වගක් මෙරට ජනප්‍රවාද හා සාහිත්‍ය ග්‍රන්ථවල මිස ත්‍රිපිටක මූලාශ්‍රවල හමු නොවේ. එසේ නමුත්, ලංකාවේ මහියංගනය ආශ්‍රිතව තවමත් ජීවත් වන වැදි පිරිස් තමන් යකුන්ගෙන් පැවත එන බව කියා ගතිති. ඔවුන්ගේ මුතුන්මිත්තන් හඳුන්වනු ලබනුයේ නෑයකුන් නමිනි. නෑයකුන් වෙනුවෙන් කරන පුද පූජා හා පිළිවෙත් වැද්දන්ගේ ජන ජීවිතයේ අත්‍යවශ්‍ය අංගයකි. එබැවින් වැද්දන් යනු මහියංගනයෙන් පලවා හැරි යක්ෂයන්ගෙන් පැවත එන පිරිසක් බවට මතයක් පලවී ඇත. (ඒ මතය සත්‍ය නම් මහියංගනයේ සිටි යක්ෂයන් අමනුෂ්‍ය පිරිසක් නොවන බව



Scanned with CamScanner

පැහැදිලිය.) සමහරු යකුන් පලවා හැරි ගිරිදිවයින ඕස්ට්‍රේලියාව බව කියති. පුදුමයකට මෙන් ඕස්ට්‍රේලියාවේ ආදිවාසීන් වන ඇබෝර්ජින් (Aborgins) ජනතාව ශ්‍රී ලංකාවේ වැද්දන්ට හැඩහුරුකමෙන් සමාන පිරිසකි.

මෙරට පළමු සිංහල රජු ලෙස මහාවංශයෙහි දැක්වෙන විජය දැනට වසර 2550 කට පමණ පෙර ලක්දිවට ගොඩබසිද්දී පළමුවරට මුණගැසුණේ කුවේණි නම් වන "යක්ෂ ගෝත්‍රික" කාන්තාවකි. යක්ෂයන්ට හුරුපුරුදු ඇස්බැන්දුම්වල බලයෙන් විජය තමා වෙත වසඟ කරගන්නා ඇය අවසානයේ විජයගේ බිරිය බවට පත්වේ. කුවේණියගේ උදව් ඇතිව කුමන්ත්‍රණයකින් මෙරට සිහසුනට පත්වන විජය, කුවේණිය හා තමාට දාව ඇයට උපන් දරු දෙදෙනා කැලයට පන්නා දමයි. දැනට දඹානේ ජීවත් වන වැද්දන්ගේ මතය වන්නේ තමන් කුවේණිලැත්තන්ගේ දරුවන් වන ජීවහත්ථ හා දිසාලා යන දෙදෙනාගේ පරපුරෙන් පැවත එන බවයි. මෙරට ඉපැරණි ජනප්‍රවාද අතර හමුවන යකුන් හා යක්ෂණියන් ගණන අති විශාලය.

මහනුවර රාජධානි සමය වන විට ලක්දිව යක්ෂයන් පිළිබඳ කතා ප්‍රවෘත්ති ඉතා බිහිසුණු ආකාරයෙන් දිග හැරෙයි. මහනුවර ආසන්නයේ තිබූ බහිරව කන්දේ ගල් ගුහාවක බිහිසුණු යක්ෂයෙකු විසූ බව කියනු ලැබේ. මේ යක්ෂයා රාත්‍රි කාලයට භයානක ශබ්දයකින් කෑ ගසන බවටත්, මිනිසුන් ලෙඩ කර මරාදමන බවටත් විශ්වාස ඇති විය. එබැවින් යක්ෂයාගේ මනදොළ පිනවනු පිණිස වසරකට වරක් තරුණ කාන්තාවක් යක්ෂයා වෙත බිලිදීමේ සිරිතක් එකල විය. යක්ෂයාට බිලිදෙන යුවතිය බලහත්කාරයෙන් රැගෙන ගොස් බහිරව කන්දේ ගල් ගුහාව ඉදිරිපිට කඹවලින් වෙළා යක්ෂයාට භාර කර ඒම සෑම වසරකදීම චාරිත්‍රානුකූලව සිදුවිය. එකල යක්ෂයාට බිලි වීමට පාත්‍රවූයේ රජුගේ අප්‍රසාදයට ලක්ව සිටි රදල පවුල්වල රූමත් තරුණ කාන්තාවන්ය. මහනුවර විසූවේ යැයි කියන මේ අප්‍රසන්න යක්ෂයාගේ හඬ තමන් ද අසා පුරුදු බව රොබට් නොක්ස්ගේ වාර්තාවල දැක්වේ.

යක්ෂයන්ගේ භයංකාර ක්‍රියා පිළිබඳව මෙන්ම යක්ෂයන් ගෙන් පිහිටාරක්ෂාව පැතීම ද බුදු දහම ඇදහීම තරම්ම මෙරට



Scanned with CamScanner

ජනප්‍රියය. හලාවත පිහිටා ඇති මුන්නේශ්වරම් දේවාලය වෙන් කර ඇත්තේ කාලි යක්ෂණිය වෙනුවෙනි. කාලි යක්ෂණිය හෙවත් "භද්‍රකාලි මෑණියන්" දස ආකාරයකින් පෙනී සිටින බව ඇදුරෝ විශ්වාස කරති. පෙරකී මුන්නේශ්වරම් දෙවොල තුළ සිදු වූයේ යැයි කියන බියකරු සිද්ධියක් නිසා බොහෝ දෙනෙකුගේ අවධානය ඒ වෙත යොමු වූ බව කියනු ලැබේ. දරුවන් නැති එක් කාන්තාවක් තමාට දරුවෙකු ලබාදෙන ලෙස කාලි මෑණියන්ට බාරහාර වී ඉල්ලීම් කළාය. වැඩිකලක් යන්නට මත්තෙන් ඇයට දරුවෙකු ලැබුණි. දරුවා යන්තම් දුව පැන ඇවිදින විට බාරය ඔප්පු කළ යුතු බව දෙමාපියන්ට මතක් විය. ඔවුහු දුරු කතර ගෙවා මුන්නේශ්වරම් වෙත පැමිණියහ. දෙමාපියන් විසින් පුද පඬුරු සහ පූජා වට්ටි ලක ලැහැස්ති කරන අතර කිසිවක් නොදත් කුඩා දරුවා දේවාල භූමියෙහි දුව පැන ඇවිදිමින් සිටියේය. දේවාලය තුළට දරුවා දිවගියේ එහි විසිතුරු බලන්නට විය යුතුය. එහෙත් හිටි හැටියේම දේවාලයේ දොර වැසුණි. අසරණ දරුවා දේවාලය තුළ තනි විය. කරකියාගත හැකි දෙයක් නුදුටු දෙමාපියෝ දරුවා තමන්ට නැවත ලබා දෙන මෙන් කාලි මෑණියන්ට කන්නලව් කරන්නට පටන් ගත්හ. හිටි හැටියේම දේවාලය තුළින් ගැඹුරු ගැහැනු කටහඬක් ඇසුණි. "මම දරුවා ඇතුළට ගත්තේ ටිකක් හුරතල් කරන්න! උඹලාට ඔය තරම් හදිස්සිද?"

"ආ! එහෙනම් නුඹේ දරුවා තියාගනු!" යනුවෙන් ඒ කට හඬින් කියවුණි. ඒත් සමගම දරුවා දෙපලු වී එක් පලුවක් අහසින් විත් දේවාලය අසල බිම පතිත විය. දෙමාපියෝ තුෂ්ණිම්භූත වූහ. දේවාලයට ඇතුළු වූ ඔවුන්ට දරුවාගේ මළ සිරුරෙහි ඉතිරි කොටස ඒ තුළ දී දැක ගත හැකි විය.

රුහුණු කතරගම දේවාලයට අධිපතිකම් කරතැයි කියන කතරගම දෙවියන් ද යක්ෂ ගණයෙහිම ලා සැලකිය හැකි බව සමහර පර්යේෂකයෝ කියති. වැද්දන්ට අනුව කතරගම දෙවියන් යනු කන්දේ යකාය. වැද්දෝ කන්දේ යකා පිදීම සඳහා වසරකට වරක් කතරගමට ඒමට අමතක නොකරති. කතරගම දෙවියන්ට මුහුණු සයක් ද අත් දොළසක් ද ලබා දී ඇත්තේ පසුකාලීනව කතරගම දේවාලයේ භාරකාරත්වයට පැමිණි හින්දු ලබ්ධික



Scanned with CamScanner

පූජකයන් විසිනි. ඊට පෙර එහි වැඩ සිටියේ "කන්දෙසාමි" නම් ප්‍රාදේශීය දෙවියාය. කන්දේ සාමිගේ කතා ප්‍රවෘත්තිය සිත්ගන්නා සුලුය.

දුරාතීතයේ දී කතරගම ප්‍රදේශය තුළ වැදි ජනතාව මෙන්ම ස්වදේශික ශිෂ්ට ජනතාව ද වාසය කළහ. ඉන්දියාවේ සිට පැමිණි මන්ත්‍රකරුවෙක් ප්‍රදේශයේ ජනතාවගේ භූත වෛද්‍යවරයා ලෙස ජනප්‍රියත්වයට පත් වූයේය. ඔහුගේ වාසස්ථානය වූයේ වැඩසිටි කන්දයි. තම භාර්යාව වන තේවානිට රහසින් වැදි කාන්තාවක් වූ වල්ලි සමග හාදකම් පැවැත් වූ මේ මන්ත්‍රකරුගේ සල්ලාලකම එකල සිටි ප්‍රදේශවාසීන්ට අමුත්තක් නොවීය. කන්දෙසාමි ජනතාවට කෙතරම් සමීප වීද යත් ඔහුගේ මරණින් අනතුරුවද මිනිස්සු කන්දෙසාමිගේ දෙවොලට පැමිණ කන්නලව් කිරීම පුරුද්දක් කොට ගත්හ. කතරගම දක්වා වූ සැතපුම් ගණනක් මාර්ගයෙන් වැඩි ප්‍රමාණයක් වැටී තිබුණේ ඝන කැලෑ සහ කටු පඳුරු සහිත ලැහැබ්වලිනි. මිනිස්සු දින සති ගණන් මග ගෙවා පයින්ම කතරගම පැමිණියහ. ඒ එන මග දෙපස මිනිසුන්ගේ හිස්කබල් හා ඇටකටු විශාල ප්‍රමාණයක් දක්නට හැකි වූ බව කියනු ලැබේ. ඊට හේතුව මං පහරන්නන් විසින් මිනිසුන් මරා මුදල් පැහැර ගැනීමත්, රාත්‍රියේ නවාතැන් ගන්නා පිරිස් වන සතුන්ගේ ගොදුරු බවට පත්වීමත්ය.

සොහොන් බිම්වලට අරක් ගත් මහසොහොන් යකාගේ පුරාවෘත්තය වසර 2000කට වඩා පැරණිය. දුටුගැමුණු රජුගේ යෝධයෙකු වන ගෝඨයිම්බර සමග සටන් කර පැරදුණු රිටිගල ජයසේන නම් සටන්කරුවා මරණින් මතු මහසෝනා බවට පත්වී ගැමියන්ට කරදර කරන බව විශ්වාස කරනු ලැබේ. මහසෝනාට මනුෂ්‍ය ශරීරයක්ද වලස් හිසක් ද ඇත. ගෝඨයිම්බරගේ ගුවන් පා පහරකට කැඩී වෙන්වූ ජයසේනගේ හිස වෙනුවට ඔහුට ලැබුණේ වලස් හිසකි. කළු කුමාර යක්ෂයා ද ගම්මුන්ට නිතර හිරිහැර කරයි. කාන්තාවන් බියවැද්දීම කළු කුමාරයාගේ ප්‍රියතම ක්‍රීඩාවයි. ස්ත්‍රීන් කෙරේ ලොල්ව සිටි තරුණයෙකු හදිසි මරණයට ලක්ව කළු කුමාර යක්ෂයා ලෙස උපත ලැබූ බව කියනු ලැබේ.

කළු කුමාරයා කාන්තාවන් බිය වද්දන අතර පුරුෂයන්



Scanned with CamScanner

බියවැද්දීමේ කාර්යය මෝහිණී නම් යක්ෂණිය වෙත පැවරේ. මෝහිණී අවතාරය දරුවෙකු අතින් ගත් සුරූපී ස්ත්‍රියක් ලෙස දිස්වන බව කියනු ලැබේ. පුදුමයකට මෙන් ශ්‍රී ලංකාවේ පමණක් නොව මුස්ලිම් බහුතරයක් සිටින මලයාසියාවේ පවා වසරකට විශාල පිරිසක් "මෝහිණී" දිෂ්ටියට බිය වී රෝගාතුර වෙති. නමුත් ශ්‍රී ලාංකික මෝහිණිය සහ මලයාසියානු මෝහිණිය අතර පැහැදිලි වෙනසක් ඇත. ඒ මලයාසියානු මෝහිණිය දරුවෙකු අතේ නැතිව තනිව පැමිණ මිනිසුන් බියවද්දන බැවිනි.

තොටගමුවේ ශ්‍රී රාහුල හිමි වැඩි ප්‍රසිද්ධියක් ඉසුලුවේ යක්ෂයන් දමනය කර වැඩ ගැනීම සම්බන්ධවය. ඊට අවශ්‍ය මන්ත්‍ර සකස් කරනු ලැබුවේ ද උන්වහන්සේ විසිනි. ඒ මන්ත්‍ර බොහොමයක් සිංහල භාෂාවෙන් ලියූ ඒවා විය. තොටගමුවේ හිමියන් යකුන්ගෙන් වැඩ ගත් ආකාරය පිළිබඳව ජනප්‍රවාද රාශියක්ම ඇත. තොටගමුවේ හිමියන් විසින් දමනය කර වැඩට ගනු ලැබූ එක් යක්ෂයෙකුට පුදුම පුරුද්දක් විය. ඒ යක්ෂයාට වැඩ නොකර සිටීමට බැරි විය. ඌට එක් වැඩක් භාරදුන් කල එය වහා නිමකර පැමිණ තවත් වැඩක් ඉල්ලයි. මේ යක්ෂයා පලවා හරිනු ලැබුවේ ඌට දීමට තවත් වැඩ නොතිබූ බැවිනි.

බලන්ගොඩ ප්‍රදේශයේ විසූවේ යැයි කියන "වෙද මහත්තයා" නම් පුද්ගලයා යකුන් බැඳ වැඩ ගැනීමේ කලාව පරතෙරටම දැන සිටියේය. බලන්ගොඩ වෙද මහතා යකුන් දමනය කළ ආකාරය පිළිබඳ ජනප්‍රවාදය මෙසේය. බලන්ගොඩ වෙද මහතාගෙන් තමන්ට වන කරදර හිරිහැර ඉවසිය නොහැකි තැන යක්ෂයෝ තම ප්‍රධානියා වන වෙසමුණි රජුට ඒ ගැන පැමිණිලි කළහ. බලන්ගොඩ වෙද මහතා මට්ටු කිරීමේ කාර්යය භාරදෙනු ලැබුවේ බලසම්පන්න යකුන් දෙදෙනෙකු වූ " කඩවර" හා "කබලෑ" යන දෙදෙනාටයි. මේ දෙදෙනා තරුණියන් දෙදෙනෙකුගේ වෙස් ගෙන සන්ධ්‍යා කල්හි බලන්ගොඩ වෙද මහතා හමුවීමට පැමිණියේ වරදට පොලඹවා ගෙන වෙද මහතා මරා දැමීමටය.

ඒ වන විට වෙද මහතා නිවස අසල තිබූ හේන අසල වූ පැලෙහි ගිමන් අරිමින් සිටියේය. සන්ධ්‍යා කාලයේ තමන් වෙත එන නාඹර යුවතියන් දෙදෙනා මනුෂ්‍යයන් නොවන බව වෙද



Scanned with CamScanner

මහතා වටහා ගත්තේය. තමා ළඟ සඟවා ගෙන තිබූ මන්ත්‍රවලින් ජීවම් කළ පොල් කිරි දෙකක් ගෙන තරුණියන්ගේ හිසේ ගැසූ විගස තරුණියන් දෙදෙනා ඔහුට අවනත වූහ. මහානුභාව සම්පන්න කඩවර සහ කබලෑ යන දෙදෙනා වෙද මහතාගේ නිවසේ මෙහෙකාර යුවතියන් ලෙස දිගු කලක් සේවය කළහ. දිනක් වෙද මහතා නිවසෙහි නැති අතර උපායෙන් පොල් කිරි දෙක ගලවා ගැනීමට ඔවුහු සමත් වූහ. වෙද මහතාගේ නිවසේ සිටි අය ද මරණයට පත් කළ ඒ යක්ෂයන් දෙපළ වෙද මහතාගේ නිවසෙන් පිටවූයේ හේන් කොටමින් සිටින වෙද මහතා වෙත ගොස් සමච්චලයක් ද කරමිනි. යක්ෂයන් බලන්ගොඩ වෙද මහතා සමග කෙතරම් වෛරයෙන් පසු වූයේ ද යත් වෙද මහතා මළ පසු යකුන් විසින් මෘත ශරීරය ගෙයින් පිටතට ඇද දමා ඇටකටු කඩාබිඳ ඇමූ බව පැවසේ.

(කබලෑ) ගම්භාර, ඇඩිමුණ්ඩ, සූනියම්, කඩවර ආදී යක්ෂ දේවතාවුන් සියලුදෙනාම පූර පක්ෂයට අයත් දිනවල දේව ගතිගුණ දක්වන බවත්, චන්ද්‍රයාගේ අවපක්ෂයට අයත් දිනවල යක්ෂ ගතිගුණ දක්වන බවත් විශ්වාස කරනු ලැබේ. සූනියම් යකුගෙන් පිහිට ඉල්ලීම මෙරට ගැමි ජනතාව අතර අදටත් ජනප්‍රියය. සූනියම් දේවතා රූපයක් පහන් පැලක තැන්පත් කර සෑම රාත්‍රී කාලයකම ඊට පුද පූජා තබා කන්නලව් කරන විට නොවැරදීම සූනියම් දෙවියන් එතැනට "වඩින" බව පැවසේ. සුදු හැඳ ජටාවක් බැඳි මිනිසෙක් සැරයටියක් ගෙන පහන් පැල අසලට පැමිණෙන ආකාරය ඔවුන්ට නිරීක්ෂණය කළ හැකි බව පැවසේ.

යක්ෂ බලවේග ගැන විශ්වාස පැතිරී ඇත්තේ මෙරට පමණක් නොවේ. තිබ්බතය අමනුෂ්‍යයන්ගේ රජ දහනක් බව කියනු ලැබේ. එරට ජනතාව අතර ප්‍රචලිතව ඇති පුද පූජා හා ශාන්තිකර්ම රාශියකටම පදනම් වී ඇත්තේ යකුන් සහ යක්ෂණියන් පිළිබඳ විශ්වාසයන්ය. තිබ්බතීයයෝ "ඩාක" යනුවෙන් යකුන් ද "ඩාකිනී" යනුවෙන් යක්ෂණියන් ද හඳුන්වති. භයානක වෙස්ගත් ඩාකයන්ගේ හා ඩාකිනීන්ගේ අත්වල ආයුධ හෝ මිනී හිස්කබල් ද ගෙල වටා මනුෂ්‍ය අතුනුබහන් හෝ මිනී ඇට මාලා ද ඇති බව කියනු ලැබේ. ඩාකයන්ගේ මග ගත් සමහර යෝගීන් අමු සොහොන්වල දමාගිය මිනිසුන්ගේ මස් අනුභව කිරීමටත්, මිනී



Scanned with CamScanner

ඇට මාලා පැලඳීමටත්, මිනී හිස් කබල් තුළ දමා ආහාර වැළඳීමටත් හුරු වූ බව කියනු ලැබේ. තිබ්බත මහායෝගී මිලාරෙපා ඩාකයන් හා ඩාකිනීන් ළඟින් ඇසුරු කළේය. දැනට වසර 800 කට පමණ පෙර විසූ ඔහු ඩාකිනීන්ගෙන් අසා දැනගත් ක්‍රම අනුව අභ්‍යාස කර අධිමානසික හැකියා රැසක් ලබා ගත්තේය. මළවුන් නැගිටු වීම, මළගිය කෙනෙකුගේ සිරුර තුළට රිංගීම, මිනිසුන් දෙදෙනෙකු අතර ප්‍රාණය හුවමාරු කිරීම වැනි අතිශය පුදුම සහගත හාස්කම් රැසක් කිරීමේ හැකියාව මිලාරෙපාගේ ගෝල පරපුර වෙත උරුම විය.

පෙරදිග මෙන්ම අපරදිග රටවල ද යක්ෂයන් පිළිබඳ විශ්වාස හා ඇදහිලිවල අඩුවක් නැත. මැදපෙරදිග ලියවුණු ග්‍රන්ථයක් වන ඇරබියන් නයිට්ස් (Arabian Nights) හෙවත් අරාබි නිසොල්ලාසයෙහි යක්ෂයන් හා සම්බන්ධ කතා පුවත් කිහිපයක්ම ඇත. සුරූපී තරුණියන් සිර කරගෙන ඔවුන් සමග කම්සැප විඳි යක්ෂයන් ගැන එම කෘතියේ විස්තර අඩංගු වේ. පුරාණයේ පැවති විශ්වාසයන් හා ජනප්‍රවාද මේ කතා ප්‍රවෘත්තිවලට පදනම් වූ බවට සැක නැත.

යුරෝපාකරයෙහි යක්ෂයන් පිළිබඳ විශ්වාස කරන්නවුන් නැති බව සමහරු සිතති. සත්‍ය තත්ත්වය එය නොවේ. මධ්‍යකාලීන යුගයේ ක්‍රිස්තියානි පල්ලිය විසින් ආගමික බලය සම්පූර්ණයෙන්ම අල්ලා ගන්නා තෙක් යුරෝපය යක්ෂ ඇදහිලිවල කේන්ද්‍රස්ථානය බඳු විය. යුරෝපය තුළ ප්‍රචලිතව තිබූ ඩෘයිඩ් ඇදහිලිවල මූලික පදනම වූයේ යක්ෂයන් පිළිබඳ විශ්වාසයයි. යකුන් ඇදහීමේ දී ඔවුන් පිනවීමට මනුෂ්‍යයන් බිලි දීමට තරම් ඩෘයිඩ් පූජකවරු සැහැසි වූහ.

එංගලන්තයේ තණ බිමක් මත ඇති ස්ටෝන් හෙන්ජ් (Stone henge) නම් ඇවැන්ත වෘත්තාකාර ගොඩනැගිල්ල තනිකරම ගල් කණුවලින් නිම වූවකි. මේ ගොඩනැගිල්ල ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් එකකි. එහි ඇති යෝධ ගල්කණු කොහි සිට එහි ගෙන ආවේ ද යන්න කීමට දන්නා කෙනෙක් මිහිපිට නැත. එමෙන්ම කවර ප්‍රයෝජනයක් සඳහා මේ ගොඩනැගිල්ල ඉදිකළේ දැයි කීමට ද නොහැකිය. එනමුත්, ඩෘයිඩ් මන්ත්‍රකරුවන් විසින් යක්ෂයන්ගේ



Scanned with CamScanner

ආධාර ඇතිව මේ ගල් කණු සිට වූ බවට මතයක් ඇත. කෙසේ නමුත් යුරෝපය පුරාම මෑතක සිට නව ප්‍රවණතාවක් හටගෙන ඇති බව දැකිය හැකිය. සමහර යුරෝපීයයෝ තම සාම්ප්‍රදායික ආගම වන ඩෘයිඩ් ඇදහිලි වෙත නැවත නැඹුරු වෙමින් සිටිති. සමහරු පෙරදිග ආගම් වෙත යොමු වී සිටිති. යුරෝපය තුළ දැවැන්ත ආධ්‍යාත්මික හිඩැසක් ඇති බව පැහැදිලිය.

අප මෙතෙක් අවධානයට ලක් කළ යක්ෂයන්ට අමතරව භූමියට අරක් ගත් එවැනිම සත්ත්ව කොට්ඨාසයක් ගැන මෙරට තුළ විශ්වාසයක් ගොඩනැගී ඇත. ඔවුහු භූමියට අරක්ගත් බැවින් බහිරව නම් වෙති. සමහරුන් තම නිවෙස් ඉදි කිරීමට පෙර බහිරව පූජා තබනුයේ භූමියට අරක්ගත් බහිරවයන්ගේ සිත් පැහැදවීම සඳහාය. බහිරවයන්ගේ උත්පත්ති කතා අතිශයින් ශෝකජනකය. ඈත අතීතයේ සහ මධ්‍යකාලීන යුගයේ මෙරට බැංකු ක්‍රමයක් නොපැවතුණි. දුප්පත් ජනතාව තම මිල මුදල් හා ආභරණ ආරක්ෂා කරගැනීම සඳහා ඒවා මුට්ටිවල දමා ගෙතුළම වළ දැමූහ. අදටත් එම සිරිත ගම්බද නිවෙස්වල අයට හුරුපුරුදුය.

ධනවත් හා වංශවත් පිරිස් තම පරම්පරාවට අයත් ධන නිධාන සැඟවූයේ මීට වෙනස් විධියකටය. ඔවුහු කළුගල් සාරා ඒ තුළ ධනය රැස්කර පිටතට නොපෙනෙන්නට වසා තැබූහ. බහිරවයන්ගේ කාර්යය වූයේ මේ ධන නිධාන ඉදිරි පරම්පරාව වෙනුවෙන් ආරක්ෂා කරදීමයි. ඒ සඳහා බහිරවයෙකු "නිර්මාණය කළ" යුතු විය. බහිරවයෙකු වීම සඳහා තෝරාගනු ලබනුයේ දුර පළාතකින් පැහැර ගෙන ආ පිරිමි දරුවෙකි. ධනය නිදන් කර වසා දැමීමට පෙර එය අසරණ පිරිමි දරුවාට පෙන්වා "මේ ධනය නුඹේය, එය ආරක්ෂා කරගැනීම නුඹ සතුය. අපගේ වංශයේ කෙනෙකු හැර වෙනත් කෙනෙකුට එය අත්කර ගැනීමට ඉඩ නොතැබීම නුඹේ කාර්යභාරයයි" කියා දරුවාට පිටුපසින් සිට කඩුවකින් පහරදී ඔහු මරා දමනු ලැබේ. මේ අසරණ දරුවා ධනයට ආශාවෙන් මියගොස් එතැනම බහිරවයෙක්ව උපත ලබයි. ධනය රැකීමේ කාර්යය අකුරටම ඉටු කරමින් එය පැහැර ගන්නට පැමිණෙන්නන් බියවද්දා පලවා හැරීම එතැන් පටන් ඔහුගෙන් සිදුවනු ඇත. (ධර්මද්වීපය නම් ලද මේ රටෙහි වැසියන්ගේ තෘෂ්ණාවේ තරම මෙයින්ම ඔප්පු වේ.)



Scanned with CamScanner

නාග සහ ගුරුළු වශයෙන් හඳුන්වනු ලබන අමනුෂ්‍ය කොට්ඨාස දෙකක් ගැන සූත්‍ර පිටකය ප්‍රමුඛ බෞද්ධ මූලාශ්‍රවල කරුණු දැක්වේ. නාග නම් වූ අමනුෂ්‍ය කොටස පොළව තුළ ජීවත් වෙති. විටින් විට වෙස් මාරු කර ගැනීමේ හැකියාව ඔවුන්ට ඇත. විටෙක ඔවුහු සර්ප වේශයක් ගනිති. තවත් විටෙක මනුෂ්‍ය වේශයක් ගනිති. දෙවියන්ට මෙන් අතිමානුෂික හැකියා ඔවුන්ට ද ඇත. නන්දෝපනන්ද නාගයා අති බිහිසුණු සටන්කරුවෙකි. නන්දෝපනන්ද නාගයා සමග සටන් කර පැරදවීමේ හැකියාව තිබුණේ එක් බුද්ධ ශ්‍රාවකයෙකුට පමණි. ඒ මුගලන් මහතෙරුන් වහන්සේය. සෙසු බුද්ධ ශ්‍රාවකයන්ට නන්දෝපනන්ද නාගයාට තරම් ක්ෂණිකව එකිනෙකට වෙනස් ශක්තීන් මුදා හැරීමේ බලයක් නොතිබුණි. නාගයන්ගේ ප්‍රාතිහාර්ය ගැන අසන භික්ෂූන් වහන්සේලා නාගයන් වනු කැමතිව සිටින බවත් ඔවුන් මරණින් මතු නාගයන්ව උපදින බවත් ඛුද්දක නිකායේ දැක්වේ. අණ්ඩජ, ජලාබුජ, සංසේදජ, ඕපපාතික යන සතරාකාරයටම නාගයන් උපදින බව ද ඛුද්දක නිකායෙහිම සඳහන් වේ.

පෙර කී නාගයන්ගේ පරම සතුරන් වනුයේ ගුරුළන්ය. ගුරුළා නාගයන් දුටු තැන අල්ලා ගිලදමයි. එබැවින් නාගයන්ගේ සෑම හැකියාවක්ම ඇත්තේ ගුරුළන් නැති තැනය. නන්දෝපනන්ද නාගරාජයා දමනය කිරීමට මුගලන් තෙරුන් වහන්සේට හැකි වූයේ ගුරුළෙකුගේ වේශයක් ගැනීමෙනි.



Scanned with CamScanner

# 22. ප්‍රේත ලොව සැබෑ තතු

ප්‍රේත යන වදනෙහි තේරුම "ශරීරයෙන් ඉවත් වී ගිය" යන්නයි. එබැවින් මළගිය ප්‍රාණකාරයන් හැඳින්වීමට යෙදෙන පොදු වදනක් ලෙස "ප්‍රේත" යන යෙදුම භාවිත කළ හැකිය. කෙසේ නමුත් බුදු දහමෙහි ප්‍රේත ලෙස නිතර හඳුන්වනු ලබනුයේ මෙලෙස මනුෂ්‍ය ආත්මවලින් අත්මිදී ගොස් දුක් විඳින අමනුෂ්‍ය කොට්ඨාසයන් කිහිපයකි.

මූලික වශයෙන් ප්‍රේතයන් කොට්ඨාස 4කට බෙදා දැක්විය හැකි බව අටුවා ග්‍රන්ථවල දැක්වේ.

**1. පරදත්තූප ජීවී**

අනුන් දෙන දෙයින් පමණක් යැපිය හැකි ප්‍රේතයන් මෙනමින් හැඳින්වේ. මෙයින් අදහස් වනුයේ පරදත්තූප ජීවීන් අනුන් දෙන පින් අනුමෝදන්ව ඉන් යැපෙන බවයි. වස්ත්‍ර පූජා කර පින් දීමෙන් නිර්වස්ත්‍ර ප්‍රේතයන්ට ඇඳුම් ලැබීම ගැන සූත්‍ර පිටකයේ කිහිප තැනකම කරුණු දැක්වේ. මෙලෙසම ආහාර පානාදිය දන් දී පින් දීමෙන් කුසගින්නෙන් පෙළෙන ප්‍රේතයන්ට කෑම ලැබේ.

**2. ඛුප්පිපාසික**

මේ ප්‍රේත කොට්ඨාසය නිතරම සිටිනුයේ තිබහෙනි, කුසගින්නෙනි. ඔවුන්ගේ පාප ක්‍රියාවල බලපෑමෙන් ආහාර නොලැබේ.

**3. නිජ්ජාමතණ්හික**

තමා කළ පාප ක්‍රියාවල බලපෑම නිසා ශරීරය ඇතුළතින්ද පිටතින්ද දැවෙමින් දුක්විඳින ප්‍රේත කොටසකි. ගිජ්ඣකූට පර්වතයේ සිටි මෙවැනි සර්පාකාර ප්‍රේතයෙක් ගැන ධර්මයෙහි සඳහන් වේ. දැවැන්ත සර්පයෙකුගේ හැඩය ගත් මේ ප්‍රේතයා ඇතුළෙන්ද පිටතින් ද ගිනිජාලා මැවෙමින් දැවෙයි. ගිජ්ඣකූට පර්වතයට බුදුන්වහන්සේ වඩින අවස්ථාවල දී මේ ප්‍රේතයා නිතර මුණගැසුණ ද උන්වහන්සේ ඒ විස්තර රහසක් ලෙස තබා ගත්හ. ඊට හේතුව දිවැසට පමණක් විෂය වන එවැනි සත්ත්වයන් සිටිතැයි මිනිසුන් විශ්වාස නොකිරීමට ඉඩ ඇති බැවිනි.



Scanned with CamScanner

4. කාලකඤ්ජික

ඉතා අප්‍රසන්න පෙනුමක් ඇති ප්‍රේත කොට්ඨාසයකි. පිටතට නෙරා ගිය ඇස් ද විශාල ශරීර ද ඇති මේ ප්‍රේතයන්ට ඇත්තේ ඉතා කුඩා මුඛයකි. ආහාර ගැනීමට ඇති අපහසුතාව නිසා කෘශවී වියළී ගිය මේ ප්‍රේතයන් සමහර තැන්හි අසුරයන් ගණයටම අයත් කොට විස්තර දක්වා ඇත.

ප්‍රේතයන්ගෙන් වැඩි කොටසක් දුක සේ ජීවත් වෙති. එනමුත් දුක හා සැප දෙකම විඳින සෘද්ධි බල සහිත ප්‍රේතයන්ද සිටින බව ධර්මයේ සඳහන් වේ. සමහර ප්‍රේතයන්ට විසිතුරු මාලිගා ද උයන් වතු ද මැවී ඇත්තේ පෙර ආත්මභාවවල කළ කුශල කර්මවල විපාක හේතුවෙනි. පුර පක්ෂයේ දී දිව්‍ය සැප ද අවපක්ෂයේ දී අපා දුක ද විඳින ප්‍රේත කොට්ඨාසයක් සිටින බව අටුවා ග්‍රන්ථවල සඳහන් වේ.



තරප්පු පෙළක් මත හිඳින භූතයෙකුගේ ජායාරූවක්



Scanned with CamScanner

තම දේපළවලට හෝ වෙනයම් පුද්ගලයෙකුට හෝ ඇලීම ඇතිව මිය යන අය තම නිවෙස් ආසන්නයේම ප්‍රේතව උපදින බවත්, කෝපයෙන් හෝ වෛරයෙන් මිය ගිය අය යක්ෂයන්ව උපදින බවත් සූත්‍ර ගණනාවකම පැහැදිලි කර ඇත. ඛුද්දක නිකායේ "ඛුද්දක පාඨ" නම් කොටසෙහි ප්‍රේත ලෝකයෙහි පොදු ස්වරූපය ගැන මෙසේ විස්තර කර ඇත.

1. මළගිය ප්‍රාණකාරයෝ ප්‍රේතයන්ව ඉපිද තම ගෘහාසන්නයේ හෝ බිත්ති මුලුවල හෝ මාර්ගයේ මංසන්ධිවල හෝ නිවෙස්වල දොර මුලුවල හෝ ගැවසෙමින් වාසය කරති.

2. නිවෙස්හි බොහෝ ආහාරපාන පිළියෙල කළද ප්‍රේතයන්ගේ පූර්ව අකුශල කර්ම බලය නිසා ඒ කැම කිසිවක් උන්ට නොලැබේ.

3. එනමුත් ආහාරපාන දන් දී (පූජා කර) ඒ පින ප්‍රේතයන්ට අනුමෝදන් කිරීමෙන් ප්‍රේතයාට ඒ පින ලැබේ. දායකයාට ද ඉන් පින් අත්වේ.

4. ප්‍රේත ලෝකයේ ගොවිතැන් හෝ සත්ත්ව පාලනයන් හෝ වෙළඳාම් ආදිය සිදු නොවේ.

5. මළ ප්‍රේතයන්ට පිහිටට ඇත්තේ මෙලොව ඇත්තන් දන් දී අනුමෝදන් කරන පින පමණකි.

6. උස් බිමක සිට පහතට ජලය ගලා යන්නාක් සේ, ගංගා ඇළදොළ සයුරට ඇදී යන්නාක් සේ, අප දුන් පිනෙන් ප්‍රේතයන්ට ලාභ සත්කාර අත්වේ. (මෙම විස්තරයට අදාළ ගාථා පාඨය මළගිය ඇත්තන්ට පිං පැමිණ වීමේ දී අදට ද භාවිත වේ.)

7. තමාට උදව් උපකාර කළ අය ද ඥාති මිත්‍රයන් ද මියගිය කල දන් දී මළගිය ඒ අයට පින් පැමිණ විය යුතුය.

8. ඒ හැරුණු කොට මළ ඇත්තන් වෙනුවෙන් හඬා වැලපීමෙන් නම් පලක් නැත. මළගිය ඇත්තන් වෙනුවෙන් කෙතෙක් හඬා වැලපුණද ඔවුන්ට එයින් කිසිවක් නොලැබේ.

9. යමෙක් සාංඝික දානයක් දෙයි නම් එය එකෙණෙහිම විපාක දෙන මහ පිංකමක් බව දත යුතුය.



Scanned with CamScann

10. මිනිසුන් තම මළගිය ඥාතීන් වෙනුවෙන් කළ යුතු දේ මෙහි දී දක්වන ලදී. (තිරෝකුඩ්ඩ සූත්‍රය)

මෙහි කී මළගිය ඇත්තන් වෙනුවෙන් පිං දීමේ චාරිත්‍රය බුද්ධ කාලයේදීම ආරම්භ වූ බව පෙනේ. මළගිය ඇත්තන් වෙනුවෙන් පින්දීමේ චාරිත්‍රය මුල්වරට සංවිධානාත්මක ලෙස පවත්වන ලද්දේ බිම්බිසාර රජු වෙනුවෙනි. එදා සිට අද දක්වාම බෞද්ධයෝ මළගිය අය වෙනුවෙන් දන් දී පින් අනුමෝදන් කරති. යමෙකු මියගොස් දින 7කින් දානයක් දිය යුතු බවට මතයක් වෙයි. මේ මතයට පදනම්ව ඇත්තේ බුද්ධ කාලයේ දී වූ එක්තරා සිද්ධියකි. එක් සිල්වත් වයෝවෘද්ධ භික්ෂුවකට සුසිනිඳු සිවුරක් ලැබුණි. ඒ සිවුර ලැබී නොබෝ දිනකින්ම භික්ෂුව අපවත් වූයේය. දින 7ක් වන තුරු ඒ සිවුර භාවිත නොකළ යුතු බවත් දින 7කින් භික්ෂුවට පින් අනුමෝදන් කර සිවුර භාවිත කළ යුතු බවත් බුදුහු ශ්‍රාවක සංඝයා වහන්සේ වෙත උපදෙස් දුන්හ. මීට හේතුව සිවුරට ආශාවෙන් මියගිය භික්ෂුව ඒ සිවුරෙහිම ක්ෂුද්‍ර ජීවියෙකුව උපත ලැබීමයි.

ප්‍රේත ලෝකය මනුෂ්‍ය ලෝකයට වඩා විවිධාකාර විසිතුරු සත්ත්වයන් සිටින තැනකි. සූත්‍ර පිටකයට අයත් ඛුද්දක නිකායේ පේතවත්ථු පාලියෙහි ප්‍රේතයන්ගේ ස්වභාවය විස්තර කර ඇත්තේ පහත දැක්වෙන පරිද්දෙනි.

*1. සූකර මුඛ ප්‍රේතයා*

රන්වන් ශරීරයක් ඇති ඌරෙකු වුවද අප්‍රසන්න කටක් ඇති ප්‍රේතයෙකි. කයින් සංවරව වචනයෙන් අසංවරව සිටි කෙනෙක් මෙලෙස සූකර මුඛ නම් ප්‍රේතව දුක් විඳියි.

*2. පූතිමුඛ ප්‍රේතයා*

කේලාම් කීම පුරුද්ද කොටගත් සිල්වත් භික්ෂුවක් මියගොස් පූතිමුඛ ප්‍රේතව උපන්නේය. පූතිමුඛ ප්‍රේතයාගේ ශරීරය දෙවියෙකුගේ මෙන් සෝභාවත්ය. එහෙත් උගේ මුඛයෙහි පණුවන් නළියන තුවාලයකි.



Scanned with CamScanner

3. පුත්තඛාදක ප්‍රේතිය

මෙම ප්‍රේතියගේ ශරීරයෙන් දුගඳ හමයි. මේ ප්‍රේතිය උදය වරුවේ දරුවන් 5 දෙනෙක් ද සවස තවත් දරුවන් 5 දෙනෙක් ද ප්‍රසූත කර කුසගින්න ඉවසනු නොහැකිව ඒ දරුවන් මරා කයි. මැය වෙනත් කතකට ගබ්සාවක් කර තමා එය නොකළේ යයි බොරුවට දිවුරා කීම නිසා මරණින් මතු පුත්තඛාදක ප්‍රේතියව උපද ලද්දීය.

4. මහා පේෂකාර ප්‍රේතිය

යකඩ වස්ත්‍ර හඳිමින් මල, මුත්‍රා හා ලේ, සැරව අනුභව කරමින් සිටිනුයේ පෙර කල රෙදි වියන්නියක්ව සිටි අයෙකි. තද මසුරු තැනැත්තියක් වූ ඇය තම ස්වාමියා දානමය පිංකම් කරන විට මේ දානය ලේ සහ සැරව වේවා යනුවෙන් ශාප කළාය. ඒ පව නිසා ඇය යකඩ වස්ත්‍ර හඳිමින් ලේ සැරව අනුභව කරමින් ප්‍රේතියක්ව දුක සේ ජීවත් විය.

5. නග්න ප්‍රේතිය

සිල්වත් භික්ෂුවකට ආහාර ස්වල්පයක් පූජා කළ පිනෙන් එක්තරා ස්ත්‍රියක් මරණින් මතු සැප සහිත ප්‍රේත විමානයක නග්නව ඉපදුණාය. ඇය නග්නව ඉපදුණේ ආහාර පමණක් දන්දුන් බැවිනි. එකී ප්‍රේතිය වෙළඳ පිරිසක් ඉදිරියේ පෙනී සිට ඇය වෙනුවෙන් එතැන සිටි බෞද්ධ උපාසකයෙකුට වස්ත්‍රයක් පූජා කරවා දන්දෙන ලෙස වෙළෙන්දන්ට උපදෙස් දුන්නාය. ඒ පින් අනුමෝදන් වීම නිසා ප්‍රේතියට වස්ත්‍ර ලැබුණි. එහෙත් ඇයගේ ජනක කර්මය ගෙවී ගොස් තිබූ බැවින් ළඟදීම ප්‍රේත විමානයෙන් චුතව දොරටු සතරක් සහ අයෝමය පියස්සක් සහිත ගින්නෙන් දැවී දුක් විඳින අපාය භූමියක ඉපදීමට නියමිතව සිටියි. එහෙයින් ඇය තවදුරටත් ශෝක වෙමින් පසුතැවෙයි.

6. ප්‍රේත පවුල

මේ ප්‍රේත පවුලෙහි සමහර සාමාජිකයෝ සැප විඳිති. සමහරු උනුන් මරාගෙන ලේ බොමින් අන්ත දුක් විඳිති. මොවුහු සියලු දෙනාම ගිය ආත්මයෙහි එක පවුලක සාමාජිකයෝ වූහ.

✧ වැඩිමහලු පුත්‍රයා දන් දුන් පිනෙන් දිව්‍යමය රූප



Scanned with CamScanner

ස්වභාවෙන් යුතුව සුදු ඇතුපිට ගමන් කරයි.

✧ දෙවැනි පුත්‍රයා වෙළඹුන් සතර දෙනෙකු යෙදූ අස්රියෙන් දිව්‍යමය තේජසින් යුතුව ගමන් කරනුයේ ඔහු ද දානපතියෙකු වූ බැවිනි.

✧ දෝලාවකින් යන රූමත් දෙවඟන ඒ පවුලේ බාල දියණියයි. තම ආදායමෙන් අඩක් දන් දුන් පිනෙන් ඇය දිව්‍යමය සැප විඳීමට සුදුසුකම් ලැබ සිටියි.

✧ ඒ පවුලේ ඉතිරි අය දන් දීමට නොකැමතිව ලෝභීව ජීවත් වූහ. ඔවුහු අද ප්‍රේතයන්ව ඉපිද දඬු මුගුරුවලින් ගසා එකිනෙකා මරණයට පත් කරමින් ලේ සැරව බොති.

*7. විරූපී ප්‍රේතිය*

මිනිස් ලොව සිටි එක් කාන්තාවක් කිසිදු පිංකමක් නොකර මියගොස් ප්‍රේතව උපන්නාය. ඇය කිසිවක් නුදුන් බැවින් නග්න විරූපී ප්‍රේතියක්ව දුක් විඳියි. ඇය දකින සැරියුත් හිමියෝ කවර උදව්වක් අවශ්‍ය දැයි අසති. මා වෙනුවෙන් දන් දී පිං පමුණුවන්නැයි ප්‍රේතිය කීවාය. සැරියුත් තෙරණුවෝ කුඩා වස්ත්‍ර කැබැල්ලක් ද පැන් තලියක් ද භික්ෂුවකට දන් දී ප්‍රේතියට පින් පැමිණුවාය. ඒ පින් බලෙන් ප්‍රේතියට දිව්‍යමය වස්ත්‍ර හා භෝජන ලැබුණි.

*8. මන්තා නම් ප්‍රේතිය*

දඹදිව එක් කුලපුත්‍රයෙකුට මන්තා සහ තිස්සා නමින් බිරින්දෑවරු දෙදෙනෙකු විය. මන්තා හැම විටම තිස්සා ගැන ඊර්ෂ්‍යා කළාය. ඈ කිසිදු පින්කමක් වත් කළේ නැත. මන්තා මරණින් මතු නිරුවත් ප්‍රේතියක්ව උපන්නාය. පෙර භවයේ දී තිස්සා වෙත පස්වලින් දමා ගැසූ නිසා දැන් ඇගේ සිරුරේ පස් ඇලී ඇත. තිස්සාගේ ඇඳෙහි කහඹිලියා ගෑ නිසා දැන් ඒ ප්‍රේතියට කුෂ්ට රෝගයක් වෙයි. තිස්සාගේ ඇඳුම් සොරාගත් පවින් ඈ නග්නව සිටියි. තිස්සාට අයත් සුවඳ විලවුන් බඳුන් වැසිකිළි වළකට හෙළූ නිසා දැන් ඇයගේ ශරීරයෙන් දුගඳ හමයි. (සංඝයා වහන්සේ සිව් නමකට සාංඝික කර අට නමකට දෙන දානයකින් මේ ප්‍රේතිය සුවපත් කළ හැකි විය.)



Scanned with CamScanner

9. නන්දා නම් ප්‍රේතිය

පෙර කල නන්දසේන නම් පුද්ගලයෙකුට නන්දා නම් බිරිඳක් විය. නන්දා තම ස්වාමි පුරුෂයාට ගරුසරු නොකළාය. නිතර ක්‍රෝධ කළාය. එහෙයින් ඈ මරණින් මතු කළු පැහැ බියකරු පෙනුමක් ඇති ප්‍රේතියක්ව උපන්නාය.

10. ධනපාල නම් ප්‍රේතයා

පෙර කල ධනපාල නම් සිටුවරයෙක් විසීය. හේ ඇඩි මසුරෙකි. තද මිථ්‍යා දෘෂ්ටිකයෙකි. ලෝභකම නිසාම තමන්ද දන් නොදුන්නේය. අනුන් ද ඉන් වැළැක් වූයේය. හේ මරණින් මතු නග්න ප්‍රේතයෙකු බවට පත් වූයේය. හේ වසර 55ක් පුරා කිසිදු ආහාරයක් නොලැබ සාපිපාසාවෙන් පෙළෙමින් සිටියේය.

11. මුහුණ හැකිළුණු ප්‍රේතයා

පෙර කල එක් පුරුෂයෙක් දන්සැලක පෙළගැසී සිටි දුගියන් දෙස බලා ඉවතට ගොස් මුහුණ හකුළුවා ගත්තේය. හේ මරණින් මතු ප්‍රේතයෙකුව ඉපිද හැකිළුණු මුහුණින් හා වකුටු වූ අතපයවලින් යුතුව කබ, කඳුළු වගුරුවමින් හිඳියි.

12. කෙස්වලින් විළි වසාගත් ප්‍රේතිය

එක්තරා ස්ත්‍රියක් තම පුත්‍රයා විසින් සිදුකරන දන් පින්වලට විරුද්ධව නොයෙකුත් දේ කීවාය. ඇය මරණින් මතුව ප්‍රේතියක්ව ඉපිද කෙස්වලින් විළි වසාගෙන හිඳියි. ඇය සැමවිටම පිපාසයෙන් පෙළෙනුයේ දිය බීමට උත්සාහ කරන සැමවිටදීම ජලය අප්‍රසන්න වූ රුධිරය බවට හැරෙන බැවිනි.

13. බල්ලා විසින් දිනපතාම කනු ලබන ප්‍රේතිය

පෙර එක්තරා කාන්තාවක් ස්වාමියාට අකීකරුව ජීවත් වූවාය. ස්වාමියාට තම රහස් සැඟවූ ඇය තමා බොරු කියයි නම් නිවසේ සිටින බල්ලා විසින් තමා කනු ඇතැයි දිවුරුවාය. මේ ස්ත්‍රිය මියගොස් මනහර උයනක දිව්‍යමය රූපශ්‍රීයෙන් යුතු ප්‍රේතියක්ව උපත ලැබුවාය. එහෙත් සෑම දිනකම මධ්‍යම රාත්‍රියේ කන් කඩා වැටුණු බල්ලෙක් පැමිණ මේ සුන්දර කාන්තාව පණපිටින් කා දමනු ලැබෙයි. අනතුරුව ඇගේ ඇටසැකිල්ල නැගිට ඇවිද ගොස් උයනෙහි වූ පොකුණට වැටෙයි. එතැන්හිදී නැවතත් දිව්‍යමය

රූපශ්‍රීයෙන් යුතු තරුණියක් බිහි වේ. ස්වාමියාට අකීකරුව බොරුවට දිව්රුම් කළ නිසා ඇයට මෙබඳු විපත්තියක් අත් විය.

### 14. බොහෝ දුක්විඳින ප්‍රේතයන් හතර දෙනා

එක් කුට වෙළෙන්දෙක් බොල් වී හොඳ වී සමග මිශ්‍ර කර විකුණුවේය. ඔහු මරණින් මතු ප්‍රේතයෙකුව ඉපිද බොල් වී හිස මත විසුරුවා ගනියි. තවත් අයෙක් තම මවට හිංසා කළ නිසා ප්‍රේතව ඉපිද තම හිසට මුගුරකින් පහර දී හිස බිඳ ගනියි. තවත් කාන්තාවක් මස් කෑමෙහි ගිජුව සිට මරණින් මතු ප්‍රේතව ඉපිද තමාගේම මස් අනුභව කරයි. තවත් අයෙක් බොරුවට දිවුරා එහි විපාක ලෙස ප්‍රේතව ඉපිද අශුචි අනුභව කරයි.

### 15. දිවා කල දුක් විඳින ප්‍රේතයා

එක් දඩයක්කරුවෙක් උපාසකයෙකුගෙන් බණ අසා පැහැදී රාත්‍රී කල දැහැමිව ජීවත් වූයේය. ඔහු දිවා කල සුපුරුදු ලෙස දඩයම් කළේය. මේ පුද්ගලයා මරණින් මතු ප්‍රේතව ඉපිද දිවා කල බල්ලන් විසින් කනු ලැබේ. රාත්‍රී කල ඔහු දිව්‍යමය සැප විඳියි.

### 16. තමාගේම මස් කන ප්‍රේතයා

පෙර කල එක් පුද්ගලයෙක් බොරු කේලාම් ආදිය කියමින් වාග් දුෂ්චරිතයෙහි යෙදුණේය. හේ අයුක්ති සහගත තීරණ ගත් අයෙකි. මේ පුද්ගලයා මරණින් මතු මහත් රූපශ්‍රීයෙන් යුතු ප්‍රේතයෙක් වූයේය. එහෙත් පෙර පව් ඵලදීම නිසා තමාගේම මස් උදුරා කා දමයි.

### 17. තියුණු සැත්වලින් කැපුම් කන ප්‍රේතයා

පෙර කල එක් පුද්ගලයෙක් චෛත්‍ය වන්දනාවෙහි යෙදුණු අයට ඒ ක්‍රියාවේ ඵලයක් නැති බව කියා ඉන් වැළැක්වූවේය. ඒ පාපයේ බලයෙන් ඔහු ප්‍රේතව ඉපිද තියුණු සැත්වලින් කැපුම් කයි. ඔහුගේ ශරීරයෙන් ඉවසිය නොහැකි දුගඳක් හමයි.

### 18. උක්දඬු උයනේ සිටි ප්‍රේතයා

එක්තරා ප්‍රේතයෙක් උක්ගස් වැඩී ඇති උයනක කුසගින්නේ හිඳියි. ඔහු උක්දඬු කෑමට උත්සාහ කරන සෑම විටකම උක් පත්‍රවලට කැපී කැපුම් තුවාල ලබයි. පෙර කල ඔහු උක්දඬු මිටියක්



Scanned with CamScanner

රැගෙන යමින් ඉන් එක් උක්දණ්ඩක් සැපුවේය. තවත් කෙනෙක් ඔහු පිටුපසින් පැමිණ උක්දණ්ඩක් ඉල්ලීය. ඔහු අදිමදි කර පිටුපසට අත යොමුකර අකමැත්තෙන් උක්දණ්ඩක් දුන්නේය. සාපිපාසාවෙන් සිටි අයට කන්නට යමක් නුදුන් බැවින් ඔහු අද උක්දඬු වනයේ කුසගින්නේම සිටියි. එහෙත් ඔහුට උක්දඬු කෑ හැකි ක්‍රමයක් ඇත. අත පිටුපසට යොමු කර උක්දණ්ඩක් ලබාගෙන කෑමට ඔහුට හැකියාව ඇත. ඊට හේතුව ඔහු අත පිටුපසට හරවා අකමැත්තෙන් දුන් බැවිනි.

*19. ප්‍රේත ලොවට ගිය උපාසකයා*

පෙර කල එක්තරා උපාසකයෙක් විහාරයක් කරවීය. මේ විහාරයේ සිටි එක් භික්ෂුවක් සිව්පසයෙහි ගිජුව උපාසකයාගේ සිත් වෙනස් කර ඒ විහාරයට පැමිණි සිල්වත් භික්ෂූන්ට එතැන එපා වන තැනට වැඩ කළේය. මොවුහු දෙදෙනාම මියගොස් වැසිකිළි වළක ප්‍රේතයන්ව උපත ලැබූහ. උපාසක ප්‍රේතයා පෙර කල භික්ෂුව ලෙස හිඳි ප්‍රේතයාගේ කර මත හිඳියි. මිනිසුන්ගේ අශුචි උපාසක ප්‍රේතයාගේ කටට වැටේ. උපාසක ප්‍රේතයාගේ අශුචි ශ්‍රමණ ප්‍රේතයාගේ ආහාරය වෙයි.

*20. යකුළු පහර කන ප්‍රේතයා*

බොහෝ කලකට එපිට සුනෙත්ත නම් පසේ බුදුවරයෙක් විය. එක්තරා දුෂ්ට මිනිසෙක් පසේ බුදුන්වහන්සේ සමවත් සුවයෙන් සිටිය දී උන්වහන්සේගේ හිසට ගලකින් පහර දී මරණයට පත් කළේය. දිගු කලක් නිරයේ පැසුණු ඔහු දැන් ප්‍රේතයෙකුව ඉපිද සිටියි. ඔහුගේ හිසට හැම දිනයකම යකුළු පහරවල් 60,000 ක් බැගින් වැදෙයි. ඔහු ප්‍රේතයන් අතර සිටින ඉතා අවාසනාවන්ත අයෙකි.

නිරය, අසුර ලෝකය හා ප්‍රේත ලෝකය පිළිබඳ විස්තර මෙසේය. තිරිසන් සතුන් ද අයිතිවනුයේ සතර අපාගත සත්ත්වයන්ටමය.

✧ අධික මානය සහිතව අනුන්ට නින්දා කළ අය මරණින් මතු වඳුරන්ව උපදිති.

✧ තම වස්තුවට ඇති තෘෂ්ණාව නිසා මරණින් මතු




Scanned with CamScanner

සුනඛයන්ව උපත ලැබීමට සිදුවිය හැකිය. තෝදෙය්‍ය සිටුතුමා තමාගේ ධනයට ඇති තෘෂ්ණාව අතහැර ගත නොහැකිව මියගොස් තම නිවසෙහිම සුනඛයෙකු වී උපත ලද්දේය.

✧ මිථ්‍යා දෘෂ්ටිකව දිවි ගෙවූ රාජ මහේශිකාවක් මියගොස් ගොම කුරුමිණියෙකුව උපන්නාය.

✧ අනුන්ට ණයගැතිව සිට මියගිය අය ගවයන්ව උපත ලබා ණයහිමියන්ට බැළ මෙහෙවර කරන බවට බෞද්ධයන් අතර විශ්වාසයක් ඇත.

යමෙකුට අපායෙහි දුක දැකීමට අවශ්‍ය නම් ඔහුට තිරිසනුන් විඳින දුක් වේදනා දෙස බලා ඒ පිළිබඳ දළ අවබෝධයක් ලද හැකිය. තිරිසන් සත්තු උනුන් කා ගනිති. සමහර විට හඬව හඬවා පණ පිටින්ම කාදමනු ලැබෙති. තිරිසන් ලෝකයේ කුසගින්න, පිපාසාව හා මරණ භය සෑම කල්හිම ඇත.



අනපේක්ෂිතව භූතයන් දෙදෙනෙක් ඡායාරූපයට හසු වූ අවස්ථාවක් - භූතයන්ගේ සේයාවන් ඊතලවලින් දැක්වේ.



Scanned with CamScanner

# 23. සදෙව් ලොව අසිරිසිරි

සත්ත්වයන් කම් සැප බහුලව විඳින ලෝකවලට "කාමාවචර සුගති" යන නම යෙදෙයි. මිනිස් ලොව කාමාවචර සුගති ගණයටම අයත් වේ. එබැවින් මිනිසෙකු ලෙස උත්පත්තිය ලබනුයේ කුශල කර්මයක විපාක හේතු කොට ගෙනය. මිනිස් ලොව හැරුණු විට තවත් කම් සැප බහුල තැන් හයක් ඇති බව සූත්‍ර ධර්මයන්හි දැක්වේ. ඒවා කාමාවචර දිව්‍යලෝක නම් වේ. කාමාවචර දිව්‍යලෝක ගණනින් හයකි.

1. *චාතුර්මහාරාජිකය*

මෙහි රජවරු හතර දෙනෙකු පාලන කටයුතු භාරව සිටිති. දිව්‍ය වර්ෂවලින් අවුරුදු 500ක ආයුෂය මෙහි ඇත. මෙහි එක් දිනක් මිනිස් ලොව අවුරුදු 50කට සමානය. ඒ අනුව චාතුර්මහාරාජිකයේ උපන් අයෙකුගේ පරමායුෂ මිනිස් ලොව වර්ෂවලින් වර්ෂ අනූලක්ෂයකි.

2. *තාවතිංසය*

තාවතිංසය හෙවත් තව්තිසා දෙව්ලොව පිහිටා ඇත්තේ චාතුර්මහාරාජිකයට එපිටිනි. එහි ආයුෂය දිව්‍ය වර්ෂ 1000කි. එහි දිනක් මිනිස් ලොව අවුරුදු 100කි. ඒ අනුව තව්තිසාවෙහි පරමායුෂ අවුරුදු තුන්කෝටි හැටලක්ෂයකි. දෙව් ලොවට අධිපති ශක්‍රයා සිටිනුයේ තව්තිසාවෙහිය. ඔහුගේ වාසස්ථානය ශක්‍ර භවන නම් වෙයි. ශක්‍රයා තව්තිසාවෙහි රජකමට අමතරව චාතුර්මහාරාජිකයෙහි පාලන කටයුතු භාරව සිටියි.

3. *යාමය*

යාමය ඇත්තේ තව්තිසාවට එපිටිනි. යාමයෙහි වැසියෝ දිව්‍ය වර්ෂ 2000ක් පරමායුෂ විඳිති. යාමයෙහි එක් දිනක් මිනිස් ලොව වසර 200කි. ඒ අනුව මනුෂ්‍ය වර්ෂ දාහතර කෝටි හතළිස් ලක්ෂයක් ජීවත්වීමට යාමයෙහි වැසියන්ට වරම් ඇත. යම රජු සිටිනුයේ යාමයෙහි බව සමහරු සිතති. තවත් අය කියන පරිදි යම රජු යනු චාතුර්මහාරාජිකයේ සිටින වෛශ්‍රවණ නම් පාලකයාය. එනමුත් අපායෙහි වෙනම යම රජ කෙනෙක් සිටින බව දේවදූත



Scanned with CamScanner

සූත්‍රයේ එන කරුණු අනුව පැහැදිලි වේ. යම රජු අපායෙහි වෙසෙන අය විඳින දුක් වේදනා දැක කම්පනයට ලක්ව බුදුන් දැක බණ අසනු රිසියෙන් යුතුව කල් ගෙවයි.

### 4. තුසිතය

තුසිතයේ වැසියෝ සැමවිටම සතුටින් කල් ගෙවති. තුසිත හෙවත් "සන්තුසිත" දෙව් ලොවට එනම ලැබුණේ එලෙසිනි. තුසිතයේ වැසියන් සතුටින් සිටිනුයේ මතු මෛත්‍රී නමින් බුදු වන මෛත්‍රී බෝසතුන් එහි වැඩසිටින බැවිනි. තුසිතය තුළ ඇති ධාර්මික පරිසරය නිසා බොහෝ බොදුනුවෝ මරණින් මතු තුසිත දෙව් ලොවෙහි උපත ලබනු රිසිව පින්කම් කරති. තුසිතයේ ආයුෂ දිව්‍ය වර්ෂ 4000කි. එහි එක් දිනක් මිනිස් වර්ෂ 400කි. එබැවින් තුසිතයේ වැසියන්ට වර්ෂ 57 කෝටි හැට ලක්ෂයක් පරමායුෂ විඳිය හැකිය. සිදුහත් බෝසත්හු මෙලොව පහළ වීමට පෙර තුසිත දෙව් ලොවෙහි ශ්වේත කේතු නම් දිව්‍ය පුත්‍රව සිටියේය.

### 5. නිර්මාණරතිය

මෙය සුවිශේෂී දෙව් ලොවකි. නිර්මාණරතියේ වැසියන්ට තමන් වෙනුවෙන් සැප සම්පත් නිර්මාණය කළ හැකිය. එබැවින් එහි දී විඳිය හැකි සැප සම්පත්වල සීමාවක් නැත. "මනාප කායික" නම් වූ දෙවියන් විශේෂයක් බුදුන් හමුවීමට පැමිණි බව ධර්මයේ දැක්වේ. මනාප කායික දෙවියන්ට තමන් කැමති රූප ස්වභාවයක් ගත හැකිය. තමන් කැමති දිව්‍ය වස්ත්‍ර හෝ දිව්‍ය ආභරණවලින් සැරසිය හැකිය. සරාගී මනාප කායික දෙව්ලියන්ගේ ශරීරාංග දුටු ආනන්ද හිමියන් ලැජ්ජාවට පත් වූ බව ධර්මයෙහි සඳහන්ය.

නිර්මාණරතියේ ආයුෂ දිව්‍ය වර්ෂ අටදහසකි. මිනිස් ලොව වර්ෂ 800ක් එහි එක් දිනයකි. ඒ අනුව නිර්මාණරතියේ වැසියන්ට මිනිස් වර්ෂ 230 කෝටි 40 ලක්ෂයක් පරමායුෂ විඳීමට අවසර ඇත.

### 6. පරනිර්මිත වසවර්තිය

අවසාන දිව්‍ය ලෝකය මෙයයි. වැඩිම කම්සැප ඇත්තේ පරනිර්මිත වසවර්තියෙහිය. මෙහි වැසියන්ට තමන් වෙනුවෙන් ද අනුන් වෙනුවෙන් ද පස්කම් සැප නිර්මාණය කළ හැකිය. එහෙයින්



Scanned with CamScanner

පරනිර්මිත වසවර්තියේ ඇති සැපයෙහි ද සීමාවක් නැත. බුදුන්ට නිතරම කරදර කළ වසවර්ති මාරයා පරනිර්මිත වසවර්තියේ සිට පැමිණියෙකි. ඔහු එහි පාලකයා බව සමහර අටුවාචාර්යවරු කියති. තවත් මතයකට අනුව මාර දිව්‍ය පුත්‍රයා පරනිර්මිත වසවර්තියේ සිටින ත්‍රස්තවාදී නායකයෙකි. ඔහුගේ ප්‍රධානතම අරමුණ වනුයේ මිනිසුන්ගේ ආධ්‍යාත්මික දියුණුව වැළැක්වීමයි. පරනිර්මිත වසවර්තියේ ආයුෂය දිව්‍ය වර්ෂ 16,000 කි. මිනිස් වර්ෂ 1,600ක් එහි එක් දිනයකි. ඒ අනුව වර්ෂ 921 කෝටි 60 ලක්ෂයක් දිව්‍ය සැප විඳීමට එහි වැසියන්ට හැකිය.

පෙර කී දෙවියන්ට අමතරව අසුර නම් දේව කොට්ඨාසයක් ද වෙසෙති. අසුරයන් කලින් වාසය කළේ තාවතිංසයේය. තාවතිංසයේ ඇති වූ වර්ගවාදී අරගලයක් නිසා දෙවියෝ දෙපිලකට බෙදුණහ. වර්ගවාදී කෝලාහල උත්සන්න වී සුර අසුර යුද්ධය එළඹුණි. යුද්ධයෙන් පැරදුණු අසුරයෝ මහමෙර පත්ලට හෙළන ලදහ. (මෙකී මහමෙර ඇති ස්ථානය අවිනිශ්චිතය) අසුරයන්ගේ පාලකයා වේපචිත්ති නම් අසුර රජුය. හේ වරෙක සුරයන් සමග යුද්ධ කරයි. තවත් විටෙක සාම සාකච්ඡා කරයි. තවත් විටෙක සුරයන්ගේ ග්‍රහණයට අසු වී අනූනවයෙන් ගැලවෙයි. රටවාසීන්ට පෙනෙන්නට යුද්ධ කරන මේ දෙදෙනා රහසේ හමු වී මිනිස් ලොව තතු බැලීමට එක්ව යති. මොවුන් දෙදෙනා අතර නෑ කමක් ද ඇත්තේය. ශක්‍රයාගේ ප්‍රියතම බිරිඳ අසුර කාන්තාවකි. අසුර ලොවින් තම වයසට නොගැළපෙන විවාහයක් කරගත් ශක්‍රයා තරමක ශටකපට පුද්ගලයෙකි.

හේ අසුරයන් පැරදවීමට විවිධ කුමන්ත්‍රණ සැලසුම් කරයි. ඔහුට අවශ්‍ය වන්නේ වේපචිත්ති ජීවග්‍රහයෙන් අල්වාගෙන තම මාලිගාව තුළ සිරකරුවෙකු කර තබා ගැනීමටය. සුරයන් හා අසුරයන් දෙපක්ෂයම දෙබිඩි ප්‍රතිපත්තිවල හිඳිමින් බල අරගලයක යෙදෙන බව සූත්‍ර පිටකයේ එන කරුණු අනුව පැහැදිලි වේ.

මූලික සූත්‍රවල එන විස්තරයේ දක්වා ඇත්තේ දිව්‍ය ලෝක හයක් පමණකි. එහෙත් දිව්‍ය ලෝක 36 කට වැඩි ගණනකට තමා ගොස් ඇති බව තිබ්බත මහායෝගී මිලාරෙපා විසින් සඳහන් කර ඇත. මිලාරෙපා කියන පරිදි දෙවියන් සිටිනුයේ නිර්වස්ත්‍රවය.



Scanned with CamScann

නිර්වස්ත්‍රව සිටිතත් ඔවුන්ගේ සිරුරෙහි රූප ශෝභාව නිසා අප්‍රසන්න භාවයක් ඇති නොවේ. සමහර දෙවියෝ බියකරු පෙනුම ඇති අය වෙති. අනෙක් අය සෞම්‍ය පෙනුමෙන් යුක්ත වෙති. මිලාරෙපාගේ සමහර ඉගැන්වීම් සකස් කර ඇත්තේ දෙවියන්ගෙන් ලත් උපදෙස් ආශ්‍රයෙනි.



දෙව් ලොව හා අපාය පිළිබඳ අබිරහස් රැසක් හෙළි කළ මහායෝගී මිලාරෙපා - තිබ්බත ආරාමයක ඇති අනුරුවකි.

දිව්‍ය ලෝකවල හිරු හෝ සඳු දක්නට නොලැබෙන බවත්, දෙවියන්ගේ ශරීර ප්‍රභාවෙන්ම දෙව් ලොව එළිය වන බවත් මුල් බෞද්ධ මූලාශ්‍රවල දැක්වේ. දෙවියන්ගේ ශරීර අපගේ ශරීරවලට වඩා සූක්ෂමය. අපට දෙවියන් නොපෙනෙනුයේ එබැවිනි. බුදුන් හමු වීමට ආ නවක දෙවියෙක් එක තැන සිටිනු නොහැකිව පොළවෙහි ගිලීයාමට පටන් ගත් බව පැවසේ. බුදුන්ගෙන් ලත් උපදෙස් අනුව ශරීරය ඝන කරගත් කල ඒ දෙවියාට පොළව මත



Scanned with CamScanner

නැඟී සිටිය හැකි විය. දෙවියෝ ද අප මෙන්ම ආහාර මත යැපෙති. එක් ආහාර වේලක් හෝ වැරදී ගියහොත් එයින් දෙවියාගේ මරණය සිදු වේ. සමහර දෙවියෝ අනුන්ට ඇති සම්පත් දැක ඊර්ෂ්‍යා කරති. ඊර්ෂ්‍යාව වැනි ප්‍රබල චිත්ත වේග හසුරුවා ගත නොහැකි වූ විට දෙවියෝ ඒ හේතුවෙන්ම මිය යති.

සෝවාන් වූවෝද සකෘදාගාමී වූවෝද මරණින් මතු දෙව් ලොව උපදිති. ඒ හැර ප්‍රබල පිංකම් නිසා ද සත්ත්වයා මරණින් මතු දෙව් ලොව උපදියි. පිංකම් බහුලව සිද්ධ කරන අය මිය යාමටත් පෙර ඔවුන්ගේ දිව්‍ය මාලිගා දෙව් ලොව පහළ වේ. දෙව් ලොව ද නිරයේ ද සත්ත්වයන් උපදිනුයේ ඕපපාතිකවය. එනම්, මවක් හෝ පියෙකු නැති උපතකි.

මනුෂ්‍යයන් මෙන් නොව දෙවියන් වැඩුණු ශරීරාංග ඇතිව පහළ වන බව සූත්‍ර පිටකයේ එන විස්තර අනුව පැහැදිලි වේ. සාමාන්‍යයෙන් දෙවියන්ගේ කය වයසත් සමග දිරා නොයයි. එහෙත් දෙවියන්ගේ ආයුෂ නිම වීමත් සමග මරණයේ පෙරනිමිති පහළ වේ.

- ඔවුන්ගේ ශරීර දුර්වර්ණ වේ.
- දිව්‍යමය ආලෝකය පහ වේ.
- පැලඳ සිටින මල්මාලා මැලවී යයි.
- දිව්‍ය ආසනයේ හිඳ ගැනීමට නොහැකි වේ.
- කිහිලිවලින් දහදිය දමයි.

මේ ලක්ෂණ පහළ වූ කල දෙවියා මහත් සේ කලබල වෙයි. ඔහුගේ අවසානය ළං වූ බව දත් අනෙක් දෙවියෝ ඔහුව අස්වැසීමට උත්සාහ කරති.

මහායාන බුදු දහමේ විස්තර වන සුඛාවතී දෙව් ලොව සිරි විසිතුරු මීට වඩා හාත්පසින්ම වෙනස්ය. ඒ විස්තර අනුව මුළු දෙව් ලොවම පොළව තැනිතලාය. එහි කඳු හෙල් ආගාධ නැත. එහි පොළව එරෙන සුලුය. සුඛාවතීයෙහි මහ විලක් ඇත. ඒ විලෙහි ඇති නෙළුම් මල් තුළින් බුදුගුණ ගී කියවේ. අපරිමිත



Scanned with CamScanner

සත්ත්වයන් සංඛ්‍යාවකට සෙත සදන්නා වූ අමිද (අමිතාභ) බුදුහු මෙහි වාසය කරති. සියලු සත්ත්වයන් සසර දුකින් මිදෙන තෙක් අමිතාභ බුදුහු අමරණීයව එහි වෙසෙති.

හින්දු යෝගීන් විසින් දක්වා ඇති දෙව් ලොව විස්තරය මූලික බෞද්ධ සූත්‍රවල එන විස්තරවලට බොහෝ සෙයින් සමානය. මහායෝගී පරමහංස යෝගානන්ද විසින් විස්තර කර ඇති පරිදි දෙව් ලොව ඇති ගස්වැල්වලට පවා මිනිසුන්ට මෙන් ජීවය ඇත. දෙව් ලොව ඇති මල්වලට ද සුළු මොහොතක් මිනිස් වේශයෙන් පෙනී සිට කතා බහ කිරීමේ හැකියාව ඇත. හින්දු දේවකතාවල එන දිව්‍ය ලෝක විස්තර මීටත් වඩා විසිතුරුය. එනමුත් ඒවා දෙව් ලොව ඇසුදුටුවන් කී විස්තර නොව හුදෙක් ජනශ්‍රැති මත පදනම් වූ තොරතුරු බව පැහැදිලිය.

දෙවියන් විසින් තම කාම දාහය සංසිඳුවා ගන්නා ආකාරය බෞද්ධ අටුවාචාර්යවරුන් විසින් මෙලෙස දක්වා ඇත.

✧ පහළ දිව්‍ය තලවල වෙසෙන දෙවියෝ උනුන් හා කායිකව එක්වෙති.

✧ ඊටත් ඉහළින් වෙසෙන දෙවියෝ උනුන් ස්පර්ශ කර කාම දාහය සංසිඳුවති.

✧ ඊටත් ඉහළ වෙසෙන දෙවියන්ගේ ශරීර වඩා සූක්ෂම බැවින් ඔවුන්ට එකිනෙකා ස්පර්ශ කළ නොහැකිය. ඔවුහු එකිනෙකාගේ ශරීර දෙස බලා කාම දාහය සංසිඳුවා ගනිති.

✧ සමහර දිව්‍ය ලෝකවල වෙසෙන දෙවියෝ එකිනෙකා හා සිනාසීමෙන් කාම දාහය සංසිඳුවා ගනිති.

දෙව් ලොව තොරතුරු ගෙනහැර දැක්වීම සඳහා සූත්‍ර පිටකයේ සැලකිය යුතු ඉඩකඩක් වෙන් කර ඇත. සූත්‍ර පිටකයට අයත් ඛුද්දක නිකායේ විමාන වස්තු ප්‍රකරණයෙහි දෙව් ලොව දෙවියන් විඳින සැප සම්පත් පිළිබඳ දීර්ඝ විස්තර අඩංගු වේ. එවැනි විස්තර කිහිපයක් මෙහි පහත සංක්ෂේපයෙන් දැක්වේ.



Scanned with CamScanner

### 1. රත්‍රන් ආසනයේ හිඳින දෙව්දුව

එක් දෙවඟනක් රත්‍රන් ආසනයක් මත හිඳගෙන සිටියි. ඒ ආසනය වාහනයක් මෙනි. ඒ ආසනය මත නැගී විදුලිය බඳු වේගයෙන් කැමති තැනකට යා හැකිය. මිනිස් ලොව සිටිය දී පැවිද්දෙකුට ආසනයක් පූජා කළ පිනෙන් මේ ආසනය පහළ විය.

### 2. ඇතු පිට නැගි දෙවඟන

මනහර රූපශ්‍රීයෙන් යුත් දෙවඟනක් ඇතුපිට නැගී සතුටින් ඔබ මොබ යයි. පැවිද්දෙකුට වස්ත්‍රයක් එළූ ආසනයක් පිදීමෙන් මේ සම්පත් පහළ විය.

### 3. ගංතෙර සිටින දෙවඟන

එක්තරා දෙවඟනක් ගංතෙරක සිටියි. හාත්පස ගැවසී ඇත්තේ ඉදුණු පලතුරු සහිත ගස්වැල්වලිනි. මිනිස් ලොව දී භික්ෂූන් පිරිසකට පැන් පිදූ පිනෙන් මේ දිව්‍ය විමානය පහළ විය.

### 4. සිරුරෙන් රැස් විහිදුණු දෙවඟන

එක් ස්ත්‍රියක් මිනිස් ලොව සිටිය දී අඳුරෙහි සිටින අයට පහන් ලබා දුන්නාය. ඒ පිනෙන් දෙව් ලොව උපන් ඇය සියලු දෙවඟනන් අබිබවා ආලෝකමත්ව සිටියි.

### 5. දෙවිවරුන් හා දෙවඟනන් රාශියක් මැද ඉපදීම

පෙර කල මිනිස් ලොව සිටි කාන්තාවක් පරපුරුෂ ඇසුරෙන් වෙන්වී පතිවත රැක්කාය. සැම විටම සත්‍ය ප්‍රකාශ කිරීම, දන්දීම, අනුන්ට සංග්‍රහ කිරීම ඈ සතු ගුණාංග විය. ඇය මරණින් මතු දෙවිවරුන් හා දෙවඟනන් රාශියක් ගැවසෙන දිව්‍ය විමානයක ඉපදුණාය.

### 6. සිරිමා නම් දෙවඟන

රජගහ නුවර බිම්බිසාර රජුට සිරිමා නමින් දේවියක් විය. ඕ බුදුන්ගෙන් බණ අසා සෝවාන් ඵලයට පැමිණියාය. ඇයට මාර්ගඵල සමාපත්තිවලට එළඹීමට ද හැකි විය. ඇය චතුරාර්ය සත්‍යය ද ප්‍රගුණ කළාය. මේ උතුම් කාන්තාව මරණින් මතු කැමති පරිදි සැප සම්පත් මවා ගත හැකි දෙව් ලොවක ඉපදුණාය. දැන් ඇය

අසීමිත සැප සම්පත් මැද එහි වෙසෙයි.

7. **කේශකාරී දෙව්දුව**

පෙර කල දඹදිව සිටි කේශකාරී නම් කාන්තාවක් ත්‍රිවිධ රත්නය කෙරෙහි සැක දුරුකොට ශික්ෂාකාමීව සිට මිය ගියාය. සෝවාන් ඵලය ලද ඒ ස්ත්‍රිය මරණින් මතු දිව්‍ය අප්සරාවන් ලක්ෂයකට වඩා සිටින දෙව් ලොවක රුවෙන් අගතැන්පත් දෙවඟන ලෙස උපන්නාය.

8. **නන්දන නම් වනය**

තව්තිසාවෙහි නන්දන නම් වනයක් ඇත. දෙවියෝ එහි සිට ප්‍රීතියෙන් ක්‍රීඩාවෙහි යෙදෙති. නන්දන වනය පිහිටි තව්තිසාවෙහි ඉපදීමට නම් බොහෝ පින් කළ යුතුය. නන්දන වනයෙහි මදාරා නම් මල් ද නිල්, රන්, කළු, දම් හා රතු පැහැති පත්‍ර සහිත ගස් ද ඇත. මෙවැනි විචිත්‍ර ස්ථානයක් වෙනත් තැනක නැත.

9. **ලඛුමා නම් දෙවඟන**

මිනිස් ලොව සිටි ලඛුමා නම් කාන්තාව උත්සාහ කර සකෘදාගාමී ඵලයට පැමිණියාය. ඇය මරණින් මතු දෙව්ලොව උපන්නාය.

10. **මෝල් ගසෙන් පහර කෑ ලේලිය**

දඹදිව විසූ එක්තරා කාන්තාවක් පිඬු සිඟා වැඩි භික්ෂුවකට කැවුමක් පූජා කළාය. මෙය ඇසූ ඇගේ නැන්දම්මා ඇයට බැණවැදී ඇයගේ උරහිසට මෝල් ගස් පහරක් දුන්නාය. ඉන් රෝගාතුර වී මිය ගිය ඇය තව්තිසාවෙහි දෙවඟනක්ව උපන්නාය.

11. **පුටුවකින් පහරකා මිය ගිය ලේලිය**

එක් කාන්තාවක් බෞද්ධ භික්ෂුවකට උක්දණ්ඩක් දන් දුන් අතර ඇගේ නැන්දණිය ඉන් කෝපයට පත්ව ඇයට පුටුවකින් පහර දුන්නාය. ඇ එම පහරින් මරණයට පත්ව තව්තිසාවෙහි අලංකාර වස්ත්‍රාභරණයෙන් සැරසුණු දෙවඟනක්ව උපන්නාය.



Scanned with CamScanner

### 12. ලතා නම් දෙවඟන

ලතා, සජ්ජා, පවරා, අච්චි මුඛි සහ සුතා යනුවෙන් වෙසමුණි රජුගේ දූවරු 5 දෙනෙකි. ඔවුහු 5 දෙනා ශක්‍රයාගේ කාර්යය මණ්ඩලයෙහි සේවය කරති. මෙයින් ලතා දිව්‍යත්වයට පත්වූයේ පෙර කල පිරූ පතිව්‍රතෙහි බලයෙනි.

### 13. සාංඝික දානයෙහි බලය

පෙර කල එක් මානවකයෙකුට බිරියන් දෙදෙනෙකු විය. ඉන් එක් අයෙක් අට නමකට සාංඝික දානයක් දුන්නාය. අනෙක් කාන්තාව මීටත් වඩා දන් දුන් නමුත් සාංඝික දානයක් දුන්නේ නැත. සාංඝික දානයක් දුන් කත මරණින් මතු බොහෝ සැප ඇති නිර්මාණරති දෙව් ලොව උපන්නාය. පුද්ගල වශයෙන් දන් දුන් කත මරණින් මතු තව්තිසාවෙහි උපන්නාය. සාංඝික දානය අප්‍රමාණ මහා සංඝයා කෙරෙහි දෙන දෙයකි. එම ක්‍රියාව නැවත නැවතත් සිහිකිරීමෙන් මරණින් මතු දෙව් ලොව උපත ලද හැකිය.

### 14. දෙවියෙකු වූ මැඩියා

එක්තරා මැඩියෙක් විලක විසීය. ඌ ධර්මානුශාසනාවකට කන්යොමා සිටිය දී ගොපල්ලෙකු ඌට පහර දී මරා දැමුවේය. මැඩියා මරණින් මතු දිව්‍ය ලෝකයේ දිව්‍ය පුත්‍රයෙක්ව උපන්නේය.

### 15. දෙව්ලොව නොයන අය

මසුරෝ ද, කිපෙන සුලු අය ද පව්කම් කරන අය ද මරණින් මතු දෙව් ලොව නූපදිති. ඔවුහු නිරයට යාමට සුදුසුකම් ලබති.

### 16. ඡත්තමානවක නම් දෙවියා

ඡත්ත නම් පුරුෂයාට මහ මග දී බුදුන් හමුවිය. බුදුහු ඔහු තිසරණ සහිත පන්සිල්හි පිහිට වූහ. ස්වල්ප වේලාවකට පසු පල්හොරු පිරිසක් ඡත්තමානවක මරා ඔහු සතු දේ පැහැර ගත්හ. ඔහු කළ එකම පිංකම පන්සිල් සමාදන් වීම පමණකි. මරණාසන්නයේ දී කළ ඒ පින දෙව් ලොව ඉපදීමට ප්‍රමාණවත් විය.

### 17. කන්ථක නම් දෙවියා

සිදුහත් බෝසතාණෝ කන්ථක අශ්වයාට මෙසේ කීහ. "මම



Scanned with CamScanner

බුදු වී සසරින් එතෙර වෙමි. අනුන්ද සසරින් මුදවමි." අශ්වයාට එය ඇසී ප්‍රීතියක් ඇති විය. බෝසතාණෝ කන්ථක අසුපිට නැගී ගොස් අබිනික්මන් කළහ. ස්වාමියා නැවත නොආ දුකින් කන්ථක අසු රෝගීව සිට මිය ගියේය. මියගොස් කන්ථක දිව්‍ය පුත්‍රයා බවට පත්විය.

### 18. මාර්ගඵල නොලත් භික්ෂුව

පෙර එක් කලෙක සුමේධ නම් බුදු කෙනෙක් විසූහ. ඒ බුද්ධ ශාසනයෙහි සිටි එක් භික්ෂුවකට පැවිදි වී සත්වසක් ගතවූ පසුව ද මාර්ගඵලයක් ලද නොහැකි විය. එහෙත් ඒ භික්ෂුව බුදුන් පිරිනිවීමෙන් පසු බුදුන්ගේ ධාතු වන්දනා කළහ. ධාතු වන්දනා කිරීමෙන් අපරිමිත පිනක් ලැබේ. ඒ පින ගෙවී නොයයි. ඒ පිනෙන් අද ඔහු දිව්‍ය පුත්‍රයෙකුව සිටියි.

### 19. මට්ටකුණ්ඩලී දිව්‍ය පුත්‍රයා

පෙර කල මට්ටකුණ්ඩලී නම් තරුණයෙක් විය. හේ රෝගාතුරව ගිලන් ඇඳෙහි සිටිය දී බුදුන්ගේ රූපය දැක්කේය. හේ ගිලන් ඇඳේ සිටම බුදුන්ට දෑත් එක් කර වැන්දේය. නොබෝ වේලාවකින් මියගිය ඔහු මහානුභාව සම්පන්න දිව්‍ය පුත්‍රයක් බවට පත් වූයේය.

### 20. සේරිස්සක යක්ෂයා

කොසොල් රට සිටි පායාසි රජු කෲර පාලකයෙකි. ඔහු මරණීය දණ්ඩනයට නියම වූ සිරකරුවන් විවිධ පර්යේෂණවලට ලක් කර වධ දී මරා දැමුවේය. හේ විටෙක සිරකරුවන්ගේ ශරීරය පතුරු ගසා මරාදමයි. තවත් විටෙක ඔවුන් පණපිටින් සැළිවල දමා තම්බා මරයි. පායාසි රජු කුමාර කාශ්‍යප හිමියන්ගෙන් බණ අසා මිථ්‍යා දෘෂ්ටිය අත්හැර බෞද්ධයෙකු වූයේය. හේ මරණින් මතු සේරිස්සක නම් මහානුභාව සම්පන්න යක්ෂයෙකු බවට පත් වූයේය. සේරිස්සකගේ විමානය දෙව් විමනක් වැනිය. ඔහු දෙවියන් හා සමාන සැප විඳියි. එහෙත් ඔහුගේ පරමායුෂ අවුරුදු 500කි. එබැවින් ඔහුගේ සහපිරිවර නොසන්සුන්තාවයෙන් යුතුව කල් ගෙවති.



Scanned with CamScanner

21. මල්ලිකා නම් දෙවඟන

මල්ලිකා නම් කාන්තාව බුදුන් පිරිනිවීමෙන් පසුව පැමිණ ශ්‍රී දේහයට වැඳ නමස්කාර කළාය. ඈය ඒ පින නිසා මරණින් මතු මහානුභාව සම්පන්න දෙවඟනක් බවට පත්වූවාය.

සටහන - සූත්‍ර පිටකයට අයත් ඛුද්දක නිකායට අයත් කතා සකස් වූයේ දෙවැනි හා තෙවැනි ධර්ම සංගායනා අතර කාලයේ දීය. මේවා එතෙක් ජනප්‍රවාද ලෙස පැවතුණු බව පෙනී යයි. මෙහි දක්වා ඇති පායාසි රජුගේ පුනරුත්පත්තිය රජුගේ මරණින් වසර 100 කට පසු ලබාගත් එකක් බව ඛුද්දක නිකායෙහිම දැක්වේ. එබැවින් මේ කතා ප්‍රවෘත්තිය සම්බුද්ධ පරිනිර්වාණයෙන් වසර 100 කටවත් මෙපිට සිදුවූ එකක් බව පැහැදිලිය.

අටුවා ග්‍රන්ථ ලියවීම සිදු වූයේ සම්බුද්ධ පරිනිර්වාණයෙන් සෑහෙන කලකට පසුවය. අටුවා ග්‍රන්ථවල එන දෙව් ලොව සහ අපාය විස්තර තුළ අතිශයෝක්තීන් බහුලය. දෙවියන් නෙළුම් මල් මත බිහිවෙන බවත්, සක්දෙවිඳුන්ගේ අසුන නාභිය තෙක් එරෙන එකක් බවත් අටුවාචාර්යවරු කියති. කෙසේ වෙතත් තවත් කල්යත්ම හින්දු දේව කතා සහ බෞද්ධ දේව කතා විස්තර මිශ්‍ර වූ ආකාරය හොඳින්ම නිරීක්ෂණය කළ හැකිය.



Scanned with CamScanner

# 24. බ්‍රහ්මයන්ගේ ජීවන තතු

සමහර හින්දු ලබ්ධිකයන් විශ්වාස කරන පරිදි ලෝකය නිර්මාණය කළේ බ්‍රහ්මන් නම් වූ සර්වබලධාරී මැවුම්කරුවෙකි. හින්දු යෝගීන් කියනුයේ ධ්‍යාන වැඩීමෙන් බ්‍රහ්මයා සමග එක්විය හැකි බවයි. මෙකී මුල් කතාවෙහි පදනමක් නැතත් දෙවැනි මතය බුදු දහමේ එන "බ්‍රහ්ම" සංකල්පයට සමානය. භාවනා වැඩීමෙන් ධ්‍යාන උපදවා ගත් අය ද අනාගාමී මාර්ගඵලයට පැමිණි පුද්ගලයන් ද මරණින් මතු බ්‍රහ්ම ලෝකවල උත්පත්තිය ලබන බව බෞද්ධ පිළිගැනීමයි. බුදු දහමේ කියවෙන පරිදි බ්‍රහ්ම ලෝක ගණන දිව්‍ය ලෝක ගණනට වඩා වැඩිය. බෞද්ධ ඉගැන්වීමට අදාළ බ්‍රහ්ම ලෝක විස්තරය මෙසේය.

1. බ්‍රහ්ම පාරිසද්‍යය - ප්‍රථමධ්‍යානය ලද්දවුන් උපදින භූමියකි. මෙහි ආයුෂය කල්ප 1/3 කි. (කල්පයක් යනු අතිවිශාල කාලයකි.)

2. බ්‍රහ්ම පුරෝහිතය - ප්‍රථමධ්‍යානය ලද්දවුන් උපදිනා භූමියකි. අයුෂය කල්ප 1/2 කි.

3. මහා බ්‍රහ්මය - ප්‍රථමධ්‍යානය ලද්දවුන් උපදින භූමියකි. ආයුෂය කල්පයකි.

4. පරිත්තාභය - ද්විතීයධ්‍යානය ලද්දවුන් උපදින භූමියකි. ආයුෂය කල්ප 2 කි.

5. අප්පමාණාභය - ද්විතීයධ්‍යාන භූමියකි. ආයුෂය කල්ප 4කි.

6. ආභස්සරය - ද්විතීයධ්‍යාන භූමියකි. ආයුෂය කල්ප 8කි.. විශ්වය විනාශ වන කල්හි ආභස්සරයට පහළ ඇති ලෝකධාතු සියල්ල නැසෙයි.

7. පරිත්තසුභය - තෘතීයධ්‍යාන භූමියකි. ආයුෂය කල්ප 16කි.

8. අප්පමාණසුභය - ආයුෂය කල්ප 32කි. තෘතීයධ්‍යාන භූමියකි.

9. සුභකිණ්හය - ආයුෂය කල්ප 64 කි. තෘතීයධ්‍යාන භූමියකි. ජලය නිසා ලෝකය විනාශ වන කල්හි සුභකිණ්හයට පහළින් ඇති භූමි සියල්ල වැනසේ.



Scanned with CamScanner

10. වේහප්ඵලය - ආයුෂය කල්ප 500කි. චතුර්ථධ්‍යාන භූමියකි. ලෝකය වායු කුණාටුවලින් නැසෙන කල්හි වේහප්ඵලයට යටින් ඇති භූමි සියල්ල වැනසේ.

11. අසංඥ තලය - ආයුෂය කල්ප 500කි. අසංඥ සමාධිය වඩන හින්දු යෝගීහු මෙහි ඉපදෙති. මෙහි උපන් අය කල්ප 500ක මුළු ජීවිත කාලයම එකම ඉරියව්වෙන් සිහිසුන්ව මෙන් හිඳ ගෙවා දමති.

12. අවිහය - මෙහි ආයුෂය කල්ප 1,000කි. ධ්‍යානලාභී අනාගාමීහු මරණින් මතු අවිහයේ උපදිති. ධ්‍යාන රහිත අනාගාමීහු මරණින් මතු වෙනත් බඹ ලොවක ඉපිද ඉන් මතු අවිහයේ උපදිති.

13. අතප්පය - මෙහි ආයුෂ කල්ප 2,000 කි. අවිහයේ ආයුෂ නිමවී ඉන් චුත වන යෝගීහු එක්කෝ (අසංඛාර පරිනිබ්බායිව) නිවන් දකිති. එසේ නොවුණහොත් අතප්පයේ උපදිති.

14. සුදස්සය - මෙහි ආයුෂය කල්ප 4,000 කි. ආයුෂ ගෙවී ගොස් අතප්පයෙන් චුත වෙන අනාගාමීහු එක්කෝ පිරිනිවනට (අසංඛාරිකව) පැමිණෙති. එසේ නොවුණහොත් ඔවුහු සුදස්සයේ උපදිති.

15. සුදස්සිය - මෙහි ආයුෂය කල්ප 8,000කි. ආයුෂ ගෙවීමෙන් සුදස්සයෙන් චුත වන අනාගාමීහු එක්කෝ පිරිනිවනට පැමිණෙති. එසේ නොවුණොත් ඔවුහු සුදස්සියට පිවිසෙති.

16. අකණිෂ්ඨය (අකනිටා බඹලොව) - මෙහි ආයුෂය කල්ප 16,000 කි. මෙහි සිටින හැමකෙක්ම එකෙක් අනිකාට දෙවැනි නොවන තරම් ප්‍රඥා සම්පන්න වෙති, බලසම්පන්න වෙති, ගරු කටයුතු වෙති. අකණිෂ්ඨයේ උපදිනුයේ අනුපිළිවෙළින් අවිහ, අතප්ප, සුදස්ස, සුදස්සි යන බඹලොව සතර ඉක්මවා පැමිණි අනාගාමීන්ය. එබැවින් අකණිෂ්ඨයේ උපන් සත්ත්වයෝ උද්ධංසෝත අකණිට්ඨගාමී ක්‍රමයට (එකින් එක ලෝක පිළිවෙළින් ගෙවා ගොස්) එහි උපත ලැබ සිටිති. අකණිෂ්ඨයේ උපන් යම් අනාගාමියෙක් එහි දී රහත් නොවුණහොත් ආයුෂය ගෙවී ගොස් නිරුත්සාහීවම පිරිනිවනට පත්වෙති.



Scanned with CamScanner

17. ආකාසානඤ්චායතනය - පළමු අරූපාවචර ධ්‍යානය ලද අය මරණින් මතු මෙහි උපදිති. මෙය පළමු අරූපාවචර භූමියයි. මෙහි ආයුෂය කල්ප 20,000කි. මෙහි උපන් සත්ත්වයන්ට එකිනෙකා නොපෙනේ. අවම වශයෙන් තමාවත් නොදකී. යම් මාර්ගඵල ලාභියෙක් මෙතැන් සිට ඉදිරි ලෝකයක උපත ලද හොත් හේ එම ලෝකයේදීම පිරිනිවන් පා සසර දුක කෙළවර කරයි.

18. විඤ්ඤානංචායතනය - දෙවන අරූපාවචර ධ්‍යාන ලද්දවුන් උපදින භූමියයි. මෙහි ආයුෂය කල්ප 40,000කි.

19. ආකිංචඤ්ඤායතනය - තුන්වන අරූපාවචර භූමියයි. මෙහි ආයුෂය කල්ප 60,000කි.

20. නේවසඤ්ඤානාසඤ්ඤායතනය - මෙය අවසාන මෙන්ම හතර වන අරූපාවචර ධ්‍යාන භූමියයි. මෙහි ආයුෂය කල්ප 84,000 කි.

අරූප භූමිවල උපන් සත්ත්වයන්ට ඇස්, කන්, නාසාදී ඉන්ද්‍රියයන් කිසිවක් නැති නිසා ඔවුන්ට කිසිවක් නොපෙනෙන නොඇසෙන බව කියවේ. එනමුත් රූපාවචර ධ්‍යාන භූමිවල උපන් දෙවියන්ට ඇස් හා කන් ඇති බව කියවේ. ගරු හේන්පිටගෙදර ඥාණසීහ හිමියෝ මෙම මතයට විරුද්ධව කරුණු දක්වති. උන්වහන්සේ පවසනුයේ දැකීම ඇසීම වැනි දේත් කාමයන් ගණයෙහි ලා වැටෙන නිසා රූපාවචර ලෝකවල උපන් බ්‍රහ්මයන්ද උනුන් නොදකින බවයි. (මෙම මතය පිළිගත නොහැකි වන්නේ කම්සැපෙන් වෙන්වූ රහතන් වහන්සේලා ද ලෝකය දකින, අසන බැවිනි.)

කෙසේ නමුත්, බුදු හිමියෝ බ්‍රහ්මයන් සමග සාකච්ඡා කළ අවස්ථා කිහිපයක්ම සූත්‍ර පිටකයේ හමුවේ.

මේ බ්‍රහ්මයන් මිනිසුන් දැකීමට පැමිණි අවස්ථා කිහිපයකි.

1. සිදුහත් බෝසතුන් බුද්ධත්වයට පැමිණීමට පෙර ඝටීකාර බ්‍රහ්මයා පැමිණ සිවුරු පාත්‍ර පිළිගැන් වූ බව කියවේ.

2. බුද්ධත්වය ලද බුදුන්ට බණ කීමට ආරාධනා කළේ සහම්පති



Scanned with CamScanner

මහා බ්‍රහ්මයා විසිනි.

3. එක්තරා බ්‍රහ්මයෙක් පැමිණ ආරුචීරිය නම් වූ අනාගාමිකයාට බුදුන් හමුවන ලෙස උපදෙස් දුන්නේය.

4. කෝකාලික භික්ෂුව විසින් සැරියුත් මුගලන් දෙනමට නින්දා අපහාස කරද්දී බ්‍රහ්මයෙක් පැමිණ එය නවත්වන ලෙස ඔහුට උපදෙස් දුන්නේය. බ්‍රහ්මයන් ලොවට එන කතාවක් මා අසා නැතැයි කී කෝකාලික බ්‍රහ්මයා සමච්චලයට ලක් කළේය.

5. බුදුහු සෘද්ධි බලයෙන් බඹලොවට වැඩ බක බ්‍රහ්මයා දමනය කළහ.

සමහර බ්‍රහ්ම ලෝකවල සිටිනුයේ ඉතා සීමිත පිරිසකි. බක බ්‍රහ්මයා සමග එලොව සිටියේ 72 ක බ්‍රහ්ම පිරිසකි. මිනිස් ලොව මෙන් උද්‍යාන, පොකුණු හා කුරුල්ලන් බඹලොව ද සිටින බව එක් බ්‍රහ්මයෙක් පැමිණ බුදුන්ට කියා සිටියේය. කෙසේ නමුත් බ්‍රහ්මයන්ට විශේෂිත හැඩයක් නැති බව ධර්මයේ සඳහන්ය. ඔවුහු අවශ්‍ය විට අවශ්‍ය වේශයක් ගනිති. සනත් කුමාර මහා බ්‍රහ්මයා බඹලොව සිටින ආදිතමයෙකි. හේ තවමත් තරුණ පෙනුමෙන් යුතුව එහි වෙසෙයි. එබැවින් සනාතන කුමාර නම් වේ. සනත් කුමාර මහා බ්‍රහ්මයා ඉඳහිට පැමිණ බුදුන් හමු වෙයි. ඔහු දෙව් ලොවට ගොස් ධර්ම දේශනා කිරීමට කැමැත්තක් දක්වයි.

එහි දී ඔහු දෙවියෙකුගේ හැඩය ගන්නට ඉටා ගනියි. දේවරූපයෙන් යුතුව වැඩ සිටින සනත් කුමාර දකින සෑම දෙවියෙක්ම තම අස්න ඔහුට පිරිනැමීමට කැමැත්තෙන් සිටියි.

බ්‍රහ්මයන් පිළිබඳව යෝගීන් විසින් හෙළි කළ තොරතුරු මෙතරම් විස්තරාත්මක නොවේ. මහායෝගී පරමහංස යෝගානන්ද බ්‍රහ්මලෝක 2ක් ගැන තොරතුරු කීමට දැන සිටියේය. ඉන් එක භූමියක් සාමාන්‍ය ධ්‍යානලාභීන්ට වෙන්වෙයි. දෙවැනි භූමිය වූ හිරණ්‍යක බඹලොව උපදිනුයේ නිර්විකල්ප සමාධිය නම් වූ උසස් ධ්‍යානයට පැමිණි අයයි.

මෙහි විස්තර කළ දිව්‍ය ලෝක හා බ්‍රහ්ම ලෝක කිසිවක් සැප කැමති සත්ත්වයාට නිත්‍ය වාසස්ථාන නොවේ.



Scanned with CamScann

# 25. අපව දකින්නට එන පිටසක්වළ අමුත්තෝ

පීරිසිවල හැඩය ගත් නොහඳුනන පියාසර වස්තු විශේෂයක් ගැන ලොව නන් දෙසින් වාර්තා වෙයි. මෑතක දී ශ්‍රී ලංකාවෙන් වාර්තා වූ එවැනි සිද්ධීන් කිහිපයක් නිසා බොහෝ දෙනෙකුගේ අවධානය ඒ වෙත යොමුව ඇත.

පියාඹන පීරිසි යනු මොනවාද? ඒවා මෙහි පැමිණෙන්නේ ඇයි?

ඉංග්‍රීසි භාෂාවෙන් මේවා හඳුන්වනුයේ නොහඳුනන පියාසර වස්තු (Unidentified flying objects) ලෙසයි. මෙකී පියාඹන පීරිසි ප්‍රධාන වශයෙන් ආකාර 2 කි.

1. පීරිසියක හැඩය ගත් පියාඹන වස්තු

2. සුරුට්ටුවක හැඩය ගත් පියාඹන වස්තු



නාඳුනන පියාසර වස්තුවක
ඡායාරූපයක්

එම ආකාර දෙකයි. පීරිසියක හැඩය ගත් පියාඹන වස්තුවල ඡායාරූප රාශියක් මේ වන විට ලොව විවිධ රටවල සිටින



Scanned with CamScanner

පුද්ගලයන් විසින් වාර්තා ගත කර ඇත. මේ ඡායාරූපවලින් දැක්වෙන වස්තූන් ඇත්ත වශයෙන්ම පහසුවෙන් ගුවන් ගත විය හැකි හැඩයකින් යුක්තය. ගුවන් යානාවල තටු තැනීමට ආධාර කරගන්නා බ'නූලි මූලධර්මයට අනුකූලව ඒවා නිපදවා ඇත්තේ උඩු පැත්ත වැඩි පෘෂ්ඨ වර්ගඵලයක් සිටින අයුරිනි. එබැවින් මේ යානාවලට පහසුවෙන්ම වායුගෝලයේ ඉපිලීමට හැකිය. තවද මේ යානා නිරීක්ෂණය කළ සමහරුන් එහි සිට නික්මෙන වේගවත් වායුධාරාවන් (Jet Propellant) දැක ඇත. සැබවින්ම පියාඹන පීරිසි යනු කිසියම් අද්භූත ස්වරූපයක ගුවන් යානාවන්මය.

අබිරහස් ගුවන්යානාවන් පොළවට කඩා වැටුණු අවස්ථා ගණනාවක් ගැනම ප්‍රවෘත්ති ඇතත් ඒ හැම අවස්ථාවකදීම අදාළ රටවල ආරක්ෂක බලධාරීන් ඒ ප්‍රවෘත්ති වසන් කිරීමට උත්සාහ කර ඇත. කඩා වැටුණු පියාඹන පීරිසි හමුදා අංශවල රැකවරණය යටතේ පර්යේෂණාගාර තුළ තිබෙන බව කියනු ලැබේ.



රුසියාවට කඩා වැටුණු නාඳුනන
පියාඹන වස්තුවක් - හමුදා නිලධාරියෝ
ඒ අවට රැකවල් ලා සිටිති.

පියාඹන පීරිසිවලින් පැමිණෙන පිරිස් මෙලොවට එන්නේ ඇයි? පර්යේෂකයන් බහුතරයකගේ මතය වී ඇත්තේ ඔවුන් මෙලොවට එන්නේ හොඳකට නම් නොවන බවයි. මනස දියුණු



Scanned with CamScanner

කර අධිමානසික හැකියා ලබාගත් එක් බටහිර කාන්තාවක් මේ සම්බන්ධව වැදගත් තොරතුරක් අපට ලබාදෙයි. පියාඹන පීරිසිවලින් මෙලොවට එන එක් වර්ගයක අමුත්තෝ මෙලොව ඔවුන්ගේ ජනාවාස ඉදිකිරීමට සුදුසු තත්ත්වයක ඇත්දැයි පර්යේෂණ පවත්වති. ඊට හේතුව වී ඇත්තේ ඔවුන්ගේ ලෝකය කාර්මීකරණය නිසා දැනටමත් අපවිත්‍ර වී එහි ජීවින්ට නුසුදුසු පරිසරයක් නිර්මාණය වෙමින් පැවතීමයි.


පිටසක්වළින් එන අමුත්තෝ විවිධාකාර හැඩහුරුකම් දරති.

1. මින් එක් වර්ගයක් අඩි 3 ක් පමණ උසැති සිරුරු සහිතය. මුහුණු බස්සන්ගේ මෙනි. ශරීරය මිනිසුන්ගේ වැනිය.

2. තවත් වර්ගයක් ඊට වඩා තරමක් උසය. ඔවුන්ගේ හිස් විශාලය, මොළය පිටතට දිස්වේ.

3. අනෙක් වර්ගයට අයත් සත්ත්වයන් මීටත් වඩා ප්‍රමාණයෙන් විශාලය. ඔවුන්ගේ හිස හරකෙකුගේ වැනිය. ඉතා අප්‍රසන්න පෙනුමක් ඇති මොවුන්ගේ දැස් කකුළුවන්ගේ මෙන් ඉදිරියට නෙරා ඇත.

පිටසක්වළ ජීවීන්ගේ තොරතුරු ඇසුරෙන් සකස් කළ අනුරූ දෙකක්



සැබවින්ම මේ පිටසක්වළ ජීවින් කවුද යන ප්‍රශ්නය මෙතෙක් විසඳී නැත.




Scanned with CamScanner

# 26. අබිරහස් මෘත ශරීරාගාරය

ටිබෙට් රට (තිබ්බතයේ) පොතාලා මාලිගය වසර 1300 කට පමණ ඉතිහාසයකට හිමිකම් කියයි. පසු කලෙක පරසතුරු ආක්‍රමණ නිසා විනාශ වූ පොතාලා මැඳුර 17 වන සියවසේ දී මොන්ගෝලියානු රජයේ අනුග්‍රහය ඇතිව නැවත ඉදිකරන ලදී. එතැන් සිට 20 වන සියවසේ මැදභාගයේ දී චීනුන් ආක්‍රමණය කරන තෙක් පොතාලා මැඳුර ටිබෙටයේ නායක භික්ෂුව හෙවත් දලයි ලාමාතුමාගේ වාසස්ථානය විය.

පොතාලා මැඳුර මිනිසා විසින් එදා මෙදා තුර ඉදිකරන ලද දැවැන්තම ගොඩනැගිලිවලින් එකකි. මාලිගා සංකීර්ණයේ සම්පූර්ණ උස මීටර් 170 කි. පොතාලා ප්‍රධාන මාලිගාව පමණක් මීටර් 119 ක් උසය. කාමර විශාල සංඛ්‍යාවකින් යුතු පොතාලා මැඳුරේ බිම් මහලට යටින් රහස් ගබඩා රාශියක් ඇත. මෙයින් පහතම ඇති ගබඩාවල එක් එක් කාලසීමාවන්හි ජීවත් වූ මිනිසුන්ගේ මළ සිරුරු බෙහෙත් ගල්වා තැන්පත් කර ඇත.




ලෝක ඉතිහාසය පිළිබඳ රහස් රැසක් සඟවා ගත් ටිබෙටයේ පොතාලා මන්දිරය

දැනට වසර දසදහස් ගණනකට එපිට ජීවත් වූ උස අඩි 15ක් පමණ වන දැවැන්ත මිනිස් වර්ගයකගේ මෘත ශරීර කිහිපයක්



Scanned with CamScanner

මෙහි තැන්පත් කර ඇති බව ටිබෙට් ජාතික භික්ෂුවක වන ලොබ්සාං රම්පා පවසයි. ලොබ්සාං රම්පා පවසන පරිදි මිනිසුන්ට ඇත්තේ අප දන්නා ඉතිහාසයට වඩා වෙනස් ඉතිහාසයකි. පොතාලා මන්දිරයේ අබිරහස් සොහොන් ගැබ මෙතෙක් ඒ රහස් සියල්ල සඟවා ගෙන සිටියි.



මනුෂ්‍ය වර්ගයා පිළිබඳ අභිරහස් රැසක් තවමත් රැකගෙන සිටින පොතාලා මන්දිරයේ සොහොන් ගැබ් සමූහයෙන් එකක්



Scanned with CamScanner

# 27. අබිරහස් සවැනි ඉන්ද්‍රිය

මිනිසාට සංවේදන ලබාදෙන ඉන්ද්‍රියයන් 5ක් ඇති බව පිළිගනු ලැබේ. ඇස්, කන්, නාසය, දිව සහ කය ඒ ඉන්ද්‍රියයන්ය. පංචේන්ද්‍රියයන්ගෙන් ලැබෙන සංවේදන හැරුණු විට වෙනත් ආකාරයක සංවේදන ලැබීමක් ගැන අතීතයේ පටන්ම විශ්වාසයක් පැවතුණි. නූතන විද්‍යාත්මක සොයා ගැනීම් ද සවෙනි ඉන්ද්‍රියයක පැවැත්ම ගැන ඉඟි පළ කරයි. එසේ නම්,

✧ ඒ සවෙනි ඉන්ද්‍රිය කුමක්ද?

✧ එය පවතිනුයේ කොහිද?

යන ප්‍රශ්නවලට පිළිතුරු සපයා ගත යුතුය.

සත්ත්ව රාජධානිය සවැනි ඉන්ද්‍රියයන් පිළිබඳ අගක් මුලක් නැති කතාවට මුල පුරන්නට හොඳම තැනයි. සමහර සතුන්ට ඇත්තේ එක් ඉන්ද්‍රියයකි. පණුවන් වැනි සරල ජීවීන්ට ඇස්, කන්, නාස හෝ දිවක් නොමැත. පණුවන්ට ඇතැයි සලකන එකම සංවේදනය ස්පර්ශය පමණි. අනෙක් අතට ගෙම්බන්, මැඩියන් වැනි උභය ජීවීන්ට ඇස්, කන්, නාසා ඇතත් උන්ට රස සංවේදනය නොදැනේ. මන්දයත් ගෙම්බන්ගේ හා මැඩියන්ගේ මුඛ කුහර තුළ රසාංකුර (රසට සංවේදී ව්‍යුහ) පිහිටා නොමැති බැවිනි. බොහෝ දෙනෙක් සිතා සිටිනුයේ ගවයන්, සුනඛයන් වැනි සිව්පා සතුන්ට අඩුවක් නොමැතිව පංචේන්ද්‍රිය ආශ්‍රිත සංවේදන දැනෙන බවයි. නමුත් සත්‍යය ඊට ඉඳුරාම වෙනස්ය. බොහෝ ක්ෂීරපායී සතුන්ගේ ඇස් පෙනීම දුර්වලය. එමෙන්ම ක්ෂීරපායීන්ගෙන් වැඩි පිරිසකට වර්ණ තෝරා බේරා ගත නොහැකිය. සුනඛයන් මීට කදිම උදාහරණයකි. සුනඛයන්ට වර්ණ වෙන් කර හඳුනාගත නොහැකිය. සුනඛයෝ වර්ණ අන්ධතාවයෙන් පෙළෙති. කොළ පැහැ තණ බිමක් මත තබා ඇති රතු පැහැ මස් වැදැල්ලක් උන්ට පෙනෙනුයේ අළු පැහැයේම ප්‍රභේදයන් ලෙසය.

මීට වඩා පුදුමය දනවන කරුණ වනුයේ සමහර සතුන් "සයවෙනි" සංවේදන ඉන්ද්‍රියයක උපකාරය ලබා ගැනීමයි. සර්පයන්ට කන් නැතත් උන්ගේ ශරීර පොළව මතුපිට ඇතිවන



Scanned with CamScanner

සියුම් කම්පනයන්ට සංවේදී වේ. වවුලන්ට ඇස් නොපෙනුණද සියුම් කම්පන තරංග නිකුත් කරමින් මග සොයා ගැනීමට උන්ට හැකියාව ඇත. ඩොල්ෆින් හා තල්මස් මසුන්ට සැතැපුම් ගණනාවක් ඈත සිට තම වර්ගයේ සතුන් හා සන්නිවේදනයෙහි යෙදිය හැකිය. මේ සියලු හැකියාවන් පංචේන්ද්‍රියන්ගේ මානයෙන් ඔබ්බට නොයතියි කෙනෙකුට තර්ක කළ හැකිය.

එසේ නම් මේ උදාහරණ කිහිපය ගැන ප්‍රවේසමෙන් සලකා බලන්න. වැසි වැටෙන දිනය කල්තබා දැන ගැනීමට කුහුඹුවෝ සමත් වෙති. භූමිකම්පා හා වෙනත් ස්වාභාවික අනතුරු ගැන කල්තබා දැන ගැනීමට බල්ලන්, බළලුන් වැනි ගෘහස්ථ ක්ෂීරපායීහු සමත් වෙති. භූමිකම්පා, ගිනි කඳු පිපිරීම් වැනි අනතුරුවලට දින කිහිපයක් පමණ පෙර සිට ගෘහස්ථ සතුන් පහත දැක්වෙන පරිදි චර්යාත්මක වෙනස්කම් දක්වන බව පර්යේෂකයන් විසින් තහවුරු කරගෙන ඇත.

- ✧ අදාළ ප්‍රදේශය හැර යාම.
- ✧ ආහාර වර්ජනය කිරීම.
- ✧ සුනඛයන් උඩුබුරලෑම.
- ✧ නිදි වර්ජිතව කල් ගෙවීම.

මෑතක දී සිදු වූ සුනාමි ව්‍යසනයට පැය කිහිපයකට පෙර බොහෝ වන සතුන් ආරක්ෂිත ස්ථාන කරා පලා ගිය බව සොයා ගෙන ඇත. ශ්‍රී ලංකාවේ යාල වනෝද්‍යානය වන සතුන් දසදහස් ගණනක් ගැවසෙන ස්ථානයකි. යාල වන බිමෙහි සමුද්‍රාසන්නයට වන්නට පිහිටි වර්ග සැතපුම් කිහිපයක් විශාල බිම් කොටසක් සුනාමි ජල කඳට යටවිය. නමුත්, සුනාමි ව්‍යසනයෙන් වන සතුන්ට සිදුවී තිබුණේ අවම හානියකි. උන් කල් ඇතිවම ආරක්ෂක ස්ථාන බලා පලා ගොස් ඇති බව පෙනෙන්ට තිබුණි. මෙවැනි සිදුවීම් පැහැදිලි කරදීමට "සවැනි ඉන්ද්‍රියයෙහි" ක්‍රියාකාරීත්වය විනා වෙනත් සුදුසු විකල්පයක් නොමැත. "සවැනි ඉන්ද්‍රියයක" පැවැත්ම පිළිබඳව ප්‍රබල ඉඟි මේ උදාහරණ තුළින් මතුවෙයි. සවැනි ඉන්ද්‍රියට (Sixth sense) ඇත්තේ කවරාකාර පැවැත්මක්ද? මේ කරුණ හා සම්බන්ධ විස්මය දනවන පුවතකට දැන් අපේ අවධානය යොමු කරමු.



Scanned with CamScanner

20 වන සියවසේ රුසියාවෙහි උපන් එක් දරුවෙකුට පුදුමාකාර හැකියාවක් විය. ඔහුට තිරිසනුන් හා කතාබහ කළ හැකි විය. මුල දී මේ කරුණ ගැන පර්යේෂකයන් සැක ඉපදුවත් පසුව ඔහුට ඇති ඒ හැකියාව ඔප්පු කර පෙන්වීමට හැකි විය.

පෙරකී දරුවා විසූ නිවසෙහි සුරතලයට ඇති කළ බළල් නාම්බෙකු විය. බළලා දිනක් කෑම වර්ජනය කරමින් ඉතා දුක්මුසු ලීලාවක් මවා පෙන්වමින් කරබා ගෙන සිටියේය.

"අම්මේ, මට බළලා ගැන හරිම දුකයි" මේ අපූරු දරුවා තම මවට කීය.

"බළලා කියන හැටියට ඌට අද හෙටම අනතුරකට මුහුණ පාන්න වෙනවලු! ඌ කියනවා ඌට ඒ අනතුරින් ගැලවෙන්න විධියක් නෑ කියලා! මොනවා කරන්නද මන්දා කියමින් බළලා අසහනයෙන් ඉන්නේ!"

දරුවාගේ ඒ ප්‍රකාශය මව ඒ තරම් ගණන් ගත්තේ නැත. පසු දිනට හිරු උදාවිය. බළලා ඒ වන විටත් සුසුම් හෙළමින් එළිපත්තට වී සිටියේය. එදින දහවල් පාර මාරුවීමේ දී බස් රථයකට යට වූ බළලා අවසන් ගමන් ගියේය. තිරිසන් සතුන්ට ඇතැයි කියනු ලබන "සවැනි ඉන්ද්‍රියේ" ක්‍රියාකාරීත්වය පිළිබඳ පැහැදිලි වැටහීමක් ලබා ගැනීමට මේ කතා ප්‍රවෘත්තිය මග පාදයි. තිරිසන් සතුන්ට අනාගතය පිළිබඳව යම් දැක්මක් ඇත. ඒ දැක්ම එතරම් පැහැදිලි එකක් නොවේ යන කරුණු අපට මේ කතා ප්‍රවෘත්තිය තුළින් පෙනී යයි.



Scanned with CamScanner

# 28. මිනිසාගේ අබිරහස් හැකියා

පංචේන්ද්‍රියන්ගෙන් ලබන සංවේදනයන්ට අමතරව වෙනත් යම් සංවේදන ලැබීමට තිරිසන් සතුන්ට හැකියාවක් ඇති බව පැහැදිලිය. මිනිසාට එම හැකියාව තිබේද? එවැනි හැකියාවක් පවතී නම් එය වර්ධනය කළ හැකිවනුයේ කෙසේද? යන වැදගත් ප්‍රශ්න දෙකට අපි යොමු වෙමු.

පංචේන්ද්‍රියන්ගෙන් ලැබෙන සංවේදනවලට අමතරව වෙනත් විවිධාකාර සංවේදන ලැබීමේ හැකියාව ඇති මිනිසුන් ගැන කලින් කල වාර්තා වී ඇත. කෙනෙකුට එවැනි අසාමාන්‍ය හැකියාවක් තිබීමටත් තවෙකෙකුට නොතිබීමටත් හේතුව කුමක්ද? මේ සම්බන්ධව සිත්ගන්නා සුලු පැහැදිලි කරදීම් ඉදිරිපත් වී ඇත. ඉන් එක මතයක් මෙපරිදිය.

දරුවකු මව්කුස තුළ වර්ධනය වන විට ඔහුගේ "සවැනි ඉන්ද්‍රියය" ක්‍රමක්‍රමයෙන් වැඩේ. එබැවින් මව්කුස තුළ සිටින බිළිඳාට තම දෙමාපියන්ගේ සිතුම් පැතුම් පවා වටහා ගැනීමේ හැකියාවක් ඇත. දරුවා මව්කුස තුළ මෝරා බිහිවන විටත් මේ සවැනි ඉන්ද්‍රියය ක්‍රියාත්මකව පවතී . බිළිඳු දරුවා ක්‍රමක්‍රමයෙන් වැඩෙත්ම ඔහුගේ ඇස්, කන්, නාසා දී ඉන්ද්‍රියයන් ශීඝ්‍රයෙන් වැඩි දියුණු වේ. මේ සමගම සවැනි ඉන්ද්‍රියයේ අවශ්‍යතාවෙන් ඔහු මිදෙයි. එබැවින් සවැනි ඉන්ද්‍රියය "මොටවී" යයි.

මේ මතයට රුකුල් දෙන සංසිද්ධි කිහිපයක්ම ඇත.

1. සමහර කුඩා දරුවෝ තම පෙර ආත්ම ගැන හෙළිදරව් කරති. කාලයත් සමග ඔවුන් වයසින් වැඩෙත්ම ඔවුන්ගේ ඒ හැකියාවන් අහිමි වී යයි.

2. කුඩා බිළිඳු දරුවන් අපට නොපෙනෙන දේ දැක සිනාසෙනු, හඬනු සහ අත් දිගුකරනු අප දැක ඇත. මේ තත්ත්වය ඉතා ඉක්මනින්ම පහව යයි.

3. බාලවියේ දී අසාමාන්‍ය හැකියාවක් පෙන්වන බොහෝ දෙනෙකුගේ ඒ හැකියාවන් වැඩිමහලු වයසට පැමිණීමත් සමගම අතුරුදහන් වේ.



Scanned with CamScanner

මෙහි දී අවබෝධ කරගත යුතු එක් වැදගත් දෙයක් ඇත. මිනිසාගේ "සවෙනි ඉන්ද්‍රියය" කුමක්ද යන්න නිශ්චිතව දැක්විය හැකි නොවේ. කෙනෙක් අතීතය දකියි. තවෙකෙක් අනාගතය දකියි. තවෙකෙක් පියවි ඇසට මුණනොගැසෙන දේ දකියි. එබැවින් "සවැනි ඉන්ද්‍රියය" එකක් නොව "පද්ධතියක්ම" ඇති බව කිව හැකිය.



Scanned with CamScanner

# 29. අතීන්ද්‍රිය ඥාන

මෙලොව කලින් කල පහළ වූ අධිමානසික හැකියා ඇත්තවුන් ගැන සත්‍ය වාර්තා රාශියක් පවතී. සමහරු නිරුත්සාහයෙන්ම අතීන්ද්‍රිය ඥාන ලබති. තවත් කෙනෙක් සුළු උත්සාහයකින් ඒ තත්ත්වයට පත්වෙති. මේ අතර, දිගුකලක් තිස්සේ දුෂ්කර අභ්‍යාස කර අධිමානසික හැකියා උපදවා ගත් අය ද වෙති. මෙවැනි "අතීන්ද්‍රිය ඥාන" හෝ අධිමානසික හැකියාවන් ලැබෙන්නේ කෙසේද? ඒවා උපදවා ගන්නේ කෙසේද? මේ ප්‍රශ්න දෙක සම්බන්ධව විවිධාකාර මතවාද පලවී ඇත. ඉන් එක මතයකින් කියවෙන පරිදි මිනිසා දිව්‍යමය මූලයකින් පැවත එයි. ආදිකාලීන මිනිසාට දෙවියන් හා සමාන රූප සෝබාවක් ද දෙවියන්ට මෙන් නොයෙකුත් අතීන්ද්‍රිය ඥානයන් ද විය. කල්යත්ම මිනිසා රූප සෝබාවෙන් ද ආයුෂයෙන් ද පිරිහී ගියේය. ඔහු සතු දිව්‍යමය ඥානයන් ද සැඟව ගියේය. එනමුත් තවදුරටත් ඒ දිව්‍යමය හැකියාවන් මිනිසා තුළ සැඟව පවතී. සමහරුන්ට උත්පත්තියෙන්ම ඒ හැකියාවන් ප්‍රදර්ශනය කිරීමේ "වරම" ලැබේ. එනමුත් උත්සාහ ගන්නා කවර කෙනෙකුට වුවද තමා තුළ සැඟව ඇති දිව්‍යමය හැකියාවන් පුබුදුවාලීමට හැකිය. එය මල බැඳුණු ආයුධයක් "මුවහත් කිරීම" වැනිය. සැඟව ගිය විවිධාකාර දිව්‍යමය හැකියාවන් රාශියක්ම මෙලෙස "නැවත" මතු කරගත හැකිය.

මිනිසා දිව්‍යමය මූලයකින් පැවතෙන බව බුදු දහමෙහි එන කැපී පෙනෙන ඉගැන්වීමකි. සූත්‍ර පිටකයේ දී දීඝ නිකායේ එන එම කරුණ සවිස්තරව දක්වා ඇත්තේ මෙපරිද්දෙනි.

✧ විශ්වයේ පවතින ලෝක ධාතුවලින් වැඩි ප්‍රමාණයක් කලින් කල නැසී යයි.

✧ ලෝක විනාශයෙන් පසු සත්ත්වයෝ වැඩි වශයෙන් ආභස්සර නම් බ්‍රහ්ම ලෝකයෙහි උපදිති.

✧ ආභස්සරයෙහි වෙසෙන දිව්‍යමය ශරීර සහිත සත්ත්වයෝ ප්‍රීතියෙන් කල් ගෙවති.

✧ අනතුරුව ක්‍රමක්‍රමයෙන් ලෝක ධාතු (ග්‍රහලෝක) බිහිවේ.



Scanned with CamScanner

✧ ආයුෂ පිරිහී ආභස්සර ලෝකය ආදී බ්‍රහ්ම ලෝක තලයන් ගෙන් චුතවන සත්ත්වයෝ පෘථිවියෙහි වාසය ආරම්භ කරති.

✧ එකල පෘථිවියේ සෘතු වෙනසක් නැත. හිරු, සඳු හෝ තරු නොපෙනෙයි. ස්ත්‍රී පුරුෂයන් කියා වෙනසක් දැකිය නොහැකි සත්ත්වයෝ පෘථිවියෙහි වාසය කරති.

✧ පෘථිවිය අඳුරු වුවද දිව්‍යමය ප්‍රභාව සහිත සත්ත්වයන්ගේ ශරීර ආලෝකමත් විය.

✧ මෙලෙස දිගුකලක් ගත වූ පසුව පෘථිවිය මත වූ ජලතලය මත ගිතෙල් වැනි දෙයක් හට ගත්තේය.

✧ පෘථිවිවාසී සත්ත්වයන් මේ ගිතෙල් වැනි සූපය (Soup) ආහාරයට ගැනීමට හුරු වූ තැන් පටන් ඔවුන්ගේ ශරීරාලෝකය අතුරුදන් විය. ශරීරවල බර වැඩි විය. අහසින් බට මිනිස්සු එතැන් සිට පොළව මත ඇවිදීම ඇරඹූහ.

✧ එකල සිට දිවා රෑ වෙනස දැකගත හැකි විය. මන්දයත් හිරු, සඳු හා තරු විද්‍යමාන වූ බැවිනි.

මිනිසා දිව්‍යමය මූලයකින් පැමිණ පෘථිවියේ වාසය ඇරඹූ අයුරුත් එතැන් සිට දිගුකලක් දිව්‍යමය හැකියාවන් සහිතව ජීවත් වූ අයුරුත් මෙලෙස විස්තර වේ. පසු කලෙක ඒ හැකියාවන් යටපත් වූයේ ද්‍රව්‍යමය ආහාරවලට හුරු වූ පසුවය. කෙසේ නමුත්, මේ විස්තරය මුල් බැල්මටම චාල්ස් ඩාවින්ගේ පරිණාමවාදී ඉගැන්වීම් සමග නොපෑහෙයි. මන්දයත් මිනිසා ඇතුළු සියලුම ජීවීන් වඩා සරල ප්‍රාථමික ජීවී ආකාරවල සිට පරිණාමිකව සංවර්ධනය වූ බව ඩාවින් පෙන්වා දුන් බැවිනි. එනමුත් පුදුමයකට මෙන් ලෝකාරම්භය පිළිබඳ එඩ්ගා කේසිගේ ඉගැන්වීම් ඒ පිළිබඳ බෞද්ධ මතවාදයත් සමග හොඳින් පෑහේ. කේසිගේ හෙළිදරව් කිරීම් අනුව දුරාතීතයේ දී මනුෂ්‍ය වර්ගයා ආකාශචාරීව පෘථිවියෙහි වාසය කර ඇත. අනතුරුව ඔවුහු ඝන ශරීරවලට මාරු වූහ. එතැන් සිට ඔවුන්ගේ දිව්‍යමය බලය වියැකී ගියේය.



Scanned with CamScanner

# 30. අසාමාන්‍ය හැකියා ඇති මිනිස්සු

ලෝක ඉතිහාසයේ සෑම කාලයකම පාහේ අසාමාන්‍ය හැකියා ඇති මිනිසුන් ගැන වාර්තා වී ඇත. බුදුන්වහන්සේ විවිධාකාර අධිමානසික හැකියා රාශියක්ම කිරීමේ හැකියා ඇති අයෙකුට උදාහරණයකි. උන්වහන්සේගේ හැකියාවන්හි සීමාවක් නොවූ බව පැවසේ. ක්‍රිස්තුස් වහන්සේට දිය මත ඇවිදීම, රෝගීන් සුවපත් කිරීම වැනි හැකියාවන් තිබූ බව බයිබලය ඇතුළු ඉතිහාස ග්‍රන්ථවල සඳහන් වේ. එදා මෙදා තුර කිතුනු පූජකවරුන් 100කට පමණ අහසේ පාවී පෙළහර පෑමේ හැකියාව තිබූ බව වාර්තාවන්හි දැක්වේ. දැනට වසර 800කට පමණ පෙර ටිබෙට් රටේ විසූ මිලාරෙපා නම් යෝගියා අසාමාන්‍ය හැකියා සම්බන්ධව ප්‍රසිද්ධ වූවෙකි. අහසින් යාම, ගිනිජාලා මැවීම, තමා වැනිම වූ අන්‍යයන් මැවීම වැනි ප්‍රාතිහාර්යය නිසා එතුමා තම ජීවිත කාලය තුළදීම දෙවැනි බුදු කෙනෙකු ලෙස ගෞරවයට ලක්වූහ.



මරණයට අභියෝග කළ යෝගියා
බාබාජි මහරාජ්




Scanned with CamScanner

අසාමාන්‍ය චරිත අතර වර්තමානයේ වැඩිම කතාබහට ලක්වී ඇත්තේ ඉන්දියානු යෝගියෙකි. හේ බාබාජි මහරාජ් නම් වේ. ඉන්දියානුවන් විශ්වාස කරන පරිදි බාබාජිගේ වයස වසර දහසකටත් වඩා වැඩිය. දහනව වන සියවසේ ඉන්දියාවේ දුම්රිය මාර්ග තනන අවස්ථාවේ බාබාජි දුම්රිය මාර්ග කම්කරුවන් සමග එක්ව වැඩ කළේය. 20 වන සියවසේ දී ඔහු ඒ ස්වරූපයෙන්ම කුම්භමේලා උත්සවවලට ඉදිරිපත් වූයේය. ගත වූ වසර 100කට වඩා කාලය තුළ ඔහු සුළුවෙන් හෝ වියපත්ව නොතිබුණි.

බාබාජිගේ දීර්ඝායුෂ පිටුපස ඇති රහස අතිමානුෂික හැකියාවන් බව ඔහුගේ අනුගාමිකයෝ විශ්වාස කරති. මීටත් වඩා විස්මය දනවන කරුණ වන්නේ ඔහුගේ අධිමානසික හැකියාවන්ය. තම අනුගාමිකයන් ඉදිරිපිට ඕනෑම අවස්ථාවක පෙනී සිටීමේ බලයක් ඔහුට ඇති බව කියති. එබැවින් බාබාජිගේ අනුගාමිකයෝ සිරිතක් ලෙස තම නිවෙස්හි ඔහු වෙත අසුනක් පනවා තබති.

මෑත කාලයේ දී බාබාජි ප්‍රසිද්ධියේ පෙනී සිටි අවස්ථා විරලය. එනමුත් හිමාල වනයේ සැරිසරන දඩයක්කරුවන්ට විටින් විට ඔහු හමු වී ඇත. වසරේ වැඩිකලක් හුදෙකලාව වනගතව වෙසෙන ඔහු විටින් විට තම මිතුරන් වන තිබ්බතීය බෞද්ධ භික්ෂූන් ඇසුරු කිරීමට ද අමතක නොකරයි. තිබ්බතයේ සහ ඉන්දියාවේ අප්‍රසිද්ධව හැසිරෙන මේ අපූරු මිනිසා නූතන විද්‍යාවට අභියෝගයක් එල්ල කර ඇති බව නිසැකය.


කයිලාශ කූටය - මිලාරෙපා, බාබාජි වැනි විස්මිත හැකියා සහිත යෝගීන් රැසක් වාසය කළේ මේ ප්‍රදේශය ආශ්‍රිතවය



# 31. මිනිසුන්ට අහසින් යා හැකිද?

2007 වර්ෂයේ දී ඇමරිකානුවෙක් පුදුමාකාර දස්කමක් ලොවටම පෙන්නුම් කළේය. ඔහු ධවල මන්දිරය ඉදිරියේ සිට අහසට නැග පෙන්වුවේය. ඔහුගේ මේ වික්‍රමය පැය 2 කට වඩා කාලයක් ඒ ලෙසම තිබුණි. ලොව පුරා රූපවාහිනී වාර්තාකරුවෝ සිය කැමරා කාචවල ඒ දසුන සටහන් කරගත්හ. හේ මෙම හැකියාව වරක් නොව කිහිපවරක්ම පෙන්වීමට සමත් විය. ඔහු කියන පරිදි අහසට පැන නැගීම ඕනෑම කෙනෙකුට කළ හැකි දෙයකි. ඊට අවශ්‍ය වනුයේ කැපවී යෝග අභ්‍යාස කිරීම සහ ඉවසීම පමණකි. තමා ඒ හාස්කම කළේ ඉන්දීය යෝග අභ්‍යාස ක්‍රමවලින් සිරුර සැහැල්ලු කිරීමෙන් බව ඔහු වාර්තාකරුවන්ට හෙළි කළේය.

මෙය යෝගියෙකු අහසට නැග සිටිනු කැමරා කාචයක සටහන් වූ ප්‍රථම වතාව නොවේ. ඉන්දීය යෝගියෙකු වූ පුල්ලෙවාර් සාමි දැනට වසර 100කට පමණ පෙර බොහෝ දෙනා ඉදිරියේ අහසට නැග සමාධිගතව සිටින ආකාරය එකල ලන්ඩන් නුවර පුවත්පත්වල මුල්පිටුවේම පළවිය.



ඇමරිකානුවෙක් ධවල මන්දිරය ඉදිරිපිට දී අහසට නැග ඉන්දීය යෝග විද්‍යාවේ හාස්කම් පෙන්වයි.




Scanned with CamScanner

විවිධාකාර යෝග අභ්‍යාස ඇසුරෙන් සිරුර සැහැල්ලු කර අහසට නැගීමට හැකි කිහිපදෙනෙක්ම දැනට ලොව පුරා සිටිති. ඔවුන්ට තව ඉතිරිව ඇත්තේ තමා සිතූ තැනට අහසින් යාමේ හැකියාව ලබා ගැනීම පමණි. මිනිසා ඍද්ධි බලයෙන් අහසේ යන දිනය වැඩි ඈතක නොවන බව පැහැදිලිය.



අධිමානසික බලයෙන් අහසේ පාවී
පෙන්වන පර්යේෂකයෙක්



අහසේ සමාධි ගතව සිටින
පුල්ලෙවාර් සාමි



Scanned with CamScanner

# 32. අසහාය අනාවැකිකරු - නොස්ත්‍රදාමුස්

එදා මෙදා තුර ලොව විසූ අනාවැකිකරුවන් අතරින් මුල් තැනෙහි ලා සැලකෙනුයේ කවුද? ඒ අන් කිසිවෙකු නොව මයිකල් ඩී. නොස්ත්‍රදාමුස්ය. ක්‍රි.ව. 16 වන සියවසත් 21 වන සියවසත් අතර කාලය තුළ ලොව සිදුවන වැදගත් සිදුවීම් විශාල ප්‍රමාණයක් කල් තබා දැන ගැනීමට ඔහු සමත් විය. ඔහු කී අනාවැකිවලින් වැරදී ගොස් ඇත්තේ කිහිපයක් පමණි.

ක්‍රි.ව. 16 වන සියවස ප්‍රංශයේ විසූ නොස්ත්‍රදාම් වෘත්තියෙන් වෛද්‍යවරයෙකු විය. ඔහු දක්ෂ වෛද්‍යවරයෙකු ලෙසට එකල ප්‍රංශ ජනතාව අතර පිළිගැනීමට ලක්විය. මෙලොව සිදුවන ස්වාභාවික සංසිද්ධීන් හා මානව ක්‍රියාකාරකම් අතර සියුම් සබඳතාවක් ඇති බව හේ තදින්ම විශ්වාස කළේය. ඒ විශ්වාසය ඔස්සේ සිත මෙහෙය වූ ඔහු ජ්‍යෝතිෂය හා අනාවැකි කීමේ කලාව ප්‍රගුණ කළේය. එකල යුරෝපයේ විසූ ජිප්සි හෙවත් අහිගුණ්ඨික ජනතාව අතර අනාවැකි කීමේ කලාව ප්‍රචලිතව තිබුණි. ජිප්සි ගැහැනු ඔපදමන ලද පළිඟු බෝලයක් දෙස බලා සිට සාස්ත්‍ර කීම ජීවිකාව කොට ගත්හ. ජිප්සි ගැහැනුන්ගේ "පළිඟු බෝල" වෙත නොස්ත්‍රදාමුස්ගේ අවධානය යොමු විය. හේ පළිඟු බෝල ඇසුරෙන් සාස්ත්‍ර කීමේ කලාව ප්‍රගුණ කරන්නට පටන් ගත්තේය.

"පළිඟු බෝල" ඇසුරෙන් සාස්ත්‍ර කීමේ විධිය සිත්ගන්නා සුලු එකකි. මේ සඳහා යොදා ගැනෙනුයේ දොඩම් ගෙඩියකට වඩා මඳක් ලොකු ඔප දමන ලද පළිඟු (Crystal Glass) හෝ ක්වාට්ස් (තිරිවාණ) බෝලයකි. පළිඟු බෝලය මිටි මේසයක් මත තබනු ලැබේ. ඉන්පසු සාස්ත්‍රකරු සහ සාස්ත්‍ර අසන්නා පළිඟු බෝලය දෙපස හිඳ ගනිති.

දැන් සාස්ත්‍රකරු පළිඟු බෝලය වෙත ළංවී සිනිඳු රෙදිකඩකින් එය මනාව පිස දමයි. ඉන්පසු පළිඟු බෝලය දෙස බලා සිට ඒ මතට සිත එක්තැන් කරයි. ක්‍රමක්‍රමයෙන් පළිඟු බෝලය මත අපැහැදිලි රටා මතු වේ. ඉන්පසු ඒ රටා වියැකී ගොස් පැහැදිලි දර්ශනයක් දැක ගැනීමට හැකිවේ. ශාස්ත්‍ර අසන්නා තම අතීතය හෝ අනාගතය ගැන අසන විට ඒ ප්‍රශ්නවලට පිළිතුරු පළිඟු



Scanned with CamScanner

බෝලය මත මැවී පෙනෙයි. නොස්ත්‍රදාම් මේ පළිඟු බෝල කලාව හොඳින් ප්‍රගුණ කළේය. මීට අමතරව එකල යුරෝපය තුළ ප්‍රචලිතව පැවතුණු රිදී කැටපතක් දෙස බලා සාස්ත්‍ර කීමේ කලාව හොඳින් ප්‍රගුණ කළ නොස්ත්‍රදාම් ඒ ක්‍රම දෙකටම සාස්ත්‍ර කීමේ හැකියාව ලබා ගත්තේය.

(රිදී කැටපත දෙස බලා සාස්ත්‍ර කීමද ඉහත විස්තර කළ පළිඟු බෝල සාස්ත්‍ර කලාවට සමානය.)

සාස්ත්‍රකරුවෙකු ලෙස නොස්ත්‍රදාම්ගේ කීර්තිනාමය ක්‍රමක්‍රමයෙන් පැතිර යද්දී තව තවත් ජනප්‍රිය වීමට ඔහුට අවැසි විය. හේ තම නාමය "නොස්ත්‍රදාමුස්" ලෙස වෙනස් කර භාවිත කළේ මිනිසුන්ගේ වැඩි අවධානය ලබනු පිණිසය.

එකල යුරෝපයෙහි ජනතාව අතර භාවනා ක්‍රම ගැන ඇලීමක් හෝ දැනුමක් නොවීය. කෙසේ නමුත් නොස්ත්‍රදාමුස් භාවනාව හෙවත් සිත එකඟ කිරීමේ කලාව ද උගත්තේය. ජලය දෙස බලා සිටීම හෝ ගිනිදැල් දෙස බලා සිටීම තුළින් අධිමානසික හැකියා පුබුදු කළ හැකි බව දත් හෙතෙම දිනපතාම එවැනි අභ්‍යාසවල නිරත වූයේය.

දැන් නොස්ත්‍රදාමුස් තරමක් ප්‍රසිද්ධ සාස්ත්‍රකරුවෙකි. දිනපතාම විවිධාකාර පිරිස් ඔහු බැහැදැකීමට පැමිණියහ. තමාගේ අනාවැකි කීමේ කලාව දියුණු කිරීමේ අවශ්‍යතාව නැවත නැවතත් ඔහුට දැනුණි. හේ ප්‍රංශයේ සිටි සුප්‍රසිද්ධ අනාවැකිකරුවන් හා වරින් වර සාකච්ඡා පවත්වා තම දැනුම කිහිප ගුණයකින් වැඩි කර ගත්තේය. පෙර අපර දෙදිගම ඒ වන විට ප්‍රචලිතව පැවති ජ්‍යෝතිෂ විද්‍යාව තම කාර්යයන්හි දී සහයට ගැනීමට ඔහුට හැකිවිය. විවිධාකාර ග්‍රහ මාරුවීම්, ග්‍රහ සංයෝග ආදිය මනුෂ්‍ය ජීවිතයට බලපාන අයුරු අවබෝධ කරගැනීමට ඔහුට වැඩි කලක් ගත නොවීය.

ආධුනිකයෙකු සේ අනාවැකි කීමේ කාර්යයට අත ගැසූ නොස්ත්‍රදාමුස් එම ක්ෂේත්‍රයෙහි පතාක යෝධයෙකු බවට පත්වන ලකුණු පෙනෙන්නට තිබුණි. මේ වන විට මුළු යුරෝපාකරය පුරාම ක්‍රිස්තියානි පල්ලියේ අණසක පැතිරී තිබුණි. භූතාවේශයෙන්



Scanned with CamScanner

සාස්ත්‍ර කීම යක්ෂයාට අයත් කාර්යයක් විය. එබැවින් භූතාවේශයෙන් සාස්ත්‍ර කියන්නන් ද යක්දෙස්සන් හෙවත් "සාතන්ගේ පණිවිඩකරුවන්" ලෙස සලකා අමු අමුවේම පුලුස්සා මරාදමනු ලැබීය. සමහර විට එක දිනක දී සාස්ත්‍රකරුවන් 300ක් පමණ පණපිටින් පුලුස්සා මරාදමන ලදී. නැතහොත් ඔවුන් නිරුවත් කර කෲර වධබන්ධනයන්ට ලක් කර අමානුෂික ලෙස මරා දමනු ලැබීය. පණපිටින් පුලුස්සා දමනු වෙනුවට ප්‍රපාතවලින් පහළට තල්ලු කර මරාදැමීම, එල්ලා මැරීම, පුටුවල තබා බැඳ ජලයේ ගිල්වා මැරීම වැනි ක්‍රියාවන් මගින් ද හැකි සෑම විටම සාස්ත්‍රකරුවන් මර්දනය කරන ලදී.

ක්‍රිස්තියානි පල්ලියේ දැඩි මර්දනකාරී ප්‍රතිපත්ති මැද වුවද තම අනාවැකි කලාවට භූත විද්‍යාවේ ආලෝකය ලබාගැනීමට නොස්ත්‍රදාමුස් සමත් වූයේය. භූත විද්‍යාඥයන් රහසේ හමු වී ඔවුන් ගෙන් ලද උපදෙස් මත නොපෙනෙන ලෝකය සමග සබඳතා පැවැත්වීමට නොස්ත්‍රදාමුස් සමත් වූයේය.

අපට පෙනෙන ලෝකය තුළම නොපෙනෙන ලොවක් වෙයි. සූක්ෂම ශරීර සහිත ජීවීහු එහි වාසය කරති. අපගේ කාලය ඔවුන්ගේ කාලයෙන් වෙනස්ය. මේ හේතුව නිසා අපගේ ලෝකයේ අතීතයද අනාගතයද නොපෙනෙන ලෝකයේ සිටින සූක්ෂම ජීවීන්ට රහස් නොවේ. සිත එක්තැන් කිරීමෙන් සූක්ෂම ජීවීන් හා සන්නිවේදනය ඇරඹිය හැකිය. අතීතය, වර්තමානය හා අනාගතය පිළිබඳ රහස් අනාවරණය කරගැනීමේ මග එලෙස විවර කරගත හැකිය.

මෙකී ලෙසම නොස්ත්‍රදාමුස් තමාට හැකි සෑම ආකාරයකින්ම සිය කුසලතා ඔප්නංවා ගත්තේය. එම තත්ත්වය ඔහු විසින් විස්තර කර ඇත්තේ මෙපරිද්දෙනි.

"මට කුඩා කල සිටම ගුප්ත විද්‍යාව කෙරෙහි ඇල්මක් විය. එමෙන්ම මා ගුප්ත විද්‍යාව හැදෑරීමට සුදුස්සෙකු වීමි. මා තුළ තිබූ සහජ ඇල්මත්, වාසනා ගුණයත් නිරන්තර අධ්‍යාපනයත් නිසා උපරිම තලයට ළඟා වීමි." සැබැවින්ම හේ ගුප්ත විද්‍යාවේ උපරිම තලයට ළඟා වී සිටියේය.

ලෝකය පිළිබඳ තමාගේ දර්ශනය සහ අනාවැකි අඩංගු



Scanned with CamScanner

පොතක් ලියා පළ කිරීම ඔහුගේ ඊළඟ ඉලක්කය විය. විවිධ පුද්ගලයන් ගැන අසුභ අනාවැකි පළ කිරීම හා ඒවා ඒ ලෙසටම පලදීම නිසාම මේ වන විට නොස්ත්‍රදාමුස් සමහර වංශාධිපතීන්ගේ වෛරයට ලක්ව සිටියේය. ඒ හේතුව නිසාම ඔහු තම අනාවැකි පොතේ සඳහන් වන බොහෝ කරුණු ඉඟි ලෙස දැක්වීමට ඉටා ගත්තේය. උදාහරණයක් ලෙස නිව්යෝක් නගරය ඔහු හඳුන්වා තිබුණේ නිව් සිටි (New City) ලෙසයි. නොස්ත්‍රදාමුස්ගේ අනාවැකි පොත මුද්‍රණද්වාරයෙන් පිටවන බව දැනගත් පිරිස් මුද්‍රණාලය අසල රැස්කකා සිටියහ. ඒ අපූරු අනාවැකි පොත සෙන්චරීස් (Centuries) නම් විය. (සෙන්චරීස් යන පදයෙහි තේරුම පේළි සියයක් වූ පද්‍යයන් යන්නයි.) සෙන්චරීස් නම් වූ ඒ අසහාය ග්‍රන්ථය මුද්‍රණද්වාරයෙන් පිටවී පැය 2ක් තුළ එහි පිටපත් සියල්ලම අලෙවි විය. එය අදට ද ලෝක වාර්තාවක් ලෙස සැලකේ. හේ මෙවැනි ග්‍රන්ථ කිහිපයක්ම ලියා පළ කළේය.

ක්‍රමක්‍රමයෙන් මහලු වියට ළං වූ නොස්ත්‍රදාමුස් තම මරණය ගැන ද ලියා තැබීමට අමතක නොකළේය. තමා වෙත ප්‍රංශ රජුගෙන් ආරාධනයක් ලැබෙන බවත් තමා රජු හමු වූ කල රජු තමාට සම්මානයක් ලබාදෙන බවත් ඔහු ලියා තැබීය. ඔහුගේ මරණය සිදුවීමට නියමිත වෙලාව වූයේ රජුගෙන් සම්මානය රැගෙන නිවසට පැමිණි මොහොතයි. ඔහු ඒ කියූ ලෙසම ඒ දෙය සිදු විය. ඔහුගේ අනාවැකියක ලියා තැබූ පරිදිම තම නිදන කාමරයේ ජනේලයත් ඇඳත් අතර දී ඔහු හදිසි හෘදයාබාධයක් සැදී මැරී වැටුණේය.

මීටත් වඩා සත්‍ය අනාවැකි තවත් තිබිය හැකිද?



Scanned with CamScanner

# 33. නොස්ත්‍රදාමුස්ගේ විස්මිත අනාවැකි

මයිකල් ඩී නොස්ත්‍රදාමුස් ඉතිහාස ගත වනුයේ හුදෙක්ම අනාවැකිකරුවෙකු වශයෙන් නොවේ. ලෝකයෙහි ගමන් මග කල් තබා දැනගත් ඍෂිවරයෙකු වශයෙනි. ලෝක දේශපාලනයෙහි කලින් කල වෙනස් වන ප්‍රවණතාවන් ඉතා නිවැරදිව කීමට නොස්ත්‍රදාමුස්ට හැකි විය. මීටත් වඩා වැදගත් කරුණ වනුයේ ලෝකයේ ආධ්‍යාත්මික ගමන් මග වෙනස් වන ආකාරය පිළිබඳ ඔහුගේ ඉගැන්වීමය. ආගම හා දේශපාලනය එකට මුසුවීම 20 හා 21 වන සියවස්වල සිදුවන සුවිශේෂී පරිවර්තනයක් බව ඔහු විසින් පෙන්වා දී ඇත. අන්තගාමී ආගමික නායකයන් විසින් ත්‍රස්තවාදී සංවිධාන බිහිකරමින් මනුෂ්‍ය ඝාතන සිදුකර බලය පතුරුවන ආකාරයත්, ආධ්‍යාත්මික බලවේග මගින් එම බලය යටපත් කරන අයුරුත් නොස්ත්‍රදාමුස් සිත්ගන්නා සුලු අයුරින් තම කෘතියෙහි විස්තර කරයි.

20 වන සියවසෙහි අවසාන දශකය වන විට ක්‍රිස්තු විරෝධී රැල්ලක් මැද පෙරදිගින් හිස ඔසවන බව නොස්ත්‍රදාමුස් කියයි. අරාබිකරයෙහි පැතිර යන මූලධර්මවාදී මතවාද නිසා ප්‍රජාතන්ත්‍ර-වාදයට මරු පහරක් එල්ල වේ. මූලධර්මවාදීහූ ක්‍රමක්‍රමයෙන් ශක්තිමත් වී අරාබිකරයෙහි බලය අල්ලති. ඔවුන් අරාබිකරයෙහි බලය අල්ලා ගන්නේ ජන හිත දිනා ගැනීමෙනි. මූලධර්මවාදීන්ගේ මතවාද දේව වාක්‍ය හා සමකොට පිළිගන්නා අරාබි ජනතාව මූලධර්මවාදීන්ට බලය ලබා ගැනීමට සහය වෙති. මෙලෙස බලය ලබාගත් මූලධර්මවාදී පාලකයන් හා ත්‍රස්තවාදී නායකයන් සෙසු ලෝකය කෙරෙහි කටයුතු කරනුයේ වෙනස් අයුරකිනි. ඔවුහු ක්‍රිස්තියානීන් ඝාතනය කරති. ක්‍රිස්තියානි රටවල පාලන තන්ත්‍ර බිඳ හෙළීමට කුමන්ත්‍රණ කරති. විවිධාකාර භයානක අවි ආයුධ මගින් ජන සංහාරයෙහි යෙදෙමින් මූලධර්මවාදී නායකත්වය තව තවත් ව්‍යාප්ත කිරීමට උත්සුක වෙති.

මධ්‍යධරණී රටවල්, රතු මුහුද ආශ්‍රිත රටවල් හා අරාබි අර්ධද්වීපය ආශ්‍රිත රටවල් ඍජුවම මූලධර්මවාදී පාලනයට යටත් වේ. මෙලෙස කුමන්ත්‍රණකාරීව බලය පතුරමින් චීනය, රුසියාව හා ආසියාව තම ග්‍රහණයට නතුකර ගන්නට ක්‍රිස්තු විරෝධීන්ට හැකියාව ලැබේ. වර්ෂ 2001 වන තෙක්ම මෙකී ක්‍රිස්තු විරෝධී



Scanned with CamScanner

ත්‍රස්තවාදී රැල්ල බලවත්ව නැගී සිටියි.

ක්‍රිස්තු විරෝධී ත්‍රස්ත රැල්ල මෙසේ පවතිද්දී ඊට එරෙහි බලවේගයක් ද වර්ධනය වේ. මෙම බලවේගය මෙහෙයවන්නා යුරේසියානුවෙකි. (යුරෝපීයෙකු හෝ ආසියානුවෙකි) ඔහු කරුණා ගුණ ඇතියෙකු මෙන්ම දරුණු සටන්කරුවෙකි. සතුරන්ට එළව එළවා පහරදෙන පුද්ගලයෙකි. මේ දේශපාලන නායකයා ශක්තිමත් සිරුරක් හා මුඩු හිසක් සහිත වයස් ගත පුද්ගලයෙකි. ක්‍රිස්තු විරෝධී ත්‍රස්ත රැල්ල මැඩපවත්වා ලෝකයට සාමය ගෙන එන්නේ ඔහුය.

**සටහන** - මෑත කාලයේ මැද පෙරදිග වර්ධනය වූ මූලධර්මවාදී බලවේගවල ක්‍රියාකාරකම් නොස්ත්‍රදාමුස් විසින් එලෙස සිය අනාවැකිවල අඩංගු කර ඇත. ක්‍රිස්තු විරෝධී බලවේග මෙහෙය වන ලෝගුවක් හඳින ත්‍රස්තවාදී නායකයෙකු ගැනත් ඔහු විසින් 20 වන සියවස අවසානය හා 21 වන සියවස මුලදී කරන විනාශකාරී ක්‍රියාවන් ගැනත් නොස්ත්‍රදාමුස් විසින් නම් කරන ලද ක්‍රිස්තු විරෝධී ත්‍රස්ත නායකයා අන් කිසිවෙකු නොව ඔසාමා බින් ලාඩන් බව විචාරකයන්ගේ මතයයි.

බින් ලාඩන් මැද පෙරදිග උපන් අයෙකි. හේ වෘත්තියෙන් ඉංජිනේරුවෙකි. තම මූලධර්මවාදී මතවාද ප්‍රචාරය කරමින් කල්ගත කළ ඔහු ඇෆ්ගනිස්ථානයත් පාකිස්ථානයත් අතර සැඟව සිට තම ත්‍රස්තවාදී කටයුතු මෙහෙයවයි. ඇමරිකාවෙහි ට්වින් ටවර්ස් ගොඩනැගිල්ල විනාශ කිරීම, පෙන්ටගන් ගොඩනැගිල්ලට අලාභ හානි කිරීම, ලෝකයේ විවිධ ස්ථානවල බෝම්බ පුපුරවා හැරීම වැනි ත්‍රස්තවාදී ක්‍රියා රාශියකට වගකිව යුතු පුද්ගලයා වනුයේ බින් ලාඩන් නම් වූ සාහසිකයාය. බින් ලාඩන්ගේ ක්‍රියාකලාපය සහ පෙරකී ක්‍රිස්තු විරෝධී (Antichrist) නායකයාගේ ක්‍රියාකලාපය බොහෝ දුරට සැසඳේ.

20 වන සියවසේ අවසානයත් සමගම නොහඳුනන පියාසර වස්තුවල බලපෑමට පෘථිවිවාසීන් හසුවේ. ලෝක ඉතිහාසයේ පළමුවරට පියාඹන පීරිසි හා පෘථිවිවාසීහු මුහුණට මුහුණලා ප්‍රසිද්ධියේ හමුවෙති. මෙකී පියාඹන පීරිසිවලින් එන සමහර ආගන්තුකයෝ සතුරු ආකල්පවලින් යුතුව පෘථිවියට එති. (ඔවුන්ගේ අරමුණ වනුයේ පෘථිවිය මත ජනාවාස පිහිටුවීමයි.)

21 වන සියවසේ වැදගත්ම ආධ්‍යාත්මික බලවේගය



Scanned with CamScanner

ඉන්දියාවෙන් හිස ඔසවයි. ආධ්‍යාත්මික කරුණු ගැන ගවේෂණය කිරීමෙන් නිපුණත්වයට පත් වූ මහා ප්‍රාඥයෙක් ඉන්දියාවෙන් බිහිවේ. හේ ආධ්‍යාත්මික ඉලක්කයක් වෙත මිනිසුන් යොමු කරවයි. ඔහු නවීන විද්‍යාව සහ ආගමික ඉගැන්වීම්වල සංකලනයක් තම අනුගාමිකයන්ට උගන්වයි. ඔහු විසින් ඉදිරිපත් කරන ආගමික ඉගැන්වීම් ඉතා වේගයෙන් ලොව ප්‍රචලිත වේ. පුරාණ අධිමානසික උපක්‍රම ඇසුරෙන් විවිධාකාර හාස්කම් කරන ආකාරය මේ ආධ්‍යාත්මික නායකයා ලොවට කියාදෙයි. මේ නව ඉගැන්වීම්වලින් මිනිස්සු විපුලඵල ලබති. මිනිසුන්ට ජීවත්ව සිටියදීම දෙවියන් දැකගැනීමට හැකිවේ. විශ්වයේ බලවේග හැසිරවීමේ හැකියාව ද ඔවුන්ට ලැබේ.

නොස්ත්‍රදාමුස් තම අනාවැකි ලියා පළ කළේ වයස 52 ත් 63 ත් අතර කාලයේදීය. තමාගේ අනාවැකි කීමේ කලාව පිළිබඳ වැදගත් රහසක් ඔහු හෙළි කළේය. ලෝකයේ වැදගත් සිදුවීම් යළි යළිත් (පුනරාවර්තව) සිදුවෙයි. ඔබට අනාගතය දැකීමට අවශ්‍ය නම් අතීත සිදුවීමක් ගැන සොයා බලන්න. ඒ අවස්ථාවෙහි දී තිබූ ග්‍රහ පිහිටීම් සටහන් කරගන්න. නැවත එවැනි ග්‍රහ පිහිටීමක් උදා වූ කල එවැනිම සිදුවීමක් ඇති වේ. වෙනසකට ඇත්තේ සිදුවීමට මුහුණ දෙන අය වෙනස් පුද්ගලයන් වීම පමණි. මේ ආකාරයට නොස්ත්‍රදාමුස් නිවැරදිව අනාවැකි පළ කළ සිද්ධීන් රාශියක්ම ඉතිහාසඥයන් විසින් හඳුනාගෙන ඇත.

✧ පාප්තුමාගේ ඝාතනය

✧ ඔසාමා බින් ලාඩන්ගේ නැගී සිටීම

✧ පළමු ලෝක යුද්ධය

✧ 2 වන ලෝක යුද්ධය

✧ පරමාණු බෝම්බ සෑදීම

✧ මිනිසාගේ සඳ ගමන

✧ ඉන්දියානු නිදහස් සටන

වැනි ඓතිහාසික සිදුවීම් රැසක් නොස්ත්‍රදාමුස් විසින් ඉතා නිවැරදිව විස්තර කර ඇත්තේ ඒ සිදුවීම්වලට සියවස් ගණනකටත් පෙරය.



Scanned with CamScanner

# 34. සිහිනෙන් දකින අනාගතය

ජීවිතය සිහිනයක් බඳුය යනුවෙන් බුද්ධ දේශනයේ සඳහන් වේ. නාගර්ජුන පඬිතුමාට අනුව ජීවිතය හා සිහිනයක් අතර වෙනසක් නැත. අප සිහිනෙන් දකින දේවල අර්ථයක් ඇත්ද?

සිහින පෙනීමට විවිධාකාර හේතු බලපෑ හැකිය.

1. එදිනෙදා ජීවිතයේ මතක සටහන් සිහින ලෙස පෙනිය හැකිය.
2. තම ජීවිතයේ නොසන්සිඳුණු ආශාවන් සිහින තුළින් පෙන්නුම් කළ හැකිය.
3. තමා නිතර බියවද්දන යම් දෙයක් සිහිනෙන් ද ඉදිරිපත්ව තමා බියපත් විය හැකිය.
4. කායික රෝගාබාධ සිහින මගින් පෙන්නුම් කළ හැකිය.

මේ අතර, අනාගත සිදුවීම් සිහින ලෙස පෙනී යෑමට ද ඉඩක් ඇත. අලුයම් කාලයේ දී පෙනෙන සිහිනවලින් අනාගතය පෙන්නුම් කරන බවට ද මතයක් ඇත.

බෝසතාණන් වහන්සේ බුදුවීමට පෙරාතුව තමා බුදුවන බවට පෙරනිමිති සිහිනෙන් දුටු බව කියැවේ. තවද තිබ්බත මහායෝගී මිලාරෙපාට තම ජීවිතයේ අනාගත සිදුවීම් වැඩි ප්‍රමාණයක් සිහිනෙන් පෙනී ඇත.

මහායෝගී නාරොපා කියන පරිදි, සමහර සිහින දෝෂ සහගත වේ.

1. එකම සිහිනය දිනපතා පෙනී යාම.
2. සිහින පෙනෙන අතර අවදි වීම.
3. සිහිනෙන් අනතුරුවලට ලක්වීම.

ස්වප්න දෝෂ නම් වේ. එකම සිහිනය දිනපතා දකින පුද්ගලයා සිහිනෙන් වෙහෙසට පත්වේ. සිහින පෙනෙන අතර අවදි වන පුද්ගලයා අක්‍රමවත් නින්දක් ලබයි. සිහිනෙන්



Scanned with CamScanner

අනතුරුවලට ලක්වන පුද්ගලයාගේ මනස පසුබෑමට ලක්වේ. නින්දට පෙර භාවනා කර, එකම වේලාවක නින්දට ගියොත් ස්වප්න දෝෂ දුරු වෙයි.

අනාගත සිදුවීම් සිහිනෙන් පෙනේද යන්න පරීක්ෂා කර බැලීම සඳහා දිනපතාම තමා දකින සිහින ලියා තබාගත යුතු බව ස්වප්න විද්‍යාව සම්බන්ධ විශේෂඥයෝ කියති. නින්දෙන් අවදි වූ විගස ඒ කරුණු ලියා ගත යුතුය. විවිධ අනාගත සිදුවීම් සංකේත මගින් පෙන්නුම් කරන බව ස්වප්න විද්‍යාවේ කියවේ.

උදාහරණ -

1. ඉහළකින් ඇද වැටීම සිහිනෙන් දකින පුද්ගලයා තනතුරෙන් පහත වැටීම වැනි සිදුවීමකට අනාගතයේ මුහුණ දිය හැකිය.

2. තමාගේ දත් සියල්ල හැළී ඇති බව සිහිනෙන් දකින පුද්ගලයා නුදුරු අනාගතයේ රෝගී විය හැකිය.

මේ ආකාරයට තමා දකින සිහින හා අනාගත සිදුවීම් අතර සබඳතාවක් ඇත්ද යන්න පරීක්ෂා කර බැලීමට හැකිය.



Scanned with CamScanner

# 35. පෙරනිමිති හෙවත් අනාගතයේ සෙවණැලි

සුබ හා අසුබ පෙරනිමිති පිළිබඳව අනාදිමත් කාලයක සිට මිනිසුන් අතර විවිධ විශ්වාසයන් විය. මෙවැනි කරුණු මෑතක් වනතුරු විද්‍යාවෙන් ප්‍රතික්ෂේප කරනු ලැබීය. එහෙත් ක්වොන්ටම් භෞතික විද්‍යාවේ නව සොයා ගැනීම් සමග ඒ අදහස් කණපිට හැරී ඇත. අනාගතය හා අතීතය වශයෙන් කාලය බෙදා ගැනීමක් සිදුවනුයේ අපගේ මනසෙනි. අතීතයක් නොමැතිව අනාගතයක් තිබිය හැකිද? නොහැකිය. අනාගත සිදුවීම්වල සෙවණැල්ල වර්තමානය තුළ පතිත වන බවට විද්‍යාඥයෝ සැක කරති. ළඟ ළඟ එන සුබ හෝ අශුභ සිද්ධියක් පෙරනිමිත්තක් මගින් පෙන්නුම් කිරීමට හොඳටම ඉඩකඩ ඇති බව මෙයින් පැහැදිලි වේ.

සෑම රටකම සුබ හෝ අශුභ නිමිති වර්ග කිරීමක් සිදුවේ. සුහුනන් ඇඟට වැටීම, කපුටන්ගේ නාදය වැනි දේ සම්බන්ධව පෙරනිමිති පොත් පවා මෙරට ලියවී ඇත්තේ ඒවා ගැන මහජනතාව විශාල උනන්දුවක් දක්වන බැවිනි. මෙවැනිම දියුණු නිමිති ශාස්ත්‍ර ක්‍රමයක් මධ්‍යකාලීන යුගයේ දී බටහිර රටවල වර්ධනය විය. ඒ නිමිති ශාස්ත්‍ර ක්‍රමය අනුව පෙරනිමිති විවිධාකාර ලෙස වර්ග කරනු ලැබේ.

1. දිව්‍යමය පෙරනිමිති - මේවා දෙව් ලොවින් එන පණිවිඩ වැනිය. අකුණු ගැසීම, වල්ගා තරු, උල්කාපාත වැනි දේ දිව්‍යමය බලවේගයන්ගේ පෙරනිමිති ලෙස සලකනු ලැබේ.

2. යක්ෂයාගේ පෙරනිමිති - මේවා සාතන් (යක්ෂයා) සහ අපායේ බලවේග විසින් මෙහෙයවනු ලබන නිමිති ලෙස සලකනු ලැබේ. බළලුන්, බකමුහුණන්, කපුටන් ආදී සතුන්ගේ චර්යාවන් මගින් යක්ෂයාට අයත් පෙරනිමිති පෙන්නුම් කරයි.

3. අස්වාභාවික සිදුවීම් - අස්වාභාවික සිදුවීම්වලින් කියාපානුයේ පෙර නොවූ විරූ දෙයක් සිදුවන බවයි.

4. අහඹු සිදුවීම් - ඔබ නොසිතූ ආකාරයේ සිදුවීමක් වීමට නියමිත බව අහඹු සිදුවීමකින් කියා පායි.

5. කාලගුණය සම්බන්ධ අනාවැකි - හදිසි කාලගුණ වෙනසක්



Scanned with CamScanner

මගින් තවත් එවැනිම කාලගුණ වෙනසක් ගැන අනාවැකි පවසයි.

විවිධ පෙරනිමිති දහස් ගණනක් බටහිර රටවල පැතිරී ඇත. මේවා දුර්මත ලෙස සමහරු සලකති. පෙරනිමිති තරම්ම ජනප්‍රිය ගුප්ත විශ්වාස රාශියක් ද බටහිර රටවල පොදු ජනතාව අතර ජනප්‍රියය. එවැනි පෙරනිමිති හා ගුප්ත විශ්වාස කිහිපයක් මෙතැන් සිට දැක්වේ.

1. පමණට වඩා පැහැබර උදෑසනකින් කියවෙනුයේ සවසට වැසි ඇති වන බවයි.

2. තිදෙනෙක් එකට ඡායාරූපයකට පෙනී සිටියහොත් එයින් මැද සිටින්නා පළමුව මිය යයි.

3. දහතුන් දෙනෙක් ඡායාරූපයකට පෙනී සිටියහොත් ඉන් එක් අයෙක් වසරක් තුළ මිය යයි.

4. තිදෙනෙක් එක්ව සුබ ගමනක් ගියොත් මග දී බාධකයකට මුහුණ දෙනු ඇත.

5. ඔබේ ඇඳ උතුරට හරවා ඇත්නම් ඔබ අඩු ආයුෂ විඳ මිය යනු ඇත. එය දකුණට හරවා ඇත්නම් ඔබ ධනවත් වනු ඇත.

6. ඔබගේ ජීවිත කාලය තුළ දී එක්වරක් හෝ දුප්පතෙකුට සපත්තු දෙකක් දන් දිය යුතුය. නැතිනම් ලබන ආත්මයේ සපත්තු පැලඳීමේ වාසනාව හිමි නොවේ.

7. ඔබ උපන් තැනට යළිත් වරක් ගියහොත් ඔබගේ ආයුෂ දිගුවේ.

8. ඔබ අතින් ගවයන්ගේ ඇටකටු ගින්නට වැටුණොත් දුප්පත් වීම සිදුවේ. වෙනත් සතුන්ගේ ඇටකටු පිලිස්සුව හොත් ඔබ ගැන නරක කතා පැතිරේ.

9. බෝතලයක් බිඳීයාම, ඉදිරියේ අවාසනාවන්ත සිදුවීමක් වන බවට ලකුණකි.

10. ඔබගේ ඇඳුමෙහි ගසක කොටසක් පැටලුණ හොත් එය ළඟ දී ඔබට මුදල් ලැබීමක් ගැන සුබ පෙරනිමිත්තකි.



Scanned with CamScanner

11. ඔබ වැරදීමකින් කමිසයේ වැරදි ලෙසට බොත්තම් දැමුවහොත් ඔබ යන්නට සිතා සිටින ගමනෙන් අනර්ථයක් සිදුවේ.

12. සෑම විටම දොර වසන විට දොර දෙස බලාගෙන දොර වසන්න. පසුපස බලාගෙන දොර වැසීමෙන් නරක කලදසාවක් එළඹීමට හේතු වේ.

13. බිත්තර කටු පිලිස්සීමෙන් ඔබේ ගෙවත්තේ සිටින කිකිළියන් වඳ වේ.

14. බිත්තරයක් බිම වැටී බිඳී විසිරී යාම සුබ නිමිත්තකි. බිම වැටී එය පිපිරීම අශුභ නිමිත්තකි.

15. සෑම කාන්තාවක්ම 31 වන වියේ දී සුවිශේෂී අත්දැකීමකට මුහුණපායි.

16. මාළු කන විට වලිගය පැත්තෙන් ආරම්භ කර ඔළුව දෙසට කෑ යුතුය. නැති නම් තමාට අශුභය.

17. ගෑරුප්පුවකින් යමක් කැලතීම නොකරන්න. එය අවාසනාව ගෙන දෙනු ඇත.

18. ඔබ ගමනක් යන විට මිනීවළවල් සාරන අයෙකු ඉදිරියට මුණගැසීම ඉදිරියේ එන අවාසනාවන්ත සිද්ධියක පෙර ලකුණකි.

19. ඔබේ ලේන්සුවේ ගැටයක් දැමීමෙන් අශුභ බලවේග ඔබෙන් ඉවත් වේ.

20. ඔබ ගමනක් යන විට නැවත හැරී ගෙට ගොස් යමක් ගෙන ඒම අශුභ දෙයකි. එහි අශුභ තත්ත්වය මගහැරවීමට පුළුවන, හිඳගෙන 1 සිට 10 ගණන් කර නැවත ගමන අරඹන්න.

21. පැනට දමන තීන්ත වැටී විසිරී යාමෙන් කියවෙනුයේ ඔබේ සැලසුමක් අසාර්ථක වන වගයි.

22. කිසිවෙකුට පිහියක් තෑගි දීම ඔහුට නරක කලදසාවක් ගෙන දෙයි. ඉන් මිදීමට ඒ සමග තෑග්ග දුන් පුද්ගලයාට ද තෑග්ගක් දිය යුතුය.

23. යමෙකුට අත්වැසුම් යුගලක් තෑගි කිරීම ද මෙබඳුය.



Scanned with CamScanner

24. ඉණිමං යටින් යාමෙන් අශුභ ඵල ඇති වේ.

25. ගෙතුළ ගින්නක් ඇල්වෙන විට එම ගෙදරට අකුණු නොගසයි.

26. කිසිදින නිදන පුද්ගලයෙකුට අකුණු නොවදියි.

27. ගිනිපෙට්ටියක් බිම වැටී විසිරී යාම ළඟ වන උත්සවයක් ගැන සුභ නිමිත්තකි. තරුණියක් අතින් එය වූවේ නම් හෝ මුළු ගිනිපෙට්ටියම විසිර ගියේ නම් ඈ ළඟදීම විවාහ වනු ඇත.

28. ඇඳ ඇතිරිලි ඇතිරිය යුත්තේ ඉහළ සිට පහළටය. පහළ සිට ඉහළට ඇතිරීම අශුභය.

29. ඔබට යම් ගමනක දී එක අයෙකු දෙවරක් මුණගැසීමද ගමන යන විට මුණගැසුණු අයෙකු ආපසු එන විට මුණගැසීමද බලගතු සුභ නිමිත්තකි.

30. ඇඳ සිටින ඇඳුම් මැසීම කිසිවිට නොකළ යුතුය.

31. තෑග්ගක් ලෙස කණ්ණාඩියක් ලැබීම අවාසනාවන්ත සිද්ධියකි.

32. කණ්ණාඩියක් බිම වැටී බිඳීමෙන් සත් වසරක් අපල ගෙන දේ.

33. ඉරිදා නියපොතු කැපීමෙන් ඉදිරි සතියේම යක්ෂයාගේ බැල්මට ඔබ හසුවේ.

34. කිසිදින වීදුරුවක් තුළින් නව සඳ නොබලන්න.

35. ගෙදර එල්ලා ඇති පිංතූරයක් බිම වැටීම අශුභ නිමිත්තකි.

36. බිම වැටුණු ඇණයක් හෝ අල්පෙනෙත්තක් අහුලා ගැනීම සුභ නිමිත්තකි. එය එතැන තිබෙන්නට හැරීමෙන් වාසනාව තමා හැර යයි.

37. පිඟානක් බිඳීම අශුභ නිමිත්තකි.

38. යමෙකුට හිස් පසුම්බියක් තෑගි නොදිය යුතුය. එතුළ යමක් දමා දිය යුතුය.



Scanned with CamScanner

39. ලුණු බිම ඉහිරීමෙන් ළඟදී කඳුළු සලන්නට වන බව කියවේ.

40. කතුරක් කැඩීයාම දබරයක් ඇති වන බවට ලකුණකි.

41. සපත්තු පැති මාරුවී දමාගැනීම බරපතළ අශුභ නිමිත්තකි.

42. හැන්දක් බිම වැටීමෙන් යමෙකු තමා හමු වීමට සිටින බව කියවේ.

43. තරප්පු පෙළක දී යමෙකු පසුකර යාම අශුභය.

44. එක පාදයක් හෝ බිම නොගැවී මේසයක් මත හිඳ ගැනීම ඉතා අපලකාරීය.

45. 13 දෙනෙක් එකට මේසයක් වටා හිඳගත්තොත් අවසානයට නැගිටින තැනැත්තා අවාසනාවන්ත ඉරණමකට ගොදුරුවනු ඇත.

46. ගෙය තුළ කුඩයක් දිගහැර තැබීම අශුභය.

47. වෙනත් යමෙක් භාවිත කළ වතුරෙන් රෙදි සෝදන අය ඒ පුද්ගලයා සමග ගැටුමක් ඇතිකර ගනී.

48. වතුර ටිකක් ඇති වීදුරුවකට තවත් වතුර දැමීම අශුභය.

49. කාන්තාවන් සිවුරුහන් බෑම නොකළ යුතුය.

50. බල්ලන්ගේ උඩු බුරුලෑමෙන් කියවෙනුයේ ළඟපාත ගෙදරක අයෙකු ළඟදීම මිය යන බවයි.

51. ගමනක් යන විට කුකුළෙකු හැඬලීම සුබ ලකුණකි.

52. කිකිළියෙකු හැඬලීම අශුභ ලකුණකි.

53. බස්සෙකුගේ හඬෙන් කියවෙනුයේ නරක ආරංචියකි.

සටහන - මෙවැනි පෙරනිමිතිවලින් වැඩි ප්‍රමාණයක් ඇති වීමට හේතු වී ඇත්තේ පොදුජනතාව ලද අත්දැකීම්ය. ක්‍රිස්තුස් වහන්සේගේ අවසන් භෝජන සංග්‍රහයේ දී 13 දෙනෙක් එකට අසුන් ගත්හ. ඔගස්ටස් සීසර් රණශූරයා තම අවාසනාවන්ත මරණය සිදුවන දිනයේ දී පාවහන් මාරු කර පලඳාගෙන සිටියේය. මෙවැනි සිදුවීම් පසුකාලීනව පෙරනිමිති ලෙස ජනතාව අතර පිළිගැනීමට ලක් වූ බව පැහැදිලිය.



Scanned with CamScanner

# 36. විශ්වය පිළිබඳ විස්මිත රහස්

විශ්වය යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද? සඳ, හිරු, තාරකා ද සියලු ඉඩකඩ ද ඇතුළත් සම්පූර්ණ පද්ධතියට අපි විශ්වය යැයි කියමු. විශ්වයෙහි දිග පළල කීමට කිසිවෙකුවත් මෙතෙක් සමත් වී නැත. මෑතක් වන තුරු විද්‍යාඥයන් සිතා සිටියේ විශ්වයට දිගක් පළලක් සහ අවසාන ඉමක් ඇති බවයි. එහෙත් මෑතක දී නිපදවන ලද ප්‍රබල දුරේක්ෂවලින් ලබාගත් ඡායාරූප නිසා එම මතය පළුදු වී ඇත.

විශ්වයෙහි තාරකා පංති එක්වීමෙන් මන්දාකිනි නම් විශාල ඒකක සෑදේ. මෙවැනි විශාල ඒකක දුරේක්ෂ මගින් ඡායාරූප ගත කර ඇත. අති ප්‍රබල නවීන දුරේක්ෂවලින් ගත් ඡායාරූපවලින් ඈත විශ්වයෙහි පවතින දසදහස් ගණන් මන්දාකිනිවල ඡායාරූප ලබාගෙන ඇති බැවින් විශ්වයට ඉමක් හෝ අවසානයක් ඇතැයි කිව නොහැකිය.

විශ්වය පිළිබඳ බෞද්ධ මතය ද මෙවැනිම වෙයි. විශ්වය අනන්ත අපරිමිත අවකාශය සිසාරා ඇති බවත්, අපරිමිත ලෝක ධාතු සංඛ්‍යාවක් එහි ඇති බවත් සූත්‍ර පිටකයෙහි දැක්වේ. විශ්වය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්වල සාරය කෙරෙහි මෙතැන් සිට අපගේ අවධානය යොමු කරමු.



Scanned with CamScanner

# 37. විශ්වය බිහිවූයේ කෙසේද?

ආරම්භයේ දී කිසිවක් නොපැවතුණි. එක් නිමේෂයකින් සියල්ල ආරම්භ විය. විශ්වය බිහිවීම ඇරඹුණි. ක්‍රමක්‍රමයෙන් එක් තැනක සිට සෑම තැනකටම පැතිරෙමින් දිගෙන් පළලින් හා උසින් සෑම අතකටම පැතිරෙමින් විශ්වය ප්‍රසාරණය වන්නට පටන් ගත්තේය. අවසානයේ එය පැතිරී සියලු ඉඩකඩ වසා ගත්තේය. තාරකා ද ග්‍රහලෝක ද බිහි විය. ග්‍රහලෝක (ලෝක ධාතු) මත ජීවය බිහි විය. ජීව ලෝකවල ජීවීහු ක්‍රමක්‍රමයෙන් බිහි වී විවිධාකාර ජීව ප්‍රභේද ඇති විය.

නැවත එළඹෙනුයේ විනාශයේ සමයයි. විශ්වය ක්‍රමක්‍රමයෙන් හැකිළෙන්නට පටන් ගන්නේය. දැන් එය හැකිළෙමින් ග්‍රහලෝක එකිනෙකා ළංවෙමින් පවතී. අවසානයේ සියල්ල එකිනෙක ගැටී විශ්වයම දවා හළු වී යයි. අනතුරුව එළඹෙන්නේ කිසිදු අංශුවක් හෝ නොමැති කාලපරිච්ඡේදයකි.

මේ ක්‍රියාවලිය එතෙකින් නොනැවතේ. නැවත නැවතත් විශ්වය බිහි වී ප්‍රසාරණය වී එලෙස පැවති, හැකිළී, දැවී සුණු විසුණු වී යයි.

මේ විශ්ව නිර්මාණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීමයි. විශ්වය නිර්මාණය පිළිබඳ කතන්දරය තවදුරටත් විග්‍රහ කළහොත් සම්පූර්ණ විශ්වයම අවස්ථා 4ක් පසු කරන බව දැක්විය හැකිය.

1. විවෘත වීමේ කාලය - විශ්වය බිහි වේ.

2. විවෘතව පැවතීමේ කාලය (විවර්තස්ථායි කාලය) - විශ්වය පැතිර ගොස් ඇති අවස්ථාවයි. විවිධාකාර ජීවීන් හා විවිධාකාර ජීව ලෝක පවතින කාලයයි.

3. සංවෘත වීමේ කාලය - විශ්වය විනාශ වෙමින් හැකිළෙන කාලයයි.

4. සංවෘත කාලය - විශ්වය ද අවකාශය ද හැකිළී ගොස් සියල්ලම විනාශ වී අතුරුදහන්ව පවතින කාලයයි.



Scanned with CamScanner

මෙම කාලසීමා 4 සූත්‍ර පිටකයේ දක්වා ඇත්තේ විවට්ටයමාන, විවට්ඨති, සංවට්ටමාන සහ සංවට්ඨති වශයෙනි. විශ්ව නිර්මාණය පිළිබඳ තවත් මූලික ඉගැන්වීම් කිහිපයක් ඇත.

✧ විශ්වය විවෘත වීම, විවෘතව පැවතීම, සංවෘත වෙමින් පැවතීම, සංවෘතව පැවතීම යන සිද්ධීන් 4ට සමාන කාලසීමා ගතවේ. මේ එක් එක් සිද්ධියකට ගණනය කළ නොහැකි තරම් විශාල කාලයක් ගතවේ.

✧ විශ්වය තුළ විවිධාකාර ජීව ලෝක හා විවිධාකාර සත්ත්වයන් සිටිනුයේ මෙකී දෙවන අවධිය වන විවර්තස්ථායි කාලය තුළ පමණි. විශ්වය හැකිළීමට පටන් ගත් විට ක්‍රමක්‍රමයෙන් ජීව ලෝක ඇවී හළු වී විනාශව යයි.

✧ මෙලෙස විශ්වය විනාශවීම ඇරඹුණ තැන් පටන් දෙවියෝ ද උත්සාහ දරා භාවනා කර ධ්‍යාන වඩති. ඔවුහු එම උත්සාහයේ බලයෙන් මරණින් මතු විනාශයට හසු නොවන බ්‍රහ්මතලයන් මත ඉපදීමට සමත් වෙති.

✧ අපායවාසී සත්ත්වයෝ ද අපායවලින් මිදී ක්‍රමක්‍රමයෙන් ඉහළ තලයන් වෙත පැමිණ ඇඩි සේ උත්සාහ දරා මරණින් මතු විනාශයට හසු නොවන බ්‍රහ්මතලයන් මත ඉපදෙති.

✧ මෙකී මහා විනාශයට කල්ප විනාශය යැයි කියනු ලැබේ. ආභස්සර නම් බ්‍රහ්ම ලෝකය සහ ඉන් එපිට ඇති ලෝක කල්ප විනාශයට හසු නොවේ. එබැවින් කල්ප විනාශයෙන් පසු ආභස්සර බ්‍රහ්ම ලෝකය මත බොහෝ දෙනෙක් වාසය කරති.

✧ සමහර අපායවාසී සත්ත්වයන්ට කල්ප විනාශය තෙක්ම ඉන් ගැලවීමට හෝ බ්‍රහ්මතලයන් වෙත ළඟා වීමට අවස්ථාව නොලැබේ. ඔවුහු වෙනත් විශ්වයන්හි ඇති අපායවල උපදිති.

මේ විස්තරය තුළ අපගේ අවධානයට ලක් කළ යුතු කරුණු කිහිපයක්ම ඇත. මේ විශ්වය හැර වෙනත් විශ්වයක් ද ඇති බව ඉන් එකකි. ඒ මතය සමහර තාරකා විද්‍යාඥයන් විසින් ද ඉදිරිපත් කර ඇත. අප සිටින විශ්වය තවත් විශ්වයක් සමග බද්ධ වී ඇති බවට විද්‍යාඥයෝ සැක පහළ කරති. දැනට අප සිටින විශ්වය හා



Scanned with CamScanner

වෙනත් විශ්වයක් පුනීලයක හැඩය ගත් සිදුරකින් සම්බන්ධ වී ඇති බව දැනට පවතින මතයයි.

විශ්ව නිර්මාණය පිළිබඳ තාරකා විද්‍යාඥයෝ දෙයාකාරයක මත පළ කරති. ඉන් එක් මතයකට අනුව විශ්වය බිහිවූයේ මහා පිපිරුමකිනි. එකී මහා පිපුරුමෙන් (Big bang theory) පසු විශ්වය දැනට පවතින තත්ත්වයට ප්‍රසාරණය විය. එය තවමත් ප්‍රසාරණය වෙමින් පවතී. මේ මතය විශ්වය පිළිබඳ බෞද්ධ ඉගැන්වීමෙහි මුල කොටස හා දෙවන කොටස නියෝජනය කරයි. විශ්වය පිම්බෙමින් හා හැකිළෙමින් පවතින බව තවත් විද්‍යාඥ පිරිසක් විශ්වාස කරති. විශ්ව නිර්මාණය පිළිබඳ බෞද්ධ මතය සමස්තයක් ලෙස සලකන විට එකී දෙවන මතයට සමීපය. විශ්ව නිර්මාණය පිළිබඳ ඉදිරිපත්ව ඇති නවතම මතයකට අනුව, විශ්වය මහා පිපිරුමකින් බිහි වී එකී පිපිරුමේ වේගය නිසා ප්‍රසාරණය වේ. ප්‍රසාරණය වී අවසානයේ නැවත විශ්වය සංකෝචනය වීම ඇරඹේ.

මෙලෙස විශ්වය නැවත සංකෝචනය වීමට හේතුව ගුරුත්වාකර්ෂණයේ බලපෑමයි. දැනට ලැබී ඇති හෝඩුවාවන් අනුව විශ්වය පුරා අඳුරු ද්‍රව්‍ය (Dark matter) විශාල ප්‍රමාණයෙන් විසිරී ඇත. මෙකී අඳුරු ද්‍රව්‍යවල සහ තාරකාවල ගුරුත්ව ශක්තිය නිසා යම්කිසි දිනක විශ්වය නැවත හැකිළීමට පටන් ගනු ඇත. අවසානයේ එය සංකෝචනය වී සියල්ල එකිනෙක ගැටී විනාශ වනු ඇත. පුදුමයකට මෙන් විශ්ව නිර්මාණය පිළිබඳ ඉදිරිපත් වූ නවතම මතවාදය ඒ පිළිබඳ බෞද්ධ ඉගැන්වීමට සර්වසම වේ!



Scanned with CamScanner

# 38. අබිරහස් කළුකුහර

තාරකා විද්‍යාඥයන් විසින් ප්‍රබල දුරේක්ෂවලින් අහස පිරික්සද්දී ඔවුන්ට පුදුමාකාර සංසිද්ධියක් නිරීක්ෂණය කිරීමට හැකි විය. සමහර විට එකම තාරකාව දෙපළක පෙනෙයි. එවැනි අවස්ථාවල තාරකාවේ වර්ණාවලිය පිරික්සීමෙන් එකම තාරකාව දෙපළක පෙනෙන බව තහවුරු කරගත හැකිය. එකම දෙය මෙලෙස දෙපළක පෙනෙන්නේ ඇයි? ඒ තාරකාවේ ආලෝකයෙන් කොටසක් හැරී ගමන් කිරීම ඊට හේතුව විය යුතුය. තාරකාවල ආලෝකය වෙනත් අතකට හැරවීමට තරම් ප්‍රබල ගුරුත්වාකර්ෂණ බලයක් ඇති යම් ග්‍රහවස්තුන් විශේෂයක් විශ්වයෙහි ඇති බව එයින් පැහැදිලිය. විද්‍යාඥයෝ ඒ හඳුනා නොගත් ග්‍රහ වස්තූන් කළුකුහර (Black holes) ලෙස නම් කළහ. කළුකුහරයක් තුළ පවතින ගුරුත්වාකර්ෂණ බලය කොතරම් අධික ද යත් එය අසලින් යන ආලෝක කිරණ පවා එහි බලපෑමට ලක්වේ. කළුකුහර ආසන්නයේ ඇති ග්‍රහවස්තු ඒ වෙතට ඇදී ගොස් සුණු විසුණු වී යයි. කළුකුහර නම් වූ මේ අද්භූත ආකාශ වස්තූන් දුටු කෙනෙකු නැතත් එවැන්නක් පැවතිය හැකි බව ඉහත කී සාක්ෂි අනුව පැහැදිලිය. හේතු කිහිපයක් නිසා කළුකුහර බිහි විය හැකි බව විද්‍යාඥයෝ පවසති.

1. විශාල තාරකාවක් පිපිරීයාම නිසා එය මධ්‍යයේ පවතින ඉලෙක්ට්‍රෝන පිටතට විසිරී ගොස් පරමාණු න්‍යෂ්ටි ඉතිරි වී කළුකුහරයක් බිහි වේ.

2. තරු පංති විශාල සංඛ්‍යාවකින් සමන්විත යෝධ චක්‍රාවාටවල මධ්‍යයේ ඇති අධික ගුරුත්වාකර්ෂණ බලය නිසා ද කළුකුහර බිහිවිය හැකිය.

3. චක්‍රාවාට දෙකක් අතර කළුකුහර පිහිටිය හැකිය.

"කළුකුහර" තාරකා විද්‍යාවට පසුකාලීනව එකතු වූ සංකල්පයකි. මුල්කාලීන තාරකා විද්‍යාඥයන් වූ ගැලීලියෝ, කොපර්නිකස්, කෙප්ලර් වැනි අය මෙවැනි අද්භූත ග්‍රහවස්තූන් ගැන කිසිවක් දැන සිටියේ නැත. එනමුත් දැනට වසර 2500 කට



Scanned with CamScanner

පෙර බිහි වූ බෞද්ධ දැනුම් පද්ධතිය තුළ කළුකුහර ගැන විස්තර අඩංගු වී ඇත.

සක්වළ දෙකක් අතර ආලෝකයෙන් තොර "ලෝකාන්තරික කුහර" පවතින බව බෞද්ධ සාහිත්‍යයේ සඳහන්ය. මෙම ලෝකාන්තරික කුහර තුළ ලෝකාන්තරික නිරය භූමි පිහිටා ඇත. ලෝකාන්තරික නිරයට වැටෙන සත්ත්වයෝ දිගු කලක් තිස්සේ එහි සිරවී අනේක පීඩ දුක් විඳිති. සක්වළ ඉමෙහි ඇති එවැනි ස්ථානවල අධික ශීතලක් පවතින බව තාරකා විද්‍යාඥයෝ කියති. උදාහරණයක් ලෙස, සූර්ය ග්‍රහ මණ්ඩලයෙන් පිටත අභ්‍යවකාශයේ පවතින උෂ්ණත්වය හිම මිදෙන උෂ්ණත්වයටත් වඩා සෙල්සියස් අංශක 273කින් අඩුය. සක්වළ ඈත ඉමේ පවතින ශීතල අපාය භූමි ගැන බෞද්ධ සාහිත්‍යයේ විස්තර වේ. "පදුම" නරකය එවැන්නකි. ගුණවතුන්ට හා සිල්වතුන්ට නින්දා අපහාස කළ අය පදුම නරකයෙහි උපදිති. ඊට පදුම යන නම ලැබුණු ආකාරය ද සිත්ගන්නා සුලුය. පදුම නරකයට පැමිණි සත්ත්වයා එහි පවතින අධික ශීතල නිසා නෙළුම් මලක් විවර වන්නාක් මෙන් පැළී යයි. පදුම නරකයට ඒ නම ලැබුණේ ඉහත කී හේතුව නිසාය.



Scanned with CamScanner

# 39. කල්ප විනාශය එළඹෙන අයුරු

"කල්පය" යන්නෙන් අදහස් වන්නේ ආයුෂ ප්‍රමාණයයි. මිනිසාගේ පරමායුෂ ආයුඃ කල්පය නම් වේ. ආයුඃ කල්පය වසර 120 ක් පමණ වෙයි. එබැවින් යමෙක් වසර 120 ක් පමණ ජීවත් වුවහොත් එය පරමායුෂ ලෙස සලකනු ලැබේ. ලෝකයේ පරමායුෂයටද කල්පය යන නම ව්‍යවහාර වේ.

පෘථිවිය මත ජීවය ඇති වී පරිණාමයට හා විපරිණාමයට ලක් වී වරින්වර සම්පූර්ණ ලෝකයෙහිම ජීවය අතුගෑවී යන බව විශ්වය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්වල දැක්වේ.

විශ්වය බිහි වී එය නැවත විනාශ වන්නට මත්තෙන් පෘථිවිය මත හා සෙසු ලෝක මත ජීවය වරින්වර ජලයෙන් ද ගින්නෙන් ද සුළඟෙන් ද විශාල වශයෙන් නැසී යන බව දැක්වේ. මෙම මතය නවීන විද්‍යාත්මක පර්යේෂණ තුළින් ද සනාථ වී ඇත. පොළව මත තැන්පත්ව ඇති පස් තට්ටු පරීක්ෂා කිරීමෙන් පසු විද්‍යාඥයන් විසින් ඉතා පැහැදිලි නිගමනයකට එළඹ ඇත. එනම් සෑම වර්ෂ මිලියන 62 කටම වරක් (වසර 62,000,000 කට වරක්) පෘථිවිය මත ජීවයෙන් 95% ක් වත් අතු ගෑවී යන බවයි. එබැවින් ලෝක විනාශය පිළිබඳ බෞද්ධ මතය සනාථ වී ඇති බව කිව හැකිය.

*සූර්යයන් සතක් පායන දිනය*

කල්ප විනාශය සම්බන්ධව කුතුහලය දනවන කරුණු රැසක්ම බුද්ධ දේශනයන් තුළ අඩංගුය. අංගුත්තර නිකායට අයත් සප්ත සූර්යය ගමන සූත්‍රය සියල්ලෙහි අනිත්‍ය බව පෙන්වීමට දේශනා කරන ලද්දකි. මෙම සූත්‍රය අසා අවසානයේ පන්සියයක් භික්ෂූන් වහන්සේලා රහත් භාවයට පැමිණි බව ධර්මයෙහි දැක්වේ. ලෝක විනාශය සහ කල්ප විනාශය පිළිබඳව තතු සොයන කෙනෙකුට සප්ත සූර්යය ගමන සූත්‍රයේ ඉගැන්වීම් අතිශය ප්‍රයෝජනවත් විය හැකිය.

ලෝකතලය මත පවතින ජීවය ජලයෙන් ද සුළඟින් ද ගින්නෙන් ද වරින්වර විනාශ වුවත් සම්පූර්ණ විනාශය



Scanned with CamScanner

එළඹෙන්නේ ඉන් ද බොහෝ කලකට පසුවය. පෘථිවි තලය මත පවතින ජීවය සහමුලින්ම අතුගෑවී යන ආකාරය සප්ත සූර්යය ගමන සූත්‍රයේ විස්තර වනුයේ මතු දැක්වෙන පරිද්දෙනි.

✧ වර්තමානයේ සිට වර්ෂ ලක්ෂ ගණනාවක් කල් ගත වූ පසු වැසි වැටීම නවතින කාලයක් ඇති වේ.

✧ වැසි දිය නොමැතිවීම නිසා ගහ කොළ සියල්ල ක්‍රමක්‍රමයෙන් මිය යයි.

✧ මේ කාලයේ දී අහසෙහි දෙවැනි සූර්යයෙකු ද පහළ වේ. සූර්යයන් දෙදෙනාගේම රශ්මිය නිසා කුඩා විල්, පොකුණු හා කුඩා ගංගාවන් සිඳී වියළි වැලි තලය පමණක් ඉතිරි වේ.

✧ තවත් කල් ගතවන විට තුන්වැනි හිරු ද උදා වේ. එකල්හි සියලුම ගංගාවෝ සිඳී යති.

✧ තුන්වැනි හිරුට පසුව සතරවැනි හිරු ද උදා වේ. සතර වැනි හිරු පායන කල්හි සියලු විල් හිඳී යයි.

✧ නැවත පස්වැනි හිරු උදාවෙන සමයෙහි මහා සාගරය ද ක්‍රමක්‍රමයෙන් සිඳී ගොස් පෘථිවිය මත ඇති ජලය අතුරුදන් වේ.

✧ ඊළඟට සයවෙනි හිරු උදා වේ. දැන් පෘථිවිය රත්වීමෙන් නැගෙන දුම් ජාලාවලින් පොළෝ තලය වැසී යයි.

✧ අවසානයේ සත්වැනි හිරු උදා වේ. මෙකල්හි මුළු පෘථිවියම ගින්නෙන් දැවී යයි. අළු හෝ අඟුරු ඉතිරි නොවී සියල්ල දැවී අතුරුදන් වේ. මෙය පෘථිවි තලයේ අවසානයයි. පෘථිවිය දැවී පැන නගින ගින්න කෙතෙක් දුර පැතිර යන්නේ ද යත් ආභස්සර බ්‍රහ්ම ලෝකයෙන් පහළ සියලු ලෝක ගින්නෙන් දැවී විනාශ වේ.

මේ කල්ප විනාශය පිළිබඳ බුද්ධ දේශනයයි. පෘථිවියේ අවසානය කෙසේ එළඹේද යන්න පිළිබඳව තාරකා විද්‍යාඥයන් අතර විවිධාකාර මත පළ වී ඇත. ඉන් එක් පිරිසක් කල්පනා කරනුයේ සූර්යයා මහලු වීම නිසා ප්‍රසාරණය වී පෘථිවිය ද ගිලගන්නා බවය. තවත් පිරිසකගේ මතය වී ඇත්තේ විශ්වයේ ප්‍රසාරණය සමග සූර්ය ග්‍රහ මණ්ඩලය ඇතුළු කොට ඇති ක්ෂීරපථ



Scanned with CamScanner

මන්දාකිනියම ලිහී යන බවයි. ගුරුත්වාකර්ෂණ බැම්මෙන් මිදෙන පෘථිවිය හා සෙසු ග්‍රහලෝක ඈත අවකාශයට ඇදීගොස් තනිවනු ඇත. එකල්හි අධික ශීතල නිසා ද සූර්යයාගෙන් ශක්තිය ලැබීම නතර වීම නිසා ද සියලු ආකාරයේ ජීවය පෘථිවිය මතින් අතුරුදහන් වනු ඇත. පෘථිවියේ අවසානය පිළිබඳ මෑත කාලීනව ඉදිරිපත් වූ මතයකින් කියවෙනුයේ විශ්වය යම් දිනක හැකිළීමට පටන් ගන්නා බවයි. මේ හැකිළීම නිසා තාරකා පංති එකින් එක ළං වේ. එලෙස තව තවත් ළං වෙන තාරකාවෝ එකිනෙකාගේ රශ්මිය නිසාම දැවී විනාශ වෙති ලෝකාවසානය පිළිබඳ බුද්ධ දේශනය මේ මතය හා පෑහෙයි. පෙර කී පරිදි විශ්වය සංකෝචනය වීම නිසා තාරකා එකිනෙක ළං වූ කල සූර්යයන් සත්දෙනෙක් පෑයීම සැබැවින්ම සිදුවනු ඇත.

විශ්වය බිහිවීම හා එහි අවසානය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් ඒ පිළිබඳ විද්‍යාත්මක සත්‍යයන් හා ඉතා හොඳින් පෑහේ. දිනෙන් දින නවීන විද්‍යාව බුදු සමය වෙත ළං වනුයේ ඇදහිය නොහැකි තරම් වේගයකිනි.



Scanned with CamScanner

# 40. ළඟ ළඟ එන ලෝක විනාශය

දකුණු ඇමරිකාවේ ඇන්ඩීස් කඳු වැටිය ආශ්‍රිතව වර්ධනය වූ මායාවරුන්ගේ (Maya) ශිෂ්ටාචාරය ක්‍රිස්තු වර්ෂ 7 වන සියවස දක්වා ඈතට දිවයයි. මායාවරුන්ගේ ගුප්ත ඇදහිලි ක්‍රම හා විශ්වාසයන් පිටුපස ප්‍රතික්ෂේප කළ නොහැකි ලෝක සත්‍යයන් රාශියක් සැඟව ඇතැයි පර්යේෂකයෝ කියති. මායාවරුන් සකස් කළ දින දර්ශනය දැනට ලොව භාවිත වන සම්මත ක්‍රමයට වඩා අතිශයින්ම සංකීර්ණය. එනමුත් එය පුදුමාකාර ලෙස නිරවද්‍යය වේ. වසර දසදහස් ගණනක් වුව ඉදිරියට හෝ අතීතයට සූර්යග්‍රහණ හා චන්ද්‍රග්‍රහණ ඇති වන දින කල්තබා ගණනය කළ හැකි තරම් ඔවුන්ගේ කාලගණන ක්‍රම නිරවද්‍යතාවයෙන් යුක්තය. එමෙන්ම මායාවරු අතිදක්ෂ ඉංජිනේරුවෝ වූහ. නිසරු කඳු මුදුන් මත පිහිටි මායාවරුන්ගේ බළකොටුවලට ජලය ලබාගත්තේ කෙසේ දැයි අනුමාන කිරීමට නූතන ඉංජිනේරුවන්ට පවා නොහැකිය.

මායාවරුන් විසින් ආගමික කටයුතු වෙනුවෙන් නිර්මාණය කර ඇති දැවැන්ත ගොඩනැගිලි නූතන ඉංජිනේරු විද්‍යාවට පවා අභියෝගයකි. ඔවුන් කළුගල් නියමිත හැඩයකට කපා එකිනෙක පුරුද්දා ඇත්තේ ඒ අතරින් කඩදාසියක්වත් රිංගවීමට නොහැකි තරම් සූමට ලෙසය. මායා රජවරුන් අතර ශ්‍රේෂ්ඨතමයා ලෙස සැලකෙන චලාන් බලාන් අතිදක්ෂ ගණිතඥයෙකු වූයේය. හේ තම අතිවිශිෂ්ට ගණිත දැනුම භාවිත කර පෘථිවියේ අනාගතය පෙන්වන කැලැන්ඩරයක් නිර්මාණය කළේය. මෙම කැලැන්ඩරය සම්පූර්ණයෙන්ම නිමවා තිබුණේ මායාවරුන්ගේ රූපාක්ෂර ඇසුරෙනි. පසුකාලීනව දකුණු ඇමරිකාව ආක්‍රමණය කළ ස්පාඤ්ඤ ජාතික ආක්‍රමණිකයෝ මායාවරුන්ගේ දෙවොල් ගිනි තබා විනාශ කළහ. මායා ශිෂ්ටාචාරයට අයත් බොහෝ ලියකියවිලි පුලුස්සා දමන ලද්දේ ඒවා "මිථ්‍යා දෘෂ්ටිකයන්ගේ ආගමික ලියවිලි" ලෙස හඳුනාගත් බැවිනි. කෙසේ නමුත් චලාන් බලාන්ගේ කැලැන්ඩරයේ කොටස් 2 ක් පමණක් දැනට සුරක්ෂිතව පවතී.

චලාන් බලාන්ගේ කැලැන්ඩරය කිය වූ පුරාවිද්‍යාඥයන් මවිතයෙන් මවිතයට පත්වූහ. හ(ර්)නැන්ඩෝ කෝටීස් නම්



Scanned with CamScanner

දේශගවේෂකයා දකුණු ඇමරිකාවට පැමිණීම, ප්‍රංශ විප්ලවය හා දෙවැනි ලෝක යුද්ධය වැනි ලොව ප්‍රධානතම දේශපාලන සිදුවීම් සියල්ල චලාන් බලාන් විසින් කල්තබාම නිරීක්ෂණය කර තිබුණි.

මායාවරුන්ගේ කාල ගණන ක්‍රමය අනුව පෘථිවිය මත ජීවය වර්ෂ 25800 කට වරක් විනාශ වී යයි. වෙනත් අයුරකින් කියතොත් පෘථිවිය හැම වසර 25800 කටම වරක් අලුත් වෙයි. වසර 25800 කට වරක් එළඹෙන ලෝක විනාශයෙන් ඉතිරිවනුයේ ඉතා සුළු පිරිසක් පමණි. පෘථිවියේ ආයුෂය නැවතත් වර්ෂ 20 බැගින් කොටස්වලට බෙදිය හැකිය. එක් එක් විංශතිවලදී (අවුරුදු 20 ක කාලය) එක් එක් බලවේගවලට ලොව ප්‍රමුඛතාවයක් ලැබේ. සමහර විංශතිවල දී අධිරාජ්‍යවාදී පාලකයෝ ලොව ප්‍රමුඛස්ථානය ලබති. එවන් කාලසීමා තුළ දී ලොව හැම දෙසකින්ම අධිරාජ්‍යවාදී වියරුවක් (Rage) හට ගනී. තවත් විංශතියක දී ලොව පුරා යුද ගැටුම් ඇති වේ. මේ අතර සමහර විංශතිවල දී ආධ්‍යාත්මික නායකයෝ ලොව පහළ වෙති.

(මෙකී විංශති ක්‍රමය පෙර විසූ ඉන්දීය ගණිතඥයන් විසින් ද භාවිත කර ඇත. එක් එක් විංශතිය ඊශ්වර විංශතිය, බ්‍රහ්ම විංශතිය ආදී ලෙස නම් ලබා ඇත.)

මායාවරුන්ගේ කාලගණන ක්‍රමය අනුව වර්ෂ 2012 දී පෘථිවියේ වයස සම්පූර්ණ වේ. එනම් වර්ෂ 2012 දී ජීව ලෝකයේ අවසානය සිදුවේ. හරියටම කියතොත් වර්ෂ 2012 දෙසැම්බර් මස 21 වන දින ලෝක ශිෂ්ටාචාරය විනාශ වී යයි. මෙය සිදුවනුයේ කෙසේද? සාගරයට අධිපති දෙවියා උදම් රැළි මවයි. අහසට අධිපති දෙවියා මහා කුණාටුවක් මවයි. මේ දෙකේ ක්‍රියාකාරිත්වය එක්වී 2012 දෙසැම්බර් 21 වන දින මිනිස් ශිෂ්ටාචාරය මෙලොවින් අතුගෑවී යයි.

මායාවරුන්ගේ මේ අද්භූත අනාවැකිය පිළිබඳව විද්‍යාඥයෝ මෑතක දී තවදුරටත් සොයා බැලූහ. ඔවුන්ට මේ හා සමාන අනාවැකි කිහිපයක් මෑතක දී සොයා ගැනීමට හැකි විය.

චීනයේ තාඕවාදී ඉගැන්වීම්වලට නෑකම් කියන ඊ චිං නමැති ග්‍රන්ථයක් වෙයි. මෙකී ඊ චිං නම් ග්‍රන්ථය කොතරම් පැරණි දැයි



Scanned with CamScanner

කීමට කිසිවෙක් නොදනිති. තාඕවාදී (Taoist) සංකල්පවලට අදාළව විස්මිත අනාවැකි කියන අයුරු මේ කෘතිය තුළ දක්වා ඇත. ඒ චීං අනාවැකි ක්‍රමයේ කියවෙන පරිදි ලෝකයේ සිදුවෙන අනාගත සිදුවීම් සියල්ල කල්තබා නිවැරදිව ගණනය කළ හැකිය. තවත් නිවැරදිව කිවහොත් සෑම වසර 64 කටම වරක් ලෝකයේ ඉරණම වෙනස් වේ. එමෙන්ම හැම වසර (64X64) 376 කටම වරක් ඊටත් වඩා දැවැන්ත පරිවර්තනයක් ඇති වේ. මේ ආකාරයට ගණනය කළ විට ලෝකයේ දැවැන්තම පරිවර්තනය වන දිනය සොයා ගත හැකිය. නුදුරු අනාගතයට අයත් එම දිනය වර්ෂ 2012 දෙසැම්බර් මස 21 වන දිනයම වේ. අතිත් අතට චීන ජ්‍යෝතිෂ දැනුම මෙයට එක් කළ විට, 2012 දෙසැම්බර් මස 21 වන දින ලෝක කේන්ද්‍රයේ අවාසනාවන්තම දිනයයි.

21 වන සියවසේ දී සිදුවෙතැයි කියන භයානක විපත්තිය පිළිබඳව එංගලන්තයේ විසූ සුප්‍රසිද්ධ අනාවැකිකරුවෙකු වන මර්ලින් විසින් ද විස්තර දක්වා ඇත. ජනප්‍රවාදයන්හි කියවෙන පරිදි මර්ලින් යනු එංගලන්තයේ සිටි බලවත්ම රජු වූ ආතර් රජුගේ අග්‍ර පුරෝහිතයාය. ආතර් රජු කිසිවෙකුටවත් පැරදවිය නොහැකි රණකාමී නායකයෙකුව සිටි බව ජනප්‍රවාදයන්හි කියවේ. ආතර් රජුගේ විජයග්‍රහණ පිටුපස සිටි අදිසි බලවේගය වූයේ මර්ලින්ය. යුද වැදිය යුතු වෙලාවන් ද පසුබා සිටිය යුතු වේලාවන් ද ආතර් රජු වෙත කල්තබා දන්වන ලද්දේ මර්ලින් විසිනි. මර්ලින්ගේ එක් අනාවැකියකට අනුව 21 වන සියවසේ දී ඇති වන දැවැන්ත සුනාමි ව්‍යසනයකින් මනුෂ්‍ය ශිෂ්ටාචාරයෙන් වැඩි කොටසක් මෙලොවින් අතුගෑවී යයි.

මර්ලින්ගේ අනාවැකි හා සමාන නිරවද්‍යතාවක් එංගලන්තයේ විසූ ෂිෆ්ටන් නම් පූජකවරිය විසින් කියූ අනාවැකිවල ඇති බව පැවසේ. ෂිෆ්ටන් නම් පූජකවරිය කුමන කාලයක ජීවත් වී ද යන්න කීමට කිසිවෙක් නොදනිති. ජනප්‍රවාදයන්හි කියවෙන පරිදි ෂිෆ්ටන් යනු ගල්ගුහාවක හුදෙකලාව භාවනානුයෝගීව සිටි කිතුනු පූජකවරියකි. එංගලන්තයේ පසුකාලීන ලේඛකයන් විසින් ෂිෆ්ටන්ගේ අනාවැකි සම්බන්ධව සොයාගත හැකි තොරතුරු එක් රැස්කර අනාවැකි පොත් ලියා තැබූහ. මෙවැනි එක් අනාවැකියකට අනුව 20 වන සියවස වන විට ගැහැනු පිරිමින් සේ වෙස් මාරුකර



Scanned with CamScanner

ගනිති. කොණ්ඩය කොටට කැපීම ද දිග කලිසම් ඇඳීම ද 20 වන සියවසේ යුවතියන් අතර ජනප්‍රිය විලාසිතාවක් වනු ඇත. තවද, 20 වන සියවසේ දී මිනිස්සු යකඩින් කළ යෝධ පියාපත් සහිත වාහනවල නැගී අහසෙහි සැරිසරති. මේ කාලසීමාව වන විට හිරු රැස් දැඩි වී ගොස් උත්තරධ්‍රැවය ආසන්නයේ ඇති හිමකඳු දියවේ. සාගර ජලය ප්‍රචණ්ඩ ලෙස ඉහළ නැගී මහත් විනාශයකට මුල පුරයි.

20 වන සියවසේ දී සහ ඉන් අනතුරුව ලොවපුරා ඇති වන භයානක සිදුවීම් ගැන අනාවැකිකරුවන් කියූ දෙය විද්‍යාඥයෝ සනාථ කරති. ෂිෆ්ටන් පූජකවරිය කී ලෙසම පෘථිවියේ උෂ්ණත්වය දිනෙන් දිනම ඉහළ යයි. ධ්‍රැවාසන්න අයිස් කඳුවල දියවීම කෙතරම් වේගවත් ද යත් මේ වන විට අයිස් දියවී යාම නිසා උත්තර ධ්‍රැවය ආසන්නයට නෞකාවන්ට යාත්‍රා කළ හැකි බව කියවේ. ධ්‍රැවාසන්න මුහුදේ අයිස් දියවී යාම නිසා රුසියාව උත්තරධ්‍රැවය අසල මුහුදේ තෙල් නිධි කැණීමට සැරසෙයි. වර්ෂ 2100 ගිම්හාන ඍතුව ඇරඹුණු විට උත්තරධ්‍රැවය මුළුමනින්ම දියවී යනු ඇතැයි විද්‍යාඥයන් විසින් ගණන් බලා ඇත.

පෘථිවියේ උෂ්ණත්වය වැඩිවීම උස් කඳු මුදුන් දක්වාම බලපා ඇත. මෑතක් වනතුරුම සමකය ආශ්‍රිතව ඇති අඩි 18,000 කට වඩා උස් කඳු මුදුන් හිමෙන් වැසී පැවතුණි. අඩි 20,000 කට වඩා උසැති කඳු ශිඛරයක් වන අප්‍රිකාවේ කිලිමංජාරෝ කඳු මුදුනේ සිට ගලා ආ අයිස් ගංගා (ග්ලැසියර) සියල්ල මේ වන විට අතුරුදන්ව ඇත. ඉන්දියාවේ හිමාලයේ කඳු පන්තියද අයිස් දියවීම නිසා ක්‍රමක්‍රමයෙන් උසින් අඩු වෙමින් පවතී. හිමාල කඳු වැටියේ වයඹදිග බෑවුමේ සැතපුම් 3 ක් පමණ උස කොටසක් මේ වන විට ගැලවී ගොස් ඒ ප්‍රදේශය බිමට සමතලා වී ඇත. ඉන්දියාවේ සමහර ගංගාවන් මේ වන විට හිඳීයාම ඇරඹී ඇත. ඊට හේතුව වී ඇත්තේ හිමාල කඳු වැටියේ සමහර ප්‍රදේශවල අයිස් දියවී අවසන් වීමයි. (ඉන්දියාවේ සමහර ගංගාවල වැඩි ප්‍රමාණයක් ඇත්තේ හිමාල කඳු වැටියේ අයිස් දියවූ ජලයයි.)

පෘථිවිය උණුසුම් වී අයිස් තැන්පතු සියල්ල දියවී යාමත් සමගම පොළවේ උෂ්ණත්වය සෙල්සියස් අංශක 2ත් 4ත් අතර



Scanned with CamScanner

ගණනකින් එක්වරම ඉහළ යනු ඇතැයි විද්‍යාඥයෝ බලාපොරොත්තු වෙති. මෙම සිද්ධිය සිදුවීමට තව ඇත්තේ වසර 100 කට අඩු කාලයකි. මේ අවස්ථාවේ මුහුදු මට්ටම මීටර් 25 ක්වත් ඉහළ යනු ඇතැයි ගණන් බලා ඇත. ඒ අනුව ලෝකයේ අධික ජනගහනයක් ඇති නගරවලින් වැඩි ප්‍රමාණයක් ජලයෙන් යට වනු ඇත.

පැහැදිලිවම දක්වතොත්, පෙර කල අනාවැකිකරුවන් කියූ කල්ප විනාශයේ පෙරනිමිති දැන් පහළ වී ඇත.

කෙසේ නමුත්, ලෝක විනාශය නිශ්චිත දිනයක දී සිදුවන බවට මෙතෙක් පළ වූ අනාවැකිවලින් විශාල ප්‍රමාණයක් අසත්‍ය බව ඔප්පු වී ඇත. මන්දයත් ලෝකය තවම පවතින බැවිනි. ක්‍රිස්තු වර්ෂ 1999 දී ඇරඹී 2006 වර්ෂය පමණ තෙක් පවතින 3 වන ලෝක යුද්ධයක් ගැන ප්‍රංශයේ විසූ නොස්ත්‍රදාමුස් නම් අනාවැකිකරු සිය ග්‍රන්ථවල දක්වා තිබුණි. තෙවන ලෝක යුද්ධයෙන් ලොව ජනගහනයෙන් සුළුතර පිරිසක් පමණක් දිවිගලවා ගනු ඇති බව නොස්ත්‍රදාමුස්ගේ විශ්වාසය විය. මේ අනාවැකිය පිළිගත් සමහරු එළඹෙන ලෝක විනාශයට කලින් කා බී සතුටු විය යුතුය කියා තම දේපළ උගසට තබා බැංකුවලින් ණය ගත්හ. සමහර ජපන් ජාතිකයෝ එළඹෙන ලෝක විනාශයට කලින් දිවිනසා ගත්හ. එහෙත් ලෝක විනාශය පිළිබඳව වූ ඒ අප්‍රසන්න අනාවැකිය සත්‍යයක් බවට පත් නොවීය.


නොස්ත්‍රදාමුස්ගේ පුත්‍රයා අසත්‍ය වූ අනාවැකි පළ කිරීම නිසා අභාග්‍යසම්පන්න ඉරණමකට මුහුණ පෑ අයෙකි. සුප්‍රසිද්ධ අනාවැකිකරුවකු වන නොස්ත්‍රදා-මුස්ගේ මරණින් මතු අනාවැකි කීමට අතගැසුවේ නොස්ත්‍රදාමුස්ගේ පුත්‍රයාය. සිය පියා මෙන් ඉක්මනින් ජනප්‍රිය වීමට සිතූ හෙතෙම යම් නුදුරු දිනයක මුළු පැරිස් නුවරම ගිනිගෙන විනාශ වන බවට අනාවැකියක් පළ කළේය. එනමුත් අදාළ දිනයේ රාත්‍රිය වන තුරු කිසිදු අතුරු ආන්තරාවක් පැරිසිය තුළ සිදු නොවීය. නවක අනාවැකිකරු පැරිසිය ගින්නෙන් දැවී යන තුරු කල්යල් බලා සිටියේය. නගරය විනාශය වන බවට කල් තබා පළ කළ අනාවැකි නිසාම නගරවාසීහු විමසිලිමත්ව සිටියහ. නගරයට ගිනිතබමින් සිටි අයෙකු පහසුවෙන්



Scanned with CamScanner

අල්ලා ගැනීමට ඔවුනට හැකි විය. ඒ අනෙකෙකු නොව නොස්ත්‍රදාමුස්ගේම පුත්‍රයාය. ව්‍යාජ අනාවැකිකරු අවසානයේ රජයෙන්ද දඬුවම් ලැබීය.

ජපානයේ විසූ ෂෝකෝ අසහාරා දක්ෂ තරුණ යෝගියෙකි. හේ යෝග විද්‍යාව ගැන තිබූ උනන්දුව නිසාම ඉන්දියාවට ගොස් යෝග ගුරුවරුන් හමු වී විවිධ යෝග ක්‍රම හදාළේය. දැඩි කැපවීමකින් යුතුව අභ්‍යාස කළ ඔහු අවසානයේ ගුවනේ පාවීමට උගත්තේය. පසුකාලීනව නැවත ජපානයට පැමිණි අසහාරා දහස් ගණන් ප්‍රේක්ෂකයන් මවිත කරමින් ගුවනේ පාවීමට සමත් වූයේය. 1990 දශකයේ ශ්‍රී ලංකාවට පැමිණි අසහාරා ගාල්ල වයි. එම්. බී. ඒ. ශාලාව තුළ දී ගුවනේ පාවීමේ සමත්කම කර පෙන්වීය. පොළවට අඩි 3ක් පමණ ඉහළින් ධ්‍යානගත ඉරියව්වෙන් රැඳී සිටි අසහාරා දුටු බොහෝ ශ්‍රී ලාංකික පිරිස් මේ තම් නියම මුනිවරයෙකැයි සිතා ඔහුගේ අනුගාමිකයන් බවට පත්වූහ. අසහාරා "මුනිවරයා" වෙනුවෙන් ඉදි කළ ආශ්‍රමය අදටත් ගාල්ල ආසන්න ප්‍රදේශයක දැකිය හැකිය.



ජපන් ජාතික ෂෝකෝ අසහාරා පොළවට අඩි කිහිපයක් උඩින් අහසේ රැඳී සිට තම දස්කම් පෙන්වයි.



Scanned with CamScanner

මෙලෙස ජනප්‍රියත්වයේ මුදුන් හිණි පෙත්තට නැගගත් අසහාරා නුදුරු අනාගතයේ දී ලෝක විනාශය සිදුවන බව කියමින් තව තවත් පිරිස් තම ග්‍රහණයට හසුකර ගත්තේය. ලෝක විනාශ දිනය එළඹුණේ අසහාරාගේ අනුගාමිකයන් කම්පනයට පත් කරමිනි. ජපානයේ සමහරු එළඹෙන ලෝක විනාශයට මුහුණ දිය නොහැකිව කල්තබාම දිවි නසා ගත්හ. "ලෝක විනාශ දිනය" සාමකාමීව අවසන් වන ලකුණු පෙනුණි. අසහාරා සිය අනුගාමිකයන් සමග වහා ක්‍රියාත්මක වී ලෝක විනාශය සියතට ගත්තේය. හේ තම අනුගාමිකයන් යොදවා ජපානයේ උමං දුම්රිය පොළකට විෂවායු මුදා හැර මහා ජන සංහාරයක් සිදු කළේය. මේ පිළිබඳව පැවැත්වුණු දීර්ඝ නඩු විභාගයකින් වරදකරු වූ අසහාරා වෙත මරණීය දණ්ඩනය නියම කෙරුණි.

මේ කතා ප්‍රවෘත්තීන්ගෙන් උගත යුතු වැදගත් කරුණක් ඇත. අනාවැකි සැමවිටම සත්‍ය නොවේය යන්න එම කරුණයි. අනාවැකි වැරදීම සහ හරියාම පිළිබඳව ඉතා වැදගත් කතා ප්‍රවෘත්තියක් ජාතක පාලියේ එන සමුද්‍රවාණිජ ජාතකයේ සඳහන්ය. ඒ කතා ප්‍රවෘත්තිය සැකෙවින් මතු දැක්වේ.

දුරාතීතයේ සමුද්‍රයක් මැද දිවයිනක් විය. සමුද්‍රයෙහි ගමන් ගන්නා වෙළෙන්දන්ගේ වාසස්ථානයක් ලෙස භාවිතයට ගැනුණි. ඒ දිවයිනට අරක් ගත් යක්ෂයෝ ද දෙවියෝ ද ළඟ එන සුනාමි අනතුරක් ගැන දූපත්වාසීන්ට අනතුරු ඇඟවූහ. ඉන් එක අනාවැකියක කියවුණේ දූපතේ එක් පැත්තක් විනාශ වන බවයි. තවත් අනාවැකියක කියවුණේ පතේ අනෙක් පැත්ත විනාශ වන බවයි. මේ අතර නුවණැති වෙළඳ පිරිසක් මෙලෙස කතිකා කරගත්හ.

"දෙවියෝ ද යක්ෂයෝ ද (මිනිසුන්ට ආවේශ වී) නොයෙකුත් අනාවැකි කියති. මේ අනාවැකිවලින් සමහර ඒවා සත්‍ය වේ. සමහර ඒවා අසත්‍ය වේ. තවද සමහර දෙවියෝ ද යක්ෂයෝ ද (මිනිසුන් රවටා වාසි ලැබීමට) අසත්‍ය අනාවැකි පළ කරති. එනමුත් අප කල්තබා සූදානම් වීම යහපත්ය"

මෙසේ කතිකා කරගත් ඔවුහු සුනාමි උවදුරක දී දියඹට පලාගොස් බේරීම සඳහා මහා නැවක් සෑදූහ. සුනාමි අනතුර



Scanned with CamScanner

සැබැවින්ම ඇති විය. සාගරයෙන් ආ මහ ජලකඳ මුළු දූපතම සෝදා හැර ආපසු දියඹට ඇදී ගියේ දූපත්වාසීන් මුහුදු රකුසාට බිලි කරමිනි. නෞකාවේ නැගී දියඹට පලා ගිය අය පමණක් අනතුරින් දිවි ගලවා ගත්හ. අනාවැකිය ගැන වාද විවාද කරමින් සිටි පිරිස අනතුරින් මිය ගියහ.

මේ අගනා කතා ප්‍රවෘත්තිය අපට කදිම පාඩම් කිහිපයක්ම කියා දෙයි.

1. සුනාමි අනතුරු ලෝක ඉතිහාසය තුළ වරින් වර ඇතිවී මිනිසුන්ට විපත් ඇති කරයි. (ජාතක පාලියේ සුනාමි යන වදන සඳහන්ව නැත. සුනාමි යන්න ජපන් වදනකි.)

2. එවන් අනතුරකට පෙර යක්ෂයෝ ද දෙවියෝ ද මිනිසුන් වෙත ආවේශ වී කල්තබා එම තත්ත්වය දැනුම් දෙති.

3. එවැනි සමහර දැනුම් දීම් නොමග යවන සුලු ඒවාය.

4. අනතුරකට පෙර කල්තබා සැලසුම් සහගතව සූදානම් වීම මිසක ඒ පිළිබඳව වාදවිවාද කරමින් සිටීම සුදුසු නැත.

5. සුනාමි අනතුරකට පෙර කළ හැකි හොඳම දෙය යාත්‍රාවක නැගී මුහුද දෙසට යාමයි. (උස් ගොඩබිමක් නොමැති තැනක සුනාමි අනතුරකින් මිදීමට මේ ක්‍රමය උචිත බව විද්‍යාඥයෝ කියති. ගැඹුරු දිය තුළ සුනාමි රළ ඇති වුවත් ඒ රළ බිඳී නොයයි. එබැවින් ගැඹුරු මුහුදේ සිටින නාවිකයන්ට සුනාමි ව්‍යසනයක දී කිසිදු හානියක් සිදු නොවේ. ඔවුන් දියඹේ දී නිරීක්ෂණය කරනුයේ මුහුදේ උස් පහත් වීම පමණකි.)



Scanned with CamScanner

# 41. පෘථිවිවාසීන්ගේ අනාගතය

මිනිසා පෘථිවිය මත පය එසවූ මුල් දිනයේ පටන්ම සෙමින් සෙමින් මිනිස් ජනගහනය වැඩි වූ බව මානව විද්‍යාඥයෝ කියති. දැනට ලොව සිටින ජනගහනය කෝටි 800 ක් පමණ විය හැකියයි ගණන් බලා තිබේ. ලෝකයේ ඇති සම්පත් ප්‍රමාණය සලකන කල ජනගහනය වැඩි විය හැක්කේ තවත් ස්වල්ප ප්‍රමාණයකින් පමණි. එතැන් සිට ලොව මත උග්‍ර ආහාර අර්බුදයක් ඇති වේ. පෘථිවිය මත ඇති තෙල් සම්පත් ද තවත් දශක කිහිපයකින් නිමවනු ඇත. මිනිස් ලොව දැනටමත් පවතින බලශක්ති අර්බුදය යම් දිනක මානව ශිෂ්ටාචාරය දෙදරා යන තරම් දරුණු වනු ඇත. තවද, ලොව පුරා ස්ථානගත කර ඇති, බිහිසුණු න්‍යෂ්ටික අවි ප්‍රමාණය මේ ලෝතලය මත පවතින ජීවය 500 වරකට වඩා විනාශ කිරීමට ප්‍රමාණවත්ය. පෘථිවිය මත උෂ්ණත්වය ද දැනට පාලනය කළ නොහැකි අයුරින් ඉහළ නගියි.


තවද 21 වන සියවසේ ස්වාභාවික මරණ ඉක්මවා ඒඩ්ස් රෝගයෙන් මිය යන පුද්ගලයන්ගේ ගණන වැඩි වන බවට පැහැදිලි සාධක ඇත.

මේ ගත වනුයේ මනුෂ්‍ය ශිෂ්ටාචාරයේ අවසාන කාලයද? එසේ වීමට බොහෝ ඉඩ ඇතැයි විද්‍යාඥයෝ කියති. එසේ නම්, ඔබ කුමක් කළ යුතුද? මිනිස් ලොවින් නික්ම යාමට, මිනිස් ලොව අතහැර යාමට ඔබ අකමැත්තෙන් වුවද සූදානම් විය යුතුය. ඒ සඳහා ඇත්තේ එකම මාර්ගයකි. සිත දියුණු කර ඉහළ මානසික තලයකට පැමිණීම මිනිස් ලොව ඉක්මවීමේ ඒකායන මාර්ගයයි. ඒ මගෙහි පියවර නගන ඔබට මේ කෘතියෙන් උගත් දැනුම මහෝපකාරී වනු ඇත.



Scanned with CamScanner

# ජීවිතය මරණය සහ පුනරුත්පත්තිය



ISBN 978-955-655-452-6

වාසනා ප්‍රකාශකයෝ තාත්තැල්ල පාර, දන්කොටුව.
☎ 031-2258384/ 4926206/ 5670570/4921922/ Fax: 2259805
E-mail: pmwasana@sltnet.lk Web: wasanapublishers.com.lk

මිල රු.200/-

Scanned with CamScanner